

වාර්ෂික කාර්යසාධන වාර්තාව

2025

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

වාර්ෂික කාර්යසාධන වාර්තාව

2025

අයවැය ශීර්ෂ අංක: 111

අයවැය ශීර්ෂ අංක: 220
(ආයුර්වේද දෙපාර්තමේන්තුව)

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

පටුන

පරිච්ඡේදය	විස්තරය	පිටු අංකය
1	**ආයතනික පැතිකඩ /විධායක සාරාංශය**	03
1.1	හැඳින්වීම	05
1.2	ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු	10
1.3	ප්‍රධාන කාර්යයන්	12
1.4	සංවිධාන සටහන	14
1.5	අමාත්‍යාංශයේ ප්‍රධාන අංශ	16
1.6	අමාත්‍යාංශය යටතේ පවතින ආයතන/ අරමුදල්	17
1.7	විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු	22
2	**ප්‍රගතිය හා ඉදිරි දැක්ම**	23
2.0	විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක	25
2.1	රෝග නිවාරණ අංශයේ වැඩිදියුණු කිරීම්	25
2.2	විදේශාධාර ව්‍යාපෘති	32
2.3	සෞඛ්‍ය ප්‍රවර්ධනය	36
2.4	සෞඛ්‍ය පද්ධතිය ශක්තිමත් කිරීම	38
2.5	සෞඛ්‍ය සත්කාර ගුණාත්මකභාවය සහ සුරක්ෂිතතාවය	40
2.6	මානව සම්පත් සංවර්ධනය	41
2.7	අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම 2025	42
2.8	වෛද්‍ය පර්යේෂණ	43
2.9	වෛද්‍ය සැපයීම්	47
2.10	ජාතික රුධිර පාරවිලයන සේවාව	48
2.11	මහජන සෞඛ්‍ය සේවාවන්	49
2.12	දේශීය වෛද්‍ය අංශය	65
3	**වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය**	93
3.1	මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය	95
3.3	මූල්‍ය තත්ත්වය පිලිබඳ ප්‍රකාශය	96
3.4	මුදල් ප්‍රවාහ පිලිබඳ ප්‍රකාශය	97
3.5	මූල්‍ය ප්‍රකාශ සටහන්	98
3.6	ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය	98
3.7	ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය	99
3.8	මු.රේ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තුවල / නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන	99
3.9	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	100
3.10	විගණකාධිපතිවරයාගේ වාර්තාව	102
4	**කාර්ය සාධන දර්ශක**	219
4.1	ආයතනයේ කාර්ය සාධන දර්ශක	221
5	**තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය**	273
5.1	හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු	275

5.2	තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග	286
6	**මානව සම්පත් පැතිකඩ**	289
6.1	සේවක සංඛ්‍යා කළමනාකරණය	291
6.2	ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය	291
6.3	මානව සම්පත් සංවර්ධනය	294
7	**අනුකූලතා වාර්තාව**	307
	අවසානය	316

1 පරිච්ඡේදය

ආයතනික පැතිකඩ / විධායක සාරාංශය

1.1 හැදින්වීම

ආර්ථික, සමාජීය, මානසික හා අධ්‍යාත්මික සංවර්ධනයට දායක වන සෞඛ්‍ය සම්පන්න ජාතියක් සඳහා වන දැක්ම සමඟින් රෝග වැළැක්වීම, රෝග නිවාරණය, ප්‍රවර්ධනය, පරිපාලනය හා පුනරුත්ථාපනය යන අංශවල ගුණාත්මක සෞඛ්‍ය සේවා සැපයීම තුළින් ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගේ සෞඛ්‍ය තත්ත්වය ආරක්ෂා කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය කැපවී සිටී. එමෙන්ම, සෞඛ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය, ප්‍රමිතීන් සකස් කිරීම, රටේ සෞඛ්‍ය සේවා සැපයීම සඳහා උපාය-මාර්ගික මගපෙන්වීම, සම්පත් වෙන් කිරීම, සියළුම සෞඛ්‍ය සේවා සැපයුම් ආයතනවල කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සහ කළමනාකරණය සහ සියළුම පුරවැසියන්ට නොමිලේ සෞඛ්‍ය සේවා සැපයීම පුළුල් සෞඛ්‍ය සේවා ජාලයක් හරහා සිදු කිරීම සෞඛ්‍ය අමාත්‍යාංශයේ වගකීම වේ.

කාර්යක්ෂම හා ඵලදායි දිවිතියික හා තෘතීයික සත්කාර සේවාවන් පවත්වා ගනිමින් වර්තමානයේ ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර සේවාවන් ශක්තිමත් කිරීම උදෙසා සෞඛ්‍ය අමාත්‍යාංශය වැඩි උත්සාහයක් හා අවධානයක් යොමු කර ඇත. මෙම උත්සාහයන් විශ්වීය සෞඛ්‍ය ආවරණය (Universal Health Coverage) සාක්ෂාත් කර ගැනීමේ පරමාර්ථයෙන් සිදු කරනු ලබන අතර, එමගින් අවශ්‍යතා ඇති සියලු දෙනාටම, මෙම සේවාවන් භාවිතා කිරීම තුලින් මූල්‍ය දුෂ්කරතාවන්ට නිරාවරණය නොවන බවට සහතික වෙමින් ප්‍රවර්ධන, නිවාරණ, රෝග ප්‍රතිකාර, පුනරුත්ථාපන සහ රෝග සත්කාර සෞඛ්‍ය සේවාවන් සඳහා ප්‍රවේශය සහතික කරනු ඇත.

ඉහළ ඵලදායීතාවය, වඩා හොඳ අධ්‍යාපන ප්‍රතිඵල, ඉහළ ශ්‍රම බලකායේ සහභාගීත්වය සහ වැඩි දියුණු කළ නවෝත්පාදන හා කුසලතා සඳහා මානව ප්‍රාග්ධන සංවර්ධනය සෘජුවම දායක වන බැවින් ඒ සඳහා සෞඛ්‍ය සම්පන්න ජනතාවක් සිටීම අත්‍යවශ්‍ය වේ. එය සමාජ ස්ථාවරත්වය ප්‍රවර්ධනය කරයි, ජීවන තත්ත්වය වැඩිදියුණු කරයි සහ ආර්ථික වර්ධණයට හා ස්ථාවරත්වයට සහාය වේ. ඒ අනුව, 2025 සඳහා රජයේ සෞඛ්‍ය අයවැය සැලකිය යුතු ලෙස රුපියල් මිලියන 604,000 ක ප්‍රතිපාදනයක් දක්වා වැඩිකර ඇත.

ඖෂධ සහ වෛද්‍ය සැපයුම් සැපයීම සහතික කිරීම සඳහා රුපියල් මිලියන 185,000 ක් වෙන් කර ඇත. නාස්තිය අවම කරමින්, ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රශස්ත කරමින් සහ අරමුදල් පූර්ණ ලෙස භාවිතා කිරීම සහතික කරමින් ගුණාත්මක ඖෂධ සහ වෛද්‍ය සැපයුම් අඛණ්ඩව ප්‍රසම්පාදනය කිරීම සහ බෙදා හැරීම සහතික කිරීම මෙම ප්‍රතිපාදනයේ අරමුණ වේ.

කොවිඩ්-19 වසංගතයෙන් පසු මූල්‍ය අර්බුදය හේතුවෙන් 2022 දී නතර කරන ලද ව්‍යාපෘති කිහිපයක් 2025 අයවැයට ඇතුළත් කර ඇත. සෞඛ්‍ය සම්පන්න සමාජයක් කරා යන නව රජයේ ප්‍රතිපත්තියත් සමග පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි 2025 අයවැය යටතේ අවධානය යොමු කරන ලදී.

1. **සෞඛ්‍ය පද්ධතිය ඩිජිටල්කරණය කිරීම**
   සෞඛ්‍ය සේවාවන් සැපයීම, ඩිජිටල්කරණය වැඩි දියුණු කිරීම සඳහා නව මුල පිරීම් සහ මැදිහත්වීම් සිදු කිරීමට බලාපොරොත්තු වේ. ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA), රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව (SPC) සහ "ස්වස්ථ" පද්ධතිය වැඩිදියුණු කිරීම හා පුළුල් කිරීම එයට ඇතුළත් වේ.

2. **ග්‍රාමීය මට්ටමේ ප්‍රාථමික සෞඛ්‍ය සේවා වැඩි දියුණු කිරීම**

බෝ නොවන රෝග පාලනය සහ වැලැක්වීම කෙරෙහි අවධානය යොමු කරමින්, 1000 කට අධික ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකක (PMCUs) සහ ප්‍රාදේශීය රෝහල් වල සේවා සැපයීම වැඩිදියුණු කිරීම. තවද, වයස්ගත ජනගහනය සැලකිල්ලට ගනිමින් සෑම දිස්ත්‍රික්කයකම තෝරාගත් PMCU වල ඇති සහන සත්කාර (palliative) සහ වයෝවෘද්ධ (geriatric) සත්කාර සේවා ස්ථාපිත කිරීමට යෝජනා කරයි.

3. වතු සෞඛ්‍ය

ප්‍රාදේශීය වැවිලි සමාගම් සමග රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් (PPP) හරහා වතු මට්ටමේ සෞඛ්‍ය සේවා ශක්තිමත් කිරීම කඩිනම් කිරීමට යෝජනා කරන ලදී. වතු රෝහල් සඳහා අවශ්‍ය මානව සම්පත්, උපකරණ සහ ඖෂධ රජය විසින් සපයනු ඇත.

4. වසංගත සඳහා සූදානම (Pandemic Preparedness)

ඇතිවිය හැකි සියලුම සෞඛ්‍ය උපද්‍රවයන්ට එරෙහිව ආවේක්ෂණ (Surveillance) සහ පූර්ව අනතුරු ඇඟවීමේ ධාරිතාවය ශක්තිමත් කිරීම.

5. ඔටිසම් ඇතුළු ස්නායු සංවර්ධන ආබාධ සහිත දරුවන් සඳහා සෞඛ්‍ය සේවා ප්‍රතිකාර ලබා දීම

පසුගිය දශකය තුළ ශ්‍රී ලංකාවේ ඔටිසම් ඇතුළු ස්නායු සංවර්ධන ආබාධ සහිත දරුවන්ගේ සංඛ්‍යාව වැඩිවී ඇති බව දක්නට ලැබේ. මෙම අභියෝගවලට මුහුණදීම සඳහා ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 පුරාම ඔටිසම් ඇතුළු ස්නායු සංවර්ධන ආබාධ සහිත දරුවන් වෙනුවෙන් සෞඛ්‍ය, අධ්‍යාපන සහ සේවා පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා වසර 5 ක ජාතික වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට යෝජනා කරනු ලැබේ. එහි මූලික පියවරක් ලෙස ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනනුකූලව ළමා ප්‍රතිකාර මධ්‍යස්ථානයක් රිජ්වේ ආර්යා ළමා රෝහලේ (LRH) ස්ථාපිත කිරීමට 2025 වර්ෂය සඳහා රුපියල් මිලියන 200ක් වෙන්කර ඇත. තවද, ඉදිරි වසර 5 තුළ අවශ්‍ය මානව සම්පත් සහිතව සෑම දිස්ත්‍රික්කයකටම සමාන ආකාරයේ ප්‍රතිකාර මධ්‍යස්ථාන පිහිටුවීමට යෝජනා කර ඇත. කෙසේ වෙතත් මෙම ප්‍රතිපාදන කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ අයවැය යටතේ පවතියි.

6. ඔටිසම් ඇතුළු ස්නායු සංවර්ධන ආබාධ සහිත දරුවන් සඳහා අන්තර්කරණ මුල් ළමාවිය සංවර්ධනය

වර්තමානයේ පෙර පාසල් සහ දිවා සුරැකුම් සේවාවන් පෞද්ගලික අංශය විසින් සපයනු ලබන අතර ඔටිසම් රෝගයෙන් පෙළෙන දරුවන්ට පෙර පාසල් සහ දිවා සුරැකුම් සේවා සඳහා පවතින පහසුකම් සීමිතය. මෙයට ප්‍රධාන වශයෙන් හේතුවී ඇත්තේ ඔටිසම් ඇතුළු ස්නායු සංවර්ධන ආබාධ සහිත දරුවන් සඳහා අන්තර්කරණ අධ්‍යාපනය සහ මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳව පෙර පාසල් ගුරුවරුන් සහ රැක බලා ගන්නන් අතර දැනුවත් භාවය සහ ධාරිතාවය නොමැති වීමයි. එබැවින්, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ අයවැය යටතේ 2025 වර්ෂය සඳහා ආදර්ශ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 250ක් වෙන් කර ඇත.

නව යොවුන් වියේ පසුවන්නන් අතර සිදුවන අවාසනාවන්ත සියදිවි නසාගැනීමේ සිදුවීම් සමාජ ගැටලුවක් ලෙස රජය විසින් හඳුනාගෙන ඇති බැවින්, අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ එක්ව සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් සිසුන් සහ නව යොවුන් වියේ පසුවන්නන් සඳහා දැනුවත් කිරීමේ සහ උපදේශන සේවා පුළුල් කිරීමේ මධ්‍යකාලීන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා සමාජ ආරක්ෂණ වැඩසටහන යටතේ 2025 වර්ෂය වෙනුවෙන් රුපියල් මිලියන 250ක් වෙන් කර ඇත.

මීට අමතරව, ආබාධ සහිත පුද්ගලයින් සඳහා අවශ්‍ය ආධාරක උපකරණ දේශීයව නිෂ්පාදනය කිරීමේ පහසුකම් පුළුල් කිරීම සඳහා පුළුල් වැඩසටහනක අවශ්‍යතාවය හඳුනාගන්නා ලදී. එබැවින් ජාතික මධ්‍යස්ථානය වන රාගම රක්තවාතවේදී හා පුනරුත්ථාපන රෝහල සහ අවශ්‍ය පරිදි ප්‍රාදේශීය නිෂ්පාදන මධ්‍යස්ථානවල ආධාරක උපකරණ නිෂ්පාදනය කිරීමේ පහසුකම් වැඩි දියුණු කිරීම ආරම්භ කිරීමට, අයවැය යෝජනා යටතේ 2025 වර්ෂය සඳහා රුපියල් මිලියන 500 ක ප්‍රතිපාදන වෙන් කර දී ඇත.

කෙසේ වුවද, ඉහත සැලැස්මට බාධා කරමින් 2025 නොවැම්බර් 25 වන දින "දිට්වා" සුළි කුණාටුවට ශ්‍රී ලංකාව මුහුණ දුන් අතර එය ප්‍රධාන මානුෂීය අර්බුදයක් නිර්මාණය කළේය. මෙමගින් දිස්ත්‍රික්ක 25ම බලපෑමට ලක්වූ අතර සෞඛ්‍ය සේවා ආයතන කිහිපයකට හානි සිදුවිය. එහි ප්‍රතිඵලයක් ලෙස වසර අවසන් වන විට සෞඛ්‍ය අයවැයට නැවත ගොඩනැගීමේ කටයුතු සඳහා අනපේක්ෂිත වියදමක් දැරීමට සිදුවිය.

ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) සහ අනෙකුත් සංවර්ධන හවුල්කරුවන්, සෞඛ්‍ය කාර්යමණ්ඩලය හා එක්ව ජාතික වශයෙන් ප්‍රතිචාර දැක්වීමට සහාය වීමට සහ බලපෑමට ලක්වූ ප්‍රජාවන්ට අවශ්‍ය කාලෝචිත හා අත්‍යවශ්‍ය සත්කාර සේවා ලබා ගැනීම සහතික කිරීමට සම්පූර්ණයෙන්ම කැපවී සිටියහ.

"විවිධ කාණ්ඩ වලට අයත් වෛද්‍ය සත්කාර ආයතන මගින් ලබාදෙන පහසුකම්" යන මැයෙන් අංක 01-18/2020 හා 2020.03.03 දිනැතිව නිකුත් කරන ලද පොදු චක්‍රලේඛය පදනම්ව 2025.12.31 දිනට සත්කාර සේවා මට්ටම් ත්‍රිත්වය යටතේ සෞඛ්‍ය සත්කාර ආයතන 1,208 ක් පහත සඳහන් පරිදි කාණ්ඩගත කර ඇත.

වගුව 01 – 2025.12.31 දිනට සෞඛ්‍ය සත්කාර ආයතනවල සාරාංශය

අංකය	සත්කාර සේවා මට්ටම	රෝහල් කාණ්ඩය	රෝහල් සංඛ්‍යාව		
			රේඛීය අමාත්‍යාංශය	පළාත් අමාත්‍යාංශය	එකතුව
01	තෘතීයික සත්කාර සේවා	ජාතික රෝහල්	03	00	03
02		ශික්ෂණ රෝහල්	11	00	11
03		විශේෂිත ශික්ෂණ රෝහල්	06	00	06
04		වෙනත් විශේෂිත රෝහල්	09	05	14
05		මණ්ඩලයක් මගින් පාලනය වන රෝහල්	01	00	01
06		දිස්ත්‍රික් මහ රෝහල්	13	07	20
		උප එකතුව	**43**	**12**	**55**
07	ද්විතීයික සත්කාර සේවා	මූලික රෝහල ඒ වර්ගය	07	28	35
08		මූලික රෝහල බී වර්ගය	01	44	45
09		මණ්ඩලයක් මගින් පාලනය වන රෝහල්	01	00	01
		උප එකතුව	**09**	**72**	**81**

අංකය	සත්කාර සේවා මට්ටම	රෝහල් කාණ්ඩය	රෝහල් සංඛ්‍යාව		
			රේඛීය අමාත්‍යාංශය	පළාත් අමාත්‍යාංශය	එකතුව
10		ප්‍රාදේශීය රෝහල ඒ වර්ගය	01	66	67
11		ප්‍රාදේශීය රෝහල බී වර්ගය	01	147	148
12		ප්‍රාදේශීය රෝහල සී වර්ගය	01	276	277
13		ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකක	11	569	580
		උප එකතුව	**14**	**1,058**	**1,072**
		එකතුව	**66**	**1,142**	**1,208**

මෙරට පෞද්ගලික සෞඛ්‍ය අංශයේ මුළු පෞද්ගලික රෝහල් 212ක් ක්‍රියාත්මක වන අතර එහි ඇඳන් සංඛ්‍යාව 5,788 කි.

තවද, ප්‍රධාන වශයෙන් ආයුර්වේද ශික්ෂණ රෝහල් හතරක් (බොරැල්ල, ගම්පහ, කයිතඩි හා ත්‍රිකුණාමලය පිහිටි), පර්යේෂණ රෝහල් හතක් (නාවින්න, අම්පාර, මන්වන්තුඩාව, හම්බන්තොට, මැදවච්චිය, නින්දවුර් හා මිහින්තලේ පිහිටි) සහ හෝමියෝපති රෝහලක් (වැලිසර පිහිටි) දේශීය වෛද්‍ය අංශය යටතේ ක්‍රියාත්මක වෙමින් පවතී.

2025 වර්ෂය සඳහා වූ මෙම කාර්ය සාධන වාර්තාව මගින් සෞඛ්‍ය අංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය මෙන්ම 2025 වර්ෂයට නියමිත ඉලක්කවලට සාපේක්ෂව, සෞඛ්‍ය අංශයේ සමස්ථ කාර්ය සාධනය පෙන්නුම් කරයි. 2025 වර්ෂයේ වාර්තාවට ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමනය අංශයේ සහ දේශීය වෛද්‍ය අංශයේ කාර්ය සාධනය ද ඇතුලත් කර ඇත.

2025 දී වැය ශීර්ෂ 111 (සෞඛ්‍ය අංශය) සහ 220 (ආයුර්වේද දෙපාර්තමේන්තුව) යටතේ මුළු සංශෝධිත ප්‍රතිපාදන රුපියල් මිලියන 89,951.98 ක් වියදම රුපියල් මිලියන 50,908.13 ක් වන අතර රුපියල් මිල්යන 8,085.18 ක් වටිනා බිලපත් පියවීමට නියමිතව තිබුණි. වැඩිදුර විස්තර පහත වගුව-02 හි සඳහන් කර ඇත.

වගුව - 02 මුල්‍ය ප්‍රගතියේ සාරාංශය

#	විස්තරය	අනුමත මූලධන ප්‍රතිපාදන (රු.මිලියන)	සංශෝධිත ප්‍රතිපාදන (රු. මිලියන)	මූල්‍ය ප්‍රගතිය (රු. මිලියන)	අතැති බිල්පත් 2025.12.31
1	111 - අමාත්‍යාංශ මූලධන ප්‍රතිපාදන	90,335.00	87,911.98	49,753.17	8,073.47
2	111 - අනුබද්ධ ආයතන	1,052.00	1.052.00	617.58	3.71
3	220 - ආයුර්වේද දෙපාර්තමේන්තුව	980.00	988.00	537.38	8.00
	එකතුව	**92,367.00**	**89,951.98**	**50,908.13**	**8,085.18**

දේශයේ ආර්ථික, සමාජීය, මානසික සහ අධ්‍යාත්මික සංවර්ධනය සඳහා දායක වන සෞඛ්‍ය සම්පන්න ජාතියක් බිහි කිරීම සඳහා වූ සෞඛ්‍ය අමාත්‍යාංශයේ දැක්ම යතාර්ථයක් කර ගැනීමෙහිලා දේශීය වෛද්‍ය අංශය විසින් සිය කැපවීම පෙන්නුම් කර ඇත.

පාරම්පරිකව පැවත එන දේශීය චිකිත්සා මෙන්ම ආයුර්වේද, සිද්ධ හා යූනානි වෛද්‍ය ක්‍රමයන් මෙරට ප්‍රාථමික සෞඛ්‍ය සංවර්ධනයට හා රෝග නිවාරණ කටයුතු සඳහා විශාල දායකත්වයක් ලබා දෙමින් සිටී. එසේම, විකල්ප වෛද්‍ය ක්‍රමයක් ලෙස හෝමියෝපති වෛද්‍ය ක්‍රමයද මේ වන විට ජනතාව අතර පිළිගැනීමට ලක්ව ඇත.

දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයේ ක්‍රියාකාරකම්, අදාළ ප්‍රතිපත්තිමය මූලධර්ම සහ උපායමාර්ගික ප්‍රමුඛතා මගින් මඟ පෙන්වනු ලබන රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුකූලව සිදු කරනු ලැබේ. සැලසුම්ගත වැඩසටහන් සාර්ථකව ක්‍රියාත්මක කිරීම තුළින් මෙම ප්‍රතිපත්තිමය අරමුණු ඉදිරියට ගෙන යාමෙහිලා 2025 වසර තුළ මෙම ක්ෂේත්‍රය වැදගත් කාර්යභාරයක් ඉටු කළේය.

මීට අමතරව, 2025 වසර තුළදී සම්පූර්ණයෙන් නිම කිරීමට නොහැකි වූ ක්‍රියාකාරකම් 2026 වසරේදී නිම කිරීම සඳහා සැලසුම් කර ඇත. මෙම ඉතිරිව ඇති වැඩසටහන් සාර්ථකව ක්‍රියාත්මක කිරීම මගින්, නිරෝගී ජනගහනයක් බිහි කිරීමට සහ ජාතික සෞඛ්‍ය අරමුණු සාක්ෂාත් කර ගැනීමට දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය මගින් ලබා දෙන දායකත්වය තවදුරටත් ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

එසේම, ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් තුළින් නිරෝගී ජනතාවක් බිහි කිරීම සඳහා වන නව රජයේ ප්‍රතිපත්ති සහ පියවරවලට අනුකූලව කටයුතු කරමින් සිටී.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

දේශයේ ආර්ථික, සාමාජීය, මානසික සහ අධ්‍යාත්මික සංවර්ධනය සඳහා දායක වන සෞඛ්‍ය සම්පන්න ජාතියක් බිහිකිරීම

මෙහෙවර

ජනතා අවශ්‍යතාවයට ප්‍රතිචාර දක්වමින්, සාමූහිකව ක්‍රියා කරමින්, පරිපූර්ණ, ඉහලම මට්ටමේ, ගුණාත්මක, සමාන, ඵලදායී සහ තිරසාර සෞඛ්‍ය සේවාවක් ශ්‍රී ලංකාවාසී ජනතාවට ලබාදීම මගින් අත්කරගත හැකි ඉහළම සෞඛ්‍ය මට්ටමට ළඟාවීම

දේශීය වෛද්‍ය අංශය

දැක්ම

හෙළ වෙදකමින් සැමට සුව සෙත

මෙහෙවර

ශ්‍රී ලාංකීය අනන්‍යතාවය රැකෙන අයුරින් පර්යේෂණ සහ නවීන තාක්ෂණය උපයෝගී කර ගනිමින් සමස්ත ප්‍රජාවට සුවසෙත සලසා මානව ශක්තීන් වර්ධනය කිරීම තුළින් ඔවුන් ජාතික ආර්ථික හා තිරසාර සංවර්ධන ඉලක්කයන් සපුරා ගැනීම සඳහා දායක කරවීම

අරමුණු

- රෝග වලක්වා ගැනීමේ අරමුණු ලඟාකර ගැනීම සඳහා සේවා සැපයීම ශක්තිමත් කිරීම.
- සියළුම ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහා උචිත වන අයුරින් සහ පහසුවෙන් ප්‍රවේශ වියහැකි පරිදි උසස් ගුණාත්මක බවින් යුත් සත්කාරක සේවාවන් ඇති කිරීම.
- ගුණාත්මක බවින් යුත් පුනරුත්ථාපන සත්කාර සේවාවක් ලබාගැනීම සඳහා අදාල රෝගීන්ට සමානාත්මක ප්‍රවේශයක් ප්‍රවර්ධනය කිරීම.
- දත්ත මත පදනම් වූ ක්‍රමවේද මගින් සේවා සැපයුම් ශක්තිමත් කර අඛණ්ඩ සේවාවන් සියළුම රෝගීන්ට ලබාදීම.
- ප්‍රතිකාර ලබාගැනීම සඳහා තමාට පුද්ගලිකව වියදම් කිරීමට සිදුවීම හා මූල්‍ය අවදානම අඩුකිරීමට නව උපාය මාර්ග වැඩි දියුණු කිරීම.
- මානව සම්පත් කළමනාකරණය ඇතුළුව අනෙකුත් අංශ මනා ලෙස ප්‍රති-ව්‍යුහගත කිරීම තුලින් පුළුල් සෞඛ්‍ය සේවා පද්ධතියක් සුරක්ෂිත කිරීම.
- සෞඛ්‍ය සේවාවන් සපයන සියළුම පාර්ශව සමඟ උපාය මාර්ගික සම්බන්ධතා වර්ධනය කරගැනීම.

1.3 ප්‍රධාන කාර්යයන්:

i. ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය
ii. සෞඛ්‍ය හා පෝෂණ විෂයයන් සහ අංක 1.6 යටතේ සඳහන් දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රාජ්‍ය සංස්ථා යටතේ පවතින විෂයයන්, අධීක්ෂණය හා ඇගයීම් කටයුතු සිදුකිරීම
iii. මහජන සෞඛ්‍ය සේවාවන්ට අදාල ප්‍රතිපත්ති හා ප්‍රමිතීන් සම්පාදනය
iv. මහජන සෞඛ්‍යය හා පෝෂණය වැඩිදියුණු කිරීමට වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාවට නැංවීම
v. අන්තර් ජාතික නිරෝධායන හා සනීපාරක්ෂණයට අදාල නීතිරීති ක්‍රියාත්මක කිරීම
vi. පෞද්ගලික රෝහල් හා වෛද්‍ය මධ්‍යස්ථානවල ගුණාත්මකභාවය, ප්‍රමිතීන් හා මිල ගණන් නියාමනය හා අධීක්ෂණය
vii. ලාභ නොලබන ප්‍රජා වෛද්‍ය සත්කාරක ආයතනවල වැඩකටයුතු නියාමනය හා අධීක්ෂණය
viii. වසංගත, බෝ වන හා බෝ නොවන රෝග තත්ත්ව පාලනය, වැළැක්වීම හා ප්‍රතිකාර සඳහා මෙහෙයුම් දියත් කිරීම
ix. පාසල් සෞඛ්‍ය වැඩසටහනට අදාල වෛද්‍ය සහ මුඛ සෞඛ්‍ය සේවාවන් ක්‍රියාත්මක කිරීම
x. වතු අංශය සඳහා වන සෞඛ්‍ය සේවාවන් පිළිබඳ කටයුතු
xi. සාමාන්‍ය සනීපාරක්ෂණය
xii. ත්‍රිපෝෂ බෙදාදීමේ වැඩපිළිවල ක්‍රියාත්මක කිරීම
xiii. සියලුම රෝහල් හා රෝහල් සේවකයින් පරිපාලනය (පළාත් සභා යටතේ ඇති රෝහල් හැර)
xiv. පුහුණුවීම් කටයුතු මෙහෙයවන සියලු දෙපාර්තමේන්තු හා එම සේවාවන් පරිපාලනය හා සංවිධානය සහ අනෙකුත් උසස් වෛද්‍ය අධ්‍යාපන ආයතන හා සම්බන්ධීකරණය
xv. ජාතික රුධිර පාරවිලයන සේවාවන් පිළිබඳ කටයුතු
xvi. ඖෂධ නිෂ්පාදනය, ආනයනය හා බෙදාහැරීම පිළිබඳ කටයුතු
xvii. ශ්‍රී ලංකා වෛද්‍ය සේවාවට අදාල පරිපාලනය හා පිරිස් කළමනාකරණය
xviii. වෛද්‍ය හා පරිපූරක වෛද්‍ය සේවාවන්හී ගුණාත්මකභාවය සහ නිපුණතා වැඩිකිරීමට අවශ්‍ය පුහුණු අවස්ථා ඇතිකිරීම
xix. සෞඛ්‍ය අංශයට අදාල පර්යේෂණ කටයුතු ව්‍යාප්ත කිරීමට නව උපක්‍රම හඳුන්වා දීම
xx. ජාතික සෞඛ්‍ය රක්ෂණ වැඩසටහන් පිළිබඳ කටයුතු
xxi. අවශ්‍යතාවය පරිදි තෝරාගත් රෝහල් උසස් කිරීම සහ ප්‍රාදේශීය සහ ප්‍රාථමික සත්කාර රෝහල් වල පහසුකම් පුළුල් කිරීම
xxii. සෞඛ්‍ය අංශයට අදාල තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම (අරමුණ 3)
xxiii. වඩා කාර්යක්ෂම ලෙස 1990 සුවසැරිය ගිලන්රථ සේවාව ක්‍රියාත්මක කිරීම සහ පුළුල් කිරීම

දේශීය වෛද්‍ය අංශයේ ප්‍රධාන කාර්යයන්

- දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනයට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම

(i) පාරම්පරික වෛද්‍ය ක්‍රම සංවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම

(ii) ආයුර්වේද, සිද්ධ, යුනානි හා හෝමියෝපති ඖෂධ නිෂ්පාදනය

(iii) ආයුර්වේද, සිද්ධ, යුනානි හා හෝමියෝපති වෛද්‍ය ක්‍රමවලට අවශ්‍ය අමු හා නිෂ්පාදිත ඖෂධ ආනයනය , විකිණීම හා බෙදාහැරීම

(iv) ආයුර්වේද, සිද්ධ, යුනානි ආදී දේශීය වෛද්‍ය ක්‍රම වැඩිදියුණු කිරීම සඳහා අදාළ රෝහල්, පර්යේෂණ හා පුහුණු ආයතන සහ වෙළඳ සැල් පිහිටුවීම හා කළමනාකරණය

(v) ඖෂධ පැලෑටි හා සකස් කළ ආයුර්වේද, සිද්ධ හා යුනානි ඖෂධ අපනයනය නියාමනය කිරීම

(vi) ආයුර්වේද ඖෂධ නිෂ්පාදකයන් නියාමනය කිරීම

(vii) ඖෂධ පැළෑටි වගාව ප්‍රවර්ධනය කිරීම හා දේශීය ඖෂධ වර්ග වැඩිදියුණු කිරීම ආශ්‍රිත ව්‍යාපෘති අදාළ ආයතන සම්බන්ධීකරණය කරමින් ඉටු කිරීම

(viii) ආයුර්වේද නිෂ්පාදකයන්, ආයුර්වේද වෛද්‍ය වෘත්තිකයන් හා ආයුර්වේද අතුරු වෛද්‍ය සේවක පිරිස් ලියාපදිංචි කිරීම

(ix) ආයුර්වේද රෝහල්, ආයුර්වේද පර්යේෂණ ආයතන, පුහුණු ආයතන සහ ඔසුසැල් පිහිටුවීම, මෙහෙයවීම හා ප්‍රවර්ධනය


(x) සංචාරකයින් සඳහා ප්‍රතිකාර කිරීමට දේශීය පාරම්පරික හා ආයුර්වේද ප්‍රතිකාර ක්‍රම සඳහා ප්‍රමුඛතාවය ලබාදෙමින් සංචාරක මණ්ඩලයේ සම්බන්ධීකරණය හා නියාමනය තුළ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම


(xi) දේශීය වෛද්‍ය විද්‍යාවට අදාළ ඖෂධ සහ ප්‍රතිකාර ක්‍රම පිළිබඳව පර්යේෂණ පැවැත්වීම දිරි ගැන්වීම

(xii) දේශීය වෛද්‍ය සේවයේ පරිපාලනය සහ පිරිස් කළමනාකරණ කටයුතු

1.4 සංවිධාන සටහන (කෙටුම්පත)


Draft Organization Structure for Ministry of Health - (Edited on 29.08.2025)





SPMC- State Pharnaceutical Manufacturing Cooperation
NMRA- National Medicianal Regulatory Authority
NATA- National Authority on Tobacco and Alcohol
SPC- State Pharmaceutical Coorperation

දේශීය වෛද්‍ය අංශයේ සංවිධාන සටහන



1.5 අමාත්‍යාංශයේ ප්‍රධාන අංශ

රෝග සත්කාර සේවා

රේඛීය අමාත්‍යාංශය යටතේ පවතින රෝහල්

මුඛ සෞඛ්‍ය සේවා

චතු හා නාගරික සෞඛ්‍ය සේවා

රෝග නිවාරණ සේවා

බෝවන රෝග පාලනය

රෝග වාහකයන් මගින් බෝවන රෝග පාලනය

බෝ නොවන රෝග පාලනය

මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා

පෝෂණය

ආපදා පෙර සූදානම්වීම සහ ප්‍රතිචාර දැක්වීම

පාරිසරික හා වෘත්තීය සෞඛ්‍ය සහ ආහාර සුරක්ෂිතතාව

සෞඛ්‍ය ප්‍රවර්ධනය

තරුණ, වැඩිහිටි සහ ආබාධිත පුද්ගලයින් සඳහා වන සේවා

මහජන සෞඛ්‍ය පශු වෛද්‍ය සේවා

දුම්කොළ හා මධ්‍යසාර පාලනය

වෙනත් සේවාවන්

අධ්‍යාපන, පුහුණු සහ පර්යේෂණ

රසායනාගාර සේවා

රුධිර පාරවිලයන සේවා

සෞඛ්‍ය සේවාවන්හි ගුණාත්මකභාවය සහ සුරක්ෂිතතාව (සෞඛ්‍ය අමාත්‍යාංශය සඳහා රෝගීන්ගේ සුරක්ෂිතතා හා ප්‍රතීතන කාර්යාංශය සහ ශ්‍රී ලංකා ජාතික සෞඛ්‍ය සත්කාර සේවා ප්‍රතීතන කවුන්සිලය)

වෛද්‍ය සැපයුම් සේවා

ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා

කළමනාකරණ සංවර්ධන හා සැලසුම් සේවා

මානව සම්පත් සංවර්ධනය

මූල්‍ය සේවා

වෛද්‍ය සංඛ්‍යාන සේවා

පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමනය

ඖෂධ සහ රූපලාවණ්‍ය ද්‍රව්‍ය නියාමනය

ඉංජිනේරු සේවා

දේශීය වෛද්‍ය අංශය

1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන / අරමුදල්

ජාතික රෝහල්

ශ්‍රී ලංකා ජාතික රෝහල, කොළඹ
ජාතික රෝහල, මහනුවර
ජාතික රෝහල, ගාල්ල

ශික්ෂණ රෝහල්

ශික්ෂණ රෝහල, අනුරාධපුර
ශික්ෂණ රෝහල, බදුල්ල
ශික්ෂණ රෝහල, මඩකලපුව
ශික්ෂණ රෝහල, කොළඹ උතුර, රාගම
ශික්ෂණ රෝහල, කොළඹ දකුණ, කළුබෝවිල
ශික්ෂණ රෝහල, යාපනය
ශික්ෂණ රෝහල, කළුතර
ශික්ෂණ රෝහල, කුලියාපිටිය
ශික්ෂණ රෝහල, කුරුණෑගල
ශික්ෂණ රෝහල, පේරාදෙණිය
ශික්ෂණ රෝහල, රත්නපුර

විශේෂිත රෝහල්

අපේක්ෂා රෝහල, මහරගම
කාසල් වීදියේ කාන්තා රෝහල (ශික්ෂණ), කොළඹ
ද සොයිසා කාන්තා රෝහල (ශික්ෂණ), කොළඹ
ජර්මන් - ශ්‍රී ලංකා මිත්‍රත්ව කාන්තා රෝහල (ශික්ෂණ), ගාල්ල
රිජ්වේ ආර්යා ළමා රෝහල (ශික්ෂණ), කොළඹ
ලාදුරු රෝහල - හැඳල
ජාතික දන්ත රෝහල (ශික්ෂණ), කොළඹ
ජාතික අක්ෂි රෝහල, කොළඹ
බෝවන රෝග පිළිබඳ ජාතික ආයතනය - අංගොඩ
ජාතික මානසික සෞඛ්‍ය ආයතනය - අංගොඩ
ජාතික වෘක්කවේද, රුධිර කාන්දු පෙරණ සහ බද්ධ කිරීමේ ආයතනය - මාලිගාවත්ත
ශ්වසන රෝග සඳහා වූ ජාතික රෝහල, වැලිසර
ජාතික වෘක්කවේද විශේෂිත රෝහල, පොළොන්නරුව
පුනරුත්ථාපන රෝහල, රාගම
සිරිමාවෝ බණ්ඩාරනායක විශේෂිත ළමා රෝහල (ශික්ෂණ) , පේරාදෙණිය

දිස්ත්‍රික් මහ රෝහල්

දිස්ත්‍රික් මහ රෝහල, අම්පාර
දිස්ත්‍රික් මහ රෝහල, හලාවත
දිස්ත්‍රික් මහ රෝහල, ඇඹිලිපිටිය
දිස්ත්‍රික් මහ රෝහල, හම්බන්තොට
දිස්ත්‍රික් මහ රෝහල, කෑගල්ල
දිස්ත්‍රික් මහ රෝහල, මාතලේ

දිස්ත්‍රික් මහ රෝහල, මාතර සහ ගොඩගම
දිස්ත්‍රික් මහ රෝහල, මොණරාගල
දිස්ත්‍රික් මහ රෝහල, නාවලපිටිය
දිස්ත්‍රික් මහ රෝහල, මීගමුව
දිස්ත්‍රික් මහ රෝහල, නුවරඑළිය
දිස්ත්‍රික් මහ රෝහල, පොලොන්නරුව
දිස්ත්‍රික් මහ රෝහල, ත්‍රිකුණාමලය

මූලික රෝහල් - "ඒ" කාණ්ඩය

මූලික රෝහල, අක්කරෙයිපත්තු
මූලික රෝහල, ගම්පොල
මූලික රෝහල, කල්මුණේ උතුර
මූලික රෝහල, කල්මුණේ දකුණ (අෂ්රොෆ් අනුස්මරණ රෝහල)
මූලික රෝහල, කන්තලේ
මූලික රෝහල, මුල්ලේරියාව (නැගෙනහිර කොළඹ මූලික රෝහල)
මූලික රෝහල, පොතුවිල්

මූලික රෝහල් - "බී" කාණ්ඩය

මූලික රෝහල, බේරුවල

ප්‍රාදේශීය රෝහල්

ප්‍රාදේශීය රෝහල, අළුත්ගම ("සී" කාණ්ඩය)
ප්‍රාදේශීය රෝහල, දර්ගා නගරය ("බී" කාණ්ඩය)
ප්‍රාදේශීය රෝහල, කඳාන ("ඒ" කාණ්ඩය)

මණ්ඩලයක් මගින් පාලනය වන රෝහල්

ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහල, තලපත්පිටිය, නුගේගොඩ
විජය කුමාරණතුංග අනුස්මරණ රෝහල, සීදුව

මහජන සෞඛ්‍ය ආයතන

බරවා මර්දන ව්‍යාපාරය
ලාදුරු මර්දන ව්‍යාපාරය
මැලේරියා මර්දන ව්‍යාපාරය
වසංගත රෝග විද්‍යා ඒකකය
පවුල් සෞඛ්‍ය කාර්යාංශය
සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය
මුඛ සෞඛ්‍ය ආයතනය, මහරගම
ජාතික පිළිකා මර්දන වැඩසටහන
නිදන්ගත වකුගඩු රෝග පිළිබඳ ජාතික වැඩසටහන
ජාතික ඩෙංගු මර්දන ඒකකය
ක්ෂය රෝග මර්දන හා ළය රෝග පිලිබඳ ජාතික වැඩසටහන
ජාතික ලිංගාශ්‍රිත රෝග / ඒඩ්ස් මර්දන වැඩසටහන
වකුගඩු රෝග නිවාරණ හා පර්යේෂණ ඒකකය (RDPRU)

වෙනත් ආයතන

ගුවන්තොටුපල සෞඛ්‍ය කාර්යාලය - කටුනායක
ගුවන්තොටුපල සෞඛ්‍ය කාර්යාලය - මත්තල
ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා
ආහාර රසායනාගාරය, අනුරාධපුර
අධිකරණ වෛද්‍ය හා විෂවේදය පිළිබඳ ආයතනය
වෛද්‍ය පර්යේෂණ ආයතනය
වෛද්‍ය සැපයුම් අංශය
වෛද්‍ය සංඛ්‍යා ලේඛන ඒකකය
ජාතික රුධිර පාරවිලයන සේවය
වරාය සෞඛ්‍ය කාර්යාලය - කොළඹ
වරාය සෞඛ්‍ය කාර්යාලය - ගාල්ල
වරාය සෞඛ්‍ය කාර්යාලය - හම්බන්තොට
වරාය සෞඛ්‍ය කාර්යාලය - කන්කසන්තුරෙයි
වරාය සෞඛ්‍ය කාර්යාලය - ඔලුවිල්
වරාය සෞඛ්‍ය කාර්යාලය - වෛද්‍ය පර්යේෂණ ආයතනය
වරාය සෞඛ්‍ය කාර්යාලය - ත්‍රිකුණාමලය
පාසල් සෞඛ්‍ය කාර්යාලය
ලිංගාශ්‍රිත රෝග සායනය, මහමෝදර
ශ්‍රී ලංකා පාර්ලිමේන්තු වෛද්‍ය මධ්‍යස්ථානය


පුහුණු ආයතන

ජාතික සෞඛ්‍ය විද්‍යායතනය, කළුතර
පශ්චාත් මූලික හෙද පාසල, කොළඹ
හෙද පුහුණු පාසල - අම්පාර
හෙද පුහුණු පාසල - අනුරාධපුර
හෙද පුහුණු පාසල - බදුල්ල
හෙද පුහුණු පාසල - මඩකලපුව
හෙද පුහුණු පාසල - කොළඹ
හෙද පුහුණු පාසල - ගාල්ල
හෙද පුහුණු පාසල - හම්බන්තොට
හෙද පුහුණු පාසල - යාපනය
හෙද පුහුණු පාසල - කඳාන
හෙද පුහුණු පාසල - මහනුවර
හෙද පුහුණු පාසල - කුරුණෑගල
හෙද පුහුණු පාසල - මාතර
හෙද පුහුණු පාසල - මුල්ලේරියාව
හෙද පුහුණු පාසල - රත්නපුර
හෙද පුහුණු පාසල - වවුනියාව
ජාතික හෙද පාසල, ශ්‍රී ජයවර්ධනපුර
ශ්‍රවණ විද්‍යා කාර්මික පුහුණු පාසල
බන්තු රේඛණ ශිල්පී පුහුණු පාසල
විද්‍යුත් නිකර්පණ රේඛණ සටහන්කරුවන් පුහුණු පාසල
සෞඛ්‍ය කීට විද්‍යා පුහුණු පාසල
වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥයන් පුහුණු පාසල - වෛද්‍ය පර්යේෂණ ආයතනය

වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥයන් පුහුණු පාසල- පේරාදෙණිය
අක්ෂි තාක්ෂණවේදී පුහුණු පාසල
භෞත චිකිත්සක සහ වෘත්තීය චිකිත්සක පුහුණු පාසල, ශ්‍රී ලංකා ජාතික රෝහල
ඖෂධවේදී පුහුණු පාසල, ශ්‍රී ලංකා ජාතික රෝහල (UOC)
විකිරණ ශිල්පී පුහුණු පාසල
ශ්‍රී ලංකා අංග ආදේශක හා ඍජුකරණඥ පුහුණු පාසල

අරමුදල් - ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල

1990 සුවසැරිය පදනම


දේශීය වෛද්‍ය අංශය
ආයුර්වේද වෛද්‍ය සභාව
ආයුර්වේද දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව
දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය
බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය
ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවය අනුරාධපුර
හෝමියෝපති වෛද්‍ය සභාව
හෝමියෝපති රෝහල
ශික්ෂණ රෝහල්
පර්යේෂණ රෝහල්
ඔසු උයන්
1. බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහල
2. ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහල
3. සිද්ධ ශික්ෂණ රෝහල, කයිතඩි
4. සිද්ධ ශික්ෂණ රෝහල, ත්‍රිකුණාමලය
1. බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණ රෝහල, නාවින්න
2. ආයුර්වේද පර්යේෂණ රෝහල, අම්පාර
3. ආයුර්වේද පර්යේෂණ රෝහල, මන්වන්තුඩාව
4. චමල් රාජපක්ෂ ආයුර්වේද පර්යේෂණ රෝහල, හම්බන්තොට
5. වකුගඩු රෝග නිවාරණ ආයුර්වේද පර්යේෂණ රෝහල, මැදවච්චිය
6. බෝ නොවන රෝග පර්යේෂණ රෝහල, නින්දවූර්
7. මෛත්‍රීපාල සේනානායක පාරම්පරික පර්යේෂණ රෝහල, මිහින්තලේ
1. නාවින්න
2. හල්දුම්මුල්ල
3. පට්ටිපොල
4. ගිරාදුරුකෝට්ටේ
5. පල්ලේකැලේ
6. පින්නදූව
7. කන්නෙලිය

1.7 විදේශ අරමුදල් ලබන ව්‍යාපෘති පිළිබඳ විස්තර

අනු අංකය	ව්‍යාපෘතියේ නම	ආධාරක ආයතනය	ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය (රු. මිලියන)	ව්‍යාපෘති කාල සීමාව
01	සෞඛ්‍ය පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (HSEP)	ආසියානු සංවර්ධන බැංකුව (ADB)	~~10,500.00~~ 35,346.00	2018 – 2023 ඔක්තෝ 2025 නොවැ.
02	සෞඛ්‍ය හා වෛද්‍ය සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය	ශ්‍රී ලංකා රජය – ජයිකා (JICA)	18,594.00	2018 ඔක්. – 2023 ඔක්.
03	ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාවට එරෙහිව සටන් කිරීම සඳහා වූ ගෝලීය අරමුදල (GFATM) ව්‍යාපෘතිය යටතේ ක්ෂය රෝගය (TB) සංරවකය සහ එච්අයිවී (HIV) සංරවකය ක්‍රියාත්මක කිරීම 2025-2027 ආධාර ප්‍රදාන චක්‍රය (Grant Cycle)	ගෝලීය අරමුදල TB HIV	 923.53 1,990.22	2025 - 2027
04	ද සොයිසා මාතෘ රෝහල සඳහා නව උපත් හා ප්‍රසව විමර්ශන මධ්‍යස්ථානය (ප්‍රංශය-HNB)	ප්‍රංශය / HNB	4,950.00	2019 - 2022
05	සෞඛ්‍ය තොරතුරු සහ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (Debt to Health Swap in Sri Lanka)	ගෝලීය අරමුදල	4,646.00	2021-2024 දිගුව 2025/06
06	ශ්‍රී ලංකාවේ ජීව වෛද්‍ය ඉංජිනේරු සේවාවන්ගේ ධාරිතා සංවර්ධනය	අන්තර්ජාතික සෞඛ්‍ය සත්කාර සඳහා වන කොරියානු පදනම (KOFIH)	1,656.00	2021-2024
07	ආඝාදිත අපද්‍රව්‍ය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය	ජයිකා (JICA)	1,520.00	2024 - 2026
08	ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ බෝ නොවන රෝග ප්‍රතිකාර පහසුකම් වැඩිදියුණු කිරීමේ වැඩසටහන	ජයිකා (JICA)	1,265.00	2024 - 2025
09	ශ්‍රී ලංකාවේ ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (PHSEP)	ලෝක බැංකුව (World Bank)	51,000.00	2024 - 2028
10	ඒකාබද්ධ එක් සෞඛ්‍ය වසංගත සහ ප්‍රතිචාර ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය (Integrated One Health Pandemic Preparedness & Response Strengthening Project)	ආසියානු සංවර්ධන බැංකුව (ADB)	31,000.00	2025 - 2029

2 පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.0 විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

ශ්‍රී ලංකා රජය විසින් සපයනු ලබන සෞඛ්‍ය සේවාවන් මෙහෙයවනු ලබන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ කැබිනට් අමාත්‍යවරයා යටතේය. 2015 සිට දේශීය වෛද්‍ය අංශය, සෞඛ්‍ය අමාත්‍යාංශයට ඇතුලත් කර ඇත. වර්තමානයේ, සෞඛ්‍ය විෂය පථය හා දේශීය වෛද්‍ය අංශය සඳහා නියෝජ්‍ය අමාත්‍යවරයකු පත්කර ඇත.

සෞඛ්‍ය අමාත්‍යාංශය, ප්‍රධාන රජයේ ආයතනය වශයෙන් අනෙකුත් රජයේ දෙපාර්තමේන්තු, දේශීය හා ජාත්‍යන්තර ආයතන, සිවිල් සමාජ කණ්ඩායම් සහ පොදු ජනතාව සමඟ එක්ව ශ්‍රී ලංකාවේ සියළුම පුරවැසියන්ගේ සෞඛ්‍ය තත්ත්වය සහ යහ පැවැත්ම සුරක්ෂිත කිරීමෙහිලා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. තවද, ඉහළ ගුණාත්මක භාවයකින් යුත් සෞඛ්‍ය සත්කාර සේවාවන් ජනතාව වෙත සමාන ආකාරයෙන් බෙදා හැරීම සෞඛ්‍ය අමාත්‍යාංශයේ වගකීම වේ. පුළුල් පරාසයක පවතින රෝග නිවාරණය, වැළැක්වීම, පුනරුත්ථාපනය හා ප්‍රවර්ධන සෞඛ්‍ය සේවාවන් සෞඛ්‍ය අමාත්‍යාංශය හා පළාත් සෞඛ්‍ය අංශ විසින් සෞඛ්‍ය සත්කාර ආයතන පුළුල් ජාලයක් ඔස්සේ සපයනු ලැබේ.

විශේෂ ලඟාකරගැනීම්:

2.1 රෝග නිවාරණ අංශයේ වැඩි දියුණු කිරීම්

- **යටිතල පහසුකම් සංවර්ධනය - ඉංජිනේරු අංශය මගින් ක්‍රියාත්මක දැනට කෙරෙමින් පවතින ව්‍යාපෘති**

  සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඉංජිනේරු අංශය විසින් දිවයින පුරා පිහිටි සෞඛ්‍ය සත්කාර යටිතල පහසුකම් සංවර්ධනය, නඩත්තුව සහ වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් ඉතා අගනා කාර්යභාරයක් ඉටු කරයි. රෝහල්, සායන සහ පර්යේෂණ මධ්‍යස්ථාන ඇතුළුව සියළුම සෞඛ්‍ය පහසුකම් නිර්මාණය කිරීම, ඉදි කිරීම හා නඩත්තු කිරීම (සුරක්ෂිතතාව, සහ තිරසාරභාවය සම්බන්ධව ඉහළම සම්මතයන්ට අනුව) පවත්වාගෙන යාම සහතික කිරීමට මෙම අංශය කැපවී සිටියි.

ක්‍රියාත්මක වෙමින් පවතින සංවර්ධන ව්‍යාපෘතිවල 2025.12.31 දිනට ප්‍රගතිය

අනු අංකය	ව්‍යාපෘතිය / ක්‍රියාකාරකම	භෞතික ප්‍රගතිය	වියදම (රු.මිලියන)	වෙනත්
01	මොණරාගල දිස්ත්‍රික් මහ රෝහලේ යෝජිත පස් මහල් වාට්ටු සංකීර්ණය	මහල් දෙකක් සම්පූර්ණකර ඇත (60%)	1,407.58	ක්‍රියාත්මක වෙමින් පවතී
02	රත්නපුර ශික්ෂණ රෝහලේ පිළිකා ප්‍රතිකාර ඒකකය ඉදි කිරීම - අදියර 2	දෙවන මහල සම්පූර්ණ කර ඇත. (අදියර-1) නැවත ආරම්භ කිරීමට නියමිතය. ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කරමින් පවතී.	81.35	
03	කරාපිටිය ශික්ෂණ	මහල් පහක්	616.58	

අනු අංකය	ව්‍යාපෘතිය / ක්‍රියාකාරකම	භෞතික ප්‍රගතිය	වියදම (රු.මිලියන)	වෙනත්
	රෝහලේ (ජාතික රෝහල, ගාල්ල) ශල්‍ය වෛද්‍ය ඒකකයේ පුළුල් කිරීම ව්‍යාපෘතියේ ඉතිරි වැඩ	සම්පූර්ණ කර ඇත. නිම කිරීමේ කටයුතු සිදු වෙමින් පවතියි.		
04	කෑගල්ල දිස්ත්‍රික් මහරෝහලේ හදිසි අනතුරු හා ප්‍රතිකාර ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ	මහල් තුනක් නිමකර ඇත. ඉතිරි වැඩ සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කෙරෙමින් පවතියි.	105.00	
05	ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මහ රෝහලේ අනතුරු හා හදිසි ප්‍රතිකාර ඒකකය ඉදි කිරීම	අර්ධ වශයෙන් නිම කර ඇත (40%) .ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුවෙමින් පවතියි.	00.00	
06	අම්පාර දිස්ත්‍රික් මහ රෝහලේ අනතුරු හා හදිසි ප්‍රතිකාර ඒකකය ඉදි කිරීම	බිම් මහල සම්පූර්ණ කර ඇත (55%).	866.00	ක්‍රියාත්මක වෙමින් පවතී
07	හලාවත දිස්ත්‍රික් මහ රෝහලේ අනතුරු හා හදිසි ප්‍රතිකාර ඒකකය ඉදි කිරීම	අර්ධ වශයෙන් සම්පූර්ණ කර ඇත (35%). ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කරමින් පවතියි.	159.00	
8	මහනුවර ජාතික රෝහලේ අනතුරු හා හදිසි ප්‍රතිකාර ඒකකය ඉදි කිරීම	මහල් දෙකක් සම්පූර්ණ කර ඇත. (40%) ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කරමින් පවතියි	145.00	
9	යාපනය ශික්ෂණ රෝහලේ අනතුරු හා හදිසි ප්‍රතිකාර ඒකකය අදියර-2 ඉදි කිරීම	ඉදි කිරීම සම්පූර්ණ කර ඇත. වායු සමීකරණය කිරීම හැර නිම කිරීමේ කටයුතු සිදු කරමින් පවතියි.	1,256.59	
10	කාසල් වීදියේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීම	මහල් - 16 ගොඩනැගිල්ලේ ව්‍යුහය ඉදි කිරීම සම්පූර්ණ කර ඇත. නිම කිරීමේ කටයුතු පස්වන මහල දක්වා සම්පූර්ණ කර ඇත (82%).	6,500.38	ක්‍රියාත්මක වෙමින් පවතී

අනු අංකය	ව්‍යාපෘතිය / ක්‍රියාකාරකම	භෞතික ප්‍රගතිය	වියදම (රු.මිලියන)	වෙනත්
11	මහනුවර ජාතික රෝහලේ පිළිකා ප්‍රතිකාර ඒකකය ඉදි කිරීම (අදියර 2)	මහල් දෙකක් සහ විදුලි සෝපානය සවි කිරීමේ කටයුතු සම්පූර්ණ කර ඇත (58%).	1,772.82	
12	මහනුවර ජාතික රෝහලේ පිළිකා ප්‍රතිකාර ඒකකය ඉදි කිරීම (අදියර 2) New Chiller	ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කරමින් පවතියි	00.00	
13	මාතර, මහනුවර සහ තෙලිප්පලෙයි පිළිකා රෝහල් ඉදි කිරීම	තෙලිප්පලෙයි පිළිකා ප්‍රතිකාර ඒකකයේ සියළුම නිම කිරීමේ කටයුතු සම්පූර්ණ කිරීමට නියමිතය.	57.00	
14	මහනුවර ජාතික රෝහලේ ඇට මිදුළු බද්ධ කිරීමේ ඒකකය ඉදි කිරීම (තැලසීමියා රෝගීන් සඳහා)	මහල් හතරක් සම්පූර්ණ කර ඇත (66%).	1,330.37)	
15	ළමා රෝහලේ ලිට්ල් හාට් මධ්‍යස්ථානය ඉදි කිරීම	මහල් 12ක් සම්පූර්ණ කර ඇත (88%). නිම කිරීමේ කටයුතු සිදු කරමින් පවතියි.	2,265.97	
16	සොයිසා කාන්තා රෝහලේ ඉතා විශේෂිත මාතෘ ඒකකය සහ වාට්ටු සංකීර්ණය නිර්මාණය කිරීම හා ඉදි කිරීම	මහල් දෙකක් සම්පූර්ණ කර ඇත (100%).	264.60	ගොඩනැගිල්ල රෝහල වෙත බාර දෙන ලදී. රඳවාගත් මුදල් මුදා හැරීමට නියමිතය.
17	බදුල්ල ශික්ෂණ රෝහලේ දස මහල් ගොඩනැගිල්ල ඉදි කිරීම	මහල් දෙකක ව්‍යුහය සම්පූර්ණ කර ඇත (40%).	2,395.80	ක්‍රියාත්මක වෙමින් පවතී
18	අම්පාර දිස්ත්‍රික් මහ රෝහලේ කැත් ලැබ් (තෙමහල්) ඉදි කිරීම	අර්ධ වශයෙන් නිම කර ඇත (14%).	56.00	ක්‍රියාත්මක වෙමින් පවතී
19	රත්නපුර ශික්ෂණ රෝහලේ හෘද සත්කාර සංකීර්ණය ඉදි කිරීම	අත්තිවාරම දැමීම සිදු කරමින් පවතියි. (28%)	458.73	ක්‍රියාත්මක වෙමින් පවතී
20	සෞඛ්‍ය හා වෛද්‍ය සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (GOSL-JICA)	ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මහ රෝහලේ සහ අනුරාධපුර ශික්ෂණ	398.00	2022 ඇතිවූ ආර්ථික අර්බුදය හේතුවෙන්

අනු අංකය	ව්‍යාපෘතිය / ක්‍රියාකාරකම	භෞතික ප්‍රගතිය	වියදම (රු.මිලියන)	වෙනත්
		රෝහලේ අත්තිවාරම දැමීමේ කටයුතු නිම කර ඇත (12%).		තාවකාලිකව නවතා තිබූ මෙම ව්‍යාපෘති ඉදි කිරීමේ කටයුතු නැවත ආරම්භ කිරීමට ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කරමින් පවතියි.
21	ආසාදිත අපද්‍රව්‍ය කළමණාකරණය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (JICA)	යන්ත්‍ර වලින් කොටසක් (යන්ත්‍ර 15 ක්) අදාල ස්ථාන වෙත ලැබී ඇති අතර ඉදි කිරීම් කටයුතු සිදු කරමින් පවතියි (95%).	784.00	
22	මුල්ලේරියාව මූලික රෝහලේ ජාතික ස්ට්‍රෝක් ඒකකය ඉදි කිරීම	රෝග නිශ්චය මධ්‍යස්ථාන ව්‍යුහය සම්පූර්ණ කර ඇත. නිම කිරීමේ කටයුතු සිදු වෙමින් පවතියි. ස්ට්‍රෝක් මධ්‍යස්ථාන ව්‍යුහය ඉදි කිරීමේ කටයුතු සිදු කරමින් පවතියි (38%).	418.09	
23	ශ්‍රී ජයවර්ධනපුර හෙද පීඨය (මහල්-20) සහ නේවාසික ගොඩනැගිල්ල (මහල්-6)	හෙද පීඨයේ ඉදි කිරීම් නවතා ඇත. නේවාසික ගොඩනැගිල්ල ඉදිකිරීම් සිදු කෙරෙමින් පවතියි.	2,152.00	
24	ඇඹිලිපිටිය දිස්ත්‍රික් මහ රෝහලේ යෝජිත පස් මහල් ගොඩනැගිල්ලේ පළමු මහලේ ඉදි කිරීම් කටයුතු	ප්‍රසම්පාදන කටයුතු සිදු කෙරෙමින් පවතියි.	00.00	
25	අධ්‍යයන හා පරිපාලන ගොඩනැගිල්ල (මහල්-4) ඉදි කිරීම (කළුතර)	සම්පූර්ණ කර ඇත (100%).	187.00	අවසාන බිල්පත ගෙවීමට ඇත.
26	මඩකලපුව ශික්ෂණ රෝහලේ වකුගඩු රෝග ප්‍රතිකාර ඒකකය ඉදි කිරීම	කොන්ත්‍රාත්තුව එකඟතාවයෙන් අවසන් කර ඇත.	339.00	

අනු අංකය	ව්‍යාපෘතිය / ක්‍රියාකාරකම	භෞතික ප්‍රගතිය	වියදම (රු.මිලියන)	වෙනත්
	(අවිච්ඡේද වැඩ)	අවසාන බිල්පත ගෙවීමට ඇති අතර අවිච්ඡේද වැඩ ආරම්භ කිරීමට නියමිතය		
27	කරාපිටිය ශික්ෂණ රෝහලේ විශේෂිත ළමා ඒකකය (2 wings 7 සහ මහල් 14)	ව්‍යුහය ඉදි කිරීමේ කටයුතු සිදු කරමින් පවතියි (27%).	782.63	
28	බදුල්ල ශික්ෂණ රෝහලේ වකුගඩු ප්‍රතිකාර ඒකකය ඉදිකිරීම (යෝජිත මහාචාර්ය ඒකකය)	කොන්ත්‍රාත්තුව එකඟතාවයෙන් අවසන් කර ඇත. අවසාන බිල ගෙවීමට නියමිතය (18%).	236.00	
29	අනුරාධපුර හෙද විදුහලේ අධ්‍යයන හා පරිපාලන ගොඩනැගිල්ල ඉදි කිරීම	වහලය ඉදි කිරීම සහ නිම කිරීමේ කටයුතු සිදු කරමින් පවතියි. (72%)	465.29	
30	යාන්ත්‍රික, විද්‍යුත් සහ අපද්‍රව්‍ය පද්ධතිවල වැඩි දියුණු කිරීම්	යාන්ත්‍රික කටයුතු අර්ධ වශයෙන් නිම කර ඇත.	215.01	
31	අංගොඩ ජාතික බෝවන රෝග ආයතනයේ (IDH) මුළුතැන්ගෙය, කණිෂ්ඨ කාර්ය මණ්ඩලය සඳහා කෑම කාමරය හා ඇඳුම් මාරු කරන කාමර සඳහා ගොඩනැගිල්ලක් ඉදි කිරීම	ටෙන්ඩර් ලියකියවිලි සකස් කරමින් පවතියි.	00.00	
32	ජාතික බෝවන රෝග විද්‍යායතනයේ ගබඩා ගොඩනැගිලලේ අවිච්ඡේද වැඩ	සම්පූර්ණ කර ඇත. බිල්පත් ගෙවීමට නියමිතය.	00.00	
33	කළුතර ශික්ෂණ රෝහලේ ඇස් වාට්ටුව (අදියර 2)	ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කරමින් පවතියි (45%).	47.98	
34	කරාපිටිය ශික්ෂණ රෝහලේ යෝජිත ශ්වසන ඒකකය	ඉතිරි වැඩ සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු වෙමින් පවතියි (75%).	47.87	
35	කළුතර ශික්ෂණ රෝහලේ වෛද්‍ය වාට්ටු සංකීර්ණයේ	3වන මහලේ නිම කිරීමේ කටයුතු සිදු	695.00	

අනු අංකය	ව්‍යාපෘතිය / ක්‍රියාකාරකම	භෞතික ප්‍රගතිය	වියදම (රු.මිලියන)	වෙනත්
	ඉදිකිරීම් (මහල් 8 , අදියර-2)	වෙමින් පවතියි. (59%)		
36	අනුරාධපුර ශික්ෂණ රෝහලේ හෙද නිවාස වල ඉදිකිරීම් කටයුතු (අවිච්ඡේද වැඩ)	සිදු කරමින් පවතියි (65%).	34.97	ක්‍රියාත්මක වෙමින් පවතී
37	කරාපිටිය ශික්ෂණ රෝහලේ මුඛ සෞඛ්‍ය ඒකකයේ (මහල්-8) ඉදිකිරීම් කටයුතු	සිදු කරමින් පවතියි (54%).	644.43	ක්‍රියාත්මක වෙමින් පවතී
38	මහනුවර ජාතික රෝහලේ ඒකලන ඒකකය (ආසාදිත රෝග ඒකකය) වාට්ටු සංකීර්ණය ඉදි කිරීම (ඉතිරි වැඩ)	අර්ධ වශයෙන් නිම කර ඇත (55%). අදියර 11 වැඩ සඳහා ප්‍රසම්පාදන ලියකියවිලි සකස් කරමින් පවතී.	0	ක්‍රියාත්මක වෙමින් පවතී
39	නාවලපිටිය දිස්ත්‍රික් මහ රෝහලේ නව ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ	අදියර 11 වැඩ සඳහා ප්‍රසම්පාදන ලියකියවිලි සකස් කරමින් පවතී.	0	ආරම්භ කිරීමට නියමිතය.

➢ **ජාතික රෝහල, ගාල්ල**

- ළමා පියස ඉදි කිරීම සම්පූර්ණ කර රෝගී සත්කාර සේවා ආරම්භ කිරීම



- රෝගී සත්කාර සේවා සඳහා දෙවන කැතීටකරණ රසායනාගාරය ආරම්භ කිරීම



- ජාතික ECMO මධ්‍යස්ථානය සම්පූර්ණ කිරීම

- නිර්වින්දන දේශන ශාලාව සහ නිර්වින්දන පූර්ව ශල්‍ය සායනය සම්පූර්ණ කිරීම

- පොලිතීන් වලින් තොර සංකල්පය හඳුන්වා දීම.

- නරඹන්නන් සඳහා අවසර පත්‍ර ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.

- රෝහල් ආපදා කළමනාකරණ සැපසුම් යථාවත් කිරීම සහ ආපදා කළමනාකරණ පෙරහුරු පැවැත්වීම.

- විශේෂිත ආහාර වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

- ඖෂධ ලේබල් කිරීමේ (LASA ඖෂධ ඇතුළුව) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

- සායනික විගණන කමිටුව ස්ථාපිත කිරීම.

➢ **දකුණු කොළඹ ශික්ෂණ රෝහල, කළුබෝවිල**

- අන්තර්-ඒකක ඵලදායීතාවය, ගුණාත්මකභාවය සහ රෝගී සුරක්ෂිතතාවය පිළිබඳ තරඟය 2025 මැයි මස 27 දින රෝහලේදී පවත්වන ලදී.
- Entrostomal Therapy - හෙද නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. (නුවරඑළිය දිස්ත්‍රික් මහ රෝහලෙන් 08 දෙනෙකු සහ කළුබෝවිල, දකුණු කොළඹ ශික්ෂණ රෝහලෙන් 05 දෙනෙකු සඳහා)
- රෝගීන්ට ප්‍රවේශවීම වැඩි දියුණු කිරීම සඳහා වෘත්තීය චිකිත්සක ඒකකය නව ස්ථානයක නැවත පිහිටුවන ලදී.
- රෝගී සත්කාර සඳහා වැඩිවන ඉල්ලුම සපුරාලීමට පිරිමි රෝගීන් සඳහා වාට්ටු අංක 16, නව වෛද්‍ය වාට්ටුවක් විවෘත්ත කරන ලදී.
- රෝහලේ රුධිර බැංකුවේදී 🩸 ලේ පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

ස්වේච්ඡා පරිත්‍යාගශීලීන් පහත පරිදි ඇගයීමට තක් කරන ලදී.

🌿Silver (රිදී) - පරිත්‍යාගශීලීන් 50 අධික සංඛ්‍යාවකට
🌳Gold (රන්) - පරිත්‍යාගශීලීන් 100 අධික සංඛ්‍යාවකට

- දීපව්‍යාප්ත විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරීන්ගේ පුහුණු වැඩසටහන රෝහලේදී පවත්වන ලදී.
- Fashion Bug ආයතනයෙන් පරිත්‍යාග කරන ලද ත්‍රෙ භාෂා සංඥා පුවරුව රෝහලට ඇතුළු වන ස්ථානයේ සවි කරන ලදී. මෙම නව සංඥා පුවරුව සවි කිරීම නිසා රෝගීන්ට වර්ණ කේත හරහා විවිධ කලාප පහසුවෙන් හඳුනාගෙන සේවා අවශ්‍යතා සඳහා ගමන් කල හැක.
- “Knowing Mind” - සිත දැනගනිමු මැයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයසහ අන්තරායකර
- ඖෂධ පාලන ජාතික මණ්ඩලය එක්ව සංවිධානය කරන ලද ඖෂධ වැලැක්වීමේ පුහුණු වැඩසටහන 2025.09.14 දින රෝහලේදී පවත්වන ලදී.
- රෝගී සත්කාර සේවා ඉහළ නැංවීමට පෝෂණ සායනය පුළුල් කිරීම.
- රෝගී සත්කාර සේවා ඉහළ නැංවීමට Stoma therapy ඒකකය ආරම්භ කිරීම.
- සායන සහ වාට්ටු ඩිජිටල්කරණය මගින් රෝගී සත්කාර සේවා වැඩි දියුණු කිරීම.

2.2 විදේශාධාර ව්‍යාපෘති

➢ **ශ්‍රී ලංකා ජීව වෛද්‍ය ඉංජිනේරු සේවාවේ යටිතල පහසුකම් පුළුල් කිරීම (KOFIH)**
මෙම ව්‍යාපෘතිය යටතේ ජීව වෛද්‍ය ඉංජිනේරු ඒකකය ප්‍රතිසංස්කරණය කිරීමට හා පලාත් 09 තුළ ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා මධ්‍යස්ථාන ඉදි කිරීම, නඩත්තු සේවා සඳහා අවශ්‍ය සැපයීම් ලබාදීම, සේවා රථ සහ යන්ත්‍රෝපකරණ සැපයීම, ජාතික මට්ටමේ විද්‍යුත් ජීව වෛද්‍ය උපකරණ සහ නඩත්තු පද්ධතිය සකස් කිරීම, ජීව වෛද්‍ය ඉංජිනේරු වරුන් සඳහා වැඩබිමේ හා ආයතනික පුහුණුව ලබාදීම හා මෙහෙයුම් හා ඇගයුම් ආදී ක්‍රියාකාරකම් ඉටු කිරීමට යෝජනාකර ඇත. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය ඇමෙරිකානු ඩොලර් 1,675,153 වන අතර මෙම ප්‍රදානය කොරියානු ජනරජය මගින් ජාත්‍යන්තර සෞඛ්‍ය සත්කාර සඳහා වූ කොරියානු පදනම (KOFIH) හරහා ලබා දේ.

මෙහි ප්‍රගතිය සහත සඳහන් වේ.

අනු අංකය	සංරචකය	ක්‍රියාකාරකම්	භෞතික ප්‍රගතිය
1	පහසුකම් වැඩිදියුණු කිරීම (අළුත්වැඩියා කිරීම - අදියර 1 හා අදියර 11)	BMES හි ප්‍රධාන ගොඩනැගිල්ලේ දෙවන මහල ඉදිකිරීම - පරිපාලන කටයුතු පුළුල් කිරීම, පරීක්ෂණ හා ක්‍රමාංකන මධ්‍යස්ථානයක් සහ ශ්‍රවණාගාරයක් ස්ථාපිත කිරීම සඳහා.	අළුත්වැඩියා කිරීම - අදියර 1 - 80% අදියර 11 – 60%
2	මෙවලම් සහ උපකරණ ආශ්‍රිත සහාය (මෙවලම් -	වෛද්‍ය උපකරණ අලුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම සහ ක්‍රමාංකනය	අදියර 1 - කොරියාවෙන් සැපයූ උපකරණ බස්නාහිර,

අනු අංකය	සංරචකය	ක්‍රියාකාරකම්	භෞතික ප්‍රගතිය
	අදියර I, II සහ III)	කිරීම සඳහා අවශ්‍ය පරීක්ෂණ උපකරණ සහ මෙවලම් සැපයීම.	වයඹ සහ සබරගමුව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල (PDHS) වෙත බෙදා හැරීම. අදියර 11 - මිලදී ගැනීම් - 75%
3	ජංගම වැඩමුළුව	දෝෂ සහිත උපකරණ නඩත්තු කිරීම මෙන්ම වෛද්‍ය උපකරණ පරීක්ෂා කිරීම සහ ක්‍රමාංකනය කිරීම සඳහා වන පහසුකම් වැඩිදියුණු කිරීම	ඇණවුම ලබා දී ඇත, අභ්‍යන්තර වෙනස් කිරීම් අවසන් කර ඇත, වාහන ලියාපදිංචිය සඳහා වන කටයුතු සිදු වෙමින් පවතී.
4	පරිගණකගත වෛද්‍ය උපකරණ තොග සහ උපකරණ නඩත්තු කළමනාකරණ පද්ධතිය (MEIMS).	පද්ධතිය ස්ථාපිත කිරීම	
5	ධාරිතා ගොඩනැගීම (CBT)	පශ්චාත් උපාධි වැඩසටහන් සහ කෙටි කාලීන පාඨමාලා හරහා ජෛව වෛද්‍ය ඉංජිනේරුවන්ගේ සහ තාක්ෂණික කාර්ය මණ්ඩලයේ ධාරිතාව සංවර්ධනය කිරීම	

- **ශ්‍රී ලංකා ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (PHSEP) 2024-2028**

මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ සියලුම දිස්ත්‍රික්ක තුළ ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර සේවා ප්‍රවේශය සහ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමයි. ලෝක බැංකුවේ ණය ආධාරයක් වන ඇමෙරිකානු ඩොලර් මිලියන 150 ක් මගින් මෙම ව්‍යාපෘතිය වසර 05ක කාලයක් සඳහා ක්‍රියාත්මක කරනු ලැබේ. පහත සඳහන් අංශ වලින් ව්‍යාපෘතිය සමන්විත වේ.

(i) ප්‍රාථමික වෛද්‍ය සත්කාර ආයතනවල (PMCIs) සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලවල (MOH) පුළුල් ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර (PHC) සේවාවන් පවත්වා ගැනීම ඉහළ නැංවීම.

(ii) ප්‍රාථමික වෛද්‍ය සත්කාර ආයතන වල (PMCIs) ගුණාත්මක සායනික සහ පුද්ගල කේන්ද්‍රීය සත්කාර සේවා ශක්තිමත් කිරීම.

(iii) සෞඛ්‍ය ප්‍රවර්ධනය, ප්‍රජාව සවිබල ගැන්වීම සහ පුරවැසි සහභාගීත්වය ශක්තිමත් කිරීම.

(iv) ව්‍යාපෘති කළමනාකරණය, මෙහෙයුම සහ ඇගයීම

(v) හදිසි අවස්ථා ප්‍රතිචාරය.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, ව්‍යාපෘති කළමනාකරණය හා මෙහෙයුම් ඒකකය ස්ථාපිත කිරීම සහ ව්‍යාපෘති කාර්යමණ්ඩලය බඳවා ගැනීම සඳහා අවශ්‍ය අනුමැතීන් ලබාගන්නා ලදී. අරමුදල් එකඟතා ගිවිසුම 2024.09.10 දින අත්සන් කරන ලදී. ප්‍රථම ජාතික කමිටු රැස්වීම 2025.12.16 දින පවත්වන ලදී.

2025.03.26 දින සමාරම්භක උත්සවය පවත්වා මෙම ව්‍යාපෘතිය නිල වශයෙන් ආරම්භ කරන ලදී. දෙවන ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම ද 2025.03.26 දින පවත්වන ලදී. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ඇතිවූ ප්‍රධානම ගැටළුව වූයේ පළාත් මට්ටමේ ආයතනවල සිවිල් වැඩ (අළුත්වැඩියා කටයුතු) ඉටු කිරීමේ ක්‍රමවේදය යි. පළාත් සිවිල් වැඩ මුල් ව්‍යාපෘතියේ ක්‍රියාත්මක සැලසුම අනුව ක්‍රියාත්මක කිරීමට උපදෙස් ලබා දෙමින් එම ගැටළුව විසඳීමට ගරු ජනාධිපතිතුමා විසින් කටයුතු කරන ලදී. 2025 වසර සඳහා වෙන්වූ ප්‍රතිපාදන වල ප්‍රගතිය පහත දැක්වේ.

වැය විෂය	විස්තරය	සංශෝධිත ප්‍රතිපාදන (රු.මිලියන)	මූල්‍යමය ප්‍රගතිය (රු.මිලියන)
111-02-12-02	මධ්‍යම රජය	2,572.86	430.06
111-02-12-03	බස්නාහිර පළාත් සභාව	816.00	0.00
111-02-12-04	මධ්‍යම පළාත් සභාව	720.00	0.00
111-02-12-05	දකුණු පළාත් සභාව	660.00	0.00
111-02-12-06	උතුරු පළාත් සභාව	340.00	0.00
111-02-12-07	වයඹ පළාත් සභාව	540.00	0.00
111-02-12-08	උතුරු මැද පළාත් සභාව	540.00	0.00
111-02-12-09	ඌව පළාත් සභාව	529.76	0.00
111-02-12-10	සබරගමුව පළාත් සභාව	600.00	0.00
111-02-12-11	නැගෙනහිර පළාත්සභාව	720.00	0.00

ඒ අනුව, 2025 වර්ෂය තුළදී රුපියල් මිලියන 1,398.90ක් වටිනා ප්‍රසම්පාදනයන් මධ්‍යම රජයේ ප්‍රසම්පාදන (schedule) එක යටතේ ප්‍රදානය කර තිබූ අතර පළාත් වැඩ ප්‍රසම්පාදන පැකේජ 12ක් පුවත්පත් දැන්වීම් පළ කර තිබුණි.

- **GFATM ව්‍යාපෘතිය 2025-2027**

එච්.අයි.වී./ඒඩ්ස් (HIV/AIDS), ක්ෂය රෝගය (TB) හා මැලේරියාව යන රෝග ත්‍රිත්වය කළමනාකරණය කිරීම, වැලැක්වීම සහ පාලනය කිරීමට 2002 සිට සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ඒඩ්ස්, ක්ෂය රෝගය හා මැලේරියාවට එරෙහිව ක්‍රියා කිරීම සඳහා වූ ගෝලීය අරමුදල (GFATM) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. කෙසේ වෙතත් , 2021 සිට GFATM ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරන ලද්දේ ක්ෂය රෝගය හා එච්.අයි.වී.යන සංරචක දෙක පමණි. පහත සඳහන් ව්‍යාපෘති සංරචක දෙක ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදී.

(i) අනුමත ප්‍රතිපාදනය වන ඇමෙරිකානු ඩොලර් 2,969,568 (ශ්‍රී ලංකා රුපියල් මිලියන 923.53) උපයෝගී කරගෙන ක්ෂය රෝග මර්දන සහ ලය රෝග පිළිබඳ ජාතික වැඩසටහන මගින් GFATM ව්‍යාපෘතියේ LKA-T-MOH-TB සංරචකය 2025-2027 ක්‍රියාත්මක කිරීමට සහ යෝජිත ව්‍යාපෘති කාර්ය මණ්ඩලය පත් කර ගැනීම.

(ii) අනුමත ප්‍රතිපාදන වන ඇමෙරිකානු ඩොලර් 6,381,149 (ශ්‍රී ලංකා රුපියල් මිලියන 1,990.22) උපයෝගී කරගෙන ජාතික එස්ටීඩී/ඒඩ්ස් පාලන වැඩසටහන (STD/AIDS) මගින් GFATM ව්‍යාපෘතියේ LKA-H-MOH-HIV සංරචකය 2025-2027 ක්‍රියාත්මක කිරීමට සහ යෝජිත ව්‍යාපෘති කාර්යමණ්ඩලය පත්කර ගැනීමට

- **Integrated One Health Pandemic Preparedness and Response Strengthening Project (ඒකාබද්ධ එක් සෞඛ්‍ය වසංගත සූදානම සහ ප්‍රතිචාර ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය)**

මෙම ව්‍යාපෘතිය ප්‍රධාන වශයෙන් සෞඛ්‍ය, ආවේක්ෂණ (surveillance) සහ රසායනාගාර ධාරිතාවය, හදිසි අවස්ථා සඳහා අවශ්‍ය මානව සම්පත්, අවදානම් සන්නිවේදනය හා ප්‍රජා ඔරොත්තුදීමේ හැකියාව යන ක්ෂේත්‍ර ආවරණය කිරීමට යෝජනා කර ඇත. මෙම ව්‍යාපෘතියට සහාය ලබාදීමට සංවර්ධන හවුල්කරුවන් පස් දෙනෙකු (FAO, ADB, WHO, WB සහ UNICEF) එකඟ වී ඇත. මුළු ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය රුපියල් මිලියන 5,430.27කි. මෙහි රුපියල් මිලියන 4,784.25 (ඇමෙරිකානු ඩොලර් මිලියන 16.79) ප්‍රදානයක් ලෙස ලැබෙන අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රුපියල් මිලියන 646.02 කි. ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ 2025.04.11 දිනැති ලිපිය මගින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කර ඇත.

- **Strengthening Integrated Health Care for Universal Health Coverage programme, Sri Lanka {ADB financed, Results Based Lending (RBL) Programme}**

(ශ්‍රී ලංකාවේ විශ්ව සෞඛ්‍ය ආවරණ වැඩසටහන සඳහා ඒකාබද්ධ සෞඛ්‍ය සේවාව ශක්තිමත් කිරීම {ADB මූල්‍යකරණය කරන ලද ප්‍රතිඵල පාදක ණය දීමේ (RBL) වැඩසටහන}

රටපුරා පිහිටි ද්විතීයික සත්කාර රෝහල්වල ගුණාත්මකභාවය සහ ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව ඇමෙරිකානු ඩොලර් මිලියන 100 ක අයවැය සහනයක් ලබා දීමට එකඟ වී ඇත.

එම ව්‍යාපෘති යෝජනාවේ ප්‍රධාන අරමුණු දෙකක් ඇත.

(i) විශ්ව සෞඛ්‍ය ආවරණය (UHC) ශක්තිමත් කිරීම සඳහා ප්‍රාථමික සහ පළමු යොමු කිරීමේ සෞඛ්‍ය සේවා අතර ඒකාබද්ධතාවය වැඩි දියුණු කිරීම සහ දේශගුණික ඔරොත්තුදීමේ හැකියාව හා පාරිසරික තිරසාර භාවය, ස්ත්‍රී පුරුෂ සමාජයට ප්‍රතිචාර දැකිවීම, වැඩිහිටි හිතකාමී සේවා සහ අනෙකුත් අවදානමට ලක්විය හැකි ජනගහන කණ්ඩායම් සඳහා ඉලක්කගත සහාය ඇතුළුව ද්විතීයික සෞඛ්‍ය සේවා රෝහල්වල සේවා ධාරිතාවය සහ ගුණාත්මකභාවය ප්‍රමිතිකරණය කිරීම.

(ii) ඖෂධ සැපයුම් දාමය, සෞඛ්‍ය ප්‍රසම්පාදනය සහ මූල්‍යකරණ පද්ධතියේ විනිවිද භාවය සහ කාර්යක්ෂමතාවය ශක්තිමත් කිරීම.

මුළු ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය රුපියල් මිලියන 31,000 කි. මුළු ඇස්තමේන්තුගත පිරිවැයෙන් රුපියල් මිලියන 30,000ක් ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) අරමුදල් හරහා මූල්‍යකරණය කිරීමට නියමිත අතර රුපියල් මිලියන 1,000 ක් ශ්‍රී ලංකා රජයේ අරමුදල් යටතේ වෙන් කරනු ඇත.

- **ඉන්දියානු ප්‍රදානය යටතේ මන්නාරම දිස්ත්‍රික් මහ රෝහලේ අනතුරු හා හදිසි අනතුරු ඒකකය ඉදිකිරීම සහ වෛද්‍ය උපකරණ සැපයීම**

ඉහත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදල් සපයා ගැනීමට ඉන්දියානු ජනරජය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අතර අවබෝධතා ගිවිසුම (MoU) 2025 සැප්තැම්බර් 09 දින අත්සන් කරන ලදී. ශ්‍රී ලංකා රුපියල් මිලියන හයසියයක මුළු මුදල ඉන්දියානු රජයෙන් ලැබීමට නියමිතය.

2.3 සෞඛ්‍ය ප්‍රවර්ධනය

සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යංශය (HPB), ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ සෞඛ්‍ය අධ්‍යාපනය සහ සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා වන ජාතික විශිෂ්ටතා මධ්‍යස්ථානය ලෙස සේවය කරයි. මෙම කාර්යංශය විශේෂිත තාක්ෂණික ඒකක හතක් හරහා ක්‍රියාත්මක වන අතර පරිපාලන අංශය මගින් සහාය ලබාදේ. සෞඛ්‍ය ප්‍රවර්ධන සැකසුම් ප්‍රවේශයක් (Health Promotion setting approach) භාවිතා කරමින් එහි අභිප්‍රායයන් සාක්ෂාත් කර ගැනීම සඳහා රටපුරා සෞඛ්‍ය සහ සෞඛ්‍ය නොවන පාර්ශවකරුවන් සමග සමීපව සහයෝගයෙන් කටයුතු කරනු ලැබේ. ඊට අමතරව, සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යංශය මහජනතාවගේ සෞඛ්‍ය සන්නිවේදන අවශ්‍යතා සඳහා 24 පැය පුරා ක්‍රියාත්මක වන 1999 ‘‘සුවසැරිය’’ ක්ෂණික ඇමතුම් අංකය, නිල වෙබ් අඩවිය, මුහුණු පොත පිටුව සහ යූ ටියුබ් නාලිකාව මෙන්ම සාමාන්‍යයෙන් සතිපතා මාධ්‍ය සම්මන්ත්‍රණ පැවැත්වීම ඇතුළුව බහු වේදිකා (multiple platform) හරහා කටයුතු කරයි.

- **ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන ඒකකය**

  - මහජනතාව සහ අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් සඳහා සාක්ෂිමත පදනම් වූ සෞඛ්‍ය ප්‍රවර්ධන පණිවිඩ සකස් කිරීම

  - මුහුණු පොත, වට්ස් ඇප් සහ ඩිජිටල් පෝස්ටර් ඇතුළු සමාජ මාධ්‍ය වේදිකා හරහා නිතිපතා සෞඛ්‍ය ප්‍රවර්ධන කටයුතු පවත්වාගෙන යාම

- සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවන්, මානසික යහ පැවැත්ම සහ ගංවතුර සඳහා ප්‍රතිචාර දැක්වීම වැනි ආපදා ආශ්‍රිත සෞඛ්‍ය ගැටළු පිළිබඳ සෞඛ්‍ය අධ්‍යාපන පණිවිඩ ලබා දීම

- සමස්ථ ප්‍රජා යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම සඳහා "Happy Village Initiative" ක්‍රියාත්මක කිරීමට නායකත්වය හා සහය ලබාදී ඇත

➢ **සෞඛ්‍ය සන්නිවේදනය සහ ජීවන කුසලතා, මාධ්‍ය හා ප්‍රචාරණ ඒකකය**

- ශ්‍රී ලංකාවේ පුළුල් ලිංගික අධ්‍යාපනය පිළිබඳ සන්නිවේදනය සඳහා වූ ජාතික මාර්ගෝපදේශය (CSE) සහ ඔසප් සෞඛ්‍ය සහ සනීපාරක්ෂාව පිළිබඳ ජාතික මාර්ගෝපදේශය (MHH) සකස් කරන ලදී.

- සෞඛ්‍ය සන්නිවේදන අන්තර්ගත සංවර්ධනය සහ ප්‍රමිතිකරණය.

- ජීවන කුසලතා සහ පුළුල් ලිංගික අධ්‍යාපනය (CSE) පිළිබඳ වැඩසටහන් සකස් කිරීම.

- - පුහුණුකරුවන් පුහුණු කිරීමේ (TOT) සහ ධාරිතා වර්ධන වැඩසටහන් පැවැත්වීම
- (වැඩසටහන් 69)
- 2025 වසරේ පළමු මාධ්‍ය සම්මාන උළෙල ඇතුළුව මාධ්‍ය, ප්‍රචාරණ සහ අවදානම් සන්නිවේදන ක්‍රියාකාරකම් සිදු කරන ලදී.
- - ඩිජිටල් සෞඛ්‍ය ප්‍රවර්ධනය සහ සමාජ මාධ්‍ය සම්බන්ධතා ක්‍රියාකාරකම් සිදු කරන ලදී.
- - සාක්ෂි උත්පාදනය, පර්යේෂණ සහ තත්ත්ව විශ්ලේෂණ ක්‍රියාකාරකම් සිදු කරන ලදී.
- ජාතික භාෂා ත්‍රිත්වයෙන්ම මහජනතාවට නිවැරදි, කාලෝචිත සහ සාක්ෂිමත පදනම් වූ සෞඛ්‍ය තොරතුරු ලබා දීමේදී "සුවසැරිය" ඇමතුම් මධ්‍යස්ථානයට සහාය ලබා දීම

➢ **පුහුණුව, ප්‍රදර්ශනය, තොරතුරු අධ්‍යාපන සන්නිවේදනය (IEC) සහ රෝහල් සෞඛ්‍ය ප්‍රවර්ධන ඒකකය**

- විවිධ සන්නිවේදන පුහුණු වැඩසටහන් සහ වැඩමුළු පවත්වන ලදී.

- "දිට්වා" (Ditwah) ආපදාවට පසුව සෞඛ්‍ය පණිවිඩ සකස් කර ඩිජිටල් සංඥා පද්ධතිය සහ විවිධ නාලිකා ඔස්සේ ප්‍රචාරය කරන ලදී.

➢ **ප්‍රතිපත්ති, උපදේශනය, අවදානම් සන්නිවේදනය සහ සේවා ස්ථාන සෞඛ්‍ය ප්‍රවර්ධන ඒකකය**

- සහායක වීඩියෝ ද්‍රව්‍ය ඇතුළුව පුළුල් අවදානම් සන්නිවේදන පුහුණු පැකේජයක් සකස් කිරීම, මුද්‍රණය සහ බෙදා හැරීම

- බලපෑමට ලක්වූ පුද්ගලයින්ට වගවීම (AAP) පුහුණු පැකේජයක් සකස් කිරීම, පළාත් ප්‍රධාන පුහුණුකරුවන් සඳහා AAP නැවත පණගැන්වීමේ පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ දිස්ත්‍රික්ක මට්ටමින් AAP පුහුණු වැඩසටහන් පැවැත්වීම.

- අවදානම් සන්නිවේදනය පිළිබඳ තාක්ෂණික උපදේශක කමිටු (TAC) රැස්වීම් පැවැත්වීම.

➢ **පවුල් සෞඛ්‍ය, පෝෂණ සන්නිවේදනය සහ හැසිරීම් පර්යේෂණ ඒකකය**

- මව්වරුන්ගේ සහාය කණ්ඩායම් (Mothers support Group – MSGs) පිහිටුවීම සහ ශක්තිමත් කිරීම පිළිබඳ විවිධ ක්‍රියාකාරකම් සිදු කරන ලදී.
- ඉහළ කාර්යසාධනයක් සහිත දිස්ත්‍රික් මට්ටමේ මව්වරුන්ගේ සහාය කණ්ඩායම් සහ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය ඇගයීම සඳහා වාර්ෂික ජාතික සම්මාන උළෙල සංවිධානය කරන ලදී.

➢ **මුඛ සෞඛ්‍ය ප්‍රවර්ධන ඒකකය**

- මුඛ සෞඛ්‍යයට අදාළ විශේෂ සෞඛ්‍ය දින සැමරීම සඳහා මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- ප්‍රමිතිගත මුඛ සෞඛ්‍ය පණිවිඩ මහජනතාවට ලබා දීමේදී සෞඛ්‍ය සේවකයින්ට සහාය වීම සඳහා මුඛ සෞඛ්‍ය පණිවිඩ පොතක් සකස් කර මුද්‍රණය කරන ලදී.
- පාසල් දන්ත සේවාව සඳහා ජාතික ඉලක්ක සකස් කිරීමට දායක විය.

➢ **උපායමාර්ගික තොරතුරු, මෙහෙයුම, ඇගයීම සහ පෙර පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන ඒකකය**

- ශ්‍රී ලංකාවේ ජාතික පෙර පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන සැකසුම් සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශ සහ පොදු චක්‍රලේඛය සකස් කිරීම, මුද්‍රණය සහ බෙදා හැරීම.
- කුරුණෑගල, ඌව පළාත සහ මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය තුළ පෙර පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන පුහුණු වැඩසටහනක් පැවැත්වීම.

➢ **පරිපාලන අංශය**

- අභ්‍යන්තර කටයුතු කමිටුව සහ සෞඛ්‍ය සේවා ආයතන ආරක්ෂාව ශක්තිමත් කිරීමේ කමිටුව ස්ථාපිත කරන ලදී.
- යටිතල පහසුකම් වැඩි දියුණු කරන ලදී.

2.4 සෞඛ්‍ය පද්ධතිය ශක්තිමත් කිරීම

➢ **WHO මූල්‍යාධාර සහිතව 2026 - 2035 ජාතික සෞඛ්‍ය ක්‍රමෝපායික ප්‍රධාන සැලැස්ම සකස් කර අවසන් කරන ලදී.**

ඉදිරි වසර දහය සඳහා ක්‍රමෝපායික ප්‍රධාන සැලැස්ම සකස් කිරීම සඳහා යෝජිත ක්‍රමෝපායයන් සාකච්ඡා කිරීමට 1000කට වැඩි සෞඛ්‍ය, සෞඛ්‍ය නොවන වෘත්තීයවේදීන්

සහ ප්‍රජා සහභාගිවන්නන් ඇතුළුව අදාල පාර්ශවකරුවන් සමග යොමු කණ්ඩායම් සාකච්ඡා (Focus Group Discussion) පවත්වන ලදී. ඊට අමතරව WHO ද්වී වාර්ෂික අරමුදල් වල මූල්‍ය සහාය ඇතිව එම සැලැස්ම සකස් කර අවසන් කිරීම සඳහා ප්‍රධාන පාර්ශවකරුවන් සමඟ රැස්වීම් දහයක් පවත්වන ලදී. 2026 - 2035 ජාතික සෞඛ්‍ය උපායමාර්ගික ප්‍රධාන සැලැස්ම සකස් කිරීම සෞඛ්‍ය අමාත්‍යාංශයේ සැලසුම් අංශය විසින් ක්‍රියාත්මක කරන ලදී.

- **සෞඛ්‍ය සහ යහ පැවැත්ම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (2026 - 2035)**
  නව රජයේ ප්‍රතිපත්තිය මත පදනම්ව ප්‍රතිපත්ති විශ්ලේෂණ හා සංවර්ධන අංශයේ නායකත්වයෙන් සහ තාක්ෂණික විශේෂඥයින්, සිවිල් සමාජ සංවිධාන සහ ළමා හා තරුණයින්ගේ හඬ ඇතුළු 1,500කට අධික සංඛ්‍යාවකගේ සහභාගිත්වයෙන් සෞඛ්‍ය හා යහ පැවැත්ම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (2026 - 2035) සකස් කර කෙටුම්පත් කරන ලදී. ප්‍රතිපත්ති සංවර්ධන ක්‍රියාවලියට පුළුල් තත්ත්ව විශ්ලේෂණය, සමාලෝචනය, කඩිනම් තක්සේරුව සහ ප්‍රතිපත්ති සංවාද 58 ක් ඇතුළත් විය. මෙම ලේඛනය අවසන් කිරීම සඳහා මහජන අදහස් ලබා ගැනීමට නියමිතය.

- **ආංශික ප්‍රතිපත්ති සංවර්ධනය**
  ජාතික මුඛ සෞඛ්‍ය ප්‍රතිපත්තිය, ජාතික ජෛව ආරක්ෂණ ප්‍රතිපත්තිය සහ ප්‍රති-ක්ෂුද්‍රජීවී ප්‍රතිරෝධය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම සඳහා. ප්‍රතිපත්ති විශ්ලේෂණ සහ සංවර්ධන අංශය සහාය විය.

- **ලෝක සෞඛ්‍ය සමීක්ෂණය එකතුව දියත් කිරීම (World Health Survey Plus – WHS+)**
  සෞඛ්‍ය අසමානතාවයන්, සේවා භාවිතය සහ පද්ධති ප්‍රතිචාර දැක්වීම පිළිබඳව විසිරී ඇති දත්ත රැස් කිරීම සඳහා ලෝක සෞඛ්‍ය සමීක්ෂණ ප්ලස් 2025 අගෝස්තු මාසයේදී දියත් කරන ලදී.

- **ආයතනික ප්‍රතිඵල රාමුව (ORF)**
  සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආයතනික ප්‍රතිඵල රාමුව (ORF), ප්‍රධාන සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ කාර්යය සාධනය නිරීක්ෂණය කිරීම සඳහා සකස් කරන ලද අතර අමාත්‍යාංශය පුරා වගවීම ප්‍රතිඵල පාදක කළමණාකරණය ශක්තිමත් කිරීමට කාර්යය සාධන දර්ශක සක්‍රීයව නිරීක්ෂණ සහතික කිරීම මෙ මගින් සිදුවේ.

- **මානව සම්පත් පැතිකඩ දත්ත පද්ධතිය විධිමත් කරන ලදී**


- **අභ්‍යන්තර කටයුතු ඒකකය ස්ථාපිත කරන ලදී.**

- **අදාල පාර්ශවකරුවන් සමග රැස්වීම් පවත්වා මූලික රෝහල්, දිස්ත්‍රික් මහ රෝහල් සහ ශික්ෂණ රෝහල් සඳහා වෛද්‍ය උපකරණ අවශ්‍යතාවය හඳුනා ගන්නා ලදී. ජීව වෛද්‍ය ඉංජිනේරු අංශය හා වෘත්තීය විද්‍යාලවල නියෝජිතයින් සමග සාකච්ඡා කර මෙම ලැයිස්තුව යාවත්කාලීන කරන ලදී. මෙම ලැයිස්තුව සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළ කරන ලදී.**

2.5 සෞඛ්‍ය සත්කාර ගුණාත්මකභාවය හා සුරක්ෂිතතාවය

සෞඛ්‍ය සත්කාර ගුණාත්මකභාවය සහ සුරක්ෂිතතාවය පිළිබඳ අධ්‍යක්ෂ අංශයේ (DHQS) නාමය රෝගී සුරක්ෂිතතාව සහ ප්‍රතිකාර කාර්යාංශය (PSAB) ලෙස නැවත නම් කරන ලදී. ඒ බව 2025.05.27 දිනැති පොදු චක්‍රලේඛ අංක 01-24/2025 මගින් ප්‍රකාශයට පත් කරන ලදී. රෝගී සුරක්ෂිතතාව සහ ප්‍රතිකාර කාර්යාංශයේ උපදේශක මණ්ඩලය ලෙස ශ්‍රී ලංකාව සඳහා වූ රෝගී සුරක්ෂිතතාව සහ ප්‍රතිකාර කවුන්සිලය ද ස්ථාපිත කරන ලදී.

- ලෝක රෝගී සුරක්ෂිතතා දිනය සැමරීම සඳහා "අලුත උපන් සෑම බිළිඳෙකුටම සහ සෑම දරුවෙකුටම සුරක්ෂිත රැකවරණය" යන තේමාව යටතේ ජාතික උත්සවය 2025.09.17 වන දින ගාලු මුවදොර හෝටලයේදී පැවැත්වුණි.
- ගුණාත්මකභාවය සහ සුරක්ෂිතතාවය පිළිබඳ රෝහල් කාර්ය සාධනය ඇගයීම සඳහා රේඛීය අමාත්‍යාංශයේ සෞඛ්‍ය ආයතන (53) සහ දිස්ත්‍රික්ක 26 පළාත් සෞඛ්‍ය ආයතන (බී වර්ගයේ මූලික රෝහල් වලට ඉහළ) සමග මාර්ගගත කාර්ය සාධන සමාලෝචන රැස්වීම පවත්වන ලදී.
- වැඩි දියුණු කළ ඵලදායීතාවයක් සහිත දක්ෂ නිපුණ සහ තෘප්තිමත් ශ්‍රම බලකායක් සංවර්ධනයට විවිධ පුහුණු වැඩසටහන් පවත්වන ලදී.
- ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සත්කාර ආයතන සඳහා ප්‍රතිකාර පද්ධතිය ස්ථාපිත කිරීම.
- ප්‍රතිපත්ති, සැලසුම් හා මාර්ගෝපදේශ සකස් කිරීම සංශෝධනය සහ අවසන් කිරීම.
- තීරණාත්මක (critical) කාර්ය මණ්ඩල කාණ්ඩවල (වෛද්‍ය නිලධාරීන්, හෙද නිලධාරීන් හා පරිපූරක කාර්ය මණ්ඩලය - වෛද්‍ය රසායනාගාර තාක්ෂණඥයින් (MLTs), විකිරණවේදීන් (PHLTs) සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් (PHIs) සේවා ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමේ අරමුණින් සෞඛ්‍ය සේවා ගුණාත්මකභාවය සහ සුරක්ෂිතතාවය පිළිබඳ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) අත් පොතක් සකස් කරන ලදී.
- 2022, 2023 සහ 2024 වර්ෂවල සිදු කරන ලද කාර්ය සාධනය සහ මූල පිරීම් ඇතුළත් වාර්ෂික සෞඛ්‍ය සත්කාර ගුණාත්මකභාවය සහ සුරක්ෂිතාවය පිළිබඳ වාර්තාව ප්‍රකාශයට පත් කරන ලදී. මෙම ප්‍රකාශනයේ අරමුණ වනුයේ ගුණාත්මක ප්‍රමිතීන් සහ සුරක්ෂිත පියවරයන් ශක්තිමත් කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද නව්‍ය විසඳුම් ඉස්මතු කිරීමයි.





- 2025 වර්ෂය තුළදී ජාතික ප්‍රතීතන කවුන්සිලය, ජාතික මාර්ගෝපදේශ කමිටුව සහ ඖෂධ සුරක්ෂිතතාවය, ආසාදන වැලැක්වීම සහ පාලනය හා සායනික පාලනය පිළිබඳ උපකමිටු රැස්වීම් පවත්වන ලදී.

- උපදේශක ක්‍රියාවලිය හරහා **ඖෂධ සුරක්ෂිතතා ප්‍රායෝගික පැකේජයක්** සකස් කරන ලදී.

- 2022 දී සිදු කරන ලද පරතර විශ්ලේෂණය (Gap analysis) මගින් හඳුනාගත් පරතරයන් සම්බන්ධයෙන් අවධානය යොමු කරමින් තත්ත්ව කළමනාකරණ ඒකක හරහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ රෝහල්, පළාත් සහ දිස්ත්‍රික්ක මට්ටමේ සෞඛ්‍ය සත්කාර ආයතනවල තත්ත්ව කළමනාකරණ වැඩසටහන් ශක්තිමත් කිරීම සඳහා ගෝලීය අරමුදල් සපයන සෞඛ්‍ය වැඩි දියුණු කිරීමේ සහ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමේ (HiQi) ව්‍යාපෘතියේ BL 33 යටතේ රෝහල් සඳහා අරමුදල් බෙදා හැරීම ආරම්භ කරන ලදී.

- රෝහල් වල රෝගීන්ගේ සුරක්ෂිතතා පිළිවෙත් සහ ගුණාත්මක මුල පිරීම් අධීක්ෂණය කිරීම සඳහා ජාතික බෝවන රෝග ආයතනය සහ නැගෙනහිර කොළඹ මූලික රෝහල වෙත රෝහල් චාරිකා සිදු කරන ලදී.

2.6 මානව සම්පත් සංවර්ධනය

- **අධ්‍යාපන, පුහුණු සහ පර්යේෂණ (ET&R) ඒකකය**
  - සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යාපන, පුහුණු සහ පර්යේෂණ (ET&R) ඒකකය, වෛද්‍ය නිලධාරීන් සහ දන්ත වෛද්‍ය නිලධාරීන් හැර අනෙකුත් සියළුම කාර්ය මණ්ඩල කාණ්ඩ සඳහා මූලික පුහුණු වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම, පුහුණුව පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය සහ තාක්ෂණික මග පෙන්වීම සඳහා වගකිව යුතුය. ඊට අමතරව, පශ්චාත් මූලික සහ සේවාස්ථ පුහුණු වැඩසටහන් හරහා සෞඛ්‍ය ශ්‍රම බලකායේ ධාරිතාවය වැඩි දියුණු කිරීම සඳහා මෙම ඒකකය වග කියනු ලැබේ. තවද, කළුතර ජාතික සෞඛ්‍ය විද්‍යායතනය, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ) ගේ පරිපාලන හා තාක්ෂණික අධීක්ෂණය යටතේ පවතී.
  - සෞඛ්‍ය අංශයේ මානව සම්පත් ධාරිතාවය වැඩි දියුණු කිරීම සඳහා ET&R ඒකකය ලංකා වෛද්‍ය විද්‍යාල කවුන්සිලය, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකාවේ අනෙකුත් අදාළ අධ්‍යයන හා වෘත්තීය ආයතන සමග සහයෝගයෙන් කටයුතු කරයි.

  - මෙම ඒකකය මගින් රජයේ වෛද්‍ය නිලධාරීන් සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) වැඩසටහන්, විශේෂයෙන් මාර්ගගත ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය (LMS) වේදිකාව හරහා වැඩි දියුණු කර ඇත. පශ්චාත් උපාධි වෛද්‍ය ආයතනය (PGIM) සහ රාජ්‍ය වෛද්‍ය පීඨය සමග සහයෝගයෙන් වෛද්‍ය නිලධාරීන් සඳහා වෘත්තීය සංවර්ධන අවස්ථා වැඩි දියුණු කරන මුල පිරීම (initiative) සඳහා කේන්ද්‍රීය මධ්‍යස්ථානයක් ලෙස මෙම ඒකකය සේවය නරයි.

- **අධ්‍යක්ෂ හෙද (වෛද්‍ය සේවා) ඒකකය**

  - හෙද කාර්ය මණ්ඩලයේ සායනික දැනුම සහ කුසලතා යාවත්කාලීන කිරීම සහ වැඩි දියුණු කිරීම සඳහා සේවාස්ථ පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

  - ආපදා කළමනාකරණය, බෝ නොවන රෝග, සන්නිවේදන කුසලතා සහ ආතති කළමනාකරණය පිළිබඳව හෙද පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

අනු අංකය	වැඩසටහනේ නම	පවත්වන ලද වැඩසටහන් ගණන
01	බෝ නොවන රෝග	09
02	ආපදා පුහුණු වැඩසටහන්	05
03	හදිසි සහ කම්පන සත්කාර	09
04	විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරීන් සඳහා බෝ නොවන රෝග පිළිබඳ දින හතක පුහුණු වැඩසටහන	01
05	පවුල් සෞඛ්‍ය සේවිකා පුහුණු වැඩසටහන (soft skills)	05
06	හෙද සොයුරු/සොයුරි සහ වාට්ටු භාර හෙද නිලධාරී	03
07	ආසාදන පාලනය	01
08	විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරීන් සඳහා හෙද කළමනාකරණ වැඩසටහන	01

2.7 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම


අයවැය යෝජනා අංකය	ව්‍යාපෘති යෝජනාවේ නම	මුළු ඇස්තමේන්තුගත වියදම (රු.මිලියන)	ප්‍රතිපාදන (රු.මිලියන)	භෞතික ප්‍රගතිය
	කොළඹ රිජ්වේ ආර්යා ළමා රෝහලේ අංග සම්පූර්ණ ඔටිසම් සහ ස්නායු සංවර්ධන ඒකකය පුළුල් කිරීම සහ සංවර්ධනය කිරීම	200.00	87.50	අමාත්‍ය මණ්ඩල අනුමැතිය වසර අවසානයේ දී ලැබුණි. මූල්‍ය ප්‍රගතියක් නොමැත.
	ශ්‍රී ලංකාව සඳහා වූ අන්තර්කරණ මුල් ළමාවිය සංවර්ධන වැඩසටහන (FHB)	882.50	112.50	අමාත්‍ය මණ්ඩල අනුමැතිය වසර අවසානයේ දී ලැබුණි. මූල්‍ය ප්‍රගතියක් නොමැත.
40	මානසික සෞඛ්‍ය පිළිබඳ දැනුවත් කිරීමේ හා උපදේශන වැඩසටහන	250.00	89.26	35%
	රාගම රක්තවේද හා පුනරුත්ථාපන රෝහලේ	530.00	300.00	5% ඔක්තෝම්බර්

	ආබාධිත පුද්ගලයින් සඳහා ආධාරක උපකරණ සපයන සේවාවන් වැඩි දියුණු කිරීම			මස අවසානයේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණි. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. මූල්‍ය ප්‍රගතියක් නොමැත.
	ආබාධිත පුද්ගලයන් සඳහා සහායක උපකරණ දේශීයව නිපදවීමේ පහසුකම් - ශ්‍රී ලංකා ජාතික රෝහලේ හදිසි අනතුරු හා විකලාංග සේවාව	100.00	100.00	
	එකතුව	**1.962.50**	**689.26**	

2.8 වෛද්‍ය පර්යේෂණ

වෛද්‍ය පර්යේෂණ ආයතනය (MRI) යනු ප්‍රසිද්ධ රෝග විනිශ්චය රසායනාගාරයක් වන අතර ජාතියේ ජෛව වෛද්‍ය සහ ව්‍යවහාරික සෞඛ්‍ය පර්යේෂණ සඳහා ප්‍රමුඛතම ආයතනයකි. වෛරස් විද්‍යාව, බැක්ටීරියා විද්‍යාව, පරපෝෂිත විද්‍යාව, ජලහීතිකාව, පෝෂණය, ජෛව රසායන විද්‍යාව, හිස්ටෝ ව්‍යාධි විද්‍යාව, රක්තවේදය, ප්‍රතිශක්ති විද්‍යාව, කීට විද්‍යාව, අණුක ජීව විද්‍යාව, ඖෂධවේදය, ක්ෂුද්‍ර විද්‍යාව, සෞඛ්‍ය තොරතුරු විද්‍යාව සහ සත්ත්ව අධ්‍යයන ඇතුළු පුළුල් පරාසයක විෂයයන් ආවරණය වන පරිදි MRI විවිධ ක්ෂේත්‍ර හරහා පුළුල් පර්යේෂණ සිදු කරයි.





එක් එක් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය පහත සඳහන් වේ.

දෙපාර්තමේන්තුව	ළභාකර ගැනීම් / කාර්යසාධනය
වෛද්‍ය පර්යේෂණ අධ්‍යක්ෂක අංශය	- වර්තමාන සහ නැගී එන වෛද්‍ය මාතෘකා පිළිබඳ පුළුල් පරාසයක සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ දැනුම යාවත්කාලීන කිරීම සහ වැඩි දියුණු කිරීම අරමුණු කරගත් අධ්‍යයන සම්මන්ත්‍රණ සෑම මසකම පවත්වන ලදී. - ලෝක බැංකු නියෝජිතයින් සමග වසංගත අරමුදල් ක්‍රියාකාරකම් පිළිබඳ සාකච්ඡා - NASTEC සංචාරය සහ ආයතකනික කාර්ය සාධන ඇගයීම් පිළිබඳ සාකච්ඡාව - MRI හි 125 වන සැමරුමට සමගාමීව සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සඳහා වෛද්‍ය පරීක්ෂණ වැඩසටහනක් පවත්වන ලදී.
බැක්ටීරියාවේදය	- ISO15189:2022 වෛද්‍ය රසායනාගාර ප්‍රතීතන තක්සේරුව සඳහා අලුතින් යාවත්කාලීන කරන ලද ප්‍රමිතිය සම්පූර්ණ කර ඇත. - MALDI-TOF ස්කන්ධ වර්ණා උසස් ක්ෂුද්‍රජීවී හඳුනා ගැනීමේ පද්ධතිය එක්සත් රාජධානියේ ෆ්ලෙමින් අරමුදල් ව්‍යාපෘතිය මගින් බැක්ටීරියා විද්‍යා දෙපාර්තමේන්තුවේ AMR නිරීක්ෂණ සඳහා වන ජාතික යොමු රසායනාගාරයට පරිත්‍යාගයක් ලෙස ලැබෙනු ඇත. - රසායනාගාර කාර්ය මණ්ඩලයේ 10 දෙනෙකු සඳහා ‘ක්ෂුද්‍රජීව විද්‍යාත්මක මාධ්‍ය සකස් කිරීම’ පිළිබඳ පුහුණු වැඩසටහනක් භූතාන රාජකීය රජය මඟින් පවත්වන ලදී. - රසායනාගාර 90 ක සහභාගීත්ව ඇතිව රාජ්‍ය හා පෞද්ගලික ක්ෂුද්‍රජීවී විද්‍යාගාරවලට සේවය කරන සායනික ක්ෂුද්‍රජීවී විද්‍යාව පිළිබඳ ජාතික බාහිර තත්ත්ව සහතික කිරීමේ යෝජනා ක්‍රමය අවසන් කරන ලදී.
රසායනික ව්‍යාධිවේදය	- IFCC ගෝලීය මෙඩිලැබ් සතිය 2025 පොඩ්කාස්ට් (podcast) තරඟයේ 2 වන ස්ථානය දිනා ගැනීම - සිදු කරන ලද ඩෙංගු සමීක්ෂණ ගණන - 18 - ජෛව කාර්යක්ෂමතා පරීක්ෂණ ක්ෂේත්‍ර අත්හදා බැලීම් ගණන - 51 (නිෂ්පාදන 10) - ජෛව කාර්යක්ෂමතා පරීක්ෂණ අත්හදා බැලීම් ගණන (ප්‍රමිතීන්, පාලන ඇතුළුව) – 300 - ඵලදායී කාල පරිච්ඡේද තක්සේරු කිරීම් ගණන - 06 - නඩත්තු කරන ලද ජනපද ගණන -04 - ජෛව කාර්යක්ෂමතා පරීක්ෂණ සහ ඵලදායී කාල පරිච්ඡේද තක්සේරු කිරීම් වලින් ජනනය වන මුළු ආදායම - රු1,540,000.00
වෛද්‍ය රසායනාගාර තාක්ෂණ පාසල	- MRI මාසික අධ්‍යයන සම්මන්ත්‍රණය ආරම්භ කරන ලදී - 2025 ලෝක ප්‍රති-ක්ෂුද්‍ර ජීවී දැනුවත් කිරීමේ සතියේ (WAAW) කොටසක් ලෙස ‘දාමය බිඳ දැමීම: AMR ට එරෙහිව දෛශික කළමනාකරණය’ (Breaking the Chain: Vector Management Against AMR) යන මාතෘකාව යටතේ දැනුවත් කිරීමේ වැඩසටහන 2025 නොවැම්බර් 25 වන දින පවත්වන ලදී
රසායනාගාර සත්ත්ව	- සත්ත්ව මධ්‍යස්ථානයෙන් පර්යේෂණ සහ රෝග විනිශ්චය අරමුණු

දෙපාර්තමේන්තුව	ළඟාකර ගැනීම් / කාර්යසාධනය
විද්‍යාව	සඳහා රසායනාගාර සතුන් නිකුත් කරන ලදී - සත්ත්ව පරීක්ෂණ සඳහා විකල්පයක් ලෙස පර්යේෂණ සඳහා සීබ්‍රාෆිෂ් (Zebrafish) කළල නිකුත් කරන ලදී - මාධ්‍ය සකස් කිරීම සහ රෝග විනිශ්චය අරමුණු සඳහා සත්ත්ව රුධිරය නිකුත් කරන ලදී - දේශීය සෞඛ්‍ය විද්‍යා හා තාක්ෂණ පීඨයේ දේශීය වෛද්‍ය සම්පත් දෙපාර්තමේන්තුවේ උපාධි අපේක්ෂක සිසුන් හතළිස් හතර දෙනෙකු පුහුණු කරන ලදී
පටක ව්‍යාධි විද්‍යාව සහ පිළිකා ජාන විද්‍යාව	- දිවයින පුරා පිහිටි රෝහල්වල විද්‍යාගාරවල වෛද්‍ය රසායනාගාර තාක්ෂණවේදීන් සඳහා සේවාස්ථ පුහුණු වැඩසටහන 2025 අප්‍රේල් 25 වන දින පවත්වන ලදී - 2025 ජාතික බාහිර තත්ත්ව සහතික කිරීමේ යෝජනා ක්‍රමයට සෛල විද්‍යාත්මක තක්සේරුව සහ ඉටි කුට්ටි තක්සේරුව ඇතුළත් කිරීම - SV 40 සමග වකුගඩු බද්ධ කිරීම ප්‍රතික්ෂේප කිරීමේ සලකුණු ආරම්භ කිරීම - ඇල්බියුමින් ඇතුළු වකුගඩු රෝග විනිශ්චය සඳහා සම්පූර්ණ ප්‍රතිශක්තීකරණ ප්‍රතිදීප්ත පරීක්ෂණ පැනලය හඳුන්වා දීම - වකුගඩු රෝග සඳහා නිශ්චිත රෝග විනිශ්චය සලකුණු අරම්භ කිරීම උදා: PLA2R විරෝධී, DNAJB9 - පුද්ගලාරෝපිත ඖෂධ සඳහා පියයුරු පිළිකා සලකුණු කිරීම තව දුරටත් පුළුල් කිරීම - පිළිකා අණුක ජාන පරීක්ෂණ ආරම්භ කිරීම. EGFR
ඉලෙක්ට්‍රෝන අන්වීක්ෂය	- සම්ප්‍රේෂණ ඉලෙක්ට්‍රෝන අන්වීක්ෂය රෝග විනිශ්චය සහ පර්යේෂණ අරමුණු සඳහා භාවිතා කරන ලදී
වෛරස් විද්‍යාව	- වෛරස් විද්‍යා දෙපාර්තමේන්තුව ජාතික හා ජාත්‍යන්තර වෛරස් රෝග නිරීක්ෂණ වැඩසටහන් සඳහා කේන්ද්‍රීය රසායනාගාරය ලෙස ක්‍රියා කරයි. - ශක්තිමත් කරන ලද නිරීක්ෂණ පද්ධති හරහා ජාතික හා ගෝලීය මට්ටම් දෙකෙහිම මතුවන සහ නැවත මතුවන වෛරස් ආසාදන නිරීක්ෂණය කිරීම - පර්යේෂණ සොයා ගැනීම්, නිගමන සහ නිර්දේශ විද්‍යාත්මක, සායනික, මහජන සෞඛ්‍ය සහ පරිපාලන ප්‍රජාවන් වෙත සමාලෝචනය කරන ලද සඟරා ප්‍රකාශන, සම්මන්ත්‍රණ සාරාංශ සහ ශ්‍රී ලංකා ක්ෂුද්‍රජීව විද්‍යාඥයින්ගේ විද්‍යාලය, වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනය සහ ජාතික සෞඛ්‍ය පර්යේෂණ සම්මන්ත්‍රණය වැනි විද්‍යාත්මක සංසදවල ඉදිරිපත් කිරීම් හරහා බෙදා හරින ලද අතර එමගින් මහජන සෞඛ්‍ය ක්‍රියාමාර්ග සහ ප්‍රතිපත්ති සංවර්ධනය පිළිබඳ සාක්ෂි පරිවර්තනය කිරීමට හැකි විය. - ජාතික වශයෙන් අදාළ පර්යේෂණ ව්‍යාපෘති සාර්ථකව පැවැත්වීම,

දෙපාර්තමේන්තුව	ළඟාකර ගැනීම් / කාර්යසාධනය
	සම්පූර්ණ කිරීම සහ ආරම්භ කිරීම උදා- ප්‍රති වෛරස් ප්‍රතිරෝධක පරීක්ෂණ - බහුවිධ නැගී එන සහ නැවත මතුවන වෛරස් ආසාදන සඳහා ඵලදායී වසංගත ප්‍රතිචාරයක් - අප ජල නිරීක්ෂණ ආරම්භ කිරීම සහ ජාතික ගැබ් ගෙල පිළිකා පරීක්ෂණ වැඩසටහන සඳහා සහාය ඇතුළුව රෝග නිරීක්ෂණ ශක්තිමත් කිරීම - Mpox සඳහා අණුක පරීක්ෂණ සහ අනුපිළිවෙල ඇතුළුව නව රෝග විනිශ්චය පරීක්ෂණ ස්ථාපිත කිරීම
ජලභීතිකා රෝගය සහ එන්නත් තත්ත්ව පාලනය	- ජලභීතිකා රෝගය සඳහා සෘජුවම පටල පරීක්ෂා (smear) සිදු කිරීම. ජනවාරි 1 සිට ජූනි 30 දක්වා පරීක්ෂණ 449 ක් සිදු කරන ලදී - ලොව පුරා ජලභීතිකා රෝගය හඳුනා ගැනීම සඳහා රන් සම්මත (gold standard) ක්‍රමය වන ජලභීතිකා රෝගය සඳහා සෘජු ප්‍රතිදීප්ත ප්‍රතිදේහ පරීක්ෂණය සිදු කිරීම. ජලභීතිකා රෝගය සඳහා DFAT 491 ක් සිදු කරන ලදී - වෛද්‍ය නිලධාරීන් ක්‍රියාකාරීව රෝගීන් පරීක්ෂා කිරීම සහ ජලභීතිකා රෝගය සම්බන්ධයෙන් අත්‍යවශ්‍ය මග පෙන්වීමක් ලබා දෙයි. අපගේ ප්‍රජාවේ සෞඛ්‍යය හා ආරක්ෂාව සහතික කිරීම සඳහා මෙම මුලපිරීම ඉතා වැදගත්වේ. පසුගිය මාස හය තුළ රෝගීන් 566 දෙනෙකු පරීක්ෂාවට ලක්කර ඇත. - තවදුරටත් තහවුරු කිරීමේ ක්‍රමයක් ලෙස ජලභීතිකා රෝගය සඳහා PCR පරීක්ෂණ සිදු කරන ලදී. ජනවාරි සිට ජූනි දක්වා PCR පරීක්ෂණ 30 ක් පවත්වන ලදී. - එන්නත් ලේඛනය සමාලෝචන කර කොටස් නිකුත් කිරීමේ සහතික නිකුත් කිරීමෙන් එන්නත් කොටස් නිකුත් කිරීමට පහසුකම් සපයයි. පසුගිය මාස 6 තුළ එන්නත් කොටස් 39ක් නිකුත් කරඇත.
පෝෂණය	- "පිළිගැනීම පිළිබඳ අධ්‍යයනය" (Acceptance Study) පිළිබඳ සාරාංශය, 46 වන EPSEN (මාපිය සහ ළදරු පෝෂණය පිළිබඳ යුරෝපා සංගමය) 2025 සමුළුව සඳහා ප්‍රකාශයට පත් කිරීමට තෝරා ගෙන ඇත. - කොළඹ සම්මන්ත්‍රණ කටයුතු වලදී "ශ්‍රී ලංකාවේ තෝරාගත් විශ්වවිද්‍යාලයක ව්‍යවහාරික විද්‍ය උපාධි අපේක්ෂකයින්ගේ පවුල් අතර දැනුම, ආකල්ප සහ ඉවුම් පිහුම්, තෙල් භාවිතය තීරණය කිරීම" යන මැයෙන් සාරාංශයක් ප්‍රකාශයට පත් කරන ලද අතර සම්පූර්ණ පත්‍රිකාවක් පිළිගනු ලැබීය.

දෙපාර්තමේන්තුව	ළඟාකර ගැනීම් / කාර්යසාධනය
දිලීර විද්‍යාව	- *Candidozyma auris* (Candida auris) හඳුනා ගැනීම සඳහා PCR පරීක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීම. - පරීක්ෂණ වාර්තා අදාල රෝහල් වෙත විද්‍යුත් තැපෑලෙන් යැවීම ආරම්භ කරන ලදී.

2.9 වෛද්‍ය සැපයීම්

සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයුම් අංශය (MSD) දිවයින පුරා පිහිටි රජයේ සෞඛ්‍ය සේවා ආයතන සඳහා සියළුම ඖෂධ, ශල්‍ය උපකරණ, රසායනාගාර ද්‍රව්‍ය, විකිරණශීලී ද්‍රව්‍ය සහ මුද්‍රිත ආකෘතිපත්‍ර සැපයීම සඳහා වගකිවයුතු මධ්‍යම ආයතනය වේ. පෞද්ගලික රෝහල් ඇතුළුව රටේ සියළුම රෝහල් සඳහා අන්තරායකර ඖෂධ (මත්ද්‍රව්‍ය) සපයන එකම සැපයුම්කරු වෛද්‍ය සැපයුම් අංශය වේ.

- 2025 වර්ෂය සඳහා රුපියල් මිලියන 122,856.31ක් වටිනා වෛද්‍ය සැපයීම් මිලදී ගන්නා ලදී.

විස්තරය	වැය විෂය	මුළු ප්‍රතිපාදන (රු.මිලියන)	මුළු වියදම (රු.මිලියන)	මූල්‍ය ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස
වෛද්‍ය සැපයීම් අංශය (MSD) ට සහ රෝහල් වලට වෛද්‍ය සැපයීම් (GoSL)	111-2-25-010-1204(11)	54,300.00	33,922.98	62.47
රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව SPC (GoSL)	111-2-25-010-1204(11)	76,800.00	67,135.40	87.42
රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාව SPMC (GoSL)	111-2-25-010-1204(11)	30,000.00	21797.93	72.66
එකතුව		**161,100.00**	**122.856.31**	**76.26**

- සැපයුම් වල ප්‍රගතිය පිළිබඳ පවත්වන ලද මුළු සමාලෝචන රැස්වීම් සංඛ්‍යාව 46 කි. (රැස්වීම් 25 ක් ගරු සෞඛ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් සහ 21 ක් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි).

- රෝග විනිශ්චය අයිතම ලැයිස්තුවේ සූත්‍ර සංශෝධනය සම්පූර්ණ කරන ලද අතර ශල්‍ය අයිතම ලැයිස්තුවේ සූත්‍ර සංශෝධනය අර්ධ වශයෙන් නිම කර ඇත.

- තොරතුරු තාක්ෂණ (ICT) නිලධාරීන්, රාජ්‍ය කළමනාකරණ සහකාර, සංවර්ධන නිලධාරීන්, ICT සහකාර සහ වාප්පු නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලය 60 දෙනෙකු සඳහා සේවාස්ථ පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

- ලෝක බැංකු අරමුදල් සහිත PHSEP සහ ADB අරමුදල් සහිත HSEP යටතේ විශේෂ ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදී.


- දේශීය නිෂ්පාදන අයිතම වල ප්‍රගතිය

1	2024 දී අයිතම සංඛ්‍යාව	129
2	2025 දී අයිතම සංඛ්‍යාව	175
3	2025 දී අයිතම වල වටිනාකම	රු.මිලියන 27,513
4	2025 දි වැඩි දියුණුවීමේ %	36


2.10 ජාතික රුධිර පාරවිලයන සේවය

ජාතික රුධිර පාරවිලයන සේවය (NBTS) යනු සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ සම්බන්ධීකරණය කරනු ලබන විශේෂිත වැඩසටහනකි. සියළුම රජයේ රෝහල් වලට සහ පෞද්ගලික අංශයේ බොහොමයක් රෝහල් වලට රුධිරය සහ රුධිර නිෂ්පාදන සැපයීමේ ජාතික වගකීම එමගින් දරයි. භූගෝලීය ව්‍යාප්තිය අනුව රෝහල් පාදක රුධිර බැංකු 110 ක් හා පොකුරු මධ්‍යස්ථාන 24 කට අනුබද්ධිත ස්වාධීන රුධිර මධ්‍යස්ථාන 02 ක් ඇත.

- රුධිර බැහැර කිරීමේ මට්ටම <1% දක්වා අඩු කර ඇත.
- 100% ක් ස්වේච්ඡා පරිත්‍යාගය පවත්වා ගැනීම
- ERASMUS ව්‍යාපෘතිය - අදියර 1 සම්පූර්ණ කිරීම (ආරක්ෂිත රුධිර පරිත්‍යාගය සහ සැපයීම සඳහා පාරවිලයන වෛද්‍ය වෘත්තිකයින් සඳහා ඉහළ බලපෑමක් ඇති තිරසර අධ්‍යාපනික වැඩසටහන සකස් කිරීම)
- ප්‍රාථමික සෛල පරිත්‍යාගශීලීන්ගේ ලේඛනය (Stem Cell donor Registry) සඳහා පරිත්‍යාගශීලීන් බඳවා ගැනීම
- කොටස් කිරීම සඳහා අතිරික්ත ප්ලාස්මා අපනයනය සම්පූර්ණ කිරීම.
- සියළුම රුධිර බැංකු සඳහා හොඳ නිෂ්පාදන පිළිවෙත් (GMP) හඳුන්වා දීම
- සමාකරණ රසායනාගාරයක් (Simulation Laboratory) ස්ථාපිත කිරීම.
- ලෝක රුධිර පරිත්‍යාගශීලීන්ගේ දිනය සැමරීම



සටහන 1 - 100% ස්වේච්ඡා පරිත්‍යාගශීලීන්ගේ පදනම මත අඛණ්ඩව නඩත්තු කිරීමත් සමග රුධිර එකතුවේ වාර්ෂික වැඩි දියුණු වීම



සටහන 2 - ජනගහනය 1000 කට වාර්ෂික රුධිර එකතු කිරීම

2.11 මහජන සෞඛ්‍ය සේවා

- **පාරිසරික සෞඛ්‍ය, වෘත්තීය සෞඛ්‍ය සහ ආහාර සුරක්ෂිතතාව**
  - ජාතික පාරිසරික සෞඛ්‍ය වැඩසටහන අනෙකුත් පාර්ශවකරුවන් සමග සහයෝගයෙන් පාරිසරික සෞඛ්‍ය ගැටළු කළමණාකරණය සම්බන්ධයෙන් කටයුතු සිදු කරයි. මෙම වැඩසටහන මගින් වායු දූෂණය හා රසායනික සුරක්ෂිතතාව, දේශගුණික විපර්යාස හා සෞඛ්‍යය, සෞඛ්‍ය සේවා පහසුකම්වල ජලය, සනීපාරක්ෂාව හා සෞඛ්‍ය සම්පන්නභාවය (WASH) සහ සෞඛ්‍ය සත්කාර අපද්‍රව්‍ය කළමනාකරණය වැනි පාරිසරික අවදානම් සාධක පිළිබඳව කටයුතු කරයි.

    - දේශගුණික විපර්යාස අනුවර්තනය සහ සෞඛ්‍ය අංශයේ ඔරොත්තුදීමේ හැකියාව පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීමේ (TOT) වැඩසටහන. සියළුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන් ආවරණය වන පරිදි සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සඳහා දින දෙකක වැඩසටහන් නවයක් පවත්වන ලදී. සහභාගීවූ මුළු සංඛ්‍යාව 1,009 ක් වූ අතර වියදම රුපියල් 1,823,285.00කි.

    - පාරිසරික සහ වෘත්තීය සෞඛ්‍ය දිස්ත්‍රික් සමාලෝචන රැස්වීම් පවත්වන ලදී.

    - බස්නාහිර පළාතේ මහජන සෞඛ්‍ය කාර්යය මණ්ඩලය සඳහා සෞඛ්‍ය සත්කාර අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ පුහුණුවන්නන් පුහුණු කිරීමේ (TOT) වැඩසටහන් පවත්වන ලදී.

    - WASH සමීක්ෂණයේ සොයාගැනීම් බෙදා හැරීම සඳහා වූ වැඩමුළුව 33 දෙනෙකු සඳහා මඩකලපුවේදී පවත්වන ලදී.

    - WASH FIT පිළිබඳ සිව්-දින ජාතික පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන පවත්වන ලදී.

    - ජාතික හා පළාත් සෞඛ්‍ය සත්කාර අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලසුම් කෙටුම්පත් කිරීම සහ ජාතික WASH මාර්ග සිතියම සකස් කිරීම ආරම්භ කිරීම.

- සම පැහැපත් කිරීමේ නිෂ්පාදන වල රසදිය ඉවත් කිරීම (skin lightening products – SLPs). හැසිරීම වෙනස් කිරීම සහ SLPs භාවිතය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම පිළිබඳව වැඩසටහන් හතක් පවත්වන ලද අතර 288 ක් සහභාගී විය.

- රෝහල් සෞඛ්‍ය සහායකයින් අතර SLPs භාවිතය පිළිබඳ පර්යේෂණ අධ්‍යයනයක් සිදු කරන ලදී.

○ ජාතික වෘත්තීය සෞඛ්‍ය වැඩසටහන. දිස්ත්‍රික් හා පළාත් සෞඛ්‍ය පද්ධති හරහා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් එක්ව බිම් මට්ටමේ සිට වෘත්තීය සෞඛ්‍ය සේවාවන් සපයනු ලැබේ.

○ ආහාර සුරක්ෂිතතාව මහජන සෞඛ්‍යයේ මූලික අංගයක් වන අතර ජනතාව විසින් පරිභෝජනය කරන ආහාර සුරක්ෂිත සහ හානිකර දූෂක වලින් තොර බවට සහතික කරයි. ජීව විද්‍යාත්මක, රසායනික හෝ භෞතික උපද්‍රව වලින් දූෂණය වීමේ අවදානම අවම කිරීම සඳහා ආහාර හැසිරවීම, සකස් කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය සහ බෙදා හැරීම යන සියළුම අංශ එයට ඇතුළත්වේ .

- බලයලත් නිලධාරීන්ගේ කාර්ය සාධනය ඇගයීම සඳහා සහ දිස්ත්‍රික් මට්ටමින් ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා දිස්ත්‍රික් ආහාර සුරක්ෂිතතා සමාලෝචන ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ මට්ටමින් හා කොළඹ මහ නගර සභා බල ප්‍රදේශයේදී පවත්වන ලදී.
- ආහාර උපදේශක කමිටුවේ (Food Advisory Committee) අදහස් දැක්වීමෙන් පසුව ආහාර සුරක්ෂිතතා ප්‍රතිපත්තිය සංශෝධනය කරන ලදී.
- 2025 ලෝක ආහාර සුරක්ෂිතතා දිනය සැමරීම සඳහා මාධ්‍ය සම්මන්ත්‍රණයක් පැවැත්වූ අතර "ආහාර සුරක්ෂිතතාව : විද්‍යාව ක්‍රියාත්මක වේ " (Food safety : Science in action) යන තේමාව යටතේ දැනුවත්භාවය ඉහළ නැංවීමට සහ සාක්ෂි මත පදනම් වූ හොඳම භාවිතයන් ප්‍රවර්ධනය කිරීමට වේදිකාවක් සකස් කරන ලදී.
- අයඩීන් ගෝලීය ජාලයේ (IGN) සහාය ඇතිව 2024 ජාතික ලුණු අයඩීකරණ (iodization) සමීක්ෂණය 2025 දී අවසන් කරන ලද අතර එහි වාර්තාව අදාල නිළධාරීන් වෙත ලබා දෙන ලදී.
- රට තුළ ආපදා තත්ත්වය (දිට්වා සුළි කුණාටුව) අතරතුර ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම සඳහා පෝෂණ සහ ආහාර සුරක්ෂිතතා මාර්ගෝපදේශ සහ සමාජ මාධ්‍ය පළ කිරීම් දිවයින පුරා බෙදා හරින ලදී.
- නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මහජන සෞඛ්‍ය සේවා) 1 ගේ මග පෙන්වීම යටතේ ආහාර පනත සංශෝධනය කරන ලද අතර එය යථා කාලයේදී සම්පූර්ණ කරනු ඇත.
- BESPA ව්‍යාපෘතිය යටතේ පරීක්ෂණ තොරතුරු කළමනාකරණ පද්ධතියක් (Inspection Information Management System – IIMS) සහ බලයලත් නිලධාරීන් සඳහා ඉගෙනුම් කළමනාකරණ පද්ධතියක් (Learning Management System -LMS) සංවර්ධනය කිරීම සඳහා මූලික සාකච්ඡා පවත්වන ලදී.

➢ **වතු හා නාගරික සෞඛ්‍ය**

- **නායකත්වය සහ පාලනය** - වතු හා නාගරික අංශ දෙකෙහිම ප්‍රධාන පාර්ශවකරුවන් සමග එක් ජාතික වතු හා නාගරික සෞඛ්‍ය මෙහෙයුම් කමිටු රැස්වීමක් පවත්වන ලදී.

- **උපායමාර්ගික සැලසුම්කරණය සහ ප්‍රතිපත්ති සංවර්ධනය** - වතු හා නාගරික සෞඛ්‍ය සඳහා පස් අවුරුදු උපායමාර්ගික සැලැස්ම (2026-2030) සකස් කිරීම WHO සහාය ඇතිව ආරම්භ කරන ලද අතර උපදේශක රැස්වීම් හතරක් පවත්වන ලදී.

- **නාගරික ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර සේවා ශක්තිමත් කිරීම** - කොළඹ මහ නගර සභාවේ සෞඛ්‍ය හා සෞඛ්‍ය නොවන පාර්ශවකරුවන් සඳහා තුවාලවීම් වැලැක්වීම, හදිසි ප්‍රතිචාර දැක්වීම සහ මූලික ප්‍රථමාධාර පිළිබඳ ධාරිතා වර්ධන වැඩසටහන් අටක් පවත්වන ලදී.

- **බෝ නොවන රෝග වැලැක්වීම** - කොළඹ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, කොළඹ මහ නගර සභාව සහ නාගරික අංශ සංවර්ධන අධිකාරියේ සහයෝගය ඇතිව තෝරාගත් නාගරික අංශ තුළ බෝ නොවන රෝග පරීක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

- **ප්‍රජා සවිබල ගැන්වීම සහ මත් ද්‍රව්‍ය අනිසි භාවිතය වැළැක්වීම** - කාන්තාවන් සහ දරුවන්ගේ ආරක්ෂාව කෙරෙහි අවධානය යොමු කරමින් සිරිමුතු උයන (කොළඹ 14) සහ සොරණවත්ත (හොරණ) යන නාගරික ප්‍රදේශවල මධ්‍යසාර දුම්කොළ සහ අනෙකුත් මත් ද්‍රව්‍ය (ATOD) භාවිතය වැළැක්වීම සඳහා ප්‍රජා පාදක මුල පිරීම දියත් කරන ලදී.

- **හවුල්කාරිත්වයන් ශක්තිමත් කිරීම** - පළාත් පාලන බල ප්‍රදේශවල සෞඛ්‍ය තත්ත්වය සහ සෞඛ්‍ය සේවා සැපයීමේ විෂමතා මගහරවා ගැනීම සඳහා නගර සභා සහ නාගරික ආඥා පනතේ ව්‍යවස්ථාදායක සංශෝධනයක් සිදු කරන ලදී.

- **සෞඛ්‍යය සඳහා මානව සම්පත් සංවර්ධනය** - මත් ද්‍රව්‍ය භාවිතය පිළිබඳව සහ ප්‍රජා යහ පැවැත්ම වැඩි දියුණු කිරීම සඳහා නුවරඑළිය දිස්ත්‍රික්කයේ ප්‍රජා පාදක මධ්‍යසාර වැළැක්වීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

- **ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර සේවා සහ සෞඛ්‍ය ප්‍රවර්ධනය** - ප්‍රජා යහ පැවැත්ම ප්‍රවර්ධනය සඳහා කොළඹ, නුවරඑළිය, මාතලේ, මාතර, ගාල්ල, කළුතර සහ කෑගල්ල යන දිස්ත්‍රික්කවල "සතුටුමත් වතු" (Happy Estate) ස්ථාපිත කිරීම ආරම්භ කරන ලදී.


- ළදරු සහ කුඩා දරුවන්ගේ ප්‍රශස්ථ පෝෂණ පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම සඳහා UNICEF සමඟ සහයෝගයෙන් ළමා සංවර්ධන මධ්‍යස්ථානවල ආදර්ශ මව් කිරි දීමේ ස්ථාන 60ක් පිහිටුවීම ආරම්භ කරන ලදී.

➢ **ජාතික පිළිකා පාලන වැඩසටහන**

ජාතික පිළිකා පාලන වැඩසටහන (NCCP), පිළිකා වැලැක්වීම සහ පාලනය සඳහා වූ කේන්ද්‍රස්ථානය වේ. "ශ්‍රී ලංකාවේ පිළිකා වැලැක්වීම සහ පාලනය පිළිබඳ ජාතික උපාය මාර්ගික සැලැස්ම" ට අනුව පිළිකා වැලැක්වීම සහ පාලනය සම්බන්ධ ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට, ක්‍රියාත්මක කිරීමට සහ අධීක්ෂණය කිරීමට ජාතික පිළිකා පාලන

වැඩසටහන, රේඛීය අමාත්‍යාංශයේ අනෙකුත් අධ්‍යක්ෂ අංශ සහ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් සමග සම්බන්ධීකරණය කරයි.

- **ජාතික මට්ටමේ පිළිකා පාලන ක්‍රියාකාරකම් පිළිබඳ පුළුල් සමාලෝචනය**
  ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සිය (IAEA), ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) සහ පිළිකා පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර ඒජන්සිය (IARC) යන ආයතනවල සහයෝගීතාවයෙන් ජාතික හා ජාත්‍යන්තර විශේෂඥයින්ගේ සහභාගීත්වයෙන් 2025 වර්ෂයේදී පිළිකා පාලනය පිළිබඳ " IMPACT" සමාලෝචනය පවත්වන ලදී. මෙම පුළුල් සමාලෝචනය මත පදනම්ව 2026-2030 පිළිකා වැලැක්වීම සහ පාලනය පිළිබඳ යාවත්කාලීන කරන ලද ජාතික උපාය මාර්ගික සැලැස්ම හරහා ක්‍රියාත්මක කිරීම සඳහා සලකා බැලිය යුතු නිර්දේශ සමග " පිළිකා පාලන ධාරිතාවය සහ අවශ්‍යතා තක්සේරු වාර්තාව" නිකුත් කරන ලදී.



- පිළිකා පාලනය පිළිබඳ ජාතික උපදේශක කමිටුව (NAC) සහ පිළිකා පාලනයේ විවිධ තේමා යටතේ ක්ෂේත්‍ර පිළිබඳ තාක්ෂණික උපදේශක කමිටු (TAC) පවත්වන ලදී. පළාත් පිළිකා පාලන සමාලෝචන 6 ක් (බස්නාහිර, දකුණ, නැගෙනහිර, උතුර,මධ්‍යම සහ උතුරු මැද පළාත්) පවත්වන ලදී.

- ජාතික මට්ටමේ සහ පළාත් මට්ටමේ උපදේශක ක්‍රියාකාරකම් ලෙස විශේෂ දින/මාස සමරන ලදී. ලෝක පිළිකා දිනය සැමරීම (පෙබරවාරි 4), ජාත්‍යන්තර ළමා පිළිකා දිනය (පෙබරවාරි 15), ලෝක හිස සහ බෙල්ල පිළිකා දිනය (ජූලි 27), මහා අන්ත්‍ර පිළිකා පිළිබඳ දැනුවත් කිරීමේ මාසය (මාර්තු), ළමා පිළිකා දැනුවත් කිරීමේ මාසය (සැප්තැම්බර්) සහ පියයුරු පිළිකා පිළිබඳ දැනුවත් කිරීමේ මාසය (ඔක්තෝම්බර්).

- වෛද්‍ය නිලධාරීන්, මහජන සෞඛ්‍ය හෙද සොයුරියන්, හෙද නිලධාරීන්, මහජන සෞඛ්‍ය හෙද නිලධාරීන්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්, සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරීන්, ආයුර්වේද වෛද්‍ය නිලධාරීන් සඳහා පිළිකා වැලැක්වීම සහ කල්තියා හඳුනා ගැනීම පිළිබඳ ධාරිතා වර්ධන වැඩසටහන් පවත්වන ලදී.

- පිළිකා වැලැක්වීම හා පාලනය පිළිබඳ තොරතුරු අධ්‍යාපනය හා සන්නිවේදනය පිළිබඳ ද්‍රව්‍ය සකස් කිරීම සහ බෙදා හැරීම

- රත්නපුර, මඩකලපුව, කුරුණෑගල ශික්ෂණ රෝහල් වල සහ පොලොන්නරුව දිස්ත්‍රික් මහ රෝහලේ පිළිකා කලින් හඳුනා ගැනීමේ මධ්‍යස්ථාන (CEDCs) ස්ථාපිත කරන ලදී


- ශ්‍රී ලංකාවේ න්‍යෂ්ටික වෛද්‍ය සේවා ඇගයීම සඳහා IAEA කණ්ඩායම (4 වැනි කණ්ඩායම) වෙත සහය ලබා දීම (SRL 9012 ව්‍යාපෘතිය)

- පිළිකා රෝගීන් සහ අනෙකුත් රෝගීන් සඳහා සහන සත්කාර සේවා ශක්තිමත් කිරීම

- ජාතික පිළිකා පාලන වැඩසටහන ශ්‍රී ලංකා පරමාණුක බල ශක්ති මණ්ඩලය (SLAEB) සමග සහයෝගයෙන් ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සිය (IAEA) විසින් මහරගම ජාතික පිළිකායතනය, ගාල්ල ජාතික රෝහල, මඩකලපුව ශික්ෂණ රෝහල සහ අනුරාධපුර ශික්ෂණ රෝහල යන ආයතන වල පිළිකා ප්‍රතිකාර ඒකකවල QA/QC වැඩසටහන් ශක්තිමත් කිරීම සඳහා උපකරණ පරිත්‍යාග කිරීමට පහසුකම් සපයයි.

- ළමා පිළිකා ඖෂධ ලබා ගැනීමට ප්‍රවේශය සඳහා ගෝලීය වේදිකාව සමග සම්බන්ධ වීම (GPACCM)





- 2022 වසරේ ජාතික පිළිකා සිදුවීම් සහ මරණ දත්ත වාර්තා (Reports of National Cancer Incidence & Mortality) ප්‍රකාශයට පත්කර බෙදා හරින ලදී.


➢ **ක්ෂය රෝග පාලන සහ ළය රෝග සඳහා වූ ජාතික වැඩසටහන**

ක්ෂය රෝග පාලනය සහ ළය රෝග සඳහා වූ ජාතික වැඩසටහන (NPTCCD) යනු දිස්ත්‍රික් ළය රෝග සායන හරහා ක්‍රියාත්මක වන රටේ ක්ෂය රෝග පාලන ක්‍රියාකාරකම් සඳහා වගකිව යුතු ජාතික මට්ටමේ ආයතනයයි. කිසිදු බාධාවකින් තොරව රෝගීන් සඳහා හොඳ තත්ත්වයේ රෝග විනිශ්චය සහ ප්‍රතිකාර සැපයීම සහතික කිරීම සඳහා දිස්ත්‍රික්ක මට්ටමේ කාර්යමණ්ඩලයට තාක්ෂණික මග පෙන්වීම සහ අනෙකුත් සහාය ලබාදීම NPTCCD මගින් සම්බන්ධීකරණය කර සිදු කරයි. මීට අමතරව NPTCCD විසින්

ක්‍රියාත්මක කරන රෝග වැලැක්වීමේ සේවාවන් අතරට හඳුනාගත් අධි-අවදානම් කණ්ඩායම් අතර ක්ෂය රෝගය වැලැක්වීමේ ප්‍රතිකාරය දිගටම කරගෙන යාමට සහාය වීම ක්ෂය රෝගය පිළිබඳ මහජනතාවගේ දැනුවත්භාවය සහ සෞඛ්‍ය ප්‍රවර්ධන හැසිරීම වැඩි දියුණු කිරීම මෙන්ම ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය සාක්ෂි සපයා ගැනීමට ක්ෂය රෝගයට අදාල සේවාවන් සම්බන්ධයෙන් පර්යේෂණ පැවැත්වීම ඇතුලත් වේ.

ක්ෂය රෝගීන් සඳහා ප්‍රතිකාර ලබාදීම ප්‍රධාන වශයෙන් දිස්ත්‍රික් ළය සායන 26ක්, ශාඛා සායන 108ක් සහ ශ්වසන රෝග සඳහා වන ජාතික රෝහල හරහා සිදු කරනු ලැබේ. වැලිසර ජාතික ක්ෂය රෝග යොමු කිරීමේ රසායනාගාරය (National Tuberculosis Reference Laboratory), ගාල්ල, රත්නපුර, යාපනය හා මහනුවර පිහිටි අතරමැදි ක්ෂයරෝග රසායනාගාර (Intermediate TB Laboratories) සහ රට පුරා පිහිටුවා ඇති ක්ෂුද්‍ර පරීක්ෂණ මධ්‍යස්ථාන (Microscopy Centers) 160කට අධික සංඛ්‍යාවක් හරහා රෝග විනිශ්චය සේවා සපයනු ලැබේ.

- ප්‍රජා-පාදක සංවිධාන (CBOs) සහ අනෙකුත් සියළුම පාර්ශවකරුවන්ගේ සහයෝගයෙන් කොළඹ ළය සායනයේ සිට ශ්‍රී ලංකා ජාතික රෝහල දක්වා මාර්තු 25 දින ක්ෂය රෝග දින පා ගමනක් පැවැත්වීමෙන් ලෝක ක්ෂය රෝග දිනය සැමරන ලදී.
- මහනුවර ළය සායනයේ ePIMS පද්ධති දෝෂ නිරාකරණය සහ ජාල ඇගයීම සහ ePIMS පරිශීලක පුහුණු සැසිය පවත්වන ලදී.
- පාර්ශව කරුවන්ගේ සහභාගීත්වයෙන් තාක්ෂණික සහාය කණ්ඩායම් (TSG) රැස්වීම් දෙකක් 2025 දී පවත්වන ලදී.
- 2025දී විවිධ සැකසුම් (settings) හරහා ඉලක්කගත සෞඛ්‍ය අධ්‍යාපන සහ ක්ෂය රෝග දැනුවත් කිරීමේ ක්‍රියාකරකම් කිහිපයක් පවත්වන ලදී.
- ක්ෂය රෝගය පිළිබඳ දැනුවත් භාවය සහ හැසිරීම වෙනස් කිරීම සඳහා සහය වීමට ඵලදායී තොරතුරු, අධ්‍යාපනය සහ සන්නිවේදන (IEC) ද්‍රව්‍ය සකස් කිරීම සහ බෙදා හැරීම සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන ලදී.
- ශ්වසන ආසාදන පාලනය වැඩි දියුණු කිරීම, ආරක්ෂිතව සෙම එකතු කිරීම පහසු කිරීම සහ රෝගීන් හා සෞඛ්‍ය සත්කාර කාර්යමණ්ඩලය අතර වාතයෙන් රෝග සම්ප්‍රේෂණය වීමේ අවදානම අඩු කිරීම සඳහා තෝරාගත් සෞඛ්‍ය මධ්‍යස්ථානවල කැස්ස කුටි (cough booths) 40ක් ඉදිකර ස්ථාපිත කර ඇත.
- ජාතික ක්ෂය රෝග මරණ සමාලෝචනය සහ ද්ස්ත්‍රික් ක්ෂය රෝග සමාලෝචන පවත්වන ලදී.



➢ **ජාතික වකුගඩු රෝග වැලැක්වීම සහ පර්යේෂණ**

තරුණවියේ සිටම නිරෝගී වකුගඩු පවත්වා ගැනීම පිළිබඳව ප්‍රජාවට හැකියාව ලබා දීම හා ප්‍රවර්ධනය කරමින් නිදන්ගත වකුගඩු රෝගය (CKD) සහ අවිනිශ්චිත සම්භවයක් සහිත නිදන්ගත වකුගඩු රෝග (CKDu) වැළැක්වීම සඳහා වන ජාතික කේන්ද්‍රස්ථානය ලෙස ජාතික වකුගඩු රෝග වැළැක්වීමේ සහ පර්යේෂණ ඒකකය (NRDPRU) සේවය සපයයි.

- සියළුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්ගේ සහභාගීත්වයෙන් ලෝක වකුගඩු දිනය මාර්තු 13 දින සමරනු ලැබීය. “අවධානයෙන් සිටින්න, කලින් හඳුනාගන්න, ඔබේ වකුගඩු ආරක්ෂා කර ගන්න” (Stay aware, Detect early, Protect your Kidneys) යන ගෝලීය තේමාව මටතේ දැනුවත් කිරීමේ වැඩසටහනක් සකස් කරන ලදී.

- නව RO යන්ත්‍ර 63 ක් ස්ථාපිත කර ආරක්ෂිත පානීය ජලය සැපයීම.

- නිදන්ගත වකුගඩු රෝග කලින් හඳුනාගැනීම සඳහා ප්‍රජා-පාදක පරීක්ෂණ වැඩසටහන් පැවැත්වීම. 2025 දී පුද්ගලයින් 823 දෙනෙකු පරීක්ෂාවට ලක්කරන ලදී.

- ඵලදායී රුධිර කාන්දුකරණය, පෙරිටෝරියල් (peritoreal) කාන්දුකරණය සහ සහන සත්කාර සේවා සිදු කිරීමට සහාය වීම.

- කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය, ගාල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක සහ චීන විද්‍යා ඇකඩමිය අතර සහයෝගී පර්යේෂණ ක්‍රියාකාරකම් සිදු කරන ලදී. පර්යේෂණ ප්‍රකාශන තුනක් සිදු කරන ලදී.

- රුධිර කාන්දුකරණ ඒකක නඩත්තු කිරීම හා නිදන්ගත වකුගඩු රෝග පරීක්ෂා කිරීම පිළිබඳ මාර්ගෝපදේශ සකස් කිරීම ආරම්භ කරන ලදී. 2026 දී එය සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වේ.

➢ **පෝෂණ අංශය**

<u>මන්දපෝෂණය සම්බන්ධයෙන් 2025 දී ගෙන ඇති පියවර</u>

- පෝෂණ ගැටළු මහහරවා ගැනීම සඳහා දිස්ත්‍රික් නිශ්චිත ඉලක්කගත මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම: දිස්ත්‍රික් පෝෂණ ක්‍රියාකාරී සැලැස්ම (DNAP)

- ශ්‍රී ලංකාවේ මන්දපෝෂණය මහහරවා ගැනීම සම්බන්ධයෙන් ප්‍රධාන කරුණු සාකච්ඡා කිරීම සඳහා 2025 ජූලි 16 සහ 2025 දෙසැම්බර් 9 යන දිනවල ජාතික පෝෂණ මෙහෙයුම් කමිටු (NNSL) රැස්වීම් දෙකක් පවත්වන ලද අතර පෝෂණ ගැටළු මගහරවා ගැනීමට උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා තීරණය කරන ලදී.

- 2025-2030 ජාතික ක්ෂුද්‍ර පෝෂක උපායමාර්ගික සැලැස්ම සකස් කිරීම

- ජාතික පෝෂණ මාසය ලෙස 2025 ජූනි මාසය ප්‍රකාශයට පත් කළ අතර එහි ප්‍රධාන තේමාව වූයේ පළතුරු සහ එළවළු පරිභෝජනය ප්‍රවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් “එළවළු සහ පළතුරු: සැමවිටම ඔබව නිරෝගීව තබා ගනී”



- සෞඛ්‍ය සම්පන්න ආහාර පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම - ශ්‍රී ලාංකිකයින් සඳහා ආහාර පාදක ආහාර ගැනීමේ මාර්ගෝපදේශ (Food Based Dietary Guidelines-FBDG)

- MAM සහිත දරුවන් සඳහා අතිරේක ආහාර - ත්‍රිපෝෂ වැඩසටහන

- ක්ෂුද්‍රපෝෂක ඌනතාවයන් වැළැක්වීම - සහල් පෝෂණ ගුණය ශක්තිමත් කිරීමේ වැඩසටහන (Rice Fortification Programme) පාසැල් අහාර වැඩසටහන (SMP) හරහා පාසැල් දරුවන්ට පෝෂණ ගුණය ශක්තිමත් කල සහල් (FR) ලබා දීම

- සෞඛ්‍ය සම්පන්න පාසල් ආපනශාලා ප්‍රවර්ධනය කිරීම සහ පාසල් ආපනශාලා මාර්ගෝපදේශ සංශෝධනය කිරීම

- “වෛද්‍ය ආයතනවල රෝගීන්ට සහ කාර්යමණ්ඩලයට ආහාර සැපයීම” සම්බන්ධයෙන් පවතින චක්‍රලේඛය සංශෝධනය කිරීම ආරම්භ කරන ලදී. රෝහල් ආහාර චක්‍රලේඛය පිළිබඳව කෑගල්ල දිස්ත්‍රික් මහ රෝහලේ, වැලිසර ජාතික ශ්වසන

රෝග රෝහලේ සහ මුල්ලේරියාව නැගෙනහිර කොළඹ මූලික රෝහලේ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

- **මාතෘ හා ළමා සෞඛ්‍ය සත්කාර සේවාවන් (පවුල් සෞඛ්‍ය කාර්යංශය)**

පවුල් සෞඛ්‍ය කාර්යංශය යනු රට තුළ ප්‍රජනක සෞඛ්‍ය, මාතෘ සෞඛ්‍ය, නව ජන්ම සෞඛ්‍ය, යෞවන සෞඛ්‍ය, ළමා සෞඛ්‍ය, පවුල් සැලසුම්, සුවනාරී සායන වැඩසටහන් පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය, සම්බන්ධීකරණය, අධීක්ෂණය සහ ඇගයීම සඳහා වග කියන සෞඛ්‍ය අමාත්‍යාංශයේ මධ්‍යම සංවිධානයයි. මෙම කාර්යභාරය තුළ පර්යන්ත මට්ටමේ වැඩසටහන් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශකත්වය සහ උලදෙස් කාර්යංශය මගින් ලබා දේ. එමෙන්ම, ජාත්‍යන්තර ආයතන විසින් අරමුදල් සපයන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමද සිදු කරයි. වර්තමාන හා අනාගත අභියෝග වලට මුහුණ දීමේදී සේවා සැපයීම ප්‍රශස්ත කිරීම සඳහා විද්‍යාත්මක සාක්ෂි මත පදනම් වූ මාතෘ හා ළමා සෞඛ්‍ය සේවාවන් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම සඳහා පවුල් සෞඛ්‍ය කාර්යංශය අඩිතාලම දමයි. 2030 වන විට තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට ශ්‍රී ලංකාව කැපවී සිටියි. මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා සඳහා වගකිවයුතු කේන්ද්‍රීය ආයතනය වන පවුල් සෞඛ්‍ය කාර්යංශය, ජාතික හා දිස්ත්‍රික් මට්ටමින් එහි ජයග්‍රහණ ඉතා සමීපව නිරීක්ෂණය කරමින් අරමුණ-3 (යහපත් සෞඛ්‍ය සහ යහපැවැත්ම) සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළේය.

1. **මාතෘ සත්කාර සැඩසටහන**

- පූර්ව ප්‍රසව හා පසු ප්‍රසව කාන්තාවන් දෙපිරිසටම මනෝ සමාජීය ගැටළු සඳහා පරීක්ෂා කිරීමට මනෝ සමාජීය පරීක්ෂණ මෙවලමක් සකස් කරමින් පවතියි.

- **ගර්භනී කාලය තුළ බර වැඩිවීම හා ඒ ආශ්‍රිත සාධක පිළිබඳව ගර්භනී කාන්තාවන්ගෙන් පෝෂණ මාසයේ දත්ත රැස් කිරීම සහ විශ්ලේෂණය කිරීම:** මාර්ගගත දත්ත එකතු කිරීමේ පෝරමයක් නිර්මාණය කර අදාළ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී/පවුල් සෞඛ්‍ය නිළධාරී (MOH/PHM) ප්‍රදේශ වෙත යවන ලදී. දත්ත විශ්ලේෂණය සිදු කෙරෙමින් පවතියි.

- **තත්ත්ව ඇගයීමේ මෙවලම්:** රෝහල් වල පූර්ව ප්‍රසව, සූතිකාගාරය, පසු ප්‍රසව සහ නවජ සත්කාර ඒකක භාවිතා කළ යුතු තත්ත්ව ඇගයීමේ මෙවලම්-ලෝක රෝගීන්ගේ සුරක්ෂිතතා දිනය සැමරීමේ උත්සවයේදී හොඳම ක්‍රියාකාරී රෝහල් තුනක් තෝරාගෙන සම්මාන පිරිනමන ලදී.

- **මූලික මාතෘ සත්කාර පිළිබඳ සෞඛ්‍ය සේවා කාර්ය මණ්ඩලය පුහුණු කිරීම:** පළාත් නවයම ආවරණය වන පරිදි පුහුණුකරුවන් පුහුණු කිරීමේ (TOT) වැඩසටහන් දොළහක් සහ දිස්ත්‍රික් පුහුණු වැඩසටහන් 35ක් පවත්වන ලදී.

- දිවයින පුරා සියළුම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී සායන සඳහා ඩිජිටල් රුධිර පීඩන මාපක 720ක් මිලදීගෙන බෙදා හරින ලද අතර මේ සඳහා දේශීය අරමුදල් යොදා ගන්නා ලදී.

2. අන්තර් ප්‍රසව හා නව ජන්ම සත්කාර ඒකකය

- අධ්‍යාපනික වීඩියෝ සහ ජනමාධ්‍ය සම්මුඛ සාකච්ඡා හරහා පොදු ජනතාව අතර මව් කිරි දීම ප්‍රවර්ධනය කිරීම

- සංජානනීය හයිපොතයිරොයිඩසම් (hypothyroidism) සඳහා නව ජන්මයින් පරීක්ෂා කිරීමේ ජාතික වැඩසටහන ශක්තිමත් කිරීම: නව ජන්ම පරීක්ෂා කිරීමේ පැකේජය නියමු කිරීම.

- නව ජන්ම සත්කාර සපයන ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයේ දැනුමේ සහ නිපුණතාවල පරතරයන් පියවා ගැනීම සඳහා "ක්ෂේත්‍ර නව ජන්ම සත්කාර පැකේජය" සහ මහජන සෞඛ්‍ය කාර්යමණ්ඩලය සඳහා පුහුණු මොඩියුලය සම්පාදනය කරන ලදී.

3. ළමා පෝෂණ වැඩසටහන

- ජාතික පෝෂණ මාසය - වයස අවුරුදු 5ට අඩු දරුවන්ගේ මානව මිතික තක්සේරුව (anthropometric assessment) 2025 ජුනි මාසයේදී පවත්වන ලදී.

- පවුල් සෞඛ්‍ය කාර්යංශයේ (FHB) RMNCAYH වැඩසටහන යටතේ පෝෂණ ගැටළු අවම කිරීම සහ ප්‍රශස්ත සෞඛ්‍යය සහතික කිරීම සඳහා අත්‍යවශ්‍ය පෝෂණ ද්‍රව්‍ය වන භාවිතයට සූදානම් චිකිත්සක ආහාර - BP100 සහ බහු ක්ෂුද්‍ර පෝෂණ කුඩු සැෂේ (MMN-P) යුනිසෙෆ් හි පරිත්‍යාගයක් ලෙස මිලදී ගෙන වයස අවුරුදු පහට අඩු දරුවන් අතර බෙදා හරින ලදී. මෙම භාණ්ඩ බෙදා හැරීම සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයුම් අංශයේ eLMIS-SWASTHA පද්ධතිය හරහා "අයිතම කාණ්ඩය - පවුල් සෞඛ්‍ය කාර්යංශය (FHB)" යටතේ බෙදාහැරීම 2025 දී ආරම්භ කරන ලදී.

- 2025 දෙසැම්බර් මාසයේදී ඇතිවූ දිට්වා සුළි කුණාටුවෙන් පීඩාවට පත් දරුවන්ගේ පෝෂණ තත්ත්වය ආරක්ෂා කිරීම සඳහා හදිසි ප්‍රතිචාර දැක්වීමේ පියවරක් ලෙස ත්‍රිපෝෂ අක්‍රමවත් සැපයුම හමුවේ අතිරේක ආහාර ලබා ගැනීම සහතික කිරීම සඳහා යුනිසෙෆ් සහ අනෙකුත් හවුල්කාර ආයතන සමග සාර්ථකව සම්බන්ධීකරණය කරන ලදී. MAM සඳහා භාවිතා කිරීමට සූදානම් අතිරේක ආහාරයක් වන BP5, යුනිසෙෆ් විසින් පරිත්‍යාග කරන ලද අතර බලපෑමට ලක්වූ MAM දරුවන් අතර බෙදා දෙන ලදී.

4. ළමා රෝගාබාධ සහ මරණ ආවේක්ෂණ වැඩසටහන

- 2024 සඳහා වයස අවුරුදු පහට අඩු ළමා මරණ පිළිබඳ ජාතික මේස සමාලෝචනය (National Desk Review) 2025 සැප්තැම්බර් 17 දින සාර්ථකව පවත්වන ලදී.

- 2025 සඳහා නව ජන්ම මරණ පිළිබඳ ජාතික මේස සමාලෝචනය 2025 මාර්තු 26 දින පවුල් සෞඛ්‍ය කාර්යංශයේදී නවජ රෝග විශේෂඥ වෛද්‍යවරුන්ගේ හා ළමා රෝග විශේෂඥ වෛද්‍යවරුන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

- 2025 ජනවාරි 28, 2025 ජුනි 26 හා 2025 නොවැම්බර් 19 යන දිනවල ළමා සියදිවි නසාගැනීම් සඳහා මනෝ විද්‍යාත්මක මරණ පරීක්ෂණ මෙවලම් (PATChis) පිළිබඳ ජාතික මේස සමාලෝචනය පවත්වන ලදී.

- පාර්ශවකරුවන් සමග රැස්වීම් පවත්වන ලදී: උපත් දෝෂ සඳහා වන ජාතික උපායමාර්ගික සැලැස්ම කෙටුම්පත (2025-2030) සමාලෝචනය කිරීම, වයස අවුරුදු පහට අඩු ළමා මරණ නඩු සමාලෝචන ආකෘතිය සංශෝධනය කිරීම, වයස අවුරුදු පහට අඩු ළමා මරණ දැනුම්දීම සහ විමර්ශන ආකෘතිපත්‍ර සකස් කිරීම, අනිවාර්ය පශ්චාත් පරීක්ෂණ අවශ්‍යතා සහ ඇතුළත් කිරීමේ මරණ විමර්ශන සහ ජාතික අත් පා ආශ්‍රිත උපත් දෝෂ සම්බන්ධයෙන් පාර්ශවකරුවන් සමග රැස්වීම් පවත්වන ලදී.

5. ළමා සත්කාර, සංවර්ධනය සහ විශේෂ අවශ්‍යතා වැඩසටහන

- රැක බලා ගන්නන් රැක බලා ගැනීමේ පැකේජයේ පළමු අදියර දිවයින පුරා ක්‍රියාත්මක කිරීම
- ග්‍රාමීය සහ වතු ප්‍රජාව සඳහා ප්‍රජා-පාදක දෙමාපිය වැඩසටහනක නියමු ක්‍රියාත්මක කිරීම
- පවුල් සෞඛ්‍ය නිළධාරිනියන් විසින් පාලනය කරනු ලබන ඔටිසම් විශේෂිත පරීක්ෂණ මෙවලම කොළඹ දිස්ත්‍රික්කයේ නියමු කිරීම
- Reflective portfolios සහ කතන්දර කීම මගින් CFC සඳහා ගුණාත්මක අධීක්ෂණ සහ ඇගයීම් රාමුවක් නියමු කිරීම
- ආබාධ සහිත දරුවන්ට සේවය සපයන ළමා සත්කාර ආයතන සඳහා අවම මාර්ගෝපදේශ සකස් කිරීම

6. පාසල් සෞඛ්‍ය වැඩසටහන

සෞඛ්‍ය හා අධ්‍යාපන අමාත්‍යාංශ එක්ව පාසැල් සෞඛ්‍ය සේවා සපයනු ලැබේ. පවුල් සෞඛ්‍ය කාර්යාංශය (FHB) පාසැල් සෞඛ්‍ය වැඩසටහනේ (SHP) කේන්ද්‍රස්ථානයයි. රජයේ සහ පෞද්ගලික පාසැල් වලට යන ළමුන් සහ නව යොවුන් වියේ පසුවන්නන් පාසැල් සෞඛ්‍ය වැඩසටහනේ (SHP) ඉලක්කගත කණ්ඩායම වන අතර රජයේ පාසල් 10,076 ක පමණක් ඇතුළත් කර ඇති පාසැල් සිසුන් 3,816,234 ක් සිටිති (ජාතික පාසැල් සංගණනය, 2024) .

- පාසැල් වෛද්‍ය පරීක්ෂණය (SMI) පවත්වන ලදී.
- මහනුවර, අනුරාධපුර, පොළොන්නරුව, පුත්තලම, කුරුණෑගල, රත්නපුර, කෑගල්ල සහ අම්පාර දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ජීවන කුසලතා සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන් අටක් පවත්වන ලද අතර, ඒ සෑම වැඩසටහනකටම මහජන සෞඛ්‍ය හා අධ්‍යාපන නිලධාරීන් 40-50ක් සහභාගී වූහ.
- ගෝලීය පාසැල් සෞඛ්‍ය සමීක්ෂණය, ශ්‍රී ලංකාව-2024, පවත්වන ලදී
- පාසැල් දරුවන් අතර පෝෂණය හා මනෝ සමාජීය ගැටළු පිළිබඳව ජාතික අධ්‍යාපන ආයතනය ඇතුළු අධ්‍යාපන අමාත්‍යාංශයේ ඉහළ සහ මධ්‍යම මට්ටමේ නිළධාරීන් සඳහා ප්‍රධාන උපදේශක රැස්වීමක් 2025 මැයි මාසයේදී පවත්වන ලදී.

7. නව යොවුන් සහ තරුණ වැඩසටහන්

- නව යොවුන් සහ තරුණයින්ගේ සෞඛ්‍යය පිළිබඳ ජාතික උපාය මාර්ගික සැලසුම සම්පාදනය කරන ලදී.
- යුනිසෙෆ් (UNICEF), ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) සහ එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලේ (UNFPA) මූල්‍ය සහයෝගය ඇතිව ප්‍රජාවේ ජාතික නියැදිය නියෝජනය කරමින් වයස අවුරුදු 15-24 අතර තරුණයින් 8800කගේ සහභාගීත්වයෙන් තුන්වන ජාතික තරුණ සෞඛ්‍ය සමීක්ෂණය ආරම්භ කරන ලදී.
- නව යොවුන් වියේ සහ තරුණ සෞඛ්‍ය සහ AYFHS පිළිබඳ පුහුණු කරුවන් පුහුණු කිරීම-නැගෙනහිර පළාත
- 2025 ජාතික තරුණ සෞඛ්‍ය සමීක්ෂණය ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන් - උතුරු පළාත සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

8. මුඛ සෞඛ්‍ය වැඩසටහන

මාතෘ හා ළමා සෞඛ්‍ය (MCH) වැඩසටහන යටතේ වැළැක්වීමේ හා ප්‍රවර්ධන මුඛ සෞඛ්‍ය සේවා ශක්තිමත් කිරීම සඳහා පවුල් සෞඛ්‍ය කාර්යංශයේ (FHB) මුඛ සෞඛ්‍ය ඒකකය (OHU) සිය වගකීම් දිගටම පවත්වාගෙන යනු ලැබේ.

- සායනික වැලැක්වීමේ සත්කාර සඳහා සහාය වීමට ෆ්ලෝරයිඩ් වාර්නිෂ් 1,500ක් සහ ෆිෂර් සීලන්ට් පැකට් 800ක් දිලදී ගන්නා ලදී.





- ලෝක මුඛ සෞඛ්‍ය දිනය සැමරීම සහ උපදේශන ක්‍රියාකාරකම්
- පාසැල් දන්ත සේවා යටිතල පහසුකම් ශක්තිමත් කිරීම
  පාසැල් දන්ත සායන සඳහා සම්මත ගොඩනැගිලි සැලසුම් සකස් කිරීම දන්ත උපකරණ අවශ්‍යතා තීරණය කිරීම සහ නවීකරණය කිරීම් සහ නව ඉදි කිරීමේ ප්‍රමුඛතා ලැයිස්තුව සකස් කිරීම

9. පවුල් සැලසුම් සැඩසටහන

- පවුල් සැලසුම් සේවාවන් සඳහා අවශ්‍ය උපත් පාලන උපකරණ ප්‍රසම්පාදනය

රජයේ අරමුදල් වලින් මිලදී ගත් උපත් පාලන උපකරණ

වර්ෂය	උපත් පාලන උපකරණ	ප්‍රමාණය	පිරිවැය (රුපියල්)
2025	මුඛ පෙති (චක්‍ර)	650,011	31,203,778.00
	DMPA එන්නත් කළ හැකි (කුප්පි)	350,000	82,091.090.00

	දණ්ඩ දෙකක බද්ධ කිරීම් (Two rod implants) (පස් අවුරුදු)	60,000	179,712,000.00
	AD සිරින්ජ මි.ලි.1, 22G ඉඳිකටුව	350,000	5,564,650.00
	එකතුව		**298,571,518.00**

- සැපයුම්දාම කළමනාකරුවන්ගේ ධාරිතා වර්ධනය
- සහායක ප්‍රජනක ශිල්පීය ක්‍රම සඳහා වන පිළිවෙත් සංග්‍රහය (Code of Practice for Assisted Reproductive Techniques)
- දත්ත රැස් කිරීම ශක්තිමත් කිරීම සඳහා H523 සහ H524 සංශෝධනය කිරීම

10. සුවනාරී කාන්තා වැඩසටහන

- ශ්‍රී ලංකාවේ ගැබ්ගෙල පිළිකා පරීක්ෂාව සඳහා HPV DNA පරීක්ෂාව පවත්වන ලදී. ශ්‍රී ලංකා රජයේ අරමුදල් භාවිතා කර මිලදී ගත් රුපියල් මිලියන 35ක පරීක්ෂණ කට්ටලවලට අමතරව, 2024 දෙසැම්බර් මාසයේදී රුපියල් මිලියන 101ක් වටිනා HPV DNA පරීක්ෂණ කට්ටල පරිත්‍යාගයක් ශ්‍රී ලංකාවට ලැබුණි. 2025දී වයස අවුරුදු 35 සහ 45 වයස් කාණ්ඩවල ඉලක්කගත කාන්තා ජනගහනයෙන් 12%ක් පමණ ආවරණය වන පරිදි මෙම පරීක්ෂණ කට්ටල භාවිතා කරන ලදී.

- සේවා ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට ස්වයං ඇගයීමේ මෙවලමක් වශයෙන් සුවනාරී කාන්තා සායන සහ රසායනාගාර සඳහා විගණන මෙවලම් සකස් කරන ලදී.

11. ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ කාන්තා සෞඛ්‍ය ඒකකය

- සංශෝධිත ප්‍රොටොකෝල: සංශෝධිත "මිතුරු පියස මධ්‍යස්ථාන සඳහා මෙහෙයුම් ප්‍රොටොකෝල" පොත් 900ක්, UNFPA සහ ශ්‍රී ලංකා රජයේ සහාය ඇතිව මුද්‍රණය කර බෙදා හරින ලදී.

- ධාරිතා සංවර්ධනවැඩසටහන් සහ පුහුණු සැඩසටහන් පවත්වන ලදී.

12. මාතෘ රෝගාබාධ සහ මරණ ආවේක්ෂණ වැඩසටහන

- මාතෘ රෝගාබාධ සහ මරණ ආවේක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මාතෘ මරණ පිළිබඳ ආවේක්ෂණය සහ විමර්ෂණය තවදුරටත් ශක්තිමත් කිරීමට ශ්‍රී ලංකාව 2023 දී බස්නාහිර හා දකුණු පළාත්වල නියමු ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කරන ලද මාතෘ මරණ පිළිබඳ ආවේක්ෂණ සහ විමර්ෂණ (CEMD) පද්ධතිය හඳුන්වා දී ඇත.

13. අධීක්ෂණ සහ ඇගයීම් ඒකකය

- දිස්ත්‍රික් මාතෘ හා ළමා සෞඛ්‍ය ක්‍රියාකාරකම්වල ප්‍රගතිය සමාලෝචනය කිරීම සහ මධ්‍යම මට්ටමේ කළමණාකරුවන් යාවත්කාලීන කිරීම සඳහා සෞඛ්‍ය දිස්ත්‍රික්ක 28 ම (කොළඹ මහ නගර සභාව - CMC සහ ජාතික සෞඛ්‍ය විද්‍යායතනය -

NIHS ඇතුළුව) පැමිණි සියළුම වෛද්‍ය නිලධාරීන් හා ප්‍රජා වෛද්‍ය විශේෂඥවරුන්ගේ සහභාගීත්වයෙන් තෙදින වැඩමුළුවක් මහනුවර Myst by Cinnamon හිදී පවත්වන ලදී. මෙම වැඩමුළුව 2025 ජූලි මස 23 සිට 25 දක්වා පැවැත්විණි.

- eIMMR හරහා මාතෘ සහ නව ජන්ම සෞඛ්‍ය දත්ත ලබා ගැනීම
- වයඹ පළාත හැර දිවයිනේ අනෙක් පළාත්වල සියළුම අධීක්ෂණ නිලධාරීන් පුහුණු කිරීම සම්පූර්ණ කරමින් නව අධීක්ෂණ රාමුවක් හඳුන්වා දෙන ලදී. සියළුම අධීක්ෂණ නිලධාරීන්ට ඔවුන්ගේ අදාල ප්‍රදේශවල අධීක්ෂණ කටයුතු ශක්තිමත් කිරීම සඳහා උපදෙස් ලබා දෙන ලදී.


- වයස අවුරුදු පහට අඩු ළමා මරණ ආවේක්ෂණ පද්ධතිය ප්‍රශස්ත කිරීම


- ළමා සෞඛ්‍ය සංවර්ධන වාර්තාව (CHDR) ඩිජිටල්කරණය කිරීම

- දිවිවා සුළි කුණාටුවෙන් පසු MCH සේවාවන්හි තත්ත්ව ඇගයීම සිදු කිරීම

- 2025-2029 සෞඛ්‍ය තොරතුරු සහ ඩිජිටල් සෞඛ්‍ය පරිවර්තනය සඳහා උපායමාර්ගික සැලැස්ම සකස් කිරීම

- FHB සඳහා සයිබර් ආරක්ෂණ රාමුව සකස් කිරීම





14. සැලසුම්කරණය සහ සංවර්ධනය

- ශ්‍රී ලංකාවේ මාතෘ හා ළමා සෞඛ්‍ය (MCH) පිළිබඳව පවතින ප්‍රතිපත්තිය සමාලෝචනය කරන ලදී.

- දිස්ත්‍රික් කාර්ය මණ්ඩලය සඳහා ආපදා සූදානම් කිරීමේ රැස්වීම් දෙකක් සහ පශ්චාත් ආපදා රැස්වීම් හතරක් පවත්වන ලදී.

- PSSP අරමුදල් මගින් මහජන පවුල් සෞඛ්‍ය නිලධාරීන් (PHM) සඳහා යතුරුපැදි ලබාදෙන ලදී.

- MCH තත්ත්ව ඇගයීමක් සිදු කරන ලදී.

15. පර්යේෂණ ඒකකය

- ජාතික හදිසි ප්‍රසව හා නව ජන්ම සත්කාර (EmONC) අවශ්‍යතා ඇගයීම 2025 සිදු කරන ලදී.
- කොලොම්බියා විශ්ව විද්‍යාලයේ සම්පත් දායක එමිලි කීස් මහත්මිය විසින් AMDD මෙවලම් පිළිබඳ පස් දින ප්‍රධාන පුහුණු කිරීමේ වැඩමුළුවක් 2025.07.28 සිට 2025.08.01 දක්වා පවත්වන ලදී.

- EmONC අනුවර්තිත මෙවලම් සඳහා දත්ත රැස් කිරීමේ අත් පොත සහ මාර්ගෝපදේශය පර්යේෂණ කමිටු සාමාජිකයින් විසින් කරන ලදී.

➢ **බන්ධනාගාර සෞඛ්‍ය සේවා**

- බන්ධනාගාර 28 න් 12 ක හදිසි ප්‍රතිකාර ඒකක ස්ථාපිත කරන ලදී.

- උතුරු පළාතේ ද්විතියික සෞඛ්‍ය සේවා මට්ටමේ සේවාවන් සඳහා ප්‍රවේශය වැඩි දියුණු කරමින් වවුනියා බන්ධනාගාරයේ බන්ධනාගාර රෝහලක් ක්‍රියාත්මක කිරීම.

- නේවාසික රෝගීන්ගේ ධාරිතාව හා අඛණ්ඩ වෛද්‍ය සත්කාර සේවා ශක්තිමත් කිරීමට මඩකලපුව බන්ධනාගාරයේ ඇඳන් 10කින් යුත් නේවාසික රෝගී වාට්ටුවක් ස්ථාපිත කිරීම.

- වැලිකඩ, මහර, බෝගම්බර සහ අගුණකොළපැලැස්ස යන රෝහල් සාමාන්‍ය වෛද්‍ය, ශල්‍ය වෛද්‍ය, චර්ම රෝග සහ මනෝ චිකිත්සාව පිළිබඳ විශේෂඥ සේවා සැපයීම සහිත විශේෂිත බන්ධනාගාර රෝහල් ලෙස නම් කරන ලදී.

- අදාල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්ගේ සහයෝගයෙන් බන්ධනාගාර රෝහල් වලට සති දෙකකට වරක් ජංගම දත්ත සායන පැවැත්වීම හඳුන්වා දෙන ලදී.

- බන්ධනාගාර දින සැමරුම් (2025 අගෝස්තු 10-23) හා සමගාමීව තෝරාගත් බන්ධනාගාර වල බෝ නොවන රෝග (NCD) සහ අක්ෂි පරීක්ෂා කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

- මානසික සහ මනෝ චිකිත්සක අවශ්‍යතා ඇති රැඳවියන් සඳහා කඩිනම් සහ විධිමත් සම්බන්ධීකරණ සත්කාර මාර්ග සපයා දීම.

- දින 28 ඉක්මවන වාට්ටු නවාතැන් ගන්නා රෝගීන් සඳහා බලපා ඇති හේතු සමාලෝචනය කර කඩිනම් පියවර ගැනීම ආරම්භ කිරීමට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය ලබා ලන්නා ලදී.

➢ **මහජන සෞඛ්‍ය පශු වෛද්‍ය සේවා**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ මහජන සෞඛ්‍ය පශු වෛද්‍ය සේවා (PHVS), වර්තමානයේ ජලභීතිකා පාලනයේ කේන්ද්‍රස්ථානය වන අතර, ශ්‍රී ලංකාවේ ජලභීතිකා පාලනයේ ප්‍රධාන කොටස්කරුවන් වන ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) වැනි අනෙකුත් පාර්ශවකරුවන් සමග සහයෝගයෙන් මිනිස් සහ සත්ත්ව ජලභීතිකා රෝගය වැළැක්වීමේ ජාතික වගකීම පවරා ඇත.

- ජලභීතිකා රෝගය හේතුවෙන් සිදුවන මරණ සංඛ්‍යාව 20 සිට 14 දක්වා තව දුරටත් අඩු කිරීම.

- දිවයින පුරා සිටින ගෘහස්ථ මෙන්ම වීදි සුනඛයින් 1,484,825 කට එන්නත් ලබා දෙන ලදී.

- දිවයින පුරා සිටින ගැහැණු සුනඛයින් 8,855 ක් සඳහා ශල්‍ය වන්ධ්‍යාකරණය සිදු කරන ලදී.

- මහජන සෞඛ්‍ය පරීක්ෂවරුන් සඳහා දිස්ත්‍රික්ක මට්ටමින් පවත්වනු ලබන "ජලභීතිකා අධ්‍යාපනඥ සහතිකය" (Rabies Educator Certificate-REC) දිස්ත්‍රික්ක 8ක පවත්වන ලදී. වෛද්‍ය නිලධාරීන් සඳහා PEP වැඩසටහන දිස්ත්‍රික්ක 6 ක වෛද්‍ය නිලධාරීන් සහ හෙද නිලධාරීන් 283 දෙනෙකු සඳහා පවත්වන ලදී. දිස්ත්‍රික්ක 6ක එන්නත් කරුවන් 132 දෙනෙකු සඳහා "එන්නත්කරුවන් පුහුණු කිරීමේ" වැඩසටහන් පවත්වන ලදී.

- ජලභීතිකා රෝගයට නිරාවරණය වීමෙන් පසු වැලැක්වීමේ මාර්ගෝපදේශ සංශෝධනය කිරීම / යාවත්කාලීන කිරීම සිදු කරන ලදී.

- සියළුම මාර්ගෝපදේශ සංශෝධනය කිරීම ආරම්භ කළ අතර 2026 පළමු කාර්තුවේදී අවසන් කිරීමට අපේක්ෂා කරනු ඇත.

- 2026-2030 කාලය තුළ සුනඛයින් මගින් ඇතිවන මිනිස් ජලභීතිකා රෝගය ශ්‍රී ලංකාවෙන් තුරන් කිරීම සඳහා වන උපාය මාර්ගික සැලැස්ම සකස් කරන ලද අතර එය 2026 දී දියත් කිරීමට නියමිතය.

➢ **නිරෝධායන ඒකකය**

ශ්‍රී ලංකාවේ දේශ සීමා ආරක්ෂාව පවත්වාගෙන යාමේ ප්‍රධාන හවුල්කරුවන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිරෝධායන ඒකකයයි. මෙම ඒකකයේ ප්‍රධාන වගකීම් වන්නේ ජාත්‍යන්තරව රෝග පැතිරීම සහ අනෙකුත් මහජන සෞඛ්‍ය තර්ජන සීමා කිරීම සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම ජාත්‍යන්තර ගමනාගමනය වෙළඳාමට අනවශ්‍ය ලෙස අත පෙවීම වලක්වා ගැනීම, ජාත්‍යන්තර සංචාරකයින්ගේ ගුවන් යානා සහ නැව් කාර්ය මණ්ඩලයේ සහ සාමාන්‍ය ජනතාවගේ සෞඛ්‍ය හා යහ පැවැත්ම ඇතුළුව මානව සෞඛ්‍යයට සිදුවන හානිය වැලැක්වීමට පියවර ගැනීමයි.

- ආරක්ෂාව, රේගු, ජෛව ආරක්ෂාව, සමුද්‍රීය සහ ගුවන් ප්‍රවාහනය, සත්ත්ව සෞඛ්‍ය, පොලිස් සහ සංක්‍රමණ වගකීම් ඇතුළුව දේශ සීමා පාලන වගකීම් සහිත අනෙකුත් ආයතන සමග සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිරෝධායන ඒකකය කටයුතු කරයි.

- සංචාරකයින් 4,173 දෙනෙකු සඳහා කහ උණ එන්නත් ලබා දෙන ලදී.

- නැව් සනීපාරක්ෂක සහතිකය නිකුත් කිරීම සඳහා නැව් 410 ක් පරීක්ෂා කරන ලදී.

- ශ්‍රී ලංකාව සඳහා සෞඛ්‍ය හදිසි වැලැක්වීම, සූදානම්වීම සහ ඔරොත්තුදීමේ හැකියාව සඳහා ජාතික ආයෝජනයකට සැලැස්ම සකස් කරන ලදී (WHO අරමුදල්).

- ඇතුල්වීමේ ස්ථානවල මහජන සෞඛ්‍ය පියවර සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි යාවත්කාලීන කරන ලදී (WHO අරමුදල්).

- IHR හැකියාවන් ශක්තිමත් කිරීම සඳහා පාර්ශවකරුවන්ගේ ඒකකවල ඉහල මට්ටමේ අධිකාරීන් සමග උපදේශක රැස්වීම් පවත්වන ලදී (ලෝක බැංකු ආධාර).
- පාර්ශවකරුවන් සඳහා රාජ්‍ය පාර්ශව වාර්ෂික වාර්තාකරණ මෙවලම් (State Party Annual Reporting Tool SPAR) සම්පූර්ණ කරමින් උපදේශක රැස්වීමක් පවත්වන ලදී (WHO අරමුදල්).

- අදාල පාර්ශවකරුවන් සඳහා සෞඛ්‍ය සුරක්ෂිතතාව සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්මේ (NAPHS) ප්‍රගතිය ඇගයීමට උපදේශක රැස්වීමක් පවත්වන ලදී (WHO අරමුදල්).

- සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ජාත්‍යන්තර සංක්‍රමණ සංවිධානය (IOM) හා එක්ව නේවාසික වීසා අයදුම්කරුවන්ගේ අභ්‍යන්තර සෞඛ්‍ය ඇගයීමක් සිදු කර මැලේරියාව, බරවා රෝගය, ක්ෂය රෝගය සහ HIV සඳහා ඔවුන්ව පරීක්ෂා කරන ලදී.

2.12 දේශීය වෛද්‍ය අංශය

- **ප්‍රතිපත්ති සම්පාදනය, අණ පනත් සහ නීති සම්බන්ධ කටයුතු**

  - පෞද්ගලික ආයුර්වේද ආරෝග්‍යශාලා, බෙහෙත් ශාලා සහ ආයුර්වේද ස්වස්ථ සංරක්ෂණ මධ්‍යස්ථාන අධීක්ෂණය හා නියාමන කටයුතු සඳහා වූ නියෝග කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇත.

  - පාරම්පරික වෛද්‍යවරුන්ට අදාළ හෙළ වෙද ගෙවල්, වෙදගම යන ව්‍යාපෘති වල අදාළ කටයුතු සඳහා උපදෙස් ලබා දීම හා වෙදගමට අදාළ ඉඩම් බෙදාදීමට අදාළ අත්පත් යෝජනාව සංශෝධනය කිරීම.

- **දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයට අදාළව විවිධ රටවල් අතර ඇති කර ගත් අවබෝධතා ගිවිසුම්**

  - ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර දේශීය වෛද්‍ය ක්‍රම සහ හෝමියෝපති ක්ෂේත්‍රයේ සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම සඳහා දෙරට අතර අවශ්‍ය සංශෝධනයන් හා අදහස් හුවමාරු වෙමින් පවතී.

  - ශ්‍රී ලංකාව සහ භූතානය අතර දේශීය වෛද්‍ය ක්‍රමය පිළිබඳ අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම සඳහා දෙරට අතර අවශ්‍ය සංශෝධනයන් සඳහා අදහස් හුවමාරු වෙමින් පවති.

  - ශ්‍රී ලංකාව සහ බංගලාදේශය අතර දේශීය වෛද්‍ය ක්‍රමය පිළිබඳ අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම සඳහා දෙරට අතර අවශ්‍ය අදහස් හුවමාරු වෙමින් පවතී.

- **බිම්ස්ටෙක් සමඟ සහයෝගීතාව (Cooperation with BIMSTEC)**

  - පාරම්පරික වෛද්‍ය ක්‍රම පිළිබඳ බිම්ස්ටෙක් කාර්ය සාධක බලකායේ සත්වන සැසිය (Seventh BIMSTEC Task Force on Traditional Medicine) ගරු සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් 2025 නොවැම්බර් මස 26 සහ 27 දෙදින ශ්‍රී ලංකාවේදී පවත්වන ලදී. ශ්‍රී ලංකාව මෙහි සත්කාරකත්වය දරණ ලද

අතර මේ සඳහා බිම්ස්ටෙක් ලේකම් කාර්යාලය, භූතාන් රාජධානිය, ඉන්දියා ජනරජය මියන්මාර සංගම ජනරජය, නේපාලය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ තායිලන්ත රාජධානිය යන රටවල නියෝජිතයින්, මෙන්ම සෞඛ්‍ය හා ජනමාධ්‍ය ආමාත්‍යාංශයේ සහ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහභාගී විය. මෙම රැස්වීමේදී බිම්ස්ටෙක් කලාපයේ සම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාව සංවර්ධනය කිරීම සඳහා සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම පිළිබඳ සමාලෝචනය කරන ලදී. එහිදී බිම්ස්ටෙක් සම්ප්‍රදායික වෛද්‍ය ද්වාරයක් (Portal) සංවර්ධනය කිරීමේ ප්‍රගතිය, කොවිඩ්-19 සහ දියවැඩියාව සඳහා භාවිතා වන සම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම පිළිබඳ පර්යේෂණ, පාඨමාලා සමාලෝචනය කිරීම සහ පාරම්පරික වෛද්‍ය ක්‍රමය සඳහා මධ්‍යස්ථානයක් (Centre of Excellence) ස්ථාපිත කිරීම සහ සම්ප්‍රදායික වෛද්‍ය දැනුම, ජාන සම්පත් සහ බුද්ධිමය දේපළ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ කරුණු පිළිබඳ විශේෂ අවධානය යොමු කර ඇත.

- පාරම්පරික වෛද්‍ය දැනුම (TMK), ජාන සම්පත් (GR) සහ බුද්ධිමය දේපළ අයිතිවාසිකම් (IPR) පිළිබඳ දෙවැනි බිම්ස්ටෙක් සමුළුව සහ නෝඩල් කණ්ඩායම් රැස්වීම (2nd Conference on Traditional Medicine Knowledge, Genetic resources and International Property Rights and the Nodal Group Meeting back to back with the conference) 2025 අගෝස්තු 27 වන දින මාර්ගගත ක්‍රමය ඔස්සේ පවත්වන ලදී. මෙහිදී රටවල් අතර පාරම්පරික වෛද්‍ය දැනුම, ජාන සම්පත් සහ බුද්ධිමය දේපළ අයිතිවාසිකම් හුවමාරු කර ගන්නා ආකාරය පිළිබඳ සාකච්ඡා විය.

➢ **අයවැය ප්‍රතිපාදන මත සිදු කළ සංවර්ධන වැඩසටහන්/ව්‍යාපෘති**

(i) සංරක්ෂණ සහා සවිබල ගැන්වීම

පාරම්පරික වෛද්‍ය ක්‍රම සංරක්ෂණය කරමින් පාරම්පරික වෛද්‍යවරයාගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම හා ස්වකීය වෛද්‍ය වෘත්තියේ අනන්‍යතාවය සුරකිමින් පාරම්පරික වෛද්‍ය ක්‍රමයේ ප්‍රගමනයට පාරම්පරික වෛද්‍යවරුන් දායක කර ගැනීමත් අරමුණු කර ගනිමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ආයුර්වේද සංරක්ෂණ සහා සවිබල ගැන්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

2025 වර්ෂය සඳහා රු.මි.30 ක ප්‍රතිපාදන මේ සඳහා වෙන්ව තිබූ අතර ඒ යටතේ සංරක්ෂණ සහා සාමාජිකයින් දැනුවත් කිරීම් හා සවිබලගැන්වීමේ කටයුතු සිදු කිරීම, ඖෂධ නිෂ්පාදනය ප්‍රවර්ධනය සඳහා කුඩා පරිමාණ ඖෂධ නිෂ්පාදන යන්ත්‍ර ලබාදීම, පුස්තකාල සේවා පහසුකම් ප්‍රවර්ධනය කිරීම සහ ඖෂධ නිෂ්පාදනයට අවශ්‍ය ඔසු පැල සම්පාදනය සහ කාර්යයන් සඳහා මෙම ප්‍රතිපාදන යොදවන ලදී.

භෞතික හා මූල්‍ය ප්‍රගතිය පහත දැක්වේ.

ක්‍රියාකාරකම	ප්‍රතිපාදන (රු.මි)	ඉලක්කය	සිදු කළ සංඛ්‍යාව (භෞතික ප්‍රගතිය)	මූල්‍ය ප්‍රගතිය (රු.මි)
දැනුවත් කිරීමේ සහ සවිබල ගැන්වීමේ වැඩසටහන්	0.372	වැඩසටහන් 29	යාපනය, මන්නාරම, මොණරාගල, බදුල්ල, කොළඹ, ගම්පහ, ත්‍රිකුණාමලය, ගාල්ල හා	0.372 (100%)

ක්‍රියාකාරකම	ප්‍රතිපාදන (රු.මී)	ඉලක්කය	සිදු කළ සංඛ්‍යාව (භෞතික ප්‍රගතිය)	මූල්‍ය ප්‍රගතිය (රු.මී)
			හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් (26) හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන් (3)ක ආයුර්වේද සංරක්ෂණ සභාවන්හි ලියාපදිංචි වෛද්‍යවරුන් හා ලියාපදිංචි වෛද්‍ය ශිෂ්‍යයින් 1,076 ක් ඉලක්ක කර ගනිමින් දැනුවත් කිරීමේ හා සවිබල ගැන්වීමේ වැඩසටහන් පවත්වා ඇත.	
සංරක්ෂණ සහා පුස්තකාල සඳහා පහසුකම් සැපයීම	0.299	7	පලුගස්වැව, වීරකැටිය, මිල්ලනිය, එරාවුර් පත්තු, වෙන්කලඩි, දික්වැල්ල, මධ්‍යම නුවරගම් පළාත, තඹලගමුව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි ඇති සංරක්ෂණ සහා සාමාජිකයන්ගේ පරිහරණය වෙනුවෙන් පුස්තකාලයන්ට අවශ්‍ය පාරම්පරික වෛද්‍ය ක්‍රම සබැඳි පොත් අල්මාරි ලබා දීම සිදුකර ඇත.	0.299 (100%)
කුඩා ඖෂධ නිෂ්පාදන යන්ත්‍ර ලබා දීම	1.415	7	වලිකාමම් නැගෙනහිර-කෝපායි, බුත්තල, වලිකාමම් දකුණ, උඩුවිල්-වුන්නාකම්, තෙන්මාරච්චි-වාවකච්චේරි, ත්‍රිකුණාමලය සහ සියඹලාණ්ඩුව යන ප්‍රාදේශීය කාර්යාලයන්හි සංරක්ෂණ සහා සාමාජිකයන්ගේ පොදු පරිහරණය සඳහා යුෂ/තෙල් නිස්සාරණය කිරීමේ යන්ත්‍ර (3), ඖෂධ ඇඹරුම්/කුඩු කිරීමේ යන්ත්‍ර (6), සීලර් යන්ත්‍රයක් සහ අත්	1.376 (96%)

ක්‍රියාකාරකම	ප්‍රතිපාදන (රු.මී)	ඉලක්කය	සිදු කළ සංඛ්‍යාව (භෞතික ප්‍රගතිය)	මූල්‍ය ප්‍රගතිය (රු.මී)
			බෙහෙත් කුඩු /ගුලි සාදන යන්ත්‍රයක් සපයා දී ඇත.	
පාරම්පරික වෛද්‍ය සායනයන් පැවැත්වීම	0.600	20	අම්පාර, ගාල්ල, රත්නපුර, මඩකලපුව, මාතර, ගාල්ල හා කොළඹ දිස්ත්‍රික්කයන්වල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 20ක පාරම්පරික වෛද්‍යවරුන්ගේ සම්පත් දායකත්වයෙන් වෛද්‍ය සායන පවත්වා ඇත. මෙම සායන තුළින් 1532 දෙනෙකු සඳහා ප්‍රතිකාර සිදුකර ඇත.	0.599 (99%)
ඔසු වගාව සඳහා පහසුකම් සැපයීම.	0.300	23	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 23ක පාරම්පරික වෛද්‍යවරුන්ගේ ඖෂධ නිෂ්පාදන අවශ්‍යතාවය වෙනුවෙන් ඔසු වගාව සඳහා අවශ්‍ය පහසුකම් සම්පාදනය කර ඇත.	0.300 (100%)
එකතුව	**2.986**			**2.947 (98%)**

(ii) පෝෂණ මන්දිර ස්ථාපිත කිරීම

වස විසෙන් තොර පෝෂණීය දේශීය ආහාර ජනතාව අතර ප්‍රචලිත කිරීම තුළින් බෝ නොවන රෝග වැළැක්වීමේ අරමුණින් පෝෂණ මන්දිර වැඩසටහන ක්‍රියාත්මක වේ. ඒ අනුව 2025 වර්ෂය සඳහා රු.මී.2.0 ක ප්‍රතිපාදන මේ සඳහා වෙන්ව ඇති අතර එම ප්‍රතිපාදන උපයෝජනය කරමින් අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ 2024 වර්ෂයේ ඉදි කරන ලද පෝෂණ මන්දිරයේ පහසුකම් ප්‍රවර්ධනය සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 10ක් සඳහා පෝෂණීය ආහාර ප්‍රවර්ධනය සඳහා කැඳ කරත්ත සැපයීම සිදු කොට ඇත. මූල්‍ය ප්‍රගතිය රු.මී.1.959 කි.

(iii) හෝමියෝපති ක්‍රම සංවර්ධනය

රජයේ හෝමියෝපති රෝහල සංවර්ධනය සහ ඒ ආශ්‍රිත පහසුකම් ප්‍රවර්ධනය සඳහා රු.මී.3.0 ක ප්‍රතිපාදන 2025 වර්ෂය සඳහා වෙන්ව ඇත. ඒ යටතේ රෝහලේ රසායනාගාර ගොඩනැගිල්ලේ අළුත්වැඩියා කටයුතු, රෝහල් තාප්පය අළුත්වැඩියාව, ආරක්ෂක කුටිය ඉදිකිරීම ඇතුළු අලුත්වැඩියා කටයුතු සිදු කර ඇත. එමෙන්ම

රෝහලේ රසායනාගාර පර්යේෂණ සේවාවන් ස්ථාපිත කිරීමට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් රු.මි.6.0 ක ප්‍රතිපාදන වෙන් වී තිබූ නමුත් රෝහලේ දැනට පවතින ධාරිතාවන් සහ පවතින මානව සම්පත් පිළිබඳවද සැලකිල්ලට ගනිමින් පෙර වර්ෂයේදී මිලදී ගත් රසායනාගාර උපකරණ මත රසායනාගාර සේවාවන් ආරම්භ කිරීමට තීරණය කළ අතර මෙම ප්‍රතිපාදන හෝමියෝපති වෛද්‍ය සභාව යටතේ ක්‍රියාත්මක සායන 14ක් සඳහා අවශ්‍ය පරිගණක හා උපාංග සහ අනෙකුත් පහසුකම් සැපයීම සඳහා යොදවන ලදී. මෙහි සමස්ථ මූල්‍යමය ප්‍රගතිය රු.මි. 9.277 (97.6%).

(iv) ආයුර්වේද සමඟ සහයෝගී සත්කාර ක්‍රියාත්මක කිරීම

ඒකාබද්ධ වෛද්‍ය ප්‍රතිකාර හඳුන්වාදීම සඳහා වූ රජය පිළිගත් වැඩපිළිවෙල අනුව ඒ සඳහා අදාළ රෝහල් සූදානම් කිරීම වෙනුවෙන් රු.මි.5.0ක ප්‍රතිපාදනයක් 2025 අයවැය මඟින් වෙන් කර තිබුණි. මේ යටතේ පොතුවිල් මූලික රෝහලේ තෝරාගත් කොටසක සංචාරක සුව සත්කාර සේවාවන් ආරම්භ කිරීමට අදාළ අළුත්වැඩියා කටයුතු සිදු කරන ලදී. මූල්‍යමය ප්‍රගතිය රු.මි.4.875 (97.51) කි.

(v) ඔසු දිරිය ව්‍යාපෘතිය

දේශීය ඖෂධ නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය විදේශයන්ගෙන් ආනයනය කිරීමට වැයවන වාර්ෂික විදේශ විනිමය අවම කර ගනිමින් රට තුළ ගුණාත්මක ඖෂධ අමුද්‍රව්‍ය සුලභ කිරීමටත්, භාවිතයට නොගෙන ඇති ඉඩම් ඔසු වගාව සඳහා ඵලදායීව භාවිතා කරමින් සමාජ, ආර්ථික සංවර්ධනයට දායක කිරීමත් අරමුණු කර ගනිමින් ‘‘ඔසු වගා’’ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. ඔසු වගාව ප්‍රවර්ධනය සඳහා සැලසුම් කරන ලද නියමු ව්‍යාපෘතියක් වන මෙහි මුළු ව්‍යාපෘති පිරිවැය රු.මි.20.0ක් වන අතර වර්ෂය අවසානයේදී 90% වඩා වැඩි භෞතික හා මූල්‍යමය ප්‍රගතියක් අත් පත් කර ගැනීමට සමත්ව ඇත.

‘‘ඔසු දිරිය’’ ව්‍යාපෘතිය යටතේ 2025 වර්ෂයේ සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් වල ප්‍රගතිය පහත දක්වා ඇත.

අංකය	ප්‍රධාන ක්‍රියාකාරකම්	ප්‍රතිපාදන (රු.මී.)	2025.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු.මී.)	භෞතික ප්‍රගතිය	%
01.	ඔසු උයන්හි පැල නිෂ්පාදනය වැඩි කිරීමට අදාළ යටිතල පහසුකම් සංවර්ධනය	2.00	1.982	පින්නදූව ඔසු උයනෙහි ආරක්ෂිත ගෘහ 08 නවීකරණය කර ඇත.	100
02.	වගාවට අවශ්‍ය කෘෂි උපකරණ මිලදී ගැනීම	1.00	0.961	පින්නදූව හා ගිරාදුරුකෝට්ටේ ඔසු උයන් සඳහා අවශ්‍ය කෘෂි උපකරණ මිලදී ගෙන ඇත.	96
03.	ඔසු වගාව හා පසු අස්වනු තාක්ෂණ සම්බන්ධ පුහුණු කිරීම්	1.00	0.982	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ සේවය කරන සංවර්ධන නිලධාරීන් හා හඳුනාගත් ගොවීන් හට වගාව සම්බන්ධව පුහුණුව ලබා	98

				දී ඇත.	
04.	ඔසු පැල මිලදී ගැනීම් සහ මෙහෙයුම් කටයුතු	4.50	3.780	- මාතර දිස්ත්‍රික්කය තුළ හීං අරත්ත පැල 25,000ක් නිෂ්පාදනය කර ඇත. - ගිරාදුරුකෝට්ටේ ඔසු උයනෙහි ජල සම්පාදන පද්ධතිය ස්ථාපිත කර ඇත. - පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තු ඉල්ලීම් පරිදි වගාව සඳහා ඔසු පැල ලබා දීම සිදු කර ඇත. - ප්‍රජා සත්කාරයක් ලෙස පාසල් කිහිපයකට ඔසු උයන් සඳහා පැල ලබා දීම සිදුකර ඇත.	
	එකතුව	**8.50**	**7.705**		

- **සිදු කරන ලද සෙසු වැඩසටහන්**

  - **බෝ නොවන රෝග පාලනය සහ වැළැක්වීම සඳහා දේශීය වෛද්‍ය මැදිහත්වීම**

    බෝ නොවන රෝග වැළැක්වීම සහ පාලනය සඳහා දේශීය වෛද්‍ය දැනුම හා එහි ජීවන දර්ශනය ප්‍රායෝගිකව භාවිතා කිරීම පිණිස ජනතාව දැනුවත් කිරීම සහ පෙළඹවීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. 2025 වර්ෂය වෙනුවෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් රු.මි. 4.013ක ප්‍රතිපාදනයක් මේ සඳහා ලබා දී ඇත. එහි මූල්‍යමය ප්‍රගතිය රු.මි.3.99කි.

    ඒ යටතේ පාරම්පරික ආහාර වට්ටෝරු හා ආහාර සංස්කරණ ක්‍රම ජනතාවට හඳුන්වාදීම, මහජන සංකේන්ද්‍රීය දේශීය ආහාර හා පෝෂණය පිළිබඳ දැනුම හා භාවිතයෙන් වැඩිදියුණු කිරීම, මන්දපෝෂණ ගැටළුව මහහරවා ගැනීම සඳහා දේශීය ක්‍රමවල යථාභූත අත්දැකීම් බෙදා ගැනීම සහ යෝග අභ්‍යාස ජනගත කිරීම යන ක්‍රියාකාරකම් සාර්ථකව සිදු කරන ලදී.

(ග) 2018 වර්ෂයේදී මූල්‍ය නොවන වත්කම්වල පිරිවැය රු. මිලියන 46,940.73 කින් අඩුවෙන් දක්වා තිබුණු අතර ඉන් රු.මිලියන 7,102.99 ක් 2019 වර්ෂයේදී අළුතින් ඉඩම් අත්පත් කර ගැනීමක් ලෙස දක්වා තිබුණි.

(ඝ) 2018 වර්ෂයේදී මූලධන වත්කම් අත්පත් කර ගැනීම් රු.මිලියන 14,793.13 කින් අඩුවෙන් දැක්වීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට මූලධන වත්කම් ඊට සමාන අගයකින් අඩුවෙන් දක්වා තිබුණි.

(ච) භාණ්ඩාගාර මූල්‍ය ප්‍රකාශන අනුව 2019 වර්ෂය තුළදී අත්පත් කර ගෙන තිබුණු ගොඩනැගිලි හා ඉදිකිරීම් පිරිවැය රු.මිලියන 6,501.94 ක් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයට ඇතුළත් කර නොතිබුණු අතර 2019 වර්ෂය තුළදී අත්පත් කර ගෙන තිබුණු වත්කම්වල පිරිවැය රු.මිලියන 2,967.27 ක් වැඩියෙන් ගිණුම් ගත කිරීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඡ) භාණ්ඩාගාරය විසින් පවත්වාගෙන යනු ලබන එස්ඒ 80 මූල්‍ය නොවන වත්කම් ගිණුම් මාසික සාරාංශයට හා එස්ඒ 82 සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාවට අනුව 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම්වල පිරිවැයෙහි පැවති රු.මිලියන 19,789.44 ක වෙනසට හේතු සඳහා අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි.

(ජ) 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව 2021 ජනවාරි 01 දිනට දේපළ, පිරියත හා උපකරණවල පිරිවැය රු.මිලියන 192,229.15 ක් වූවද, භාණ්ඩාගාරය විසින් පවත්වා තිබුණු මූල්‍ය නොවන වත්කම් ගිණුම් මාසික සාරාංශය (SA 80) හා සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාව (SA 82) ප්‍රකාරව එම අගය පිළිවෙලින් රු.මිලියන 172,439.71 ක් හා රු.මිලියන 184,327.77 ක් වූයෙන් පැවති පිළිවෙලින් රු.මිලියන 19,789.44 ක හා රු.මිලියන 7,901.38 ක වෙනස්කම්වලට හේතු අනාවරණය නොකෙරුණි.

(ට) 2021 වර්ෂයේ වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශය (ACA 2 (i) ආකෘතිය) හා භාණ්ඩාගාරය විසින් පවත්වා තිබුණු මාසික වියදම් සාරාංශය (SA 10) ප්‍රකාරව, සමාලෝචිත වර්ෂයේදී මූලධන වත්කම් අත්පත් කර ගැනීම් හා භාණ්ඩාගාරය විසින් පවත්වා තිබුණු සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාව (SA 82) ප්‍රකාරව එම අගයන් අතර වූ රු.මිලියන 16,877.89 ක වෙනස සඳහා හේතු අනාවරණය නොවුණි.

(ඨ) 2010 වර්ෂයේ සිට 2020 දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කර තිබුණු විදේශාධාර ව්‍යාපෘති 54 ක් යටතේ දරන ලද රු.මිලියන 7,603.09 ක වියදම තුළ ඇතුළත් මූල්‍ය නොවන වත්කම් අත්පත් කර ගැනීම් හා සංවර්ධනය සඳහා දරන ලද වියදම් මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඩ) 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය අනුව හා භාණ්ඩාගාර සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාව (SA 82) අනුව එදිනට මූල්‍ය නොවන වත්කම්වල අගය හා 2022 වර්ෂයේ භාණ්ඩාගාර සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාව (SA 82) අනුව 2022 ජනවාරි 01 දිනට එම අගය අතර රු. මිලියන 5,244.56 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර මෙම වෙනසට හේතුව විගණනයේදී පැහැදිලි නොකෙරුණි.

(ඪ) 2022 වර්ෂයේ වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශය (ACA 2 (i) ආකෘතිය) හා භාණ්ඩාගාර මුද්‍රිත සටහන් SA 10 ට අනුව, 2022 වර්ෂයේදී මූලධන වත්කම් අත්පත් කර ගැනීම් හා භාණ්ඩාගාරයේ සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාව (SA 82) අනුව එම අගය අතර රු. මිලියන 11,423.16 ක වෙනසක් පැවතුණි.

(ණ) විගණනය විසින් ඉල්ලුම් කළ තොරතුරු ඇතැම් ආයතන විසින් ලබාදී නොතිබුණි. අමාත්‍යාංශය යටතේ පවතින රෝහල්, අනෙකුත් සෞඛ්‍ය ආයතන, පුහුණු ආයතන හා අංශ 11 ක 2017, 2018, 2019 යන වර්ෂ වලට අදාළව එකතුව රු. මිලියන 2.66 ක් පිරිවැය වූ භාණ්ඩ හා බදුල්ල පළාත් මහ රෝහලට අදාළ පිරිවැය සඳහන් නොකළ භාණ්ඩ පොත් වලින් කපා හැරීමට කටයුතු කර තිබුණි. නමුත් එම අපහරණය කළ භාණ්ඩවල පිරිවැය අමාත්‍යාංශ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් වලින් ඉවත් කලේද යන්න විගණනය වෙත තහවුරු කර නොතිබුණි. එසේම ඇතැම් රෝහල්වල අපහරණ කටයුතු අවසන් කර නොතිබුණු අවස්ථාද, පත්කරන ලද අපහරණ මණ්ඩල විසින් අදාළ අපහරණ ක්‍රියාවලිය අවසන් කර නොතිබුණු අවස්ථාද වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන්ට අදාළ ඌනතාවයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 757(2) ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අවස්ථාද නිරීක්ෂණය විය.

(ත) විවිධ දේශීය, විදේශීය ආයතන, සංවිධාන හා පුද්ගලයින් විසින් අමාත්‍යාංශයට හා ඒ යටතේ පවතින ආයතන/රෝහල් හා අංශ 31 ක් වෙත 2020 හා 2021 වර්ෂ වලදී ලැබී තිබුණු රු.මිලියන 2,588.30 වටිනා භාණ්ඩ වටිනාකම් පිළිබඳ තොරතුරු ඇතුළත් නොවූ අවස්ථා 2057 කට අදාළ භාණ්ඩ විධිමත් පරිදි ලේඛනගත කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

(ථ) 2023 දෙසැම්බර් 31දිනට පිළියෙල කර තිබුණු මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය අනුව 2023 ජනවාරි 01 දිනට දේපළ, පිරියත හා උපකරණවල අගය රු. මිලියන 195,221.42 ක් විය. නමුත් භාණ්ඩාගාර මුද්‍රිත, මූල්‍ය නොවන වත්කම් ගිණුම් මාසික සාරාංශය (SA 80) හි 2023 ජනවාරි 01දිනට වූ ආරම්භක ශේෂය රු.මිලියන 200,118.27 ක් විය. ඒ අනුව රු. මිලියන 4,896.85 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ද) 2022 වර්ෂයේ සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාව (SA 82) අනුව 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම්වල අගය රු. මිලියන 200,118.27 ක් වූ අතර 2023 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු එම වාර්තාවේ 2023 ජනවාරි 01 දිනට එම

අගය රු.මිලියන 195,221.42 ක් විය. මේ අනුව රු.මිලියන 4,896.85 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර මෙම වෙනසට හේතු පැහැදිලි නොකෙරුණි.

(ධ) 2023 වර්ෂයේ වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශය (ACA 2(i) ආකෘතිය) හා භාණ්ඩාගාර මුද්‍රිත සටහන් SA 10 ට අනුව, 2023 වර්ෂයේදී මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වියදම රු.මිලියන 11,605.50 ක් වූවද භාණ්ඩාගාරයේ සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාව (SA 82) අනුව එම අගය රු. මිලියන 3,698.37 ක් වූයෙන් වත්කම්වල පිරිවැය රු. මිලියන 7,907.13 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(න) මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම රු. මිලියන 204,292.96 ක් වූවද විගණනය වෙත ඉදිරිපත් කරන ලද සෞඛ්‍ය අමාත්‍යාංශය හා ඊට අයත් ආයතන 63 ක 2023 දෙසැම්බර් 31 දිනට පැවති මූල්‍ය නොවන වත්කම් පිළිබඳ තොරතුරු දැක්වෙන පරිගණක මෘදු පිටපත් අනුව එම වත්කම්වල වටිනාකම රු. මිලියන 215,870.86 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව රු. මිලියන 11,577.90 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ප) 2018 වර්ෂයෙන් පසු පේරාදෙණිය රෝහල් පරිශ්‍රයේ වකුගඩු ප්‍රතිකාර ඒකකයක් සහ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ප්‍රතිපාදන යටතේ මහල් 03 කින් සමන්විත ශල්‍ය වාට්ටු සංකීර්ණයක් ඉදිකර තිබුණද මෙම ගොඩනැගිලිවල වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ඵ) කොවිඩ් 19 හදිසි ප්‍රතිචාර හා සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ තෙවන අතිරේක මූල්‍යකරණ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රතිපාදන මඟින් 2022 වර්ෂයේදී පිරිවැය රු. මිලියන 173.13 ක්වූ ලීටර් 6800 හිස් ඔක්සිජන් සිලින්ඩර් (Oxygen Cylinders) 3764ක් මිලදී ගෙන රෝහල් වෙත ලබා දී තිබුණද එම වත්කම්වල පිරිවැය අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

1.6.2 අග්‍රිම ශේෂය

1997 වර්ෂයේ සිට නිරවුල් නොකර ඉදිරියට ගෙන එන, මඩකළපුව ශික්ෂණ රෝහලට අයත් රු. 362,702 ක අග්‍රිම ශේෂය 2021 වර්ෂයේ නොපියවූ අග්‍රිම ශේෂයක් ලෙස අග්‍රිම ගිණුමට මාරු කර තිබුණු අතර එම ශේෂය සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කර නොතිබුණි.

1.6.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) මුළු පිරිවැය රු.මිලියන 276,180.75 ක් වූ මූල්‍ය නොවන වත්කම් පිළිබඳව විස්තරාත්මක උපලේඛන, භාණ්ඩ සමීක්ෂණ වාර්තා සහ CIGAS වැඩසටහන අනුව දැක්වෙන වත්කම් පිළිබඳ තොරතුරු, ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති වත්කම් ශේෂයට ගැලපීම් කර තිබුණු රු.මිලියන 9,673.61 ක මුදලට, සමාලෝචිත වර්ෂය තුළදී වත්කම් මිලදීගැනීම් ලෙස ගිණුම්ගත කර තිබුණු රු. මිලියන 21,808.16 කට අදාළව මෙන්ම රු.

මිලියන 5,818.22 ක වත්කම් අපහරණයන් සහ රු.මිලියන 1,158.08 ක වත්කම් මාරු කිරීම්වලට අදාළ විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකෙරුණු බැවින් එම අගයන් සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. ස්ථාන මාරුවී ගිය, වැඩ තහනමට ලක් වූ, සේවය අතහැර ගිය සහ විශ්‍රාම ගිය නිලධාරීන් 68 දෙනෙකුගෙන් අයවීමට තිබුණු රු. මිලියන 13.85 කට අදාළ දේපල/ වාහන ණය ලිපිගොනු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. මීට අමතරව විවිධ කාරණා සම්බන්ධයෙන් තොරතුරු කැඳවීම් ලිපි 37 2025 අප්‍රේල් 10 දින වනවිටත් තොරතුරු ඉදිරිපත් නොකිරීම හෝ සම්පූර්ණ තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් අදාළ ක්ෂේත්‍ර නිසිලෙස විගණනය කළ නොහැකි විය. ඇතැම් තොරතුරු කැඳවීමේ ලිපි නිකුත්කර මාස 38 කට වඩා වැඩි කාලයක් ගතවී තිබුණි.

(ආ) 2018 මැයි 04 දින ශ්‍රී ලංකා රජය වෙනුවෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ලේකම් සහ International Organization for Migration, Mission in Sri Lanka ආයතනය සමඟ අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම අනුව ආරම්භ කරන ලද Health Assessment program for Resident Visa Applicants to Sri Lanka ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත සඳහන් තොරතුරු මෙම වාර්තාවේ දිනය දක්වා විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(i) 2001 ජූනි මාසයේදී ශ්‍රී ලංකා රජය සහ International Organization for Migration (IOM) අතර අත්සන් කරන ලද සහයෝගිතා ගිවිසුම, 2018 මැයි 04 දින අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම සංශෝධනය කිරීම සඳහා ලබාගත් අමාත්‍ය මණ්ඩල අනුමැතීන් වලට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ හා අමාත්‍ය මණ්ඩල අනුමැතීන් සහ අවබෝධතා ගිවිසුමේ 2(l) වගන්තිය අනුව සෞඛ්‍ය අමාත්‍යාංශය IOM ආයතනය සමඟ සම්බන්ධීකරණයෙන් සිදුකළ යුතු ඒකාබද්ධ තක්සේරු කිරීම් සිදු කර තිබේද යන්න හා නිබෙනම් එකී තක්සේරු වාර්තාවල සහතික කළ පිටපත් යන තොරතුරු.

(ii) අවබෝධතා ගිවිසුමේ 3(d) වගන්තිය අනුව පුහුණුව සහ උපදේශනය තුළින් වැඩසටහනේ තාක්ෂණික හා මෙහෙයුම් අංග ක්‍රියාත්මක කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ධාරිතාවය ගොඩනැගීම සිදුකළ යුතු බව දැක්වේ. මේ අනුව 2018 වර්ෂයේ සිට 2026 මාර්තු දක්වා සිදුකරන ලද කාර්යයන් පිළිබඳ තොරතුරු.

(iii) මෙම වැඩසටහනේ 2018 වර්ෂයේ සිට 2026 මාර්තු දක්වා සේවයේ යොදවන ලද සියළුම සෞඛ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ, නම සහ තනතුර, ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ, ශ්‍රී ලංකා හෙද සභාවේ ලියාපදිංචි අංකය සහ සේවය කළ කාලපරිච්ඡේදය යන තොරතුරු.

(iv) අවබෝධතා ගිවිසුමේ 3(h) වගන්තිය අනුව ස්ථිර සම්බන්ධීකරණ මධ්‍යස්ථානයක් පිහිටුවීමට සහ එහි පත් කරන ලද කාර්ය මණ්ඩලයේ ධාරිතාව ගොඩනැගීමට සෞඛ්‍ය අමාත්‍යාංශයට සහය විය යුතු බව දැක්වේ. මේ අනුව 2018 වර්ෂයේ සිට 2026 මාර්තු දක්වා සිදුකරන ලද කාර්යයන් පිළිබඳ තොරතුරු.

(v) අවබෝධතා ගිවිසුමේ 3(i) වගන්තිය අනුව මෙම වැඩසටහන පිළිබඳව සිදුකරනු ලබන ඒකාබද්ධ තක්සේරු මත පදනම්ව මෙම කාර්යය සෞඛ්‍ය අමාත්‍යාංශයට පැවරිය යුතු බව දැක්වේ. මේ සම්බන්ධයෙන්, ඒකාබද්ධ තක්සේරු සිදුකර තිබෙද යන්න හා තිබේ නම් එම තක්සේරු වාර්තාවල සහතික කළ පිටපත්, මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා IOM ආයතනයට වැයවූ පිරිවැය හඳුනාගෙන තිබෙද යන්න හා තිබේ නම් ඒ පිළිබඳ ලිඛිත වාර්තා, 2018 වර්ෂයේ සිට 2026 මාර්තු දක්වා මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම තුළින් වැඩසටහන හා රජය උපයා ඇති ආදායම් හා දරන ලද මෙහෙයුම් වියදම් පිළිබඳ තොරතුරු අමාත්‍යාංශය සතුව තිබෙද යන්න හා තිබේ නම් එම තොරතුරු සහ මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා IOM ආයතනයට වැයවූ පිරිවැය ආවරණය වී ඇති/ නැති බවට ප්‍රමාණවත් තොරතුරු අමාත්‍යාංශය සතුව පවතීද යන්න හා පවතී නම් එම තොරතුරු.

(vi) 2018 වර්ෂයේ සිට 2026 මාර්තු දක්වා සේවා ගාස්තු සංශෝධනය කර තිබෙද යන්න හා එසේ ගාස්තු සංශෝධනයක් සිදු නොකලේ නම් ඊට බලපාන ලද හේතූන් කවරේද යන්න, වැඩසටහන විසින් සේවා ගාස්තුව අයකරනු ලබන මුදල් ඒකකය, වැඩසටහන විසින් අයකරනු ලබන සේවා ගාස්තුවෙන් රජයට ගෙවනු ලබන මුදල, ගෙවනු ලබන මුදල් ඒකකය, වැඩසටහන මඟින් සේවා ගාස්තු අයකරන මුදල් ඒකකය හා රජයේ කොටස ගෙවනු ලබන මුදල් ඒකකය එකිනෙකට වෙනස් නම් විනිමය අනුපාතිකය තීරණය කරනු ලබන පදනම කුමක්ද යන්න සහ රටතුළ විදේශ විනිමය ගැටළුවක් තිබියදී සේවා ගාස්තුවෙන් රජයේ කොටස එක්සත් ජනපද ඩොලර් වලින් අයකර නොගැනීමට තුඩුදුන් හේතූන් මොනවාද යන්න පිළිබඳ තොරතුරු.

(vii) මෙම වැඩසටහන සම්බන්ධයෙන් 2019 වර්ෂයේදී සකස් කරන ලද Sri Lanka Inbound Health Assessment Program Technical Instructions සහ 2024 වර්ෂයේදී සිදුකරන ලද සංශෝධිත ලියවිල්ල සඳහා ලැබුණු අනුමැතීන් පිළිබඳ තොරතුරු.

(viii) සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් 2025 දෙසැම්බර් 11 දින "Request for Most Recent Programme Statistics" මැයෙන් International Organization for Migration, Mission in Sri Lanka ආයතනයට යොමුකරන ලද ලිපියට පිළිතුරු ලැබී තිබෙද යන්න හා තිබේ නම් එහි සහතික කළ පිටපතක්.

(ix) ශ්‍රී ලංකා රජය විසින් ක්‍රියාත්මක කළ යුතු මෙම කාර්යය අවබෝධතා ගිවිසුමක් මඟින් බාහිර පාර්ශවයකට 2018 වර්ෂයේදී පවරා ඇත. අවබෝධතා ගිවිසුම අනුව එම ආයතනය විසින් දරන ලද වියදම් ආවරණය කර ගැනීමෙන් පසුව මෙම වැඩසටහන සෞඛ්‍ය අමාත්‍යාංශයට පවරාගත යුතුව තිබුණි. නමුත් වර්ෂ 8 ක පමණ කාලයක් මෙම වැඩසටහන රජයට පවරා නොගෙන ක්‍රියාත්මක වෙමින් පවතී.

මෙම හේතුවෙන් ලබාගත හැකිව තිබුණු සැලකිය යුතු විදේශ විනිමය අගයක් රජයට අහිමි වී ඇති බව නිරීක්ෂණය විය.

1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 110 (1) ප්‍රකාරව සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, පවුල් සෞඛ්‍ය කාර්යාංශය, මැලේරියා මර්ධන ව්‍යාපාරය හා ජාතික රුධිර පාරවිලයන ආයතනය විසින් හානි හා පාඩු ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.1(අ)(i)	වැරදි නිවැරදි කර 2025 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.	1.6.1 (ග)
1.6.1(අ)(ii)	වැරදි නිවැරදි කර 2025 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.	1.6.1 (ඝ)
1.6.1(අ)(iii)	වැරදි නිවැරදි කර 2025 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.	1.6.1 (ච)
1.6.1(අ) (iv)	චෙනස්කම්වලට හේතු සොයා බලා අවශ්‍ය ගැලපීම් සිදුකර 2025 වර්ෂය සඳහා නිවැරදි මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.	1.6.1 (ඡ)
1.6.1 (අ)(v)	චෙනස්කම්වලට හේතු සොයා බලා අවශ්‍ය ගැලපීම් සිදුකර 2025 වර්ෂය සඳහා නිවැරදි මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.	1.6.1 (ජ)

1.6.1(අ)**(vi)**	වෙනස්කම්වලට හේතු සොයා බලා අවශ්‍ය ගැලපීම් සිදුකර 2025 වර්ෂය සඳහා නිවැරදි මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.	1.6.1 (ට)
1.6.1(අ)**(viii)**	ව්‍යාපෘති යටතේ අත්පත් කරගත් සියලුම මූල්‍ය නොවන වත්කම් අමාත්‍යාංශයේ හෝ එම වත්කම් ලබාදුන් ආයතනවල හෝ මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම් ගත කළ බව තහවුරු කරන ලිඛිත සාක්ෂි කඩිනමින් විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය.	1.6.1 (ය)
1.6.1(අ)**(ix)**	වෙනස්කම්වලට හේතු සොයා බලා අවශ්‍ය ගැලපීම් සිදුකර 2025 වර්ෂය සඳහා නිවැරදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.	1.6.1 (ඩ)
1.6.1(අ)**(x)**	වෙනස්කම්වලට හේතු සොයා බලා අවශ්‍ය ගැලපීම් සිදුකර 2025 වර්ෂය සඳහා නිවැරදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.	1.6.1 (ඪ)
1.6.1(අ)**(xiv)**	ඉල්ලුම් කර ඇති තොරතුරු සියලුම ආයතන වීසින් ලබාදිය යුතු අතර අපහරණය කළ වත්කම් වලට අදාළ නිවැරදි ගැලපීම් මූල්‍ය ප්‍රකාශනවල සිදුකළ යුතුය. එමෙන්ම සමීක්ෂණ මණ්ඩල වාර්තා ලැබීමෙන් පසු විෂමතා, ඌණතා සහ නැතිවීම් කිසිවක් වෙතොත් මුදල් රෙගුලාසි 757(2) ප්‍රකාරව ක්‍රියා කළ යුතුය.	1.6.1 (ණ)
1.6.1(අ)**(xv)**	සියලුම පරිත්‍යාග නියමිත පරිදි ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය.	1.6.1 (ත)
1.6.1(අ)**(xvi)**	වෙනස්කම්වලට හේතු සොයා බලා අවශ්‍ය ගැලපීම් සිදුකිරීමට කටයුතු කළ යුතුය.	1.6.1 (ථ)
1.6.1(අ)**(xvii)**	වෙනස්කම්වලට හේතු සොයා බලා අවශ්‍ය ගැලපීම් සිදුකිරීමට කටයුතු කළ යුතුය.	1.6.1 (ද)
1.6.1(අ)**(xviii)**	වෙනස්කම්වලට හේතු සොයා බලා අවශ්‍ය ගැලපීම් සිදුකිරීමට කටයුතු කළ යුතුය.	1.6.1 (ධ)

1.6.1(අ)(xix)	වෙනස්කම්වලට හේතු සොයා බලා අවශ්‍ය ගැලපීම් සිදුකිරීමට කටයුතු කළ යුතුය.	1.6.1 (න)
1.6.1(අ)(xx)	වත්කම් තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය.	1.6.1 (ප)
1.6.1(අ)(xxv)	ව්‍යාපෘති යටතේ අත්පත් කරගත් සියලුම මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කළබව තහවුරුවන ලිඛිත සාක්ෂි කඩිනමින් විගණනයට ඉදිරිපත් කළ යුතුය.	1.6.1 (එ)

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

(අ) 2024 වර්ෂයේ ටෙලි නාට්‍ය, චිත්‍රපට හා වාණිජ වැඩසටහන් බද්ද මඟින් ලබා ගත් ආදායම රු. මිලියන 121.4ක් වූ අතර 2025 වර්ෂයේ එය රු. මිලියන 94.15ක් වීමෙන් 2024 වර්ෂයට සාපේක්ෂව සියයට 22.4 කින් ආදායම අඩු වී තිබුණි.

(ආ) පෞද්ගලික ආයතන දෙකකින් අය විය යුතු රු. මිලියන 20ක මුදල වර්ෂ 12 සිට 19 දක්වා කාලයක සිට හිඟව පැවති අතර 2026 මාර්තු 31 දින වනවිටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2012 අගෝස්තු 13 දිනැති අංක 12/1037/37/019-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ප්‍රවෘත්ති වෙබ් අඩවි ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ලියාපදිංචිය සහ වාර්ෂිකව අළුත් කිරීම් සිදු කළ යුතු වුවත් 2024 වර්ෂයේ ලියාපදිංචිය අළුත් නොකළ වෙබ් අඩවි 19ක් සඳහා රු.190,000ක් ද සමාලෝචිත වර්ෂය සඳහා රු.300,000ක් ද අහිමි වී තිබුණි.

(ඈ) 2024 වර්ෂයේ ලියාපදිංචි නව වෙබ් අඩවි ප්‍රමාණය 30ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ දී එය 16ක් පමණක් විය. එලෙස ලියාපදිංචිය සියයට 50කට ආසන්න ප්‍රමාණයකින් අඩු වී තිබුණු අතර ආරක්ෂක අමාත්‍යාංශය යටතේ අවශ්‍ය නිශ්කාෂණ ලැබීමේ ප්‍රමාදය ඊට හේතු වන බවත් වෙබ් අඩවි 24කට නිශ්කාෂණ ලැබීමේ ප්‍රමාදයක් පවතින බවත් නිරීක්ෂණය විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයට අදාළව රු.240,000ක සෘජු ආදායමක් අහිමි වී ඇති බව නිරීක්ෂණය විය.

3.2 වියදම් කළමනාකරණය

මුදල් රෙගුලාසි අංක 50 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් නිවැරදි හා තාත්වික ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි. විස්තර පහත පරිදි වේ.

(අ) සමාලෝචිත වර්ෂයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මඟින් මූලධන වැය විෂයයන් 18 ක් සඳහා සලසා තිබුණු රු. මිලියන 748.50 ක් වූ මුළු ප්‍රතිපාදනයම, මුදල් රෙගුලාසි 66 හා 69 මඟින් වෙනත් වැය විෂයයන් වෙත මාරු කර තිබුණි.

(ආ) මූලධන වැය විෂයයන් 20 ක් සඳහා සලසා ගෙන තිබුණු රු. මිලියන 6,213.50 ක් වූ මුළු ප්‍රතිපාදනයෙන්, සියයට 50ත් සියයට 99 ත් අතර ප්‍රතිශතයකින් මුදල් රෙගුලාසි 66 හා 69 මඟින් වෙනත් වැය විෂයයන් වෙත මාරු කර තිබුණි. තවද මූලධන වැය විෂයයන් 13 ක් සඳහා සලසා ගෙන තිබුණු රු. මිලියන 1,266.50 ක් වූ මූලික ඇස්තමේන්තුව සඳහා මුදල් රෙගුලාසි 66 මඟින් සියයට 113 සිට සියයට 996 දක්වා ප්‍රතිශතයන්ගෙන් එකතුව රු. මිලියන 3,027.22 ක් වැඩි කර ගෙන තිබුණි.

(ඇ) පුනරාවර්තන වැය විෂයයන් 9 ක් හා මූලධන වැය විෂයයන් 47 ක් ඇතුළුව වැය විෂයයන් 56 ක් සඳහා සලසා ගෙන තිබුණු එකතුව රු. මිලියන 11,286.40 ක මූලික ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ඈ) මූලධන වැය විෂයයන් 46 ක් හා පුනරාවර්තන වැය විෂයයන් 47 ක් සඳහා සලසාගෙන තිබුණු රු. මිලියන 28,470.60 ක්වූ මූලික ප්‍රතිපාදනයෙන් රු. මිලියන 1,495.15 ක් වෙනත් වැය විෂයයන්ට මාරු කිරීමෙන් පසුව ඉතිරි රු. මිලියන 26,975.45 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 19,944.84 ක ප්‍රතිපාදන උපයෝජනයට ගෙන නොතිබුණි. එම ඉතිරිවීම් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 50 ත් සියයට 99 ත් අතර ප්‍රතිශතයක් ගෙන තිබුණි.

(ඉ) මූලධන වැය විෂයයන් 3 ක් සඳහා මුදල් රෙගුලාසි 66 මඟින් සලසා ගෙන තිබුණු රු. මිලියන 1,088.00 ක් වූ අතිරේක ප්‍රතිපාදනයන්ගෙන් රු. මිලියන 750.19 ක් ඉතිරි වී තිබුණු අතර එම ඉතිරිවීම්වල ප්‍රතිශතය අතිරේක ප්‍රතිපාදනයෙන් සියයට 56 ත් සියයට 69 ත් අතර පරාසයක පැවතුණි.

3.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් වැය ශීර්ෂ අංක 111 යටතේ විගණනයට ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශනවල සටහන (iii) ආකෘතිය (භාණ්ඩාගාරය විසින් ඉදිරිපත් කරන ලද සමුච්චිත බැදීම් හා බැරකම් වාර්තාව -SA 92) ප්‍රකාරව 2025 දෙසැම්බර් 31 දිනට තිබුණු බැදීම් ශේෂය රු.මිලියන 5,196.79ක් වූ අතර බැරකම් ශේෂය රු. මිලියන 5,027.46 ක් විය. ඒ සම්බන්ධයෙන් සිදුකළ විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මුදල් රෙගුලාසි 94 (i) ට අනුකූල නොවන පරිදි අමාත්‍යාංශයට අයත් ආයතන විසින් මෙහෙයුම් වැඩසටහනට අදාළව වැය විෂයයන් 08 කට ලබාදී තිබුණු ප්‍රතිපාදනයන්හි ඉතිරිය ඉක්මවා රු.මිලියන 127.48 ක බැරකම්වලට එළඹී තිබුණු අතර සංවර්ධන වැඩසටහනට අදාළවද විෂයයන් 08 කට ලබාදී තිබුණු ප්‍රතිපාදනයන්හි ඉතිරිය ඉක්මවා රු. මිලියන 92.76 ක් බැරකම්වලට එළඹී තිබුණි. ඒ අනුව එකතුව රු.මිලියන 220,24 ක ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි.

(ආ) වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ ඇතුළත් හෝ අළුතින් ඇතිකරන ලද වැය විෂයයන් හෝ නොවන, මෙහෙයුම් හා සංවර්ධන වැඩසටහන් යටතේ වැය විෂයයන් 21 ක් වෙනුවෙන් එකතුව රු. මිලියන 51.35 ක් වූ බැරකම් දක්වා තිබුණි. ඉහත වැය විෂයයන් සඳහා කොපමණ ප්‍රතිපාදන වෙන්කර තිබුණේද යන්න හෝ එම ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණේද යන්න විගණනයේදී තහවුරු කරගත නොහැකි විය.

(ඇ) බැඳීම් හා බැරකම් තොරතුරු විස්තරාත්මක පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද බැරකම් පිළිබඳ ප්‍රකාශය අනුව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවෙන් ලබාගත් වෛද්‍ය සැපයීම් වෙනුවෙන් එම ආයතනයට ඇති බැරකම රු. මිලියන 320.91 ක් වූ නමුත් එම ආයතනයෙහි සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව වෛද්‍ය සැපයීම් අංශයෙන් ලැබිය යුතු මුදල රු. මිලියන 39,022.80 ක් වූයෙන් රු. මිලියන 38,701.89 ක වෙනසක් නිරීක්ෂණය විය. එසේම වෛද්‍ය සැපයීම් අංශය විසින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට ලබා දී තිබුණු ශේෂ සනාථ කිරීම් ලිපිය අනුව එම අගය රු. මිලියන 24,187.95 ක් විය.

(ii) සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව රු. මිලියන 5.28 ක් අමාත්‍යාංශයෙන් ලැබිය යුතු ශේෂ ලෙස ගිණුම්ගත කර තිබුණ ද 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන තුළ බැරකම් යටතේ එම අගය දක්වා නොතිබුණි.

(iii) ජීව වෛද්‍ය ඉංජිනේරු අංශය වෙත ලබාගත් වෛද්‍ය උපකරණ වෙනුවෙන් විවිධ ආයතන සඳහා 2025 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 3,600.28 ක් ගෙවිය යුතු වුවද අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන තුළ එම අගය දක්වා නොතිබුණි.

(iv) සෞඛ්‍ය හා ජන මාධ්‍ය අමාත්‍යාංශය විසින් ලංකා ඛනිජ තෙල් සංස්ථාව වෙත ගෙවිය යුතු බැරකම් වටිනාකම රු. මිලියන 31.27 ක් ලෙස 2025 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණද, එම ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුල අමාත්‍යාංශයෙන් ලැබිය යුතු මුදල රු. මිලියන 39.38 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව රු. මිලියන 8.11 ක වෙනසක් නිරීක්ෂණය විය.

3.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.7 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම යොමුව	
(අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ	
(i) 1989 මාර්තු 23 දිනැති අංක 19/89 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 03(3) ඡේදය	සෞඛ්‍ය අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින රෝහල්, ආයතන හා අංශවල සේවයේ නියුතු කාර්යාලීය කාර්ය මණ්ඩල සඳහා පෙ.ව. 8.30 ට කලින් අතිකාල වැඩ අනුමත කළ නොහැකි බවත්, විශේෂිත හේතුවක් මත ඊට අනුකූල නොවන පරිදි කටයුතු කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා අදාළ විධිමත් අනුමැතින් ලබාගත යුතු බවත් විගණනය විසින් පෙන්වා දී තිබියදී කාර්යාලීය කාර්ය මණ්ඩල සඳහා පෙ.ව. 8.30 ට කලින් අතිකාල අනුමත කර ගෙවීම් කිරීම නීත්‍යානුකූල නොවන අතර මෙය මූල්‍ය අක්‍රමිකතාවයන්ට ඉඩ සැලසීමක් බව විගණනයේදී නිරීක්ෂණය විය. එසේම සෞඛ්‍ය සේවාව තුළ සේවයේ නියුතු කිසිදු සේවකයෙකු රජය විසින් නියම කර ඇති පරිදි තම සේවයට පැමිණීම හා පිටවීම ඇඟිළි සලකුණු යන්ත්‍ර මඟින් සටහන් නොකරන තත්ත්වයක් තුළ මේ ආකාරයට පෙ.ව. 06.00 සිට කාර්යාලීය සේවකයින්ට පැමිණීමේ හා පිටවීමේ වේලාවන් පිළිබඳ විධිමත් තහවුරුවක් රහිතව අතිකාල වැඩ අනුමත කිරීම මඟින් සෞඛ්‍ය සේවාවට පැවරී ඇති සුවිශේෂ කාර්ය භාරය කාර්යක්ෂමව සිදුවන බවට තහවුරුවක් නොලැබෙන බව විගණනයේදී නිරීක්ෂණය විය.
(ii) 1991 අගෝස්තු 07 දිනැති අංක 27/91 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	නිල ඇදුම් ලැබීමට හෝ නිල ඇදුම් දීමනා හිමිකම් ඇති හෝ නිල ඇදුම් මැසීමේ කුලිය ලබා ගන්නා හෝ සියලුම නිළධාරීන් විසින් තමා රාජකාරියේ නියුක්ත වන අවස්ථාවේදී නිල ඇදුම් පාවිච්චි කළයුතු බවත් එය පැහැර හරිනු ලබන නිලධාරීන් වෙත නිකුත් කර ඇති නිල ඇදුම් වටිනාකම හා ඔහු වෙත ගෙවන ලද නිල ඇදුම් මැසීමේ ගාස්තු ද ආපසු අය කරගත යුතු අතර, මෙම වරද ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 16 ඡේදයේ විධිවිධාන පරිදි " ආ" උපලේඛනයට ගැනෙන වරදක් ලෙස සලකා ක්‍රියා කළ යුතු බව සඳහන් කර තිබුණද 2025 මාර්තු මාසයේදී එලෙස නිල ඇදුම් දීමනා ලැබීමට හිමිකම් ලබන සෞඛ්‍ය අමාත්‍යාංශයේ කාර්යාල කාර්යය සහයකයින් හා සෞඛ්‍ය සේවා සහයකයින් 379 දෙනෙකුට රු.මිලියන 7.05 ක් ගෙවීම් කර තිබුණද රාජකාරි කාලය තුළදී ඔවුන් නිල ඇදුම් භාවිතා නොකරන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(iii)	1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 දරන රාජ්‍ය පරිපාලන වක්‍රලේඛය	රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය යෙදිය යුතු වුවද, අමාත්‍යාංශය සතු සංචිත වාහන 180ක් අතුරින් වාහන 128ක් එනම් සියයට 71ක ප්‍රමාණයක රාජ්‍ය ලාංඡනය යොදා නොතිබුණි. එසේවුවද 2024 වර්ෂයේදී රු. 26,400 ක් වැයකර රාජ්‍ය ලාංඡනය සහිත ස්ටිකර් 200ක් මුද්‍රණය කර තිබුණි.
(iv)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන වක්‍රලේඛයේ 3.1 වගන්තිය	කැගල්ල දිස්ත්‍රික් මහ රෝහල සතු වාහන 07ක සහ මැලේරියා මර්දන ව්‍යාපාරය, වෛද්‍ය පර්යේෂණ ආයතනය, ජාතික රුධිර පාරවිලයන ආයතනය හා පවුල් සෞඛ්‍ය කාර්යාංශයද ජනමාධ්‍ය අංශයේ සංචිත වාහන 12 ක් සම්බන්ධයෙන්ද ඉන්ධන පරීක්ෂාවන් සිදු කර නොතිබුණි.
(ආ)	සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ වක්‍රලේඛ	
(i)	2015 මැයි 28 දිනැති අංක 01-21/2015 පොදු වක්‍රලේඛයේ 11.8 උප වගන්තිය	කොන්ත්‍රාත්කරු දිවා ආහාර වටයට අදාළ අමු ආහාර ද්‍රව්‍ය පෙරවරු 8.00 ට පෙරද රාත්‍රී සහ පසුදින උදැසන ආහාර වටය ප.ව. 2.00 ට පෙරද සැපයීම සිදුකළ යුතු වුවද කළුතර ශික්ෂණ රෝහලේ සමාලෝචිත වර්ෂයේ බොහෝ දිනවල දිවා ආහාරය සැපයීම සඳහා අමු ආහාර ද්‍රව්‍ය සැපයීම පෙ.ව. 9.00 පසුවද රාත්‍රී සහ පසු දින උදැසන ආහාර වේල් සඳහා අමු ආහාර ද්‍රව්‍ය සැපයීම ප.ව. 2.00 ට පසුවද සිදුකර තිබුණු බව අමු ආහාර භාර ගැනීමේ ලේඛන අනුව නිරීක්ෂණය විය. මේ තත්ත්වය මත නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගීන්ට ප්‍රමාද වී පිසූ ආහාර බෙදාදීමට කටයුතු කිරීමෙන් ඒ වන විට රෝගීන් වෙනත් ක්‍රම වලින් ආහාර සපයා ගැනීම මත ආහාර අපතේ යාමක්ද සිදුවී තිබුණි.
(ii)	2015 මැයි 28 දිනැති අංක 01-21/2015 පොදු වක්‍රලේඛයේ 12.14 උප වගන්තිය	ඇණවුම් කරන ලද ආහාර ද්‍රව්‍ය සඳහා ආදේශකයක් භාර ගැනීම පුරුද්දක් වශයෙන් නොකළ යුතු වුවද, හම්බන්තොට දිස්ත්‍රික් මහ රෝහල විසින් 2025 ජනවාරි 01 සිට මැයි 30 දක්වා කාල සීමාව තුළ ආහාර ඇණවුම් කර තිබුණු අවස්ථා 78 න් අවස්ථා 57 කදී ඇණවුම් කළ ආහාර වර්ගවලට පරිබාහිරව ආදේශක ආහාර ද්‍රව්‍ය සපයා තිබුණු අතර එම අවස්ථා ගණන මුළු ඇණවුම් සංඛ්‍යාවෙන් සියයට 73 ක තරම් ඉහළ ප්‍රතිශතයක් විය.
(ඇ)	2024 අප්‍රේල් 02 දිනැති අංක 02-55/2024 දරන සෞඛ්‍ය අමාත්‍යාංශ	නිල ඇඳුම් දීමනා හිමිකම් නොමැති තනතුරු දරන 18 දෙනෙකු සඳහා නිල ඇඳුම් දීමනා ලෙස රු. 334,800 ක් ගෙවීම් කර තිබුණි.

ලේකම්ගේ පොදු
වක්‍රලේඛය

3.6 අවධිමත් ගනුදෙනු

(අ) කාසල් වීදියේ කාන්තා රෝහලට අනුයුක්තව සිටි වෛද්‍යවරයෙකුගේ පුද්ගලික ලිපිගොනුව පරීක්ෂාවේදී පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) අවස්ථා දෙකකදී වෛද්‍යවරයා අනුමත විදේශ නිවාඩු ඉක්මවා විධිමත් අනුමැතියක් රහිතව දින 13 ක් අනවසරයෙන් දිවයිනෙන් බැහැරව ගතකර තිබුණි. එසේම ආගමන විගමන දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් තොරතුරු අනුව මෙම නිලධාරියා 2006 සැප්තැම්බර් 08 දින දිවයිනෙන් පිටත්ව 2006 ඔක්තෝබර් 08 දින දක්වා මෙරටින් බැහැරව ගතකර තිබුණු නමුත් එම විදේශ නිවාඩුව සඳහා ලබාගත් විධිමත් අනුමැතියක් විගණනයට ඉදිරිපත් කරන ලද නිලධාරියාගේ පුද්ගලික ලිපිගොනුවේ ඇතුළත් නොවීය.

(ii) වෛද්‍යවරයාට 2007 වර්ෂයේ ජූනි 01 දින සිට 2007 නොවැම්බර් 30 දින දක්වා මාස 06 ක කාලයක් සඳහා දිවයිනෙන් බැහැරගත කිරීම සඳහා වැටුප් සහිත නිවාඩු අනුමත කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

- රෝහලේ පවත්වාගෙන යනු ලබන දිවයිනෙන් බැහැරයාමේ ලේඛනයේ විදේශ ගතවන බව සඳහන් කර තිබුණද මොහු එම කාලපරිච්ඡේදය තුළ දිවයිනෙන් පිටත්ව ගොස් නොතිබුණි. තවද අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලයේ පවත්වාගෙන යනු ලබන 2007 වර්ෂයට අදාළ දිවයිනෙන් බැහැරයාමේ ලේඛනය විගණනයට ඉදිරිපත් නොකළ බැවින් මොහු එම ලේඛනයේ බැහැර යාම සටහන් කලේද යන්න තහවුරු නොවීය.

- වෛද්‍යවරයා දිවයිනෙන් පිටත්ව ගොස් නොමැති වුවද සේවයට වාර්තා කර නොතිබුණු අතර විදේශ නිවාඩු අවලංගු කිරීමකින් තොරව දිවයින තුළ රැඳී සිටියදී සිදු වී ඇති අනතුරක් හේතුවෙන් 2007 ඔක්තෝබර් 10 දින සිට මොහු රෝහල් ගතවී සිට ඇති අතර 2007 දෙසැම්බර් මස 07 දින විදෙස් නිවාඩු අවලංගු කිරීමට ලිපි ඉදිරිපත් කිරීම සවේතනිකව සිදු කරන ලද ක්‍රියාවක්ද යන්න මතභේදයට තුඩුදෙන කරුණක් විය. එසේම 2010 මාර්තු 23 දින රාජකාරී නිවාඩු කාලය තුළ මෙම අනතුර සිදුවී ඇති බව සඳහන් කර ඒ සඳහා වන්දි ඉල්ලීම සම්බන්ධයෙන් පිළිගතහැකි ලිඛිත සාක්ෂි මෙම නිලධාරියා විසින් ඉදිරිපත් කර නොමැති බව නිරීක්ෂණය විය.

- වෛද්‍ය පරීක්ෂණ මණ්ඩල මඟින් මාස 21 ක කාලයක් මෙම නිලධාරියාට වෛද්‍ය නිවාඩු අනුමත කර තිබුණු අතර 2010 පෙබරවාරි 01 දිනැති වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලය මඟින් සැහැල්ලු රාජකාරී සඳහා නැවත සේවයට සුදුසු බව

නිර්දේශ කර තිබුණි. වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලය මඟින් නැවත සේවයේ යෙදවීමට හා අනතුර සිදුවූ දින සිට මෙතෙක් (දිනය පැහැදිලිව දක්වා නොමැත) ලබාගත් නිවාඩු ආවරණය කිරීමට අනුමැතිය ලබාදී තිබුණි. මෙම නිර්දේශ පදනම් කර ගනිමින් 2010 පෙබරවාරි 16 දිනැති ලිපියෙන් මොහු කාසල් විදියේ කාන්තා රෝහලට අනුයුක්ත කර තිබුණි. නමුත් රෝහලේ අධ්‍යක්ෂ විසින් මෙම නිලධාරියාගෙන් සේවය ලබා ගැනීම ප්‍රතික්ෂේප කර ඔහුට පැවරිය හැකි සැහැල්ලු රාජකාරි එම රෝහලේ නොමැති බව සඳහන් කරමින් 2010 පෙබරවාරි 17 දිනැතිව සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ලිපියක් යොමුකර තිබුණු අතර මෙම නිලධාරියා රාජකාරියට වාර්තා කරන ලද දිනය නිශ්චිතව හඳුනාගැනීමට පුද්ගලික ලිපිගොනුවෙහි තොරතුරු දක්වා නොතිබුණි.

- 2011 ජනවාරි 26 දිනැතිව මේ සම්බන්ධයෙන් සිදුකරන ලද මූලික විමර්ශනයේදී අනාවරණය වී ඇති කරුණු අනුව විනයානුකූලව කටයුතු කිරීමට නිර්දේශ කර තිබුණද 2011 පෙබරවාරි 23 දින සිට මෙම නිලධාරියා කිසිදු දැනුම් දීමකින් තොරව සේවයට වාර්තා කර නොතිබුණු බැවින් 2011 ජූනි 28 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සේවය හැරයාමේ නියෝග නිකුත් කර තිබුණි. එසේවුවද වෛද්‍යවරයා විසින් ඉදිරිපත්කරන ලද අභියාචනය අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2012 ජූලි 19 දිනැතිව සිදුකරන ලද දැනුම් දීම මත සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් ගේ 2012 සැප්තැම්බර් දින රහිත ලිපිය මඟින් 2013 ජනවාරි 16 දින සිට නැවත සේවයෙහි පිහිටුවා තිබුණි.

- වෛද්‍යවරයා විසින් 2010 මාර්තු 23 දින අග්‍රහාර රක්ෂණ මුදල් ලබාගැනීමට සඳහා ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍රය ජාතික රක්ෂණ භාර අරමුදල වෙත යොමු කර නොමැති බව සේවය කළ රෝහලේ අධ්‍යක්ෂ වෙත 2024 ඔක්තෝබර් 10 දිනැති ලිපිය මඟින් දන්වා තිබුණි. එසේ වුවද මේ සම්බන්ධයෙන් තොරතුරු විගණනයට ඉදිරිපත් කරන ලද ලිපි ගොනුවෙහි ඇතුළත් නොවුණි.

(iii) අභ්‍යන්තර විගණකගේ 2025 මැයි 26 දිනැති අංක FIB/02/2025 දරන විගණන පරීක්ෂණ වාර්තාව මඟින් මෙම නිලධාරියා විසින් ඉදිරිපත් කරන ලද ලිඛිත නියෝජනයක් පරීක්ෂා කර ඒ සම්බන්ධයෙන් ලබාදී තිබුණු නිර්දේශ (නිලධාරියා සම්බන්ධයෙන් හා වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන්) ක්‍රියාත්මක කිරීම පිළිබඳව තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) විගණනය විසින් විමසුමට ලක්කරන ලද වෛද්‍ය නිලධාරිනියක් අවස්ථා 29 කදී විධිමත් අනුමැතියක් රහිතව විදේශ ගත වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ දෙවන කොටසේ XLVII වනි පරිච්ඡේදයේ 8 වන වගන්තිය

අනුව නිලධාරිනිය සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාවය සහ අදාළ විනය ක්‍රියාමාර්ග අවසන් වන තුරු නිලධාරිනිය විධිමත් පරිදි විශ්‍රාම ගැන්වීට කටයුතු නොකිරීමේ අවශ්‍යතාවය විගණනය විසින් පෙන්වා දී තිබියදී ඒ පිළිබඳව නොසලකා නිලධාරිනිය විශ්‍රාම ගැන්වීමට නිර්දේශ කර තිබුණි. එසේම මෙම කරුණ සම්බන්ධයෙන් 2025 අගෝස්තු 22 දින පවත්වන ලද අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටුවේදී ලබාදුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය විගණනයට වාර්තා නොකෙරුණු අතර විගණන විමසුමේ දැක්වෙන විදේශ සංචාර 29 ට අදාළ කාලපරිච්ඡේදයන්ට මෙම නිලධාරිනියගේ දිනපොත්වල සහතික කළ පිටපත් විගණනයට ඉදිරිපත් කරන මෙන් ඉල්ලුම් කලද එම තොරතුරුද විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) කිසිදු රාජකාරියක් ඉටු නොකරන ලද වෛද්‍ය නිලධාරියෙකු හට ගෙවන ලද වැටුප් හා දීමනා මුදලින් රු.895,008 ක් නැවත අයකර ගැනීමට අදාළ ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර නිලධාරියාට නිකුත් කළ විධිමත් පත්වීම් ලිපියක්ද විගණනයට ඉදිරිපත් කරන ලද නිලධාරියාගේ පුද්ගලික ලිපිගොනුවේ ඇතුළත් නොවීය. එසේම මෙවැනි තත්ත්වයන් වලක්වා ගැනීම සඳහා සමස්ථ රෝහල් හා ආයතන දැනුවත් කිරීමේ වැඩපිළිවෙලක් සකස් කරමින් පවතින බව විගණනයට වාර්තා කර තිබුණද එම වැඩපිළිවෙල කුමක්ද යන්න විගණනය දැනුවත් නොකෙරුණි.

(ඈ) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් නමින් ලියාපදිංචි කරන ලද අංක PB-6544 දරන කැඩ රථය කිසිදු විධිමත් අනුමැතියක් රහිතව 2016 පෙබරවාරි 15 දින අවිධිමත් ලෙස පුද්ගලික වාහන අලුත්වැඩියා කරන ආයතනයකට යොමුකර වර්ෂ 07 කට වැඩි කාලයක් අදාළ ආයතනය තුළ දිරාපත් වීමට සැලැස්වීම සම්බන්ධයෙන් සිදුකරන ලද විමර්ශන මඟින් වාහනයට සිදුවූ අලාභය පියවා ගැනීම සඳහා ක්‍රමවේදයක් නිර්දේශ කර නොතිබුණි. එසේම 2023 ඔක්තෝබර් 13 දිනැති විගණන විමසුමේ (ඇ) ඡේදයේ දැක්වෙන කරුණු මෙම විමර්ශනය මඟින් පරීක්ෂාවට ලක්කර නොතිබුණි. සමස්ථ වගකීම සේවයේ නොමැති කොන්ත්‍රාත් පදනම මත සේවය කළ නිලධාරියෙකු හට පවරා තිබුණද එම නිලධාරියා සම්බන්ධයෙන් රට තුළ පවතින සාමාන්‍ය නීතිය යටතේ කටයුතු කර රජයට සිදුවූ පාඩුව අයකර ගැනීම සඳහා නිර්දේශ කර නොතිබුණි. වාහනය ක්‍රියාවිරහිත වීමට හේතුව හා එම අවස්ථාවේ වාහනය ධාවනය කළ ගමන රාජකාරී ගමනක්ද යන්න හා එම අවස්ථාවේ වාහනයේ ගමන් කළ නිලධාරීන් කවුරුන්ද යන්න විමර්ශනයේදී හඳුනාගෙන නොතිබුණි. මේ අනුව මෙම විමර්ශනය අසම්පූර්ණ හා විධිමත් නොවූ විමර්ශනයක් විය. එසේම ගරාජයේ සිට රැගෙන එන ලද වාහනයේ සියළුම කොටස් නියමිත පරිදි පවතින බවට යාන්ත්‍රික ඉංජිනේරුවෙකු විසින් පරීක්ෂා කර වාර්තාවක්ද ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) බැංකුව වෙත ඉදිරිපත් නොවූ 2023 නොවැම්බර් 24 දිනැති වැටුප් අවකරණ වෙක්පතකට අදාළ රු.943,286 ක මුදල විගණිත දිනය වූ 2025 නොවැම්බර් 10 දක්වාම පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබියදී එම ගෙවීම් වෙනුවෙන් 2024 ජනවාරි 02 දිනැතිව හිලව් වෙක්පතක්ද නිකුත් කර තිබුණි. ඒ අනුව, මාතලේ දිස්ත්‍රික් මහ රෝහලේ වැටුප් අවකරණ සැකසීම හා වෙක්පත් මඟින් ගෙවීම් ඉතා අවිධිමත් තත්ත්වයක පැවතුණි.

(ඊ) සෞඛ්‍ය ලේකම්ගේ අංක 02/41/2009 දරන වක්‍රලේඛය ප්‍රකාරව ගෙවන වාට්ටුවල රෝගීන්ගේ තැන්පතු මුදල් හා දිනක අයකිරීම් ලෙස පළමු පංතියේ වාට්ටුවල රෝගීන් සඳහා තැන්පතු මුදල රු.3,000ක් ද දිනක අයකිරීම රු.200ක් ද දෙවන පංතියේ වාට්ටුවල රෝගීන් සඳහා තැන්පතු මුදල රු.2,000ක් ද දිනක අයකිරීම රු.175ක් ලෙස දක්වා තිබුණි. ජාතික මානසික සෞඛ්‍ය විද්‍යායතනය විසින් පිරිමි රෝගීන්ගේ වාට්ටු සඳහා පළමු පංතියේ මිල ගණන් ද ස්ත්‍රී රෝගීන්ගේ වාට්ටු සඳහා දෙවන පංතියේ මිල ගණන් ද අයකරනු ලබන අතර එම වාට්ටු 02ක අතර පළමු හා දෙවන පංති ලෙස කිසිදු වෙනසක් නොමැති බැවින් මිල ගණන් වෙනස් වීමට හේතු විගණනයට නිරීක්ෂණය නොවුණි.

(උ) සෞඛ්‍ය අමාත්‍යාංශයේ 2017 ජූලි 24 දිනැති අංක 01 – 41/2017 දරන වක්‍රලේඛය මඟින් ගෙවන වාට්ටුවල රෝගීන්ට ලබාදෙන සේවාවල ගාස්තු සම්බන්ධයෙන් ඊට පෙර නිකුත් කරන ලද සියලු වක්‍රලේඛ අවලංගු කර 2017 ජූලි මස 24 දින සිට ක්‍රියාත්මක වන පරිදි නව සංශෝධිත වක්‍රලේඛයක් නිකුත් කර තිබුණි. ජාතික මානසික සෞඛ්‍ය විද්‍යායතනය විසින් රෝගීන්ගේ පරීක්ෂණ ගාස්තු සම්බන්ධයෙන් පමණක් මෙම වක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කරනු ලැබුවද තැන්පතු මුදල සම්බන්ධයෙන් වර්තමානයේදී ද පැරණි වක්‍රලේඛය (02/41/2009) ප්‍රකාරව අයකිරීම් සිදුකරයි.ඒ හේතුවෙන් තැන්පතු මුදල් ලෙස රු. 579,000 ක මුදලක් 2017 ජූලි සිට 2025 අගෝස්තු 15 දක්වා රෝහලට අහිමි වී තිබුණි.

(ඌ) කුලියාපිටිය ශික්ෂණ රෝහලේ වෛද්‍ය රසායනාගාර 04 ක වෛද්‍ය රසායනාගාර කාර්මික ශිල්පීන් 17 දෙනෙකු සේවය කරනු ලබන අතර රාත්‍රී (On Call) කාලයේ වෛද්‍ය පරීක්ෂණ සඳහා එක් රසායනාගාරයක් විවෘතව තබනු ලබන අතර එහි රාජකාරී (On Call) කටයුතු දෙනිකව එක් රසායනාගාර කාර්මික ශිල්පියෙකු විසින් සිදු කරනු ලබයි. 2025 ජූනි 02 වැනි දින සිට 2025 ජූනි 08 වැනි දා දක්වා වූ දින 07 ක කාල පරිච්ඡේදයේ දී වාට්ටු 14 ක රෝගීන් සම්බන්ධ රසායනාගාර පරීක්ෂණ 3,938 ක් සිදුකර තිබුණු අතර, එයින් පරීක්ෂණ 2794 ක් රාත්‍රී රාජකාරී (හදිසි ඇමතුම් රාජකාරී / On call) ලෙසද පරීක්ෂණ 1,144 ක් දිවා රාජකාරී ලෙසද ඉටුකර තිබුණි. මෙය සිදුකළ මුළු පරීක්ෂණ සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස සැලකූ විට දිවා සාමාන්‍ය රාජකාරී කාලයේ සියයට 29 ක්ද, හදිසි ඇමතුම් රාජකාරී ලෙස සියයට 71 ක් ද, වීම නිසා දිවා කාලයේදී රසායානාගාර පරීක්ෂණ අඩුවෙන් සිදු කිරීම මතභේදයට තුඩුදෙන කරුණක් විය.

(එ) කුලියාපිටිය ශික්ෂණ රෝහලේ රසායනාගාරයේ ස්ථාපිත ERBA XL 640 Bio Chemistry Analyzer මඟින් 2025 මැයි මාසය තුළ සිදුකළ පරීක්ෂණ අතුරින් තෝරාගත් පරීක්ෂණ වර්ග 15 ක් සඳහා රසායනාගාර ශිල්පීය වාර්තා අනුව සිදුකළ පරීක්ෂණ සංඛ්‍යාව 20,070 ක් වූ අතර ERBA XL 640 උපකරණ මඟින් ලබාගත් දත්ත අනුව සිදුකළ පරීක්ෂණ සංඛ්‍යාව 22,841 ක් විය. රසායනාගාර ශිල්පීය වාර්තාවල සඳහන් ප්‍රමාණයට වඩා පරීක්ෂණ 2771 ක් මෙම ERBA යන්ත්‍රය මඟින් වැඩිපුර සිදුකර තිබුණි. වෛද්‍යවරයකුගේ අනුමැතියකින් තොරව එසේ සිදුකළ රසායනාගාර පරීක්ෂණ 2771 ක් සඳහා භාවිතා කළ ප්‍රතික්‍රියකවල වටිනාකම පමණක් රු.174,264 ක් වේ. අදාළ අනුමත ක්‍රියාපටිපාටිය

අනුගමනය නොකර මෙම පරීක්ෂණ සිදු කිරීම හේතුවෙන් ඉහත පිරිවැය රජයට නිෂ්කාර්ය වැය බරක් බවට පත් වී තිබුණි.

(ඒ) මහනුවර ජාතික රෝහලේ වෛද්‍ය නිලධාරීන් සඳහා පමණක් වෙන් වූ ආපනශාලාව රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ ඉල්ලීමකට අනුව රාජ්‍ය ගිණුම්කාරක සභාවේ සභාපති තුමාගේ නියෝගය මත, එම ලේකම්ගේ 2024 අගෝස්තු 09 දිනැති ලිපියෙන් කොන්දේසි කිහිපයකට යටත්ව ලංසු පටිපාටියෙන් බැහැරව 2025/2026 වර්ෂය සඳහා වෛද්‍ය නිලධාරීන්ගේ සුභසාධක සංගමය වෙත බදු දීමෙන් රජයට වාර්ෂිකව අවම වශයෙන් රු1,338,000 ක පාඩුවක් සිදුව තිබුණු අතර එම ලිපියේ IV ඡේදයට පටහැනිව සුබසාධක සංගමය විසින් බදු ගත් ආපනශාලාව පෞද්ගලික ආයතනයකට අතුරු බදු දී තිබුණි.

(ඔ) 1996 වසරේ සිට මහනුවර ජාතික රෝහල තුළ පවත්වාගෙන ගොස් තිබුණු පුවත්පත් අලෙවිකුටිය 2013 වසරේ සිට රෝහල් බලධාරීන්ගේ අවසරයකින් තොරව පවත්වාගෙන ගිය තැනැත්තා විසින් වෙනත් තැනැත්තෙකුට පවරා දී තිබුණි. එය 2019 වසරේ සිට රෝහල් සුභසාධක සංගමයට ප්‍රසම්පාදන පටිපාටියෙන් බැහැරව තක්සේරු කුලියකට ලබා දී තිබුණු අතර සුභසාධක සංගමය විසින් එය පෞද්ගලික අංශයකට අතුරු බදු දී තිබුණි.එමඟින් එක් වර්ෂයකට රජයට අවම වශයෙන් රු 434,400 ක පාඩුවක් සිදුවී තිබුණි.

(ඕ) කල්මුණේ අෂ්රොෆ් අනුස්මරණ රෝහලේ අදාළ අමාත්‍යාංශ වක්‍රලේඛ මඟින් නියම කර ඇති ප්‍රමාණයට වඩා වැඩි රේටයකට අතිකාල දීමනා වැරදි ලෙස ගණනය කර විශ්‍රාමික වෛද්‍ය අධිකාරීවරයෙකුට ගෙවා තිබුණු අතර මේ හේතුවෙන් 2025 අගෝස්තු දක්වා රු. 2,761,860 ක වැඩිපුර ගෙවීමක් සිදුකර තිබුණි.

(ක) කළුතර ජාතික සෞඛ්‍ය විද්‍යායතනය යටතේ පාලනය වන වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ පුහුණු පාසලට 2020 පෙබරවාරි 05 දිනෙන් පසුව අභ්‍යාසලාභීන් බඳවා ගෙන නොතිබීම හා 2020 වර්ෂයේ පාසලට බඳවා ගෙන තිබුණු අභ්‍යාසලාභීන්ගේ අධ්‍යයන හා විභාග කටයුතු 2023 පෙබරවාරි මස අවසන් වී තිබීමෙන් එම පාසලට අනුයුක්තව සේවය කරන වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ තනතුර දරන නිලධාරීන් 05 දෙනෙකුගේ සේවය වසර 03 කට අධික කාලයක සිට ඌන උපයෝජිත තත්ත්වයට පත්ව තිබුණි. එවැනි තත්ත්වයක් යටතේ මෙම නිලධාරීන් සතියේ සෙනසුරාදා දින සේවයට වාර්තා කිරීම වෙනුවෙන් 2024 ජනවාරි සිට 2025 ඔක්තෝබර් දක්වා කාල පරිච්ඡේදය වෙනුවෙන් රු.568,610 ක මුදලක් නිවාඩු දින වැටුප් ලෙස ගෙවා තිබුණි. එසේම මෙම පුහුණු පාසලට 2023 වර්ෂයේ සිටම අභ්‍යාසලාභීන් බඳවා ගෙන නොතිබීම හේතුවෙන් එම පාසලට අනුයුක්ත නිලධාරීන් 05 දෙනා ඉගැන්වීමේ කාර්යයන්ට සෘජුව දායකත්වයක් ලබාදී නොතිබුණද 2023 වර්ෂයේ පෙබරවාරි සිට 2025 දෙසැම්බර් අවසානය දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා එම නිලධාරීන් වෙනුවෙන් මාසයකට රු.20,000 බැගින් එකතුව රු.3,600,000 ක මුදලක් ඉගැන්වීම් දීමනා ලෙස ගෙවා තිබුණි.

(ඛ) හෙද කාර්ය මණ්ඩල රාජකාරි වේලාවන්, අමතර සේවා මුර රාජකාරීන් හා සති විවේක දින රාජකාරීන් සඳහා යොදවා ගැනීම සහ ඒ වෙනුවෙන් ගෙවීම් කිරීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබා ගැනීමට කටයුතු නොකර 2009 මාර්තු 27 දිනැති අංක 02/19/2009 දරන පොදු වක්‍රලේඛය නිකුත් කර තිබුණි. විධිමත් අනුමැතියකින් තොරව වර්ෂ දෙකකට අධික කාලයක් මෙම වක්‍රලේඛය ක්‍රියාත්මක කිරීමෙන් පසුව මෙම වක්‍රලේඛය සඳහා අමාත්‍ය මණ්ඩල ආවරණ අනුමැතිය ලබා ගැනීමේ අරමුණින් 2011 අප්‍රේල් 05 දින සෞඛ්‍ය අමාත්‍ය තුමා විසින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර තිබුණි. මෙම වක්‍රලේඛය සංශෝධනයන්ට යටත්ව ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2011 සැප්තැම්බර් 14 දින ලබාදී තිබුණි. මේ අනුව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් 2012 ජනවාරි 02 දින අංක 02/19/2009(1) දරන පොදු වක්‍රලේඛය නිකුත් කර තිබුණද 2012 ජනවාරි 13 දින නිකුත් කරන ලද අංක 01(11)/16/20 දරන ලිපිය මඟින් වක්‍රලේඛය පිළිබඳ පසුව තීරණයක් ගන්නා තෙක් තාවකාලිකව එය අත්හිටුවා තිබුණි. මේ අනුව 2009 අප්‍රේල් 01 දින සිට 2025 දෙසැම්බර් 31 දින දක්වා වර්ෂ 17 ක පමණ කාලයක් විධිමත් අනුමැතියකින් තොරව හෙද කාර්ය මණ්ඩල සඳහා අමතර දීමනා ගෙවීම සිදු කර තිබුණි. මෙම පොදු වක්‍රලේඛයේ සංශෝධන ඇතුළත් කර නිකුත් කළ වක්‍රලේඛය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් දිගින් දිගටම හෙද සංගම් විසින් සිය විරෝධතා දක්වා ඇති අතර, ඔවුන් විසින් 4(x) වගන්ති ඉවත් කර අනෙකුත් හෙද නිලධාරීන්ට ලබා ගන්නා ආකාරයටම කෘත්‍ය ලේඛනය අනුව සේවයේ යෙදෙන හෙද නිලධාරීන්ගේ අමතර දීමනා ලබා ගැනීමට ඉඩකඩ ලබා දෙන ලෙස ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බවත් ඒ අනුව, එම ඉල්ලීම සම්බන්ධයෙන් කටයුතු කිරීම පිළිබඳව සොයා බැලීම සඳහා සහ පොදු වක්‍රලේඛයෙහි පවතින අඩුපාඩු මහහරවා ගෙන කටයුතු කිරීම සඳහා නිර්දේශ ලබා දීමට විශේෂ කමිටුවක් පත් කර ඇති බවත්, ඉදිරියේදී මෙම කමිටුව මඟින් අදාළ ගැටළු සම්බන්ධයෙන් විසඳුම් ලබා දීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන බවත්, 2020 වර්ෂයේ විගණකාධිපති වාර්තාවට පිළිතුරු ලෙස අමාත්‍යාංශ ලේකම් විසින් දන්වා ඇතත් කිසිදු විධිමත් අනුමැතියක් රහිතව අමාත්‍යමණ්ඩල අනුමැතියට පටහැනිව වගකිව යුතු නිලධාරීන් දිගින් දිගටම කටයුතු කරමින් සිටින බව නිරීක්ෂණය විය.

(ග) සෞඛ්‍ය අංශයේ සායනික අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය සහ පුද්ගලික සමාගමක් අතර වූ ත්‍රෛපාර්ශවික ගිවිසුම 2014 සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා ක්‍රියාතමක කර තිබුණි. සායනික අපද්‍රව්‍ය වෙන්කිරීමට හා ගබඩා කිරීමට අවශ්‍ය වන ඇසුරුම් සඳහා වන මිල රජයේ රෝහල් සහ ආයතන විසින් සමාගම වෙත ගෙවා තිබුණද එම ඇසුරුම් සපයා නොතිබුණු බවත්, රෝහල් සහ ආයතන සඳහා අවශ්‍යවන එම ඇසුරුම් බාහිර පාර්ශවයන් වෙතින් මිලදී ගෙන තිබුණු බවත් නිරීක්ෂණය විය. කසල කිලෝග්‍රෑම් එකක් වෙනුවෙන් සමාගමට ගෙවනු ලබන මිල 2014 අප්‍රේල් 25 දින සිට රු. 67 ක්, රු 103 ක් හා රු.260 ක් ලෙස වරින්වර සංශෝධනය කර තිබුණද මෙම ඒකක මිල විධිමත් මිල විශ්ලේෂණයක් මඟින් සකස්කර අනුමත කර නොතිබුණි. අදාළ පුද්ගලික සමාගම විසින් ගිවිසුම ප්‍රකාරව සැපයිය යුතු ඇසුරුම් නොසැපයීම හේතුවෙන් රෝහල් හා අනෙකුත් සෞඛ්‍ය ආයතන විසින් 2014 වර්ෂයේ සිට ඇසුරුම් වෙනුවෙන් දරන ලද සමස්ථ වියදම ගණනය කර අදාළ සමාගමෙන් අයකර ගැනීමට කටයුතු කර ඒ බව විගණනයට තහවුරු කර නොතිබුණු අතර විධිමත් මිල

විශ්ලේෂණයක් සකස් කර අනුමත කර ඒකක මිල තීරණය කිරීමටද වගකිව යුතු නිලධාරීන් මෙම වාර්තාවේ දිනය දක්වා කටයුතු කර නොතිබුණි.

(ඝ) කොවිඩ් 19 හදිසි ප්‍රතිචාර හා සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය හා එහි දෙවන අතිරේක මූල්‍යකරණ ව්‍යාපෘතියේ අරමුදල් භාවිතා කරමින් 2022 හා 2023 වර්ෂවලදී ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව හරහා වෛද්‍ය සැපයීම් 30 ක් මිලදීගෙන තිබුණි. ඒ වෙනුවෙන් ව්‍යාපෘතිය මඟින් 2022 වර්ෂයේ අවස්ථා 30 කදී රු. මිලියන 7,660.10 ක් සෘජුවම සැපයුම්කරුවන්ට ගෙවා තිබියදී රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් වෛද්‍ය සැපයීම් අංශය වෙත එම වටිනාකම අඩු කර සේවා ගාස්තුව වූ රු. මිලියන 872.53 ක් පමණක් අයකළ යුතු වුවත් රු. මිලියන 8,935.27 ක හරපත් නිරවුල් කිරීම සඳහා වෛද්‍ය සැපයීම් අංශය වෙත ඉදිරිපත් කර තිබුණි. වෛද්‍ය සැපයීම් අංශය විසින්ද තත්ත්වයෙන් අසමත්වීම්, අධිභාර අයකිරීම් ආදිය වෙනුවෙන් රු. මිලියන 683.26 ක් අඩුකිරීමෙන් පසුව 2023 වර්ෂයේදී රු. මිලියන 8,252.00 ක හරපත් දේශීය අරමුදල් මඟින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට නිරවුල් කර තිබුණි. තවද මෙම වෛද්‍ය සැපයීම් සඳහා ව්‍යාපෘතිය හරහා සැපයුම්කරුවන්ට නාමමාත්‍ර ඉන්වොයිසියේ සඳහන් ප්‍රමාණයට ගෙවා තිබුණද, අයිතම 05 කට අදාළව ඒකක 122,282 ක් සත්‍ය වශයෙන්ම වෛද්‍ය සැපයීම් අංශයට සපයා නොතිබීම හේතුවෙන් සැපයුම්කරුවන්ට රු. මිලියන 28.16 ක් වැඩිපුර ගෙවා තිබුණි.

3.7 තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

(අ) අමාත්‍යාංශයේ සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 37 කදී ලබාගෙන තිබුණු තත්කාර්යය අතුරු අග්‍රිම රු. 1,965,115 ක් කාර්යය නිමවූ පසු බිල්පත් ඉදිරිපත් කර පියවීමට දින 11 සිට දින 50 දක්වා කාලයක් ප්‍රමාද කර තිබුණි.

(ආ) පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ සමාලෝචිත වර්ෂයේ අවස්ථා 09 කට අදාළව එකතු වටිනාකම රු.892,690 ක අත්තිකාරම් නිරවුල් කිරීමේදී දින 21 සිට 43 දක්වා කාලයක් ප්‍රමාද වී තිබුණි.

(ඇ) 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2025 දෙසැම්බර් 31 දිනට සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ ණය ශේෂයන් ඔවුන්ගේ 2024 දෙසැම්බර් 31 දිනට වූ ණය ශේෂයන් හා සැසඳීමේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

- නිලධාරීන් 450 කට අදාළව 2024 දෙසැම්බර් 31 දිනට පැවති ණය ශේෂ 2025 වර්ෂයේදී අයකරගෙන නොමැති බව නිරීක්ෂණය විය. මේ අනුව මෙම නිලධාරීන් සත්‍ය ලෙසම සේවයේ යෙදී සිටින නිලධාරීන්ද යන සැකය විගණනයේදී බැහැර කිරීමට නොහැකි විය.

- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිවිඡේදයේ 10.5 වගන්තිය අනුව ආපදා ණය අයකර ගැනීමේදී, මාස දෙකක ඒකාබද්ධ වැටුපට වැඩි සහ මාස තුනක ඒකාබද්ධ වැටුප දක්වා ඒකාබද්ධ වැටුපෙන් සියයට 10ක ප්‍රමාණයක්වත් මාසිකව අය කර ගත යුතු බව සඳහන් වුවද, නිලධාරීන් 1470 කට අදාළව 2024 වර්ෂය අවසානයට පැවති ආපදා ණය ශේෂයන්ගෙන් සමාලෝචිත වර්ෂය තුළ අයකරගෙන තිබුණු ණය මුදල පිළිබඳව විගණනයට ගැටළු සහගත විය.

- නිලධාරීන් 162 කට අදාළව පිළිගත නොහැකි අගයන්ගෙන් ආපදා ණය ශේෂය හා 2025 දෙසැම්බර් 31 දිනට මුළු ණය ශේෂය වැඩිවී තිබුණි.

(ii) 2025 දෙසැම්බර් 31 දිනට සේවයේ නියුක්ත නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ ඇතුළත් 3.1 වගුවේ දැක්වෙන ණය ශේෂවලින් රු. මිලියන 87.33 ක්වූ ණය ශේෂ 534 කට අදාළව දක්වා තිබුණු නිලධාරීන්ගේ ජාතික හැඳුනුම්පත් අංක නිවැරදි නොවන බව නිරීක්ෂණය විය.

(iii) 2025 දෙසැම්බර් 31 දිනට සේවයේ නියුක්ත නිලධාරීන්ගෙන් අයවිය ණය ශේෂවලින් රු. මිලියන 18.10 ක්වූ ණය ශේෂ 120 කට අදාළව දක්වා තිබුණු නිලධාරීන්ගේ ජාතික හැඳුනුම්පත් අංක පරීක්ෂා කිරීමේදී එකම ජාතික හැඳුනුම්පත් අංකයක් යටතේ නිලධාරීන් දෙදෙනෙකු ඇතුළත් බව නිරීක්ෂණය විය.

(iv) 2025 දෙසැම්බර් 31 දිනට සේවයේ නියුක්ත නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂවලින් රු.මිලියන 4.20 ක්වූ ණය ශේෂ 35 කට අදාළව දක්වා තිබුණු නිලධාරීන්ගේ ජාතික හැඳුනුම්පත් අංක පරීක්ෂා කිරීමේදී එම නිලධාරීන් 2025 දෙසැම්බර් 31 දිනට සේවයේ නියුක්තව සිටිය නොහැකි බව නිරීක්ෂණය විය.

(v) 2025 දෙසැම්බර් 31 දිනට සේවයේ නියුක්ත නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂවලින් රු.මිලියන 3.99 ක්වූ ණය ශේෂ 34 කට අදාළව ණය ශේෂ දෙක බැගින් දක්වා තිබුණි. මෙම සමහර ණය ශේෂ එකම ආයතනයක් යටතේ මෙන්ම සමහර ණය ශේෂ ආයතන දෙකක් යටතේ දක්වා තිබුණි.

(vi) සැසඳුම් ප්‍රකාශනයේ ඇමුණුම 3 අනුව වෙනත් රජයේ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වෙත ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගෙන් අයවීමට පැවති ආයතන 63 කට අදාළව ණයගැති ශේෂය රු.මිලියන 53.83 ක් විය. 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන අයවැය වක්‍රලේඛය අනුව නිලධාරියා මාරුවී ගොස් මාස දෙකක් ඇතුළත ණය ශේෂ නොපියවන ලද්දේ නම්, මාරුවීම ලැබූ දෙපාර්තමේන්තුවේ අදාළ නිලධාරියා සේවය කරන බව තහවුරු කොට ගෙන එම දෙපාර්තමේන්තුවට ලිඛිතව දැනුම් දීමක් කොට තුන්වන මාසයේදී මාරුව ලබාදුන් දෙපාර්තමේන්තුව විසින් මාසික ගිණුම් සාරාංශය මඟින් එම ණයශේෂ අයකර ගතයුතු අතර මාස තුනකට පසුව එම ණයශේෂ නොපෙන්වීමට වගබලා ගත යුතු විය. නමුත් ණයගැති ශේෂ සම්බන්ධයෙන් යටෝක්ත වක්‍රලේඛය ප්‍රකාරව

කටයුතු කර නොතිබුණි. එසේම ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 1:6 සහ 1:7 යන වගන්තිවලට අනුකූලව කටයුතු කර නොමැති බවද නිරීක්ෂණය විය. මෙම ණයගැති ශේෂ තුළ රු. මිලියන 39.26 ක් වූ ණයගැති ශේෂ වර්ෂ 5ට වඩා වැඩි පැරණි ණය ශේෂයන් වූ අතර එය ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ මුළු ණයගැති ශේෂයෙන් සියයට 73 ක් පමණ විය. ඉතිරි ණයගැති ශේෂ වලින් රු. මිලියන 7.25 ක් වූ ණයගැති ශේෂ මාස 03 ඉක්ම වූ ණයගැති ශේෂ විය. මේ අනුව සමස්ථ ණයගැති ශේෂයෙන් රු. මිලියන 46.51 ක් හෙවත් සියයට 86 ක් නිලධාරීන්ගේ නොසැලකිල්ල හේතුවෙන් උද්ගත වූ ණයගැති ශේෂ බව විගණනයේදී නිරීක්ෂණය විය.

(vii) සැසඳුම් ප්‍රකාශනයේ උපලේඛන අංක 3.2.2 හි දැක්වෙන සෞඛ්‍ය අමාත්‍යාංශය හා එයට අයත් ආයතන වෙත ස්ථාන මාරුවූ නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ වලින් එකතුව රු. 977,710 ක් වූ ණයගැති ශේෂ 21 කට අදාළ ස්ථාන මාරුවීම් ලද නිලධාරීන්ගේ තනතුර දක්වා නොතිබුණු අතර රු. මිලියන 10.71 ක ණයගැති ශේෂ 148 කට අදාළ නිලධාරීන්ගේ ජාතික හැඳුනුම්පත් අංක දක්වා නොතිබුණි.

(viii) උපලේඛන අංක 3.3 අනුව පළාත් සභා වෙත ස්ථාන මාරුවීම් ලැබූ නිලධාරීන්ගෙන් අයවිය යුතු රු. මිලියන 1.60 ක් වූ ණයගැති ශේෂ 13 කට අදාළ ස්ථාන මාරු වුයේ කුමන ආයතනයකටද යන්න සඳහන්කර නොතිබුණි.

(ix) උපලේඛන අංක 3.3 හි දැක්වෙන රු. මිලියන 1.42 ක් වූ ණයගැති ශේෂ 43 කට අදාළ නිලධාරීන්ගේ තනතුරු නාමය සඳහන් කර නොතිබුණි. එසේම මින් රු. මිලියන 27.41 ක් වූ ණය ශේෂ 439 කට අදාළ නිලධාරීන්ගේ ජාතික හැඳුනුම් පත් අංක දක්වා නොතිබුණි.

(x) උපලේඛන අංක 3.3 හි දැක්වෙන රු. මිලියන 1.39 ක ණයගැති ශේෂ 55 කට අදාළ නිලධාරීන් ස්ථාන මාරුවී ගිය පළාත් සභා ආයතනය කුමක්ද යන්න නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි.

(xi) උපලේඛන අංක 3.3 හි දැක්වෙන එකතුව රු.512,405 ක් වූ ණයගැති ශේෂ 06 සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් ආයතන වෙතට ස්ථාන මාරුවීම් ලද නිලධාරීන්ගෙන් අයවිය යුතු ණයගැති ශේෂයන් විය.

(xii) උපලේඛන අංක 3.2.2 හි ඇතුළත් 2025 දෙසැම්බර් 31 දිනට අයවීමට පැවති රු. මිලියන 10.89 ණයගැති ශේෂ සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් රෝහල් හා අනෙකුත් සෞඛ්‍ය ආයතන වලට ස්ථාන මාරුවූ නිලධාරීන්ගෙන් අයවිය යුතු ණයගැති ශේෂ විය. 2019 වර්ෂයේ සිට 2024 දක්වාවූ විගණකාධිපති වාර්තා මඟින් මෙම තත්ත්වය ඔබගේ අවධානයට යොමුකරන ලද අතර එකම වැය ශීර්ෂයක් තුළ පවතින ආයතන අතර ණයගැති හා ණයහිමි ශේෂ පැවතිය නොහැකි බැවින් මෙම ණයගැති ශේෂ පිළිබඳව පරීක්ෂා කර නිරවුල් කිරීමට කටයුතු කරන ලෙස නිර්දේශ

කලද 2025 දෙසැම්බර් 31 දින දක්වා මෙම ණයගැති ශේෂ හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. මේ අනුව මෙම ණයගැති ශේෂ සැසඳුම් ප්‍රකාශ තුලනය කිරීම සඳහා සාවද්‍ය ලෙස ඇතුළත් කළ ශේෂ බවට වන සැකය විගණනයේදී බැහැර කිරීමට නොහැකි විය.

(xiii) වැඩ තහනමට ලක් වූ නිලධාරීන් 184 දෙනෙකුගෙන් 2025 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය ශේෂය රු.මිලියන 9.52 ක් වූ අතර ඉන් රු.මිලියන 7.49 ක් හෙවත් සියයට 78 ක ණය ශේෂ වර්ෂ 5 කට වඩා පැරණි ණය ශේෂ වූ අතර රු.මිලියන 9.46 ක් හෙවත් සියයට 99 ක ණය ශේෂ වර්ෂයකට වඩා පැරණි ණය ශේෂ විය.

(xiv) වැඩ තහනමට ලක් වූ නිලධාරීන් 04 දෙනෙකුගේ එකතුව රු. 139,184 ක් වූ ණය ශේෂවලට අදාළව තනතුර සඳහන් කර නොතිබුණු අතර එකතුව රු. මිලියන 6.39 ක් වූ නිලධාරීන් 94 දෙනෙකුගේ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කර නොතිබුණි.

(xv) සේවය අතහැර ගිය නිලධාරීන් 1087 දෙනෙකුගෙන් එකතුව රු.මිලියන 43.22 ක ණය ශේෂයන් අයවිය යුතුව තිබුණු අතර ඉන් රු. මිලියන 12.53 ක් හෙවත් සියයට 29 ක ණය ශේෂ වර්ෂ 5 කට වඩා පැරණි ණය ශේෂ වූ අතර රු.මිලියන 33.67 ක් හෙවත් සියයට 78ක ණය ශේෂ වර්ෂයකට වඩා පැරණි ණය ශේෂ විය. මෙම ශේෂය වසරක් පාසා අඛණ්ඩව වැඩිවන අතර, ණය අයකර ගැනීම පිළිබඳව ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන ඇති බවට විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

(xvi) එකතුව රු. 719,823 ක් වූ සේවය අතහැර ගිය නිලධාරීන් 27 දෙනෙකුගේ තනතුර සඳහන් කර නොතිබුණු අතර එකතුව රු. මිලියන 7.58 ක් වූ නිලධාරීන් 269 දෙනෙකුගේ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කර නොතිබුණි.

(xvii) විශ්‍රාම ගිය නිලධාරීන් 294 දෙනෙකුගෙන් අයවිය යුතු ණය මුදල රු.මිලියන 22.16 ක් වූ අතර එයින් රු. මිලියන 7.02 ක් හෙවත් සියයට 32 ක ණය ශේෂ වර්ෂයකට වඩා පැරණි ණය ශේෂ විය.

(xviii) එකතුව රු. 389,407 ක් වූ විශ්‍රාම ගිය නිලධාරීන් 4 දෙනෙකුගේ තනතුර සඳහන් කර නොතිබුණු අතර එකතුව රු.705,007 ක් වූ නිලධාරීන් 18 දෙනෙකුගේ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කර නොතිබුණි.

(xix) 2025 දෙසැම්බර් 31 දිනට මියගිය නිලධාරීන්ගෙන් අය විය යුතු ණය මුදල රු.මිලියන 8.60 ක් වී තිබුණු අතර ඉන් නිලධාරීන් 107 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. මිලියන 1.84 ක් හෙවත් සියයට 21 ක ණය ශේෂ වර්ෂ 05 කට වඩා

පැරණි ණය ශේෂ විය. එසේම මෙම ණයගැනි ශේෂයෙන් රු.මිලියන 4.76 ක් හෙවත් සියයට 55 ක් වර්ෂයකට වඩා වැඩි ශේෂ විය.

(xx) මියගිය නිලධාරීන් 11 දෙනෙකුගෙන් අයවිය යුතු රු432,305 ක ණයගැනි ශේෂවලට අදාළ නිලධාරීන්ගේ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කර නොතිබුණි.

3.8 තැන්පතු

(අ) 2025 දෙසැම්බර් 31 දිනට CIGAS පද්ධතිය අනුව තැන්පතු ගිණුම් සාරාංශය සහ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ කේවල ගිණුම් සාරාංශ ලේඛන අතර රු.මිලියන 16.79 ක ශුද්ධ වෙනසක් පැවතුණි.

(ආ) මුදල් රෙගුලාසි 571 (3) ප්‍රකාරව, අමාත්‍යාංශයට අයත් ආයතන 31 කට අදාළ වර්ෂ 02 ක් ඉක්ම වූ එකතුව රු. මිලියන 1,089.38 ක තැන්පතු ශේෂ නිරවුල් කිරීමට හෝ රජයේ ආදායමට ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඇ) අමාත්‍යාංශයේ පොදු තැන්පත් ගිණුමට අදාළ උපලේඛන පරීක්ෂා කිරීමේදී මහමෝදර ශික්ෂණ රෝහල, දකුණු කොළඹ ශික්ෂණ රෝහල, නුවරඑළිය මහරෝහල සහ දිස්ත්‍රික් මහ රෝහල මොණරාගල යන රෝහල් වලට අදාළව රු.මිලියන 3.93 ක් වටිනා මාස 06 ඉක්ම වූ ගෙවීමට ඉදිරිපත් නොවූ වෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව කටයුතු නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

(අ) සමාලෝචිත වර්ෂය සඳහා වෛද්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා වාර්ෂික අයවැය ප්‍රතිපාදන යටතේ රු. මිලියන 13,325 ක මුදලක් වෙන්කර තිබුණද ජීව වෛද්‍ය ඉංජිනේරු අංශය විසින් එම වෙන්කළ මුදලෙන් රු. මිලියන 12,619.03 ක මිලදී ගැනීම් සඳහා පමණක් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණු බැවින්, රු. මිලියන 705.97 ක ප්‍රතිපාදන සම්බන්ධයෙන් කිසිදු ප්‍රසම්පාදන සැලසුම්කරණයක් සිදු කර නොතිබුණි.

(ආ) ජීව වෛද්‍ය ඉංජිනේරු අංශයට අයත් 2025 ජනවාරි 01 දිනට අතැති බිල්පත් ගෙවීම සඳහා වෙන්කර තිබුණු රු. මිලියන 4,665.67 ක මුදලින් රු. මිලියන 2,661.87 ක් සමාලෝචිත වර්ෂය තුළ නිරාකරණය කර නොතිබුණි. ප්‍රසම්පාදන කටයුතු අවසන් නොවීම හේතුවෙන් ඇතැම් බිල්පත් ගෙවීම් වසර 8 කට වැඩි කාලයක් පුරා ප්‍රමාද වී තිබුණු බවද නිරීක්ෂණය

විය. එමඟින් මූල්‍ය පාලනයේ හා ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දුර්වලතා පවතින බව නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා ජීව වෛද්‍ය ඉංජිනේරු අංශය යටතේ නව වෛද්‍ය උපකරණ වර්ග 24ක් යටතේ ඒකක 1,358ක් මිලදී ගැනීම සඳහා රු. මිලියන 3,793.75ක අයවැය ප්‍රතිපාදන වෙන්කර තිබුණද, එක් උපකරණයක් හෝ ප්‍රායෝගිකව මිලදීගෙන නොතිබීම මතභේදයට තුඩුදෙන තත්ත්වයක් ලෙස විගණනයේදී නිරීක්ෂණය විය. තවද, 2026 ජනවාරි මාසයේ විගණිත දින වනවිටත් උපකරණ වර්ග 02කට අදාළව ඒකක 30ක් සඳහා ලංසු ප්‍රදානය කිරීම පමණක් සිදුකර තිබීම, ඉතිරි ප්‍රසම්පාදන ක්‍රියාවලි බොහෝමයක් ඇගයීම්, අභියාචනා, ප්‍රතික්ෂේප කිරීම්, ලේඛන සකස් කිරීම හෝ තීරණ ප්‍රමාද වීම වැනි අවධීන්හි පැවතීමෙන්, ප්‍රසම්පාදන ක්‍රියාවලියේ සැලසුම්කරණයේ හා ක්‍රියාත්මක කිරීමේ දැඩි දුර්වලතා පවතින බව නිරීක්ෂණය විය.

(ඈ) ප්‍රසම්පාදන සැලසුම් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු හේතුවෙන් 2024 හා 2025 වර්ෂයන්ට අදාළව මිලදීගැනීමට සැලසුම් කරන ලද රු.මිලියන 1,745 කට අදාළ අයිතම 09 ක ප්‍රසම්පාදන අවලංගු කර තිබුණි. ඒ අනුව රෝහල් පද්ධතිය සඳහා අත්‍යවශ්‍ය වෛද්‍ය උපකරණ කාලෝචිතව ලබාදීමට අසමත් වීම රෝගී සේවා ගුණාත්මකභාවයට හා ක්‍රියාකාරිත්වයට අහිතකර ලෙස බලපා හැකි බව නිරීක්ෂණය විය.

4.1.2 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්

දේශීය වෛද්‍ය අමාත්‍යාංශය/ අංශය විසින්, මධ්‍යම රජයට අයත් නොවන එනම් පළාත් 09 ට අයත් පළාත් පාලන ආයතන යටතේ ක්‍රියාත්මක නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලා 400කට ආසන්න සංඛ්‍යාවක් සඳහා මධ්‍යම රජයේ මූල්‍ය ප්‍රතිපාදන උපයෝගී කර ගනිමින් ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කිරීමෙන් තොරව 2021 වර්ෂයේ සිට 2025 දක්වා ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව වෙතින් සෘජුවම රු.මිලියන 479.43ක ඖෂධ මිලදීගෙන තිබුණි.

4.1.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(අ) ගාල්ල ජාතික රෝහලෙහි ස්ථාපිත කර තිබුණු සෞඛ්‍ය තොරතුරු කළමනාකරණ පද්ධතිය තවදුරටත් වැඩිදියුණු කිරීමේ අරමුණින් හා පද්ධතියට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කටයුතු HiQi ව්‍යාපෘතිය (Health Information and Quality Improvement Project) හරහා ක්‍රියාත්මක කිරීමේ අරමුණින් ඊට අවශ්‍ය උපකරණ ලබාදෙන බවත් එම උපකරණ ලැබෙන දින වන විට සේවාදායක පරිගණක කාමරයක් (Server unit) සාදා නිම කර තිබිය යුතු බවට 2024 අගෝස්තු 01 දිනැතිව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් දන්වා තිබුණි. ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග කිසිවක් ගෙන නොතිබිය දී පරිගණක හා උපාංග ඇතුළු උපකරණ ඒකක 3,851 ක් 2025 ජූලි 17 සිට 2025 දෙසැම්බර් 22 දක්වා කාලය තුළ වරින් වර රෝහලට ලබා දී තිබුණු අතර එම උපකරණ රෝහලේ ගබඩා කාමරයක් තුළ නිශ්කාර්යව ගබඩා කර තිබුණි. 2025 ජූලි 17 හා ජූලි 21 දිනැතිව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් රෝහලට ලබා දී තිබුණු පරිගණක හා උපාංග අයිතම 1827 ක පිරිවැය එක්සත්

ජනපද ඩොලර් 64,008 ක් වී තිබුණු අතර ඒ අනුව එහි වටිනාකම දළ වශයෙන් රු.US,SHK 19.20 (1 $ = රු.300/-) ක්වූ අතර අනෙකුත් උපකරණ අයිතම 2,024 ක පිරිවැයට අදාළ සාක්ෂි හා වගකීම් කාලයට අදාළ සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(i) මෙම කොන්ත්‍රාත්තුව ලබා ගැනීම සඳහා මිල ගණන් ඉදිරිපත් කළ ආයතන 05 ක් අතුරින් අවම ලංසුව වන රු.මිලියන 47.91 ක් ඉදිරිපත් කළ ආයතනයෙහි ලංසුව, විගණනය කරන ලද පූර්ව ගිණුම් වාර්තා, ගබඩා පහසුකම් සම්බන්ධ ලේඛන, ආදායම් බදු ගෙවන බවට දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලබන ලිපියක් හෝ ප්‍රේෂණ පත් සහ මූල්‍ය ස්ථාවරත්වය තහවුරු කරන ලද බැංකු වාර්තා ඉදිරිපත් නොකිරීම යන හේතු මත ප්‍රතික්ෂේප කර, ආදායම් බදු ගෙවන බවට දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරනු ලබන ලිපියක් හෝ ප්‍රේෂණපත් ඉදිරිපත්කර නොතිබුණු රු. මිලියන 48.41 ක ලංසුකරු තෝරාගෙන තිබුණි. මෙම ලංසුකරුද අදාළ ලේඛන 2025 මැයි 14 දින වන විටද ඉදිරිපත්කර නොතිබීම හේතුවෙන් 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 ඡේදය පරිදි විධිමත් ගිවිසුමකට එළඹීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(ii) 2024/25 වර්ෂයේ අමු ආහාර සැපයීමේ කොන්ත්‍රාත්තුව සඳහා තෝරාගත් ආයතනය ඉදිරිපත් කරන ලද ලංසුවේ තිබුණු ආහාර වර්ග කිහිපයක මිල ගණන් හා වෙළඳපොළ සාමාන්‍ය මිල ගණන් සැසඳීමේදී වෙළඳපල තුළ පවතින මිල ගණන් නොව අසාමාන්‍ය ලෙස අඩු මිල ගණන් ඉදිරිපත්කර තිබුණු බව නිරීක්ෂණය විය. එලෙස අසාමාන්‍ය ලෙස අඩු මිල ගණන් ඉදිරිපත් කිරීම තුලින් සමස්ත ලංසු වටිනාකම ප්‍රමාණාත්මක ලෙස අඩු වී තිබුණු අතර ප්‍රසම්පාදන අස්ථිත්වය ඒ පිළිබඳව සැලකිලිමත් වීමකින් තොරව ලංසුව පිරිනමා තිබුණි. අසාමාන්‍ය ලෙස අඩු මිල ගණන් ඉදිරිපත් කර ඇති අමු ආහාර අයිතම මාසික අවශ්‍යතාවය තුළ ලබා ගැනීමට රෝහල සැලසුම් කර තිබුණද, සලකා බලන ලද 2025 ජනවාරි සිට ජුනි දක්වා මාස 06 තුළ රෝහල විසින් මෙම අසාමාන්‍ය අඩු මිල ගණන් ඉදිරිපත් කර තිබුණු ආහාර ඇණවුම් කර නොතිබුණු හා ඇණවුම් කිරීමේදී ඉතා සුළු ප්‍රමාණයක් පමණක් ඇණවුම් කිරීම අසාමාන්‍ය තත්ත්වයක් බැවින් එය මතභේදයට තුඩු දෙන කරුණක් වූ අතරම මෙම අසාමාන්‍ය ලෙස මිල ගණන් අඩු ආහාර ආදේශක (විකල්ප) ආහාර ලෙස හෝ ඇණවුම් කිරීම මඟින් රජයට ලබා ගතහැකිව තිබුණු වාසිය හෝ ලබා ගැනීමට රෝහල විසින් කටයුතු කර නොතිබුණි.

(iii) අමු ආහාර ද්‍රව්‍ය සැපයීමේ කොන්ත්‍රාත්තුව අදාළව අසාමාන්‍ය ලෙස අඩු මිල ගණන් සහිත ආහාර ඇණවුම් නොකිරීම සම්බන්ධයෙන් පුද්ගලික ආයතනයක් විසින් ඉදිරිපත්කර තිබුණු 2025 මාර්තු 27 දිනැති ලිපිය සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකර නොතිබුණු අතරම රෝහලට අමු ආහාර සැපයීම සඳහා වන කොන්ත්‍රාත් ක්‍රියාවලියේ දූෂණ හා අක්‍රමිකතා සම්බන්ධයෙන් නීතිඥ, ප්‍රසිද්ධ නොතාරිස් හා දිවුරුම් කොමසාරිස්වරයෙකු විසින් 2025 ඔක්තෝබර් 28 දිනැති ලිපිය මඟින් සෞඛ්‍ය අමාත්‍යාංශය දැනුවත් කර තිබුණද, ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකර තිබුණු බව නිරීක්ෂණය නොවීය.

(ඡ) කොළඹ ජාතික රෝහල විසින් Urine Analyzer යන්ත්‍රයක් මිලදී ගැනීම සම්බන්ධයෙන් සිදුකරන ලද විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) රෝහලේ වෛද්‍ය රසායනාගාරයට Urine analyzer යන්ත්‍රයක් අවශ්‍ය බවට කරන ලද ඉල්ලීමට අනුව එම ප්‍රසම්පාදනය සඳහා 2017 වර්ෂයේදී අමාත්‍යාංශ අනුමැතිය ලබා දී තිබුණද ප්‍රසම්පාදනය සඳහා මිල ගණන් කැඳවීම ඊට වසර 4 කට පසු 2021 වර්ෂයේදී සිදු කර තිබුණි. එසේ ඉල්ලුම් කිරීමේදී එක් යන්ත්‍රයක් වෙනුවට යන්ත්‍ර 2 ක් සඳහා මිල ගණන් කැඳවීම සිදුකර තිබුණි. මිල ගණන් කැඳවූ දින සිට ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබාදීම සඳහා වසර දෙකකුත් මාස 09 ක කාලයක් ගතකර තිබුණි. මෙම ප්‍රසම්පාදනය සඳහා සැපයුම්කරුවන් දෙදෙනෙකු මිල ගණන් ඉදිරිපත් කර තිබුණු අතර එම මිල ගණන් අතර රු. මිලියන 23 ක වෙනසක් පැවතුණි. කෙසේ වුවද තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය අනුව අවම මිල ඉදිරිපත් කළ ලංසුව පිරිවිතරයට අනුකූල නොවන බව දක්වා රු. මිලියන 29.99 ක මිල ගණන් ඉදිරිපත් කළ ලංසුකරු වෙතින් මිලදී ගැනීමට ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබා දී තිබුණි.

(ii) මිලදී ගත් යන්ත්‍රය කොටස් 03 කින් සමන්විත වන අතර ප්‍රතික්ෂේපිත යන්ත්‍රය එම සියලු කාර්යයන් එක් කොටසකින් සිදු කරනු ලබයි. කොටස් 03 කින් ක්‍රියාත්මක වන යන්ත්‍රය සඳහා වැයවන ප්‍රතික්‍රියක ප්‍රමාණය එක් කොටසකින් ක්‍රියාත්මක වන යන්ත්‍රයට වඩා වැඩි මට්ටමක පවතින බැවින් මිලදී ගත් යන්ත්‍රය වෙනුවෙන් දැරීමට සිදුවන ප්‍රතික්‍රියක වියදම ඉහල මට්ටමක පවතී. ඒ හේතුවෙන් ප්‍රතික්‍රියක වෙනුවෙන් රජයට වැඩි පිරිවැයක් දැරීමට සිදුවන බව නිරීක්ෂණය විය. එසේ වුවද තාක්ෂණික ඇගයීම් කමිටුව හෝ ප්‍රසම්පාදන කමිටුව මේ පිළිබඳ අවධානය යොමු කර නොතිබුණි. තවද එක් පරීක්ෂණයක් සඳහා වැයවන ඒකක පිරිවැය පිළිබඳ සැලකීමේදී මිලදීගත් යන්ත්‍රය සඳහා ඒකක පිරිවැය රු.364 ක්ද ප්‍රතික්ෂේපිත ආයතනය සපයන යන්ත්‍රය සඳහා ඒකක පිරිවැය රු. 170 ක්ද ලෙස මිල ගණන් ඉදිරිපත් කර තිබුණද ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබාදීමේදී ඒ පිළිබඳ අවධානය යොමුකර නොතිබුණි.

(iii) පිරිවිතර අංක 05 යටතේ යන්ත්‍රය fluorescent flow cytomentry යන තාක්ෂණයෙන් සමන්විත විය යුතු බව දක්වා තිබුණ අතර එම පිරිවිතරය සහිත ඉහල මිල ගණන් ඉදිරිපත් කළ සැපයුම්කරුව තෝරාගෙන තිබුණි. එසේ වුවද එම

තාක්ෂණය වෙනුවට වෙනත් තාක්ෂණ මඟින් මෙම පරීක්ෂණ සිදුකළ හැකි NMRA ලියාපදිංචිය සහිත ශ්‍රී ලංකාව තුළ භාවිතා කරන Fully Automated Urine Analyzer පවතින බැවින් මෙය අනිවාර්ය නොවන පිරිවිතර අවශ්‍යතාවයක් බවත් එමඟින් මෙම ප්‍රසම්පාදනය සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීමට ඇති තරහකාරිත්වය සීමාකර තිබුණු බවත් නිරීක්ෂණය විය.

(iv) යන්ත්‍ර දෙක 2024 අගෝස්තු වන විට රෝහලට ලබාගෙන තිබුණද මෙම වාර්තාවේ දිනය දක්වාම ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව තිබුණි. කෙසේ වුවද යන්ත්‍ර සඳහා ගෙවීම් කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් ප්‍රතිපාදන ලබා දී නොතිබුණු බැවින් ගෙවීම් සිදුකර නොතිබුණි.

(ට) ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය විසින් රෝහල් සඳහා අවශ්‍ය CT Scanner යන්ත්‍ර මිලදී ගැනීමට අදාළ ප්‍රසම්පාදනයන් පිළිබඳව සිදුකරන ලද විගණනයේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) කොළඹ ජාතික රෝහල සඳහා CT Scanner යන්ත්‍රයක් මිලදී ගැනීම සම්බන්ධ මුල් ප්‍රසම්පාදන ක්‍රියාවලිය 2014 වර්ෂයේ ආරම්භ කර පසුව අවලංගු කිරීමෙන් අනතුරුව 2017 අගෝස්තු නැවත ආරම්භ කර තිබුණු අතර, ප්‍රසම්පාදන ක්‍රියාවලිය සැලසුම්කරණය, ක්‍රියාත්මක කිරීම හා පසුකාලීන කළමනාකරණය යන සියලු අදියරවල දී දුර්වලතාවයන් සහ ප්‍රමාදයන් පැවතුණි. ඒ අනුව තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින්ගේ වරින් වර සිදුවූ වෙනස්කම් හේතුවෙන් ඇගයීම් කටයුතු දිගු කාලයක් ප්‍රමාද වී තිබීම මෙන්ම, 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.4.1 හා 8.1.1(අ)(i)හි සඳහන් නියමිත කාලසීමාවන් ඉක්මවා තාක්ෂණික ඇගයීම් වාර්තා නිකුත් කිරීම, සහ අදාළ අනුමැති ක්‍රියාවලිය සම්පූර්ණ කර නොගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම මඟින් නියමිත කාලසටහන් අනුව කටයුතු කර නොතිබුණි. තවද, 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.7.1(ආ) අනුව අවසාන තීරණය ලබාගත් පසු වහාම සාර්ථක ලංසුකරු වෙත ප්‍රතිග්‍රහන ලිපිය නිකුත් කළයුතු වුවද මාස 05කට ආසන්න ප්‍රමාදයකින් ප්‍රතිග්‍රහණ ලිපිය නිකුත් කිරීම, සහ ප්‍රසම්පාදන තීරණ ක්‍රියාත්මක කිරීමට පෙර සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා නොගැනීම යනාදිය මඟින් නියාමන විධිවිධානවලට පටහැනිව කටයුතු කර ඇති බව නිරීක්ෂණය විය. එසේම, වසර 03ක වගකීම් කාලය අවසන් වූ පසු ක්‍රියාත්මක කළ යුතු සේවා ගිවිසුම වගකීම් කාලය අවසන් වීමෙන් පසු වසර 02ක කාලයක් ගතවී තිබියදීත් ක්‍රියාත්මක කර නොතිබීම හේතුවෙන් වත්කම් නඩත්තුව හා දිගුකාලීන භාවිතා හැකියාව පිළිබඳ විවිධ ගැටළු මතු කරන බවද නිරීක්ෂණය විය.

(ii) මාතර දිස්ත්‍රික් මහ රෝහලේ බාහිර රෝගී අංශය සඳහා CT Scanner යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා 2020 වර්ෂයේදී ආරම්භ කරන ලද ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනනුකූල ක්‍රියාකාරකම්, ප්‍රමාදයන් සහ පරිපාලන දුර්වලතා ගණනාවක් පැවති බව විගණනයේදී නිරීක්ෂණය විය. නියමිත පරිදි නොපමාව ලංසු ප්‍රදානය නොකර වසරකට ආසන්න කාලයක් ප්‍රමාද වීම

මඟින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.5.2 ඡේදයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කර නොතිබුණි. එසේම, ණයවර ලිපි විවෘත කිරීම සහ සැපයුම් ප්‍රමාද වීම හේතුවෙන් අතිරේක වියදම් ලෙස රු.5,007,047ක් දරා තිබුණද, ඒ සඳහා වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන එම මුදල් ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, වසර 04කට ආසන්න කාලයක් සමස්ත ප්‍රසම්පාදන ක්‍රියාවලියේ පැවති ප්‍රමාදයෙන් පසු උපකරණය 2024 මාර්තු 28 දින රෝහලෙහි ස්ථාපිත කර තිබුණි. ඉන් අනතුරුව ලංසු පිරිවිතර 19.1(b) අනුව ලබාදිය යුතු විදේශ පුහුණුව සම්පූර්ණයෙන් ලබා නොදීම හේතුවෙන් උපකරණය නිසි ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය තාක්ෂණික හැකියාවන් සීමා කර තිබුණු අතර, වගකීම් කාලය අවසන් වීමෙන් පසු ක්‍රියාත්මක කළ යුතු සේවා ගිවිසුමකටද එලඹ නොමැතිව සහ අදාළ පුහුණු වියදම්ද අයකර ගැනීමකින් තොරව සැපයුම්කරුට මුදල් සම්පූර්ණයෙන් ගෙවා තිබුණි.

(iii) කළුතර ශික්ෂණ රෝහල සඳහා CT Scanner යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා 2021 වර්ෂයේදී ආරම්භ කරන ලද ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ සැලසුම්කරණයේ දුර්වලතා, ප්‍රමාදයන්, මාර්ගෝපදේශ අනනුකූල ක්‍රියාකාරකම් සහ ආර්ථිකභාවය පිළිබඳ අවධානයක් නොමැති වීම ප්‍රබල ලෙස නිරීක්ෂණය විය. 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.3 ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නියමිත සති 02-04 ක කාලසීමාව තුළ වාර්තා ලබාදීමට අසමත් වී මාස 05ක ප්‍රමාදයකින් පසුව ඇගයීම් සිදුකර තිබීමත්, එම ඇගයීම්වලදී අත්‍යාවශ්‍ය අමතර කොටස් පිරිවැය සලකා නොබැලීමත් මඟින් නිසි හා සම්පූර්ණ ඇගයීම් ක්‍රියාවලියක් පවත්වාගෙන ගොස් නොතිබුණු බවත් නිරීක්ෂණය විය. තාක්ෂණික ඇගයීම් කමිටු තීරණයෙන් මාස 03කට පමණ පසු 2022 අගෝස්තු 24 දින ලංසු ප්‍රදානයට අනුමැතිය ලැබී තිබුණද 2024 මැයි 09 දින පැවැත්වූ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු තීරණය මත මුළු පිරිවැය එ.ජ ඩොලර් 584,500 කට 2024 ජූනි 07 දින ලංසු ප්‍රදානය සිදුකර තිබුණි.ඒ අනුව, මුල් ලංසු ප්‍රදාන අනුමැතියෙන් වසර දෙකකට ආසන්න කාලයකින් පසුව නැවත ලංසු ප්‍රදානය කරන අවස්ථාවේදී, උපකරණයේ වර්තමාන වෙළඳපොළ මිල ගණන් නැවත ඇගයීමක් හෝ යාවත්කාලීන මිල ගණන් ලබා ගැනීමක් සිදුකර නොතිබුණු අතර, 2024 ජූලි කුරුණෑගල ශික්ෂණ රෝහල සඳහා මේ හා සමාන උපකරණයක් මිලට ගැනීම සඳහා ලංසු කැඳවීමේදී මුළු පිරිවැය වටිනාකම එ.ජ. ඩොලර් 464,946 ක අවම ලංසුවක් ඉදිරිපත් වූ ලංසුකරුට ලංසු ප්‍රදානය කර තිබුණු බවද නිරීක්ෂණය විය. තවද, ගැනුම් ඇණවුම නිකුත් කිරීමෙන් පසු මාස 07කට පසුව ණයවර ලිපි විවෘත කිරීම සහ මාස 03කට පසුව රේගු දෙපාර්තමේන්තුවෙන් යන්ත්‍රය නිදහස් කිරීම දක්වා සමස්ත ක්‍රියාවලිය වසර 04කට වැඩි කාලයක් ගත කිරීම මඟින් රෝගී සත්කාර සේවාවන්ට අවශ්‍ය උපකරණ කාලෝචිතව ලබාදීමට අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය විය. එසේම, ලංසු කොන්දේසි අනුව ලබාදිය යුතු විදේශීය පුහුණුව 2026 මැයි 21 දින දක්වා ලබාදී නොතිබුණි.

(iv) කුරුණෑගල ශික්ෂණ රෝහල සඳහා CT Scanner යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා 2024 වර්ෂයේදී ආරම්භ කරන ලද ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ සැලසුම්කරණයේ දුර්වලතා, සම්බන්ධීකරණයේ අඩුපාඩු සහ ප්‍රමාදයන් පැහැදිලිව නිරීක්ෂණය විය. තාක්ෂණික පිරිවිතර සකස් කිරීමේදී ජීව වෛද්‍ය ඉංජිනේරු අංශය සහ තාක්ෂණික ඇගයීම් කමිටුව අතර නොගැලපීම් හේතුවෙන් පිරිවිතර නැවත නැවත සංශෝධනය කිරීම සිදුවීම මඟින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ වීම ප්‍රමාද වී තිබුණු අතර, පූර්ව ලංසු රැස්වීමේදීද පිරිවිතර සංශෝධනය කිරීම සහ තාක්ෂණික ඇගයීම් වාර්තා ප්‍රමාදව ඉදිරිපත් කිරීම මඟින් කාර්යක්ෂම සැලසුම්කරණයක් හා නිසි සම්බන්ධීකරණයක් නොතිබුණු බව නිරීක්ෂණය විය. එමෙන්ම ප්‍රසම්පාදන තීරණ ලබාගැනීමේදී සියලුම පිරිවැය හා වාසි නිවැරදිව සලකා නොබැලීම හේතුවෙන් අනුමැති ක්‍රියාවලිය නැවත සිදුකිරීමට සිදුවීම සහ ණයවර ලිපි විවෘත කිරීමේදී ප්‍රමාදයන් ඇතිවීම මඟින් වෛද්‍ය උපකරණ කාලෝචිතව ලබා ගැනීම ප්‍රමාද වී තිබුණි. තවද, යන්ත්‍රය 2025 දෙසැම්බර් 08 දින රෝහල වෙත සපයා තිබුණද ස්ථාපනය සඳහා අවශ්‍ය ඉදිකිරීම් කටයුතු 2026 මාර්තු වනවිටත් අවසන් නොවීම හේතුවෙන් එය භාවිතයට ගැනීමට නොහැකි වීම සහ විදේශ මුදුණුව ලබාදීම සඳහා සැපයුම්කරු විසින් අවස්ථාව ලබාදී තිබියදීත් අදාළ නිලධාරීන් නම්කර යැවීමට 2026 මාර්තු 23 වගඵිත දින වන විටත් අමාත්‍යාංශය අපොහොසත් වීම මඟින් පරිපාලන සහ යටිතල පහසුකම් සැලසුම්කරණයේ දුර්වලතා පවතින බව නිරීක්ෂණය විය.

(v) දඹුල්ල, නාවලපිටිය සහ කුලියාපිටිය රෝහල් සඳහා CT Scanner යන්ත්‍ර **03**ක් මිලදී ගැනීම සඳහා රු. මිලියන 600 ක ප්‍රතිපාදන යටතේ **2024** වර්ෂයේදී ආරම්භ කරන ලද ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ සැලසුම්කරණයේ දුර්වලතා, ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනනුකූල ක්‍රියාකාරකම්, ප්‍රමාදයන් සහ සාධාරණත්වය සම්බන්ධ ගැටලු ගණනාවක් පැවති බව විගණනයේදී නිරීක්ෂණය විය. තාක්ෂණික පිරිවිතර සකස් කිරීමේදී හා පූර්ව ලංසු අදියරේදී නැවත සංශෝධන සිදු කිරීම සහ තාක්ෂණික ඇගයීම් වාර්තා ප්‍රමාදව ඉදිරිපත් කිරීම මඟින් කාර්යක්ෂම සැලසුම්කරණයක් හා සම්බන්ධීකරණයක් නොතිබුණු බව නිරීක්ෂණය විය. තවද, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු නිර්දේශය, සෞඛ්‍ය ලේකම්ගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබීම සහ ජයග්‍රාහී ලංසුකරු තෝරා ගැනීම පිළිබඳව සියලුම ලංසුකරුවන්ට නිසි පරිදි දැනුවත් නොකිරීම මඟින් 2006 රජයේ මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 8.1.1(අ)(i) හා 8.2.1 විධිවිධානවලට අනුකූලව කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. කෙසේ වුවත් අභියාචනා ක්‍රියාවලියේදී තාක්ෂණික පිරිවිතරයන්ට අනුකූලතාවය සනාථ කර නොගෙන, අදාළ ලංසුකරු විසින් එම කොන්දේසි ඉටුකරනු ඇතැයි පදනම් මත අභියාචනා ලංසුකරුට ලංසු ප්‍රදානය කිරීමට තීරණය කිරීම ප්‍රසම්පාදන ක්‍රියාවලියේ මූලික අරමුණු උල්ලංඝනය කිරීමක් ලෙස නිරීක්ෂණය විය. එසේම අවසාන තීරණයෙන් පසු ප්‍රතිග්‍රහණ ලිපිය නිකුත් කිරීම ප්‍රමාද වීම, පූර්වයෙන් නිර්දේශිත ලංසුකරුවන්ට නැවත ඇගයීම් හෝ තීරණ පිළිබඳ දැනුවත් නොකිරීම සහ එමඟින් අභියාචනා කිරීමේ සමාන අවස්ථාව අහිමි වීම හේතුවෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලියේ

සාධාරණත්වය ඉටුකර නොතිබුණි. තවද, **2026** මැයි **21** දින වනවිටත් අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කර නොතිබුණි.

(ඇ) මැලේරියා මර්දන ව්‍යාපාරයේ මහජන සෞඛ්‍ය සංකීර්ණයේ ගබඩාව අළුත්වැඩියා කිරීම හා නව ගබඩාව ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සම්බන්ධ පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) ගබඩාව අළුත්වැඩියා කිරීමේදී ඇස්තමේන්තුවේ දක්වා තිබුණු වැඩ විෂයයන් 13කට අදාළව ඇස්තමේන්තුවේ ප්‍රමාණාත්මක විස්තර නොදැක්වීම හේතුවෙන් ඇස්තමේන්තු ගත මුදලේ නිවැරදිභාවය හා කාර්යය නිමකළ පසු ප්‍රගතිය පරීක්ෂා කිරීම සිදු කළ නොහැකි විය. උදාහරණ වශයෙන් ඉවත් කළ යුතු තහඩු ප්‍රමාණය, තහඩු සහ බිම සම්බන්ධක ස්ථාන සඳහා යොදන කොන්ක්‍රීට් ආවරණවල දිග පළල හා ඝනකම පිළිබඳව සඳහන් කර නොතිබීම, නව ගබඩාව සඳහා යකඩ ආධාරක කණු සහිත සැකිල්ල සකස් කිරීම වෙනුවෙන් වැඩ ප්‍රමාණය ගණනය කළ ආකාරය දැක්වෙන මිණුම් දක්වා නොතිබීම, ගබඩා රාක්ක ඉදිකිරීමේදී ඒවායේ දිග, පළල, උස හා යෙදිය යුතු අමුද්‍රව්‍ය සඳහන් කර නොතිබීම දැක්විය හැක.

(ii) කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා තෝරාගත් ආයතන 6කින් මිල ගණන් කැඳවීම සිදුකර තිබුණද එම ආයතන තෝරා ගත් පදනම විගණනයට අනාවරණය නොවුණු අතර එම ආයතන කිසිවක් 2024 වර්ෂයේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත්ව නොතිබුණි. තවද මෙම කොන්ත්‍රාත්තුව පිරිනමන ලද ආයතනය තනි පුද්ගල ව්‍යාපාරයක් ලෙස ලියාපදිංචි කරන ලද අංකය හා ලිපිනය පරීක්ෂා කිරීමේදී එම අංකය යටතේ ලියාපදිංචි වී ඇත්තේ වෙනත් නමකින් යුත් ආයතනයක් බවත් හා එම ලිපිනය යටතේ මේ නමින් ආයතනයක් නොමැති බවත් නිරීක්ෂණය විය.

(iii) මෙම ඉදිකිරීම සඳහා සැපයුම්කරු තෝරා ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ පහත දැක්වෙන විධිවිධාන වලට පටහැනිව කටයුතු කළ අවස්ථා පැවතුණි.

- 2.8.1(ආ) මාර්ගෝපදේශය - තාක්ෂණික ඇගයීම් කමිටුව විෂය පිළිබඳ විශේෂඥයකුගෙන් හෝ ප්‍රමාණවත් දැනුමක් ඇති එක් සාමාජිකයෙකුගෙන් සමන්විත වී නොතිබුණි.

- 5.4.6 (ආ) මාර්ගෝපදේශය - රඳවාගැනීමේ මුදලක් අයකර ගෙන නොතිබුණි.

- 6.3.6 මාර්ගෝපදේශය - විධිමත් ලංසු විවෘත කිරීමේ ආකෘති පත්‍රයක් හා විධිමත් පත්වීම් ලිපියක් නොතිබුණි.

- 8.9.1 (ආ) මාර්ගෝපදේශය - විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කිරීමට කටයුතු කර නොතිබුණි.

- 8.12.2 මාර්ගෝපදේශය - වැඩ අවසන් කිරීමේ සහතිකයක් ඉංජිනේරුවරයා/උපදේශකවරයා විසින් නිකුත් කර නොතිබුණි.

(iv) 2025 සැප්තැම්බර් 26 දින සෞඛ්‍ය අමාත්‍යාංශයේ තාක්ෂණික නිලධාරිනියකගේ සහාය ඇතිව සිදු කරන ලද ස්ථානීය පරීක්ෂාවට අනුව, තාක්ෂණික ඇහයීම් කමිටු වාර්තාවේ පිරිවිතරයන් හා ඊට අදාළව ඉටු කර ඇති වැඩ විෂයයන් පරීක්ෂාවේදී පළමු ගබඩාවේ විවෘතයට ලක්වූ තහඩු සම්පූර්ණයෙන් ඉවත් නොකිරීම, පළමු ගබඩාව තුළ ඇති Iron Support ඉවත් කිරීමක්/ පිළිසකර කිරීමක් කර නොතිබීම, තහඩු හා කොන්ක්‍රීට් ආවරණය අතර සිලිකෝන් සීලන්ට්(silicone Sealant) යොදා නොතිබීම, නව ගබඩාවේ රාමුව යකඩ කණු (Iron Support post) මීටර් 140 ක් භාවිතාකළ බව දක්වා තිබුණද සත්‍ය ලෙස ඉටුකළ ප්‍රමාණය මීටර් 50ක් පමණක් වීම, මිලිමීටර් 0.47 ක ඝනකම සහිත තහඩු වර්ගමීටර් 60ක් යෙදීම වෙනුවට වර්ගමීටර් 35 ක ප්‍රමාණයක් පමණක් ඉටුකිරීම, වර්ගමීටර් 200 ක තින්ත (anti-corrosive paint) ආලේප කිරීම වෙනුවට වර්ගමීටර් 190 ක් ප්‍රමාණයක් පමණක් යොදා තිබීම, නව සහ පවතින ගබඩා අතර අඩි 4x20 කොන්ක්‍රීට් තීරුවක් යෙදීම වෙනුවට පළල අඩි 2 ත් 3ත් අතර යොදා තිබීම හා එහි ඝනකමේ නිරවද්‍යතාව පරීක්ෂා කළ නොහැකි වීම, නව ගබඩාවේ වහලය ජලය කාන්දු නොවන (water proof) ආකාරයට අළුත්වැඩියාව සිදු නොකිරීම හා ගබඩාව තුළ සවිකරන ලද රාක්ක වලට සවිකළ යුතු ලී පුවරු (Iron frame with wooden planks) සම්පූර්ණයෙන්ම සවි නොකිරීම නිරීක්ෂණය විය. මෙම අඩුපාඩු පැවතියදී ගෙවීම් කිරීම හේතුවෙන් විගණනය විසින් සිදුකරන ලද ගණනය කිරීම් අනුව රු. 916,200 ක මුදලක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි.

(ඩ) පවුල් සෞඛ්‍ය කාර්යාංශය විසින් ක්‍රියාත්මක කර තිබුණු ප්‍රසම්පාදන කටයුතු විගණනයේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(ආ) ප්‍රකාර රු.500,000 ඉක්මවන භාණ්ඩ හා සේවා කොන්ත්‍රාත් සඳහා විධිමත් ප්‍රතිග්‍රහණ ලිපියක් නිකුත් කළ පසු විධිමත් කොන්ත්‍රත් ගිවිසුමක් ලියා අත්සන් කිරීම සිදු කළයුතු වුවත් රු.5,876,400 ක් වූ PHM Diary 20,000 ක්, රු.1,325,553 ක් වූ Eligible Family Register 15,000 ක් රු.1,057,221 ක් වූ Global School Health Survey 2024 750 ක් හා රු.1,718,080 ක් වූ Moews Chart 400,000 ක් මුද්‍රණය කිරීම සඳහා වූ ප්‍රසම්පාදන සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ii) PHM Diary හා Moews chart මුද්‍රණය කිරීම සම්බන්ධ ප්‍රසම්පාදනයේදී ලංසුකරුවන්ට ලබා දී ඇති උපදෙස් පත්‍රිකාව ප්‍රකාරව අවසන් කෙටුම්පත සඳහා කාර්යාංශයේ අනුමැතිය ලැබීමෙන් පසු සති 2ක් තුළ භාණ්ඩ සැපයිය යුතුවේ. එසේ නොවුනහොත් ලංසු ලියවිලිවල 7 ඡේදයේ 15.1 ප්‍රකාරව මුළු කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 1 ක ප්‍රමාද ගාස්තු අයකළ යුතුය. කාර්යාංශය විසින් අවසන් කෙටුම්පත සඳහා අනුමැතිය ලබා දුන් දිනයක් නිශ්චිතව සඳහන් කර නොතිබීම හේතුවෙන් ප්‍රමාද ගාස්තු අයකළ යුතුද නැද්ද යන්න තීරණය කිරීමට විගණනයට

නොහැකි විය. තවද එම ප්‍රසම්පාදනයන්ට අදාළව ලංසු උපදෙස් පත්‍රිකාවේ 37.2 ප්‍රකාරව ලංසුකරුගේ මූල්‍යමය හැකියාව සනාථ කිරීම සඳහා පසුගිය වසර 3කට අදාළව ශුද්ධ අලාභ නොලබා සිටිය යුතු බව දක්වා තිබුණද ඉදිරිපත් කර තිබුණු විගණිත මූල්‍ය ප්‍රකාශන අනුව පසුගිය වසරවල ශුද්ධ අලාභයන්ද ලබා තිබුණි.

(iii) ප්‍රසම්පාදන කාර්යය සංග්‍රහයේ 2.8.1(ආ) මාර්ගෝපදේශය අනුව, විෂය පථය සහ ප්‍රසම්පාදන කාර්යය පටිපාටිය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ඇති එක් සාමාජිකයෙකුගෙන් තාක්ෂණික ඇගයීම් කමිටුව සමන්විත විය යුතු වුවද පිරිවැය රු.2,002,932 ක් වූ Electronic adult weighing scales ප්‍රසම්පාදනයට අදාළ තාක්ෂණික ඇගයීම් කමිටුව එවැනි දැනුමක් සහිත සාමාජිකයකුගෙන් සමන්විත වී නොතිබුණි.

(ඝ) සමාලෝචිත වර්ෂයේදී හලාවත දිස්ත්‍රික් මහ රෝහලට Fully Automated Microtome යන්ත්‍රයක් මිලදී ගැනීමේදී ඉදිරිපත් කර තිබුණු මිල ගණන් දෙකෙන් රු.9,500,000 ක් වැඩියෙන් දක්වා තිබුණු ආයතනයෙන් අදාළ යන්ත්‍රය මිලට ගෙන තිබුණි.

(ඞ) වෛද්‍ය සැපයීම් අංශයට සලාක ක්‍රමයට ශල්‍ය ගෝස් (SR -14500101) සැපයීම සඳහා දේශීය සැපයුම්කරුවන් 282 ක් ලියාපදිංචි කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය සඳහා ඔවුන්ගෙන් මීටර් මිලියන 30ක් ලබා ගැනීම සඳහා අංක 2025/MSD/N/R/S/00005 දරන ඇණවුම ඉදිරිපත් කර තිබුණි. අදාළ ඇණවුමෙන් මීටර් මිලියන 5.6ක් වූ දෙවන කාර්තුවට අදාළ සැපයුම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය..

(i) 2025 අප්‍රේල් මාසයේදී ශල්‍ය ගෝස් මීටර් 86,500 ක් සැපයීම සඳහා ඇණවුම් භාරගත් සැපයුම්කරුවන් දෙදෙනෙකු එකඟ වූ නිෂ්පාදනවලින් මීටර් 17,800 ක් පමණක් සපයා තිබුණු අතර මීටර් 58,400 ක් වෙනත් සැපයුම්කරුවෙකුගේ තත්ත්වයෙන් හා ප්‍රමිතියෙන් බාල ගෝස් වර්ගයකින් සපයා තිබුණි. මීටර් 10,300 ක් සපයා නොතිබුණු අතර මීටර් 86,500 ක මුළු තොගයම සැපයූ බවට රු.5,965,905 ක ඉන්වොයිසිපත් ඉදිරිපත් කර තිබුණි. මෙම අඩුපාඩු සම්බන්ධයෙන් ගබඩා නිලධාරීන්ගේ අවධානය යොමු කර නොතිබුණු අතර තොග නියමිත වර්ගයෙන්, ගුණත්වයෙන් සහ ප්‍රමාණයෙන් සපයා ඇති බවට සැහීමකට පත්වීම සඳහා කටයුතු නොකර ඉන්වොයිසියේ සඳහන් මුළු වටිනාකම සඳහා භාණ්ඩ භාර ගැනීම් තුණ්ඩු (GRN) පිළියෙල කිරීමට සැළසුම් කර තිබූ බව නිරීක්ෂණය විය.

(ii) 2025 මැයි මාසයේදී සැපයුම්කරුවන් 53 දෙනෙකු මඟින් ශල්‍ය ගෝස් මීටර් 1,047,900ක් සපයා ගැනීමට ඇණවුම් කර තිබුණද ඉන් මීටර් 295,900 ක් වූ ප්‍රමාණය සැපයීමට එකඟ වූ සැපයුම්කරුවන් 5 දෙනෙකු අදාළ සැපයීම් කර නොතිබුණද ඇණවුම් කොන්දේසි අංක 10 ප්‍රකාරව ඔවුන් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. තවද ශල්‍ය ගෝස් මීටර් 75,200 ක් සැපයූ බවට ඉන්වොයිස්

ඉදිරිපත් කළ සැපයුම්කරුවකු ගබඩාවට සපයා තිබුණු ප්‍රමාණය මීටර් 33,000ක් පමණක් බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(iii) ආයතන සංග්‍රහයේ XLVII වැනි පරිච්ඡේදයේ 1.5 වගන්තිය අනුව නිලධරයකු විසින් ස්වකීය පෞද්ගලික කටයුතු හා රාජකාරී කටයුතු අතර ගැටුමක් ඇතිවන අන්දමේ කිසිම දෙයක් හෝ සිය නිල කටයුතුවලට අවහිර වන අන්දමේ කිසිම දෙයක් හෝ නොකළ යුතු අතර XXX වැනි පරිච්ඡේදයේ 1.2 වගන්තිය අනුව වාණිජ ව්‍යාපාරයක හෝ වෙළඳ ව්‍යාපාරයක නොයෙදිය යුතුය. එසේ වුවද වෛද්‍ය සැපයීම් අංශයේ නිලධාරීන්ට සෘජු සම්බන්ධතා පවතින ව්‍යාපාර වෙත ගෝස් සලාක ලබා දී ඇති බව නිරීක්ෂණය විය. වෛද්‍ය සැපයීම් අංශයට ශල්‍ය ගෝස් සපයන දේශීය ආයතනවල භිමිකාරිත්වය හා කළමනාකාරිත්වය සම්බන්ධයෙන් සිදුකළ විගණන පරීක්ෂාවේදී එවැනි සම්බන්ධතා සහිත ඇතැම් නිලධාරීන් ගෝස් සලාක නිර්ණය කිරීමේ කමිටුවේ නිලධාරීන් ලෙසද කටයුතු කර තිබුණු අතර ගෝස් සලාක නිර්ණය කිරීමේ කමිටුව විසින්ද මේ සම්බන්ධයෙන් කිසිදු පසුවිපරමක් සිදුකර නොතිබුණි.

(ත) මහරගම අපේක්ෂා රෝහලේ ඖෂධ, ශල්‍ය ද්‍රව්‍ය සහ ප්‍රතික්‍රියාකාරක ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2022 ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.5 මාර්ගෝපදේශය පරිදි විශේෂ අවස්ථාවන්හිදී එනම් හදිසි හා ඉතා හදිසි මිලදී ගැනීම් හෝ විශේෂිත නිෂ්පාදනයක් සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන් හෝ නිෂ්පාදකයින් නොමැති අවස්ථාවන්හිදී ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතිකයක් (Waiver of Registration (WOR)) ලබා ගත යුතුය. ඒ අනුව ලියාපදිංචිය මඟින් ඒවායේ තත්ත්වය පිළිබඳ තහවුරුවක් නොමැති වෛද්‍ය සැපයීම් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතිකය (WOR) ලබාදීමේ පදනම මත දේශීය වෙළඳපලෙන් මිලදීගැනීමට ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කර තිබුණි. නියැදි පරීක්ෂාවට අනුව ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතිකය ලබාගැනීමට යටත්ව අවස්ථා 10කදී රු.11,617,655ක (වැට් සහිත) වෛද්‍ය සැපයීම් මිලදී ගෙන තිබුණු අතර ඉන් 2024 වර්ෂයේ මිලදීගන්නා ලද එකතුව රු.3,492,800 ක් වූ ප්‍රතික්‍රියාකාරක සම්බන්ධයෙන් අදාළ ආයතන විසින් එම සහතික ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණු බව ලිපිගොනු පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. මේ හේතුවෙන් ඒවායේ ගුණාත්මකභාවය විගණනයේදී මතභේදයට තුඩුදෙන කරුණක් විය.

(ii) සමාලෝචිත වර්ෂයේ මිලදී ගත් අත්‍යවශ්‍ය ඖෂධ හා ප්‍රතික්‍රියාකාරකවලට අදාළව වෛද්‍ය සැපයීම් අංශයේ අවසාන ඇණවුම් මිලගණන්වලට (Latest price) සාපේක්ෂව සියයට 56 සිට සියයට 767 දක්වා වූ පරාසයක ඉහල මිළ ගණන්වලට මිලදීගැනීම් සිදුකර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. ඒ අනුව විගණනය විසින්

සිදුකරන ලද නියැදි පරීක්ෂාවේදී අවස්ථා 10 කදී එකතුව රු.22,330,915ක අතිරේක වියදමක් දැරීමට රෝහලට සිදුවී තිබුණු බව නිරීක්ෂණය විය.

(iii) රාජ්‍ය ඖෂධ සංස්ථාව මගින් 2020 වර්ෂයේ සිදු කරන ලද හදිසි මිලදී ගැනීමක් සම්බන්ධයෙන් රෝහලේ කිසිදු ප්‍රසම්පාදන ලේඛනයක් හෝ කිසිදු ලිඛිත සටහනක් නොමැතිවීම හේතුවෙන් ගෙවීම් සිදුකර නොතිබුණි. මෙම නොගෙවූ බිල්පත් සඳහා ගෙවීම් කරන ලෙස රාජ්‍ය ඖෂධ සංස්ථාව විසින් වරින් වර රෝහල වෙත සිහිකැඳවීම් ලිපි මගින් දැනුම්දී තිබුණු අතර මෙම හිඟ බිල්පත් සඳහා ගෙවීම් කරන තුරු රෝහල වෙත තවදුරටත් ණය පදනම මත ඖෂධ ලබාදිය නොහැකි බව දැනුම් දී තිබුණි. මේ හේතුවෙන් රෝහල්වලට අත්‍යාවශ්‍ය හදිසි වෛද්‍ය සැපයුම් මිලදීගැනීම සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද 2019 ජූලි 10 දිනැති අංක 01-41/2019 දරන පොදු වක්‍රලේඛයේ දක්වා ඇති පරිදි හදිසි වෛද්‍ය සැපයුම් රාජ්‍ය ඖෂධ සංස්ථාවෙන් මිලදීගැනීමේ අවස්ථාව රෝහලට අහිමි වී තිබුණි.

(iv) Chemical pathology අංශයේ Analyzer selectra pro–xl යන්ත්‍රය සඳහා ප්‍රතික්‍රියාකාරක (Reagents) මිලදී ගැනීම සඳහා අදාළ නියෝජිත ආයතනයෙන් මිල ගණන් කැඳවා තිබුණි. 2024 සැප්තැම්බර් 26 දිනැති ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව විසින් රු.40,522,141 ක මුදලකට එම ප්‍රතික්‍රියාකාරක මිලදී ගැනීමට තීරණය කර තිබුණු අතර මෙම ප්‍රසම්පාදන කමිටු තීරණය රෝහල් අධ්‍යක්ෂ විසින් අනුමත කර තිබුණි. සෞඛ්‍ය අමාත්‍යාංශයේ මුදල් පාලනය පිළිබඳ බලතල පැවරීම අනුව ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවට රු.මිලියන 25ක් දක්වා වූ සීමාවක් තුළ ප්‍රසම්පාදනය කිරීමේ හැකියාව පැවතුණද මෙම මිලදීගැනීමේදී එම සීමාව ඉක්මවා කමිටුව කටයුතු කර තිබුණු බව නිරීක්ෂණය විය.

(v) 2022 ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීමේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.6.2 මාර්ගෝපදේශය අනුව තරඟකාරී මිල සහතික වීම සඳහා අවම වශයෙන් මිළගණන් 03 ක්වත් ලබාගත යුතු වුවද රෝහල විසින් ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිලදී ගැනීමේ ක්‍රමය යොදාගත් අවස්ථා 32 කදී එක් මිල ගණන් ලැබීමක් පමණක් පාදක කරගනිමින් තරඟකාරිත්වයකින් තොරව රු.42,711,118ක ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය මිලදීගෙන තිබුණු බව නියැදි පරීක්ෂාවේදී අනාවරණය විය. ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළින් අපේක්ෂිත පරිදි අවම මිලගණන් යටතේ උපරිම ආර්ථික වාසි ලබාගැනීමේ අවස්ථාව අහිමි වී තිබුණි.

(vi) හිඟ ඖෂධ, ශල්‍ය ද්‍රව්‍ය සහ ප්‍රතික්‍රියාකාරක හදිසි අවශ්‍යතාවය මත මිලදී ගැනීම් සිදුකළද එම මිලදී ගැනීම්වලට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා මාස 03 සිට 06 දක්වා වූ කාලයක් ගතවී තිබුණු අවස්ථා 15ක් 2024 හා 2025 වර්ෂයන් තුළදී නිරීක්ෂණය විය. ඒ අනුව රෝගීන්ට අඛණ්ඩව සත්කාර සේවා ලබාදීමට නොහැකිවීමෙන් රෝගීන්ගේ රෝගී තත්ත්වයට බලපෑමක් සිදුවිය හැකි බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඒ) ගාල්ල ජාතික රෝහලේ දේශීය වෙළඳපොල හදිසි මිලදී ගැනීම් සම්බන්ධයෙන් සිදුකරන ලද විගණනයේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) විගණන නියැදි පරීක්ෂාවට අනුව 2024 හා 2025 මැයි වනතුරු මිලදී ගත් එකතුව රු.54,045,008 ක් වූ ශල්‍ය වෛද්‍ය උපකරණවලින් සියයට 35 ක් හෙවත් පිරිවැය රු.19,341,200 ක් එකම සැපයුම්කාර සමාගමකට ලංසු ප්‍රදානය කිරීම සිදු කර තිබුණි. ඒ අනුව එම වර්ෂ වලදී මිලදී ගත් ශල්‍ය වෛද්‍ය උපකරණ අයිතම 80 කින් අයිතම 10 ක් විගණනය විසින් නියැදි පරීක්ෂාවට ලක් කළ අතර තෝරාගත් නියැදියෙන් මෙම සැපයුම්කාර සමාගමට ලංසු ප්‍රදානය කළ අයිතම 6 ක් අඩංගු වූ අතර අයිතම 4 සම්බන්ධයෙන් අදාළ විශේෂඥ වෛද්‍යවරයාගේ නිර්දේශය මත හා කිසිදු හේතුවක් සඳහන් නොකර අවම මිල නොසලකා එම සමාගමට ලංසු ප්‍රදානය කිරීමට ප්‍රසම්පාදන කමිටුව තීරණය කිරීම හේතුවෙන් රු.2,668,800 ක මුදලක් රජයට පාඩු වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී සැපයුම්කරුවන් අතර සාධාරණ තරහකාරීත්වයකට ඉඩ ලබා දී එහි වාසිය ප්‍රසම්පාදන ආයතන වෙත ලබා ගැනීමට හැකි වන අයුරින් අදාළ අස්ථිත්වයන් විසින් ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුතු වුවත් ඊට අනුකූල නොවී එක් සැපයුම්කරුවකු පමණක් මිල ගණන් ඉදිරිපත් කළ අවස්ථා 06 ක දී රු. 6,690,175 ක් වටිනා ඖෂධ වර්ග සහ ශල්‍ය වෛද්‍ය උපකරණ 06 කට අයත් ඒකක 588 ක් මිලදී ගෙන තිබුණි.

(ඓ) හම්බන්තොට දිස්ත්‍රික් මහා රෝහලට අදාළව සිදුකරන ලද විගණනයේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයේ ඖෂධ, රසායන ද්‍රව්‍ය, ශල්‍ය උපකරණ දේශීය වෙළෙඳපලෙන් මිලදී ගැනීමට අදාළව සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීමේ දී 2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2 (ඊ) ප්‍රකාරව සුදුසුකම් ලත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ප්‍රසම්පාදනයට සහභාගී වීම සඳහා සාධාරණ, සමාන හා උපරිම අවස්ථා ලබා දීම, 1.3.2 (ඊ) ප්‍රකාරව සුදුසුකම්ලත් සියළු විභව ලංසුකරුවන්ට ප්‍රමාණවත් කාලයක් හා ප්‍රමාණවත් තොරතුරු ලබා දීම හා 1.5.1 ප්‍රකාරව රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ පවත්වා ගත යුතු රහස්‍යභාවය ආරක්ෂා කිරීම යන අරමුණු හා මූලධර්මවලට අනුකූල නොවන පරිදි එකම ප්‍රසම්පාදන කටයුත්තට අදාළව ඒකාකාරී ක්‍රමවේදයකින් බැහැරව සැපයුම්කරුවන් වෙතින් විවිධ මාර්ග ඔස්සේ මිල ගණන් විමසීම සිදු කර තිබුණි.

(ii) අවස්ථා 26 කදී රු.8,350,031 ක් වැය කර දේශීය වෙළඳපලෙන් මිලදී ගෙන තිබූ ඖෂධ 26 කට අදාළව වෛද්‍ය සැපයීම් අංශයේ මිල ගණන්වලට වඩා ඉහළ මිලක් ගෙවා තිබුණු අතර, වෛද්‍ය සැපයීම් අංශයේ මිල ගණන්වලට වඩා දේශීය වෙළඳපලේ ඒකකයක මිල සියයට 6ත් 2859 ත් අතර ගුණයකින් වැඩි වී තිබුණු බව නිරීක්ෂණය විය.

(iii) හදිසි වෛද්‍ය සැපයීම් ලෙස kabimol inf 1% w/v 100 ml glass bottle වර්ගයේ අයිතම 100 ක් එකක් රු.780.34 බැගින් රු.78,034 ක් වැය කර 2025 මාර්තු 07 දින මිලදී ගෙන තිබුණු අතර එම ඖෂධ මිලදී ගන්නා අවස්ථාව වනවිට සැපයුම්කරු සතුව තිබුණු ඖෂධ නියාමන අධිකාරී සහතිකයේ වලංගු කාල සීමාව 2024 සැප්තැම්බර් 20 දින කල් ඉකුත් වී තිබුණි.

(iv) දේශීය මිලදී ගැනීම් යටතේ 2025 ජනවාරි 28 වන රෝගීන් දෙදෙනෙකු වෙනුවෙන් රු.2,894,700 ක මුදලක් වැය කර "Implant for Revision Knee System" (SR 12704102) නැමති අයිතමයෙන් ඒකක 02 ක් මිලදී ගෙන තිබුණි. වෛද්‍ය සැපයුම් අංශයේ දත්තවලට අනුව එම අයිතමයක ඒකක මිල රු.228,000 ක් පමණ වන නමුත් හදිසි මිලදී යටතේ දේශීය වෙළඳපලෙන් එකක් රු.1,219,350 ක් තරම් වූ ඉහළ මිලකට ලබා ගෙන තිබුණි. විශේෂඥ වෛද්‍යවරයාගේ ඉල්ලීම පරිදි උපකරණ ඇණවුම් කර තිබුණ ද, උපකරණ ඇණවුම් කරන අවස්ථාව වනවිට එම රෝගීන් දෙදෙනා නේවාසිකව ප්‍රතිකාර ලබා රෝහලෙන් පිටව ගොස් මාස 1 1/2 ක් හා මාස 06 ක් ගතවී තිබුණු බව නිරීක්ෂණය විය. තව ද 2025 පෙබරවාරි 05 වන දින අංක 07 හා 08 යන වාට්ටු දෙක වෙත එම උපකරණ නිකුත් කර විගණිත දිනය වූ 2025 ජූනි 26 දින වන විට මාස 04 කට අධික කාලයක් ඒවා ප්‍රතිකාර සඳහා භාවිතයට ගෙන නොතිබුණි.

(v) 2025 අප්‍රේල් 10 දින ඒකකයක් රු.38,000 ක් බැගින් SPO 2 Sensors නැමති අයිතමයෙන් ඒකක 35 ක් මිල දී ගෙන තිබුණු අතර, 2025 ජූනි 19 දින වනවිට ඉන් අයිතම 30 ක් විවිධ අංශ වෙත නිකුත් කිරීමෙන් පසුව ඒකක 05 ශේෂයක් පැවති නමුත් භෞතික තොග පරීක්ෂාවේ දී පිරිවැය රු.152,000 ක් වූ අයිතම් 04 ක හිඟයක් පැවැතුණි.

(ධ) මීගමුව දිස්ත්‍රික් මහ රෝහලට අදාළව සිදුකරන ලද විගණනයේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) රෝගී සත්කාරක සේවා කඩිනමින් හා කාර්යක්ෂමව ඉටු කිරීමේ අරමුණින් යුතුව හදිසි මිලදී ගැනීම් යටතේ රෝහල විසින් ඖෂධ හා රසායනික ද්‍රව්‍ය සඳහා ඉල්ලීම් සිදු කළද අවස්ථා 15 කදී එසේ ඉල්ලුම් කරන ලද පිරිවැය රු.1,831,355 ක්වූ ඖෂධ වර්ග 11 ක් හා අවස්ථා 17 කදී පිරිවැය රු.459,590 ක්වූ රසායනික ද්‍රව්‍ය රෝහලට සැපයීම් සඳහා පිළිවෙලින් දින 10 සිට දින 101 දක්වා හා දින 06 සිට දින 68 දක්වා ප්‍රමාද කාලයක් අදාළ ඖෂධ සැපයුම්කරුවන් විසින් ගත කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ii) සමාලෝචිත වර්ෂයේ අවස්ථා 04 කදී රෝහලට අවශ්‍ය පිරිවැය රු.3,256,820 ක්වූ ශල්‍ය වෛද්‍ය උපකරණ 04 ක් හා අවස්ථා 08 කදී පිරිවැය රු.2,824,003 ක්වූ ශල්‍ය පාරිභෝජ්‍ය ද්‍රව්‍ය අයිතම 05 ක් දේශීය වෙළඳපලෙන් මිලදී ගැනීම් සඳහා අනුමැතිය ලබාදීමට වෛද්‍ය සැපයීම් අංශය විසින් දින 03 සිට දින 24 දක්වා

කාලයක් ගත කර තිබුණු අතර ශල්‍ය වෛද්‍ය උපකරණ රෝහල වෙත සැපයීම සඳහා ඇණවුම් කළ දින සිට දින 21 සිට දින 137 දක්වා ප්‍රමාදයක් සිදුවී තිබුණි.

4.3 වත්කම් කළමනාකරණය

(අ) සෞඛ්‍ය අමාත්‍යාංශය සතු වාහන කළමනාකරණය පිළිබඳ පරීක්ෂාව මැයෙන් නිකුත් කරන ලද 2025 නොවැම්බර් 20 දිනැති විගණන විමසුමට මෙම වාර්තාවේ දිනය දක්වා පිළිතුරු ලබාදී නොතිබුණු අතර 2024 දෙසැම්බර් 20 දිනැති විගණන විමසුමට ලබාදී තිබුණු 2025 නොවැම්බර් 01 දිනැති පිළිතුරු ලිපියේ සඳහන් කරුණු සම්බන්ධයෙන් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට ගොස් පරීක්ෂා කිරීමේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2024 ජනවාරි 29 දින පවත්වන ලද වෙන්දේසියේ අබිලි වාහන ලෙස විකුණා ඇති බව විගණනයට වාර්තා කරන ලද වාහන 27 ක අයිතිය තවදුරටත් රාජ්‍ය ආයතන හා බාහිර පුද්ගලයින් නමින් පවතින බවත්, ඇතැම් වාහන විකිණිය නොහැකි බවට කොන්දේසි පැවතියදී අබිලි වාහන ලෙස විකුණා ඇති බවත් තහවුරු විය. කිසියම් වාහනයක් අබිලි ලෙස විකිණීමට පෙර ඒවායේ ලියාපදිංචිය අවලංගු කිරීමට කටයුතු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. අබිලි ලෙස විකුණන ලද වාහනවල අයිතිය බාහිර පුද්ගලයින්ගේ නමට පැවරුනේ කෙසේද යන්න විගණනයේදී මතභේදයට තුඩුදෙන කරුණක් විය.

(ii) අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වූ වාහනයක් නොවන බව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතියේ නොමැති බව සහ තොරතුරු සොයමින් පවතින බව සඳහන් කර තිබුණු වාහන 12 ක් අමාත්‍යාංශය සතුව පැවැති බවට තොරතුරු මීට පෙර විගණනයට වාර්තා කර ඇති බව තහවුරු විය.

(iii) අංක LX-2913 දරන වාහනය අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වූ වාහනයක් නොවන බව විගණනයට දන්වා තිබුණද මෙම වාහනය 2016 දෙසැම්බර් 30 දින අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වූ වාහනයක් (Lorry Traller) බවත් 2018 ජූලි 31 දින වෛද්‍ය පීඨය කැලණිය විශ්ව විද්‍යාලය වෙත පැවරී ඇති බවත් වර්තමානයේදී (2022 පෙබරවාරි 15 දින සිට) අයිතිය ශ්‍රී ලංකා ගුවන් හමුදාවට පැවරී ඇති බවත් තහවුරු විය. එසේම මෙම වාහනය අමාත්‍යාංශ වාහන කළමනාකරණ දත්ත පද්ධතියේ ඇතුළත්ව පැවති වාහනයක් විය.

(iv) අංක 43-5982 හා අංක 53-7953 දරන වාහන 02 පිළිවෙලින් ගම්පහ වික්‍රමරාච්චි ආයුර්වේද විශ්ව විද්‍යාලයට හා කාර්මික අධ්‍යාපන පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවට ලබාදී ඇති බව/ විකිණිය නොහැකි බවට විශේෂ කොන්දේසි ඇතුළත්ව ඇති බව විගණනයට දන්වා තිබුණද මෙම වාහන දෙකෙහි ලියාපදිංචිය පිළිවෙලින් Director General Health Service යටතේ හා Secretary, Ministry of Health & Woman Affairs යටතේද ඇති බව තහවුරු විය. එසේම මෙම වාහන දෙකම විකිණිය නොහැකි බවට කොන්දේසියක් ඇතුළත් කර ඇති අතර අමාත්‍යාංශ වාහන කළමනාකරණ දත්ත පද්ධතියේ ඇතුළත් වාහන දෙකක් විය.

(v) අංක PG-9418 දරන වාහනය අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වූ වාහනයක් නොවන බව විගණනයට දන්වා තිබුණද මෙම වාහනය අමාත්‍යාංශ වාහන කළමනාකරණ දත්ත පද්ධතියේ ඇතුළත් වාහනයක් විය. වර්තමානය වන විට මෙම වාහනය බාහිර පුද්ගලයෙකුගේ නමට ලියාපදිංචි කර තිබුණි.

(vi) අංක KW-0360 දරන වාහනයේ අයිතිය ජනාධිපති ලේකම් කාර්යාලයට පවරා දී ඇති බව විගණනයට වාර්තා කර තිබුණද, නිකුත්කිරීම් නියෝග භාරදී ලැබීම් නියෝග ලබාගෙන නොතිබුණි.

(vii) අංක PK-7041 දරන වාහනයේ අයිතිය ජනාධිපති ලේකම් කාර්යාලයට පවරා දී ඇති බව විගණනයට දන්වා තිබුණද මෙම වාහනයේ අයිතිය Secretary State Ministry Of Primary Health Care Epidemics and COVID Disease Control යටතේ පවතින බව තහවුරු විය.

(viii) අංක ML-1508 හා අංක ML-1510 දරන යතුරු පැදි අමාත්‍යාංශයට නැවත භාරදී නොමැති බව විගණනයට දන්වා තිබුණද ඒවායේ අයිතිය Director General Health Service යටතේ පවතින බව තහවුරු වූ අතර මෙම යතුරු පැදි අමාත්‍යාංශයට ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ix) තොරතුරු සොයමින් සිටින බව විගණනයට වාර්තා කර තිබුණු අංක JT-0356, JT-8007 සහ අංක GQ-8592 දරන වාහන තුනෙහි අයිතිය පිළිවෙලින් බාහිර පුද්ගලයින් දෙදෙනෙකුගේ නමින් සහ Director General Health Service යටතේ පවතින බව තහවුරු විය.

(x) විකිණිය නොහැකි බවට කොන්දේසි ඇතුළත් බව විගණනයට වාර්තා කර තිබුණු අංක 39-1151 හා අංක PA-6266 දරන වාහන දෙකෙහි අයිතිය පිළිවෙලින් Director General, Sri Lanka Rupavahini Corporation යටතේ හා United Nations Children's Fund යටතේ පවතින බව තහවුරු විය. මෙම වාහන දෙකෙහි අයිතිය අදාළ ආයතන වෙත පවරා නොමැති අතර මෙම වාර්තාවේ දින වන විටත් මුල්ලේරියාව වාහන අංගනයේ ගාල්කර තිබුණි.

(xi) විකිණිය නොහැකි බවට විශේෂ කොන්දේසි ඇතුළත්ව ඇති බව විගණනයට වාර්තා කර තිබුණු අංක PA-6242 දරන වාහනයේ අයිතිය United Nations Children's Fund යටතේ පවතින බව තහවුරු විය. මෙම වාහනයේ අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(xii) කාර්මික අධ්‍යාපන පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවට ලබාදී ඇති බව විගණනයට වාර්තාකර තිබුණු අංක 59-7953 දරන වාහනයේ අයිතිය බාහිර පුද්ගලයෙකුගේ නමින් පවතින බව තහවුරු විය.

(xiii) කාර්මික පුහුණු ආයතන වෙත ලබාදුන් බව විගණනයට වාර්තා කරන ලද වාහන 08 ක අයිතිය තවදුරටත් අමාත්‍යාංශය යටතේ පවතින බව තහවුරු විය. පුහුණු කටයුතු සඳහා භාවිතා කිරීම සඳහා මෙම වාහන ලබාදීමට පෙර මෙම වාහනවල ලියාපදිංචිය අවලංගු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(xiv) ආයුර්වේද දෙපාර්තමේන්තුවට අයිතිය පවරා දී ඇති බව විගණනයට වාර්තා කරන ලද අංක PA-7161 දරන වාහනයේ අයිතිය Secretary, Health and Indigenes Medicine Ministry යටතේ පවතින බවත් ශ්‍රී ලංකා බන්ධනාගාරයට ලබාදී ඇති බව විගණනයට වාර්තා කරන ලද අංක GN-5059 දරන වාහනයේ අයිතිය Director General of Health Services යටතේ පවතින බවත්, විකිණිය නොහැකි බවට කොන්දේසි ඇතුළත්ව ඇති බවත් තහවුරු විය.

(xv) ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත ලබාදුන් බව විගණනයට වාර්තා කරන ලද වාහන 08 ක අයිතිය තවදුරටත් අමාත්‍යාංශය යටතේ පවතින බව තහවුරු විය. මෙම වාහනවල අයිතිය අදාළ ආයතනයට පවරා දීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.

(xvi) ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට ලබා දුන් බව විගණනයට වාර්තා කරන ලද අංක LW-0528, LW-0540 හා අංක LW-0707 දරන වාහන තුනෙහි අයිතිය බාහිර පාර්ශවයන් නමින් පවතින බව තහවුරු විය.

(xvii) අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වූ වාහන නොවන බව විගණනයට වාර්තා කර තිබුණු අංක PD-4265, PW-0414 හා අංක RG-1332 දරන වාහන 03 අමාත්‍යාංශ වාහන කළමනාකරණ දත්ත පද්ධතියේ ඇතුළත් වාහන විය. මෙම වාහන 03 හි අයිතිය පිළිවෙලින් Director, Department of Textile Industries හා බාහිර පුද්ගලයින් නමින් පැවතුණි.

(xviii) අයිතිය පැවරීම පිළිබඳ තොරතුරු නොමැති බව විගණනයට වාර්තා කරන ලද අංක 19-5590, 40-8552 හා අංක 254-1839 දරන වාහන තුනෙහි අයිතිය බාහිර පුද්ගලයින් නමින් පැවතුණි. 2019 අප්‍රේල් 22 දින විගණකාධිපති විසින් නිකුත් කරන ලද සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ වාහන කළමනාකරණය පිළිබඳ විශේෂ විගණන වාර්තාව අනුව මෙම වාහන තුන ගර්හිත තත්ත්වයේ ඇති බව හඳුනා ගත් නමුත් අපහරණය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග හඳුනා නොගත් වාහන ලෙස දක්වා තිබුණි.

(xix) අංක 40-4764 දරන වාහනය අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වූ වාහනයක් නොවන බව විගණනයට වාර්තා කර තිබුණද මෙම වාහනය අමාත්‍යාංශ ප්‍රවාහන අංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලද සේවා ස්ථානය තුල ගාල්කර ඇති වාහන 76 ක ලයිස්තුවේ ඇතුළත් වාහනයක් විය. වර්තමානය වන විට මෙම වාහනයේ අයිතිය බාහිර පුද්ගලයෙකු නමින් පැවතුණි.

(xx) අංක 42-0664 දරන වාහනය අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වූ වාහනයක් නොවන බව දක්වා තිබුණද මෙම වාහනය අමාත්‍යාංශය විසින් මදුර විතාන පදනමට අළුත්වැඩියාව සඳහා ලබාදීමට යෝජිත වාහනයක් ලෙස විගණනයට තොරතුරු ඉදිරිපත් කර තිබුණි. මෙම වාහනයේ අයිතිය බාහිර ආයතනයක් නමින් පැවතුණි.

(xxi) අංක 42-4237 දරන වාහනය අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වූ වාහනයක් නොවන බව විගණනයට වාර්තා කර තිබුණද මෙම වාහනය Director General of Health Services යටතේ ලියාපදිංචි වූ වාහනයක් බවත් වර්තමානයේදී එහි අයිතිය බාහිර පුද්ගලයෙකුගේ නමින් පවතින බවත් නිරීක්ෂණය විය.

(xxii) වාහනය පිළිබඳව තොරතුරු සොයමින් පවතින බව විගණනයට වාර්තා කර තිබුණු අංක QP-2468 දරන වාහනයේ අයිතිය Secretary ministry of health indigenes medicine social welfare යටතේ පැවති බවත් වර්තමානය වන විට එහි අයිතිය සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින බවත් අංක PF-6977 දරන වාහනයේ අයිතිය Ministry of Health යටතේ පැවති බවත් වර්තමානයේදී එහි අයිතිය Ministry of Tourism යටතේ පවතින බවත් තහවුරු විය. එසේම මින් අංක PF-6977 දරන වාහනය අමාත්‍යාංශ වාහන කළමනාකරණ දත්ත පද්ධතියේ ඇතුළත් වාහනයක් විය.

(xxiii) වාහනය පිළිබඳව තොරතුරු සොයමින් පවතින බව විගණනයට වාර්තා කර තිබුණු අංක HU-8373 දරන වාහනයේ අයිතිය Secretary, Ministry of Health යටතේ පවතින බව නිරීක්ෂණය විය. මෙම වාහනය යාපනය ශික්ෂණ රෝහලේ පවතින බවටද තොරතුරු විගණනයට ඉදිරිපත් කර තිබුණි.

(xxiv) 2022 වර්ෂයේ අමාත්‍යාංශ වාහන අපහරණ කමිටුව විසින් හඳුනා ගන්නා ලද රාජ්‍ය නොවන සංවිධානයක නම සටහන් කරන ලද ලියාපදිංචි නොකළ එහෙත් පාවිච්චි කරන ලද නිෂාන් වර්ගයේ ගිලන් රථයක් සෞඛ්‍ය අමාත්‍යාංශයට ලැබුණු ආකාරය නිශ්චිත කර ගැනීමකින් තොරව හා ඒ පිළිබඳව පොලිසියට පැමිණිලි කිරීමකින්ද තොරව අඛිලි වාහනයක් ලෙස යකඩ බරට විකුණූ බවට විගණනයට දන්වා තිබුණි. මෙසේ විකිණීමේදී වාහනයේ එන්ජින් හා වැසි අංක කපා මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට භාරදුන් බවටද සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. පසුව මෙම ගිලන්රථය වෘත්තීය පුහුණු ආයතනයකට ලබාදුන් බව විගණනයට දන්වා තිබුණද ඊට අදාළ නිකුත් නියෝග හා ලැබීම් නියෝග පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) පසුගිය වර්ෂ 10 තුළ සෞඛ්‍ය අමාත්‍යාංශය සතු වාහනවල අයිතිය පැවරීම පිළිබඳ පරීක්ෂාව මැයෙන් 2025 පෙබරවරි 05 දින නිකුත් කරන ලද විගණන විමසුමට 2025 ජූලි 25 දින ලබාදුන් පිළිතුරු පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) වෙනත් අමාත්‍යාංශ/ ආයතන/ පළාත් සභා/ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් වෙත ලබාදී තිබුණු වාහන 514 ක් වෙතුවෙන් නිකුත් කිරීමේ නියෝග නිකුත් කළ

බව දක්වා තිබුණද එම වාහන වෙනුවෙන් ලැබීම් නියෝග ගෙන්වාගෙන නොතිබුණි. එසේම අංක 227-5495 දරන වාහනය නිකුත් කිරීමට අදාළ නිකුත් නියෝග අංකය හා දිනය සඳහන් කර නොතිබුණි.

(ii) දකුණු පළාත් සභාව වෙත අයිතිය පැවරීමට අදාළ ලේඛන භාරදී ඇති බව දක්වා තිබුණු වාහන 06 හි අයිතිය පැවරීම තහවුරු කෙරෙන ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(iii) වාහන 16 ක අයිතිය පවරා ගැනීමේ හෝ පවරා දීමේ ප්‍රගතිය විගණනයට වාර්තා නොකෙරුණි.

(iv) පිළිතුර අනුව අමාත්‍යාංශ වාහන පැවරීම සම්බන්ධ කටයුතු විධිමත් කිරීම සඳහා යෝජනා ලබාගැනීම වෙනුවෙන් පත්කිරීමට යෝජනා කර තිබුණු කමිටුව පත්කිරීමට අදාළ තොරතුරු හෝ අදාළ කමිටුව විසින් ලබාදුන් වාර්තාවේ පිටපතක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) සෞඛ්‍ය අමාත්‍යාංශය සතු වාහන උපයෝජනය හා අමාත්‍යාංශ ප්‍රවාහන අංශයේ අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳ පරීක්ෂාව මැයෙන් 2025 පෙබරවාරි 25 දින නිකුත් කරන ලද විගණන විමසුමට 2026 ජනවාරි 07 දින ලබාදුන් පිළිතුරු පරීක්ෂා කිරීමේදි පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) වාහන 150 කින් වාහන 108 කට අදාළ 2022 වර්ෂයේ සිට දෛනික ධාවන සටහන් විධිමත් පරිදි භාරදී නොමැති බව තහවුරු විය. දෛනික ධාවන සටහන් භාරදී ඇති බවට තොරතුරු ඉදිරිපත් කර තිබුණු වාහන 42 හිද දෛනික ධාවන සටහන් නියමිත පරිදි භාරදී නොමැති බව තහවුරු විය.

(ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 1646 ප්‍රකාරව රජයේ වාහනවල දෛනික ධාවන සටහන්වල මුල්පිටපත් හා මාසික සාරාංශ ඊලඟ මාසයේ 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව ඇත. මේ අනුව විගණකාධිපතිගේ කාර්යමණ්ඩලයට අවශ්‍ය අවස්ථාවකදී පරීක්ෂා කිරීම පිණිස සියළුම වාහනවල දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ අමාත්‍යාංශ ප්‍රවාහන අංශය තුළ වෙන්වෙන්ව ගොනුකර තබා ගත යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(iii) විගණන විමසුම නිකුත් කර මාස 30 කට පමණ පසුව නිල වාහනවලට අදාළ දෛනික සටහන් පිළිබඳව තවදුරටත් සොයාබලා විගණනයට ඉදිරිපත් කරන බව ප්‍රකාශ කිරීම වගකිව යුතු නිලධාරීන් තම වගකීම ඉටු නොකිරීමේ තත්ත්වයක් බවට නිරීක්ෂණය විය. නිල වාහන වලට අදාළ 2022 සිට 2025 දක්වා වර්ෂ 04 හි දෛනික සටහන්වල සහතික කළ පිටපත් විගණනයට ඉදිරිපත් කරනමෙන් දැන්වුවද මෙම වාර්තාවේ දිනය දක්වා එම දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(iv) නිල ප්‍රවාහන කටයුතු සඳහා තම පෞද්ගලික වාහනය භාවිතා කිරීම සඳහා අනුමැතිය ලබාගත් බවට නම සඳහන් නොවන නිලධාරීන් 04 දෙනෙකුට 2021 වර්ෂය වෙනුවෙන්ද, නිලධාරීන් දෙදෙනෙකුට 2022 වර්ෂය වෙනුවෙන්ද, නිලධාරීන් දෙදෙනෙකුට 2023 වර්ෂය වෙනුවෙන්ද ප්‍රවාහන දීමනාව හා ඉන්ධන දීමනාව ගෙවා තිබුණි. එසේම අනුමැතිය ලබාගත් බව සඳහන් නිලධාරීන් තිදෙනෙකු හට ප්‍රවාහන දීමනාව හා ඉන්ධන දීමනාව ගෙවූ බවක් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව තහවුරු නොවීය.

(v) 2023 ජූනි 20 දිනැති විගණන විමසුමේ දැක්වෙන වාහන වෙනුවෙන් ගේට්ටු අවසරපත් භාවිතා නොකිරීම අමාත්‍යාංශ ලේකම් විසින් ලබාදුන් නියෝග අභිබවා කටයුතු කිරීමක් බැවින් එකී වාහන අනුයුක්ත අංශ ප්‍රධානීන් හා එකී වාහනවල සේවය කළ රියදුරන් සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ගයන් කවරේද යන්න විගණනයට දන්වනමෙන් දැන්වුවද එම තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) රෝහල් අධිකාරීගේ 2018 අප්‍රේල් 04 දිනැති ලිපිය අනුව HIMS පද්ධතිය සඳහා Barcode Hand Held Scanner යන්ත්‍ර 34ක් මාතලේ දිස්ත්‍රික් මහ රෝහල වෙත ලැබී තිබුණද යන්ත්‍ර 24 ක භෞතික පැවැත්ම හා භාවිතය සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඉ) HIMS පද්ධතිය සඳහා ලැප්ටොප් පරිගණක යන්ත්‍ර 36ක් මාතලේ දිස්ත්‍රික් මහ රෝහල වෙත ලබාදී තිබුණද තොග ලේඛනයේ යන්ත්‍ර 34ක් ලෙස සටහන් කර තිබුණි. මීට අමතරව සැපයුම්කරුගේ උපකරණ සැපයීමේ පත්‍රිකාවේ (Delivery Advice) සඳහන් කේත අංක හා 2025 සැප්තැම්බර් 11 දින වන විට රෝහලෙන් ලබාගත් තොරතුරු අනුව ලැප්ටොප් පරිගණක යන්ත්‍ර 3ක කේත අංක අතර නොසැසඳීමක් පැවති අතර, ලබාදුන් බවට දැක්වෙන ලැප්ටොප් පරිගණක 2ක තොරතුරු විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

(ඊ) මාතලේ දිස්ත්‍රික් මහ රෝහලේ භෞතිකව පවතින බවට තහවුරු කර ගන්නා ලද Barcode Scanner යන්ත්‍ර 06 ක් හා භාවිතයට ගතහැකි Dot Matrix Printers යන්ත්‍ර 04 ක් 2025 සැප්තැම්බර් 11 වන විට නිෂ්කාර්යව පැවතියදී 2025 වර්ෂයේදී නැවත වරක් රු. 108,000ක් වැයකර Barcode Reader යන්ත්‍ර 18ක් හා රු. 297,150 ක් වැයකර Dot Matrix Printers 05ක් මිලදී ගෙන ප්‍රධාන ගබඩාව වෙත 2025 ජූලි 21 දින ලබා දී තිබුණු අතර එම උපකරණ අතරින් Dot Matrix Printers යන්ත්‍ර 4ක් හා Barcode Reader යන්ත්‍ර 18 ක් 2025 ඔක්තෝබර් 31 දින වන විටත් නිකුත් කළයුතු අංශ කුමක්ද යන්න පිළිබඳව හෝ තීරණයකින් තොරව ප්‍රධාන ගබඩාවේ පැවතුණි.

(උ) මාතලේ දිස්ත්‍රික් මහ රෝහල වෙත HIMS පද්ධතිය සඳහා ලබා දෙන ලද භාවිතා කළ හැකි මට්ටමේ පැවති Sticker Printers යන්ත්‍ර 07ක් හා මුද්‍රණ යන්ත්‍ර 05 ක් නිෂ්කාර්යව පැවතුණි.

(උ) හලාවත දිස්ත්‍රික් මහ රෝහලේ විකිරණවේදී අංශයේ GE Optinga XR-200 AMX Mobile X-Ray unit 2024 ජුනි 25 දින සිට අලුත්වැඩියා කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් සහ 2025 ජනවාරි සිට Dental x-ray යන්ත්‍රය IOPA දත්ත x-ray පටල නොමැති වීම හේතුවෙන් භාවිතා නොකර නිෂ්ක්‍රීයව පැවතුණි.

(ඵ) කුරුණෑගල ශික්ෂණ රෝහල පවත්වාගෙන යන භූමිය කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය නමින් පවතින අතර එහි අනවසර පදිංචිකරුවන් හඳුනාගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත දැනුම් දී තිබුණද සම්පූර්ණ භූමිය රෝහල නමින් පවරා ගැනීමට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඒ) කුරුණෑගල ශික්ෂණ රෝහලෙහි පවතින රජයේ නිවාස සම්බන්ධයෙන් සිදුකරන ලද විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2025 දෙසැම්බර් 31 දිනට තනතුරු 52 කට අයත් නිලධාරීන් 3245 ක කාර්යය මණ්ඩලයකින් සමන්විත වුවද, ශ්‍රේණීන් 03 කට අයත් නිලධාරීන් දීර්ඝ කාලයක සිට භාවිතය අනුව වෙන්කර ගත් රජයේ නිවාස 04 ක් පමණක් පවතින අතර අධ්‍යක්ෂ හා නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු සඳහාද උපලේඛනගත රජයේ නිවාස නොවීය.

(ii) රෝහල සතු අක්කර 01 ක පමණ භූමි ප්‍රමාණයක පිහිටා ඇති රජයේ වෛද්‍ය නිවාස 02 ක් 2008 සැප්තැම්බර් 26 දිනෙන් පසු පදිංචිය සඳහා භාවිතා නොකර අබලන්ව පැවතුණි. මින් එක් නිවාසයක් 2019 වර්ෂයේ සිට සායනික අපද්‍රව්‍ය රැස් කිරීම සඳහා භාවිතා කර තිබුණු අතර 2023 අප්‍රේල් 23 දින හටගත් ගින්නක් මඟින් එම නිවාසය තවදුරටත් විනාශ වී තිබුණි. 2025 පෙබරවාරි 16 විගණිත දින වන විට මෙම භූමියෙන් කොටසක රථගාලක් පවත්වාගෙන යන අතර කොටසක වල් බිහි වී තිබුණි. අනෙක් නිවාසය දීර්ඝකාලයක සිට නිශ්කාර්යව පැවතුණි. අක්කරයක් පමණ වූ මුළු භූමියම ඌන උපයෝජිතව තවදුරටත් පවතින බව සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ මඟින් 2015 ජූනි 15 දිනැති අංක BO7/THKURU(1)/2012 දරන ලිපිය අනුව වෛද්‍ය නිල නිවාස 02 කඩා ඉවත් කර වෛද්‍ය නිල නිවාස සංකීර්ණයක් ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු සකස් කරන ලෙස 2016 වර්ෂයේදී ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය (CECB) වෙත ඉල්ලීම් ඉදිරිපත් කර තිබුණද, විගණිත දිනටද මෙම අබලන් රජයේ නිවාස 02 සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඔ) ගම්පොළ ශික්ෂණ රෝහල විසින් භාවිතා කරනු ලබන ඉඩම් කොටස් වලින් කිසිදු ඉඩමක් නීත්‍යානුකූලව පවරා ගැනීමට 2026 ජනවාරි 26 දින වන තෙක්ම කටයුතු කර නොතිබුණු අතර රෝහල පිහිටා ඇති ඉඩම හැර අනෙකුත් ඉඩම් වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. එසේම රෝහලට අයත් හෙක්ටයාර 0.0559 ක් හා හෙක්ටයාර 0.2508 ක වපසරියකින් යුතු ජයමාලපුර ඉඩම් හා හෙක්ටයාර 0.1242 ක වපසරියකින් යුතු ඇරැගොඩ ඉඩම අනවසර අත්පත් කර ගැනීම්වලට ලක්ව තිබුණි.

(ඔ) අම්පාර දිස්ත්‍රික් මහ රෝහලේ පිරිවැය රු. මිලියන 17.4 ක් වූ 127-kW සූර්ය බලශක්ති පද්ධතිය, මෙහෙයුම් ගිවිසුමක් නොමැතිකම හේතුවෙන් 2020 ඔක්තෝබර් සිට 2023 ජනවාරි දක්වා (මාස 27) භාවිතයට නොගෙන පැවතුන අතර එමඟින් රු. මිලියන 24.17 ක අලාභයක් සිදුවී තිබුණි. 2023 ජනවාරි මාසයේදී ගිවිසුමක් අත්සන් කළද, පද්ධතිය 2023 අගෝස්තු වන තෙක් ජාතික පද්ධතියට සම්බන්ධ නොකිරීම හේතුවෙන් තවත් රු. මිලියන 5.37 ක අලාභයක් සිදුවී තිබුණි. පද්ධතිය ක්‍රියාත්මක වීමෙන් පසුව පවා, විගණන දිනය දක්වා පද්ධතිය සැලකිය යුතු ලෙස අඩු ධාරිතාවයකින් ක්‍රියාත්මක වී තිබුණු අතර, අපේක්ෂිත විදුලි උත්පාදනයට වඩා බෙහෙවින් අඩුවෙන් විදුලිය ජනනය වීම හේතුවෙන් රු. මිලියන 19.94 ක අමතර අලාභයක් සිදුවී තිබුණි.

(ක) නව හම්බන්තොට දිස්ත්‍රික් මහ රෝහල් පරිශ්‍රය තුළ ස්ථාපිත කර තිබුණු විදුලිජනන යන්ත්‍ර දෙක සම්බන්ධයෙන් සිදුකරන ලද විගණනයේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) විදුලිජනන යන්ත්‍ර දෙක විදුලි බිඳ වැටීමකදී ස්වයංක්‍රියව ක්‍රියාත්මක වී විදුලි සැපයුම නැවත යථා තත්ත්වයට පත් වූ පසුව ස්වයංක්‍රියව ක්‍රියා විරහිත වීම 2023 පෙබරවාරි 27 දිනෙන් පසුව නතර වී තිබුණු අතර, 2025 ජූලි 04 වන දින වන විට එම දෝෂ තත්ත්වය ඇති වී වර්ෂ 02 කට වැඩි කාලක් ගතව ඇතත් එය යථා තත්වයට පත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii) 2025 ජුනි 28 දින පෙ.ව. 9.00 ට පමණ ජාතික විදුලිබල පද්ධතියේ ඇති වූ විදුලිය බිඳ වැටීමකින් පසුව නැවත පෙ.ව.9.05 ට පමණ විදුලි සැපයුම යථා තත්ත්වයට පත්ව තිබුණද, රෝහල සතු විදුලිජනන යන්ත්‍ර 02 ස්වයංක්‍රියව විසන්ධි නොවීම හේතුවෙන් පෙ.ව.9.00 සිට ප.ව.6.30 පමණ වන තෙක් පැය 09.30 ක පමණ කාලයක් සක්‍රීයව තිබීම හේතුවෙන් ඩීසල් ලීටර් 391 ක් නිෂ්කාර්ය ලෙස වැය වී තිබුණු අතර ඒ අනුව රු.112,999 ක පාඩුවක් රජයට සිදුවී තිබුණි.

(iii) විදුලිය විසන්ධි වීමකදී විදුලිජනන යන්ත්‍ර දෙක ක්‍රියාත්මක වී තිබුණු කාල සීමාව හා වැය වූ ඉන්ධන ප්‍රමාණය පිළිබඳ විධිමත් පරිදි වාර්තා පවත්වා ගෙන නොතිබුණි. ඒ අනුව 2023 මාර්තු 15 දිනත් 2025 ජුනි 28 දිනත් අතර කාල සීමාව තුළ ලේඛනයෙහි ඇතුළත් කර තිබුණු විදුලි විසන්ධි වීම් අවස්ථා 20 ක දී පැය 242 මිනිත්තු 58 ක කාලයක් විදුලිය විසන්ධි වී පැවති අතර එම කාල සීමාව තුළ ඩීසල් ලීටර් 11,356 ක් වැය වී තිබුණි. එක් එක් අවස්ථාවෙදී විදුලිය විසන්ධි කාල සීමාවත් දහනය වී තිබූ ඉන්ධන ප්‍රමාණයත් සැසඳීමේ දී යන්ත්‍ර ක්‍රියාත්මක වී තිබුණු පැයක් වෙනුවෙන් වැය වී තිබුණු ඉන්ධන ප්‍රමාණයන් අතර වෙනස ලීටර් 15.49 ත් 74.39 ත් අතර සැලකිය යුතු පරාසයක පැවතුණි.

(iv) 2023 මාර්තු 15 දිනත් 2025 ජුනි 28 දිනත් අතර කාල පරිච්ඡේදය ආරම්භයේ හා අවසානයේ යන්ත්‍ර දෙකෙහි සටහන් වී තිබුණු යන්ත්‍ර පැය පාඨාංක අනුව යන්ත්‍ර දෙක ක්‍රියාත්මකව පැවති කාලසීමාවත් එම කාල පරිච්ඡේදය තුළ යන්ත්‍ර ක්‍රියාත්මක වී තිබුණු අවස්ථා 20 ට අදාළව ලේඛනයේ ඇතුළත් කර තිබුණු යන්ත්‍රවල මීටර්

පාඨාංක අනුව ක්‍රියාත්මක වී තිබුණු කාල සීමාවත් අතර පැය 14 මිනිත්තු 47 ක වෙනසක් පැවති බව නිරීක්ෂණය විය.

(ඛ) ජර්මන් ශ්‍රී ලංකා මිත්‍රත්ව කාන්තා රෝහල සඳහා රෝහල් ඉදිකිරීමේ ව්‍යාපෘතිය මඟින් ලබාදී තිබුණු යූරෝ 18,000 (දළ වශයෙන් රු.6,390,000) ක පිරිවැය සහිත රෙදි මැදීමේ උපකරණය භාවිතයෙන් තොරව නිශ්කාර්යව පවතින බැවින් එය මිලදී ගැනීමට වැයකරන ලද මුදල නිශ්කාර්ය වියදමක් බවට පත් වී තිබුණි.

(ග) පැරණි මහමෝදර ශික්ෂණ රෝහලේ සිට නව ජර්මන් ශ්‍රී ලංකා මිත්‍රත්ව කාන්තා රෝහල දක්වා රෝහල් මෙහෙයුම් කටයුතු මාරුකිරීමෙන් පසුව නව රෝහල සඳහා 2023 වර්ෂයේදී වෛද්‍ය උපකරණ සහ අනෙකුත් උපකරණ මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් සිදුකළ විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. (යූරෝ රුපියල් අගයට පරිවර්තනයේදී 2023 වර්ෂයේ සාමාන්‍ය හුවමාරු වටිනාකම රු. 355 අනුව අගය කරන ලදී.)

(i) නව රෝහලේ ස්ථාපිත කර තිබුණු පිරිවැය රු.1,775,000 ක් පමණ වූ (යූරෝ 5,000) ගිනි ආරක්ෂණ හා ගිනි අනතුරු සංඥා පද්ධතිය නිසි ක්‍රියාකාරිත්වයෙන් පවතින්නේද යන්න පරීක්ෂා කිරීමෙන් තොරව සැපයුම්කරු විසින් රෝහල වෙත පවරා දී තිබුණු බවත්, අදාළ පද්ධතිය හැසිරවීම සම්බන්ධයෙන් නිලධාරීන්ට පුහුණුවක් ලබාදී නොතිබුණු බවත් 2025 මැයි විගණිත දිනය වන විට අදාළ පද්ධතින් ක්‍රියාත්මක මට්ටමේ නොපවතින බවත් නිරීක්ෂණය විය.

(ii) 2018 නොවැම්බර් 14 දින වෛද්‍ය රසායනාගාර විශේෂඥ වෛද්‍යවරයෙකුගේ නිර්දේශය මත පදනම්ව හා ප්‍රමාණාත්මක තාක්ෂණික ඇගයීමකින් තොරව මිලදී ගෙන තිබුණු රු.5,950,000 ක් වූ Semi Auto Cryotone යන්ත්‍රය වසර 07 ක කාලයක් තිස්සේ භාවිතයෙන් තොරව නිශ්කාර්යව පැවතුණි. පැරණි මහමෝදර රෝහල තුළ තවදුරටත් රෝගී සත්කාරක සේවා සඳහා භාවිතයට ගත හැකි රු.12,550,000 ක් වූ රසායනාගාරය සඳහා භාවිතා කරනු ලබන වෛද්‍ය උපකරණ 3 ක් හා වටිනාකම පිළිබඳ සාක්ෂි නොමැති වෛද්‍ය උපකරණ 16 ක් පැවතුණද, ඒ පිළිබඳ සලකා බැලීමෙන් තොරව නව ව්‍යාපෘතිය යටතේ ද අදාළ වෛද්‍ය උපකරණ මිලදී ගෙන තිබුණි. ඒ අනුව පැරණි වෛද්‍ය උපකරණ නව රෝහල ආරම්භ කළ 2024 මාර්තු 07 දින සිට විගණිත දින දක්වා නිෂ්කාර්යව නව රෝහලේ වෛද්‍ය රසායනාගාරය තුළ පැවතුණු අතර මෙම උපකරණ තුළ අන්තර්ගත Plasma Pherisis System උපකරණ 02 මඟින් රුධිරයේ ප්ලස්මා කොටස් රුධිර සෛල වලින් වෙන්කිරීම සඳහා භාවිතා කරන බවට නිරීක්ෂණය වුවද, එවැනි උපකරණ කාන්තා රෝහලක භාවිතාවීමේ ඉඩකඩ අවම මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

(iii) පිරිවැය රු.37,305,175 (යූරෝ 105,085) වූ රෝහලේ ස්ථාපිත කර තිබුණු Nurse Call System පද්ධතිය (රෝගීන්ට හෙද කාර්යමණ්ඩලයට ඇමතීමට උපයෝගී කර ගනු ලබන) භාවිතයට නොගන්නා බව විගණනයේදී නිරීක්ෂණය වූයෙන් එම

පද්ධතිය ස්ථාපිත කිරීම වෙනුවෙන් රජය වැයකර තිබුණු මුදල් නිෂ්කාර්ය වියදමක් බවට පත් වී තිබුණි.

(iv) සායනික අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා 2023 දෙසැම්බර් 28 දින මිලට ගෙන තිබුණු පිරිවැය රු.136,799,250 ක්වූ (යුරෝ 385,350) Hydroclave අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය රෝහල ආරම්භ කර දින 05 ක පමණ කාලයක් භාවිතයෙන් පසුව 2024 මාර්තු 12 න් පසුව විගණිත දිනය දක්වා නිෂ්කාර්යව පවතින බැවින් ඒ සඳහා වැය කළ මුදල නිෂ්කාර්ය වියදමක් බවට පත් වී තිබුණි.

(ඝ) රෝගී ඇඳන් 623 ක ධාරිතාවයක් සඳහා ජර්මන් ශ්‍රී ලංකා මිත්‍රත්ව කාන්තා රෝහල ස්ථාපිත කර පැවතිය ද විගණිත දිනය වන විට වාට්ටු හා ඒකකවල ඇඳන් 470 ක් පමණක් පවතින බව නිරීක්ෂණය වූ අතර විගණන නියැදි පරීක්ෂාවට ලක් කළ 2025 නොවැම්බර්, දෙසැම්බර් හා 2026 ජනවාරි මාසවල දෛනික නේවාසිකව ප්‍රතිකාර ගනු ලබන රෝගීන් ප්‍රමාණය 155 ත් 249 ත් අතර වූයෙන් පවතින රෝගී ඇඳන් ධාරිතාවයෙන් සියයට 33 ත් සියයට 52 ත් අතර ප්‍රමාණයක් උපයෝජනය වී ඇති බවත් සියයට 50 ක පමණ ප්‍රමාණයක් ඌන උපයෝජිතව හෝ නිෂ්කාර්යව පවතින බවත් නිරීක්ෂණය විය. කෙසේ වෙතත් රෝහලේ ඉදිකිරීම් සැලසුමට අනුව එහි උපරිම ධාරිතාවය වූ ඇඳන් 623 කින් දැනට භාවිතා වන ප්‍රමාණය සැලකීමේදී ඌන උපයෝජිත ඇඳන් ධාරිතාවය සියයට 60 ත් සියයට 75 ත් අතර ප්‍රමාණයක් බව නිරීක්ෂණය විය. රෝහලෙහි 03 වෙනි මහලෙහි ආරම්භ කිරීමට නියමිත HDU අංශය සඳහා වෙන්කළ වර්ග මීටර් 852 ක් හා 4 වන මහලෙහි ආරම්භ කිරීමට නියමිත ONCO ඒකකය සඳහා වෙන්කළ වර්ග මීටර් 957 ක් රෝහල ආරම්භ කළ 2024 මාර්තු සිට විගණිත දිනය දක්වා අවුරුදු 2 කට ආසන්න කාලයක් ඌන උපයෝජිතව පවතින බවත් 03 වන මහලෙහි ඇති HDU ඒකකයෙහි පවතින කාමර වෛද්‍ය නිලධාරී නේවාසිකාගාර ලෙස භාවිතා කරනු ලබන බවත් නිරීක්ෂණය විය.

(ච) 2016 වර්ෂයේ වීන ණය අධාර ව්‍යාපෘතිය යටතේ එක්සත් ජනපද ඩොලර් 330,666 ක මුදලකට මිලදිගත් DR - X- Ray Machines 02 ක් උතුරු කොළඹ ශික්ෂණ රෝහලට ලබා දී තිබුණි. 2021 මැයි 10 දිනැති අංක HMS/E/MH/07/2020/67 දරන විගණන විමසුම මඟින් සිදුකරන ලද විමසිමට පිළිතුරු ලෙස ඒ වන විටත් ස්ථාපිත කර නොතිබුණු එක් යන්ත්‍රයක් කඳාන දිසා රෝහලට ලබා දීමට කටයුතු කර ඇති බව දන්වා තිබුණද විගණිත දිනය වූ 2026 පෙබරවාරි 10 වන දින වන විටත් මෙම යන්ත්‍රය උතුරු කොළඹ ශික්ෂණ රෝහලේ නිෂ්ක්‍රීයව පවතින බව නිරීක්ෂණය විය. එසේම උතුරු කොළඹ ශික්ෂණ රෝහලේ ස්ථාපිත කර තිබුණු ක්‍රියාත්මක තත්ත්වයේ පැවති අනෙක් යන්ත්‍රය 2020 ඔක්තෝබර් දක්වා පමණක් භාවිතා කර තිබුණු අතර නඩත්තු හා සේවා කටයුතු සිදු කිරීම සඳහා නියෝජිත ආයතනයක් නොමැති වීම හේතුවෙන් එම දිනයේ සිට විගණිත දින දක්වාම ක්‍රියා විරහිතව නිෂ්ක්‍රීයව පවතින බව නිරීක්ෂණය විය.

(ඡ) ඇඹිලිපිටිය දිස්ත්‍රික් මහ රෝහල සතු අංක 227-7286 දරන ගිලන් රථය අලුත්වැඩියාව සඳහා සබරගමුව පළාත් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරියේ අනුමැතිය මත 2022 අප්‍රේල් 10 දින ඇඹිලිපිටිය ප්‍රදේශයේ පෞද්ගලික ආයතනයකට භාරදී තිබුණු

අතර එම වාහනය අළුත්වැඩියාව සඳහා භාර දී වසර 03කට වැඩි කාලයක් ගත වූ පසු සබරගමුව පළාත් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරියේ සහකාර අධ්‍යක්ෂ (යාන්ත්‍රික) විසින් 2025 මැයි 21 දින රු.1,542,968ක අළුත්වැඩියා ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි. 2022 වර්ෂයේදී අළුත්වැඩියාව සඳහා භාර දීමේදී ලබා ගත් ඇස්තමේන්තුවක් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණු අතර 2022 හා 2025 වර්ෂය අතර කාල සීමාව තුළ උද්ධමනයේ බලපෑම ඉදිරිපත් කර තිබුණු මිල ඇස්තමේන්තුවේ පැවතිය හැකි බවත් වසර 03 කට අධික කාලයක් අලුත්වැඩියාව සඳහා යොමුකළ ගිලන් රථය පිළිබඳ සොයා බලා නොතිබුණු බවත් නිරීක්ෂණය විය.

(ජ) ඇඹිලිපිටිය දිස්ත්‍රික් මහ රෝහලට අයත් අංක PB - 0022 දරන කැබ රථය 2025 ඔක්තෝබර් 08 දින අනතුරකට පත්වී තිබුණු අතර විගණිත දිනය වූ 2026 පෙබරවාරි 17 දින වනවිටත් මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව ඒ සම්බන්ධව පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමටත්, අනතුර හේතුවෙන් වූ අලාභය ගණනය කර ඊට අදාළව වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමටත් කටයුතු කර නොතිබුණි.

(ii) ජීව වෛද්‍ය ඉංජිනේරු ඒකක වෙනම ස්ථාපිත නොවූ රෝහල් හා ආයතන සඳහා නිලධාරීන් වැඩ බැලීමේ පදනමින් අනුයුක්ත කර තිබුණු අතර, එක් ජීව වෛද්‍ය ඉංජිනේරුවෙකුට රෝහල් සහ ආයතන කිහිපයක් දිගු කාලයක් පුරාවට භාර දී තිබුණි. 2022 ජනවාරි 01 දින සිට සමාලෝචිත වර්ෂය දක්වා වැඩබැලීමේ පදනමින් සිදුකරනු ලබන තත්ත්වය ක්‍රමයෙන් වර්ධනය වීමක් දක්නට ලැබුණි. මෙම තත්ත්වය හේතුවෙන්, අදාළ රෝහල්වල ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා කාර්යක්ෂමව හා කාලීනව ඉටු කිරීම පිළිබඳ ගැටළු පැන නැඟී ඇති අතර, කාර්ය මණ්ඩල සැලසුම් කිරීම, ඒකක ස්ථාපනය සහ සම්පත් බෙදාහැරීම සම්බන්ධයෙන් පරිපාලන දුර්වලතා පැවතුණි.

(ය) පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ ගබඩාව පරීක්ෂා කිරීමේදී ඉන්වෙන්ට්‍රි අයිතම 07 ක් බෙදාහැරීමකින් තොරව වසර 1 සිට 30 දක්වා කාලපරිච්ඡේදයක් තිස්සේ ගබඩාවේ පැවතුණ අතර මේවායේ වටිනාකම විගණනය ඉදිරිපත් නොකෙරුණි. 2022 ජූනි 09 දින ඉන්වෙන්ට්‍රි ගතකරන ලද ලැප්ටොප් 04 ක් ඒ තුළ ඇතුළත් වන අතර ඒවායේ වගකීම් කාලය ඉක්ම ගොස් තිබුණි. තවද පරිත්‍යාග ලෙස ලැබුණු වටිනාකම් සඳහන් නොවූ PULSE OXIMETER 34 ක් බෙදාහැරීමකින් තොරව මාස අටක කාලයක් තිස්සේ ගබඩාවේ පැවතිණි.

(ඛ) වර්ෂ දෙකහමාරක කාලයක සිට සකස් කර ඇති, 2022 ජූලි 22 දිනැති අංක 2289/43 දරන අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව ජනමාධ්‍ය අමාත්‍යාංශයේ සුවිශේෂ කාර්යයක් හා කර්තව්‍යක් ලෙස හඳුනාගෙන ඇති ජනමාධ්‍ය ප්‍රතිපත්තිය මෙම වාර්තාවේ දිනය දක්වා

ස්ථාපිත කර නොතිබුණු අතර ප්‍රතිපත්ති සකස් කිරීමේ කාර්යය වෙනුවෙන් රු. 239,617ක් වැය කර තිබුණි.

(ඇ) ඇසිඩිසි ජනමාධ්‍ය ශිෂ්‍යත්ව වැඩසටහන 2006 වර්ෂයේ සිට 2025 දක්වා අඛණ්ඩව ක්‍රියාත්මක කර තිබුණු අතර 2019 සිට 2023 දක්වා මාධ්‍ය ශිෂ්‍යත්ව ප්‍රතිලාභ ලබාගත් මාධ්‍යවේදීන් ගණන 116 ක් සඳහා රු. 19,954,711ක් වැය කර තිබුණි. 2019 වර්ෂයේ සිට 2023 දක්වා ශිෂ්‍යත්ව ලබාදුන් 116 දෙනාගෙන් 46 දෙනෙකු පමණක් පාඨමාලා අවසන් කර සහතිකපත් ලබා දී තිබුණු අතර 70 දෙනෙකු පාඨමාලා සම්පූර්ණ කර සහතිකපතෙහි පිටපතක් ජනමාධ්‍ය අංශය වෙත ලබා දී නොතිබුණි. පාඨමාලා නිසි පරිදි සම්පූර්ණ නොකර ශිෂ්‍යත්වලාභීන් පිළිබඳ නිවැරදි අධීක්ෂණයක් සිදු කර ගිවිසුම් ප්‍රකාරව එම පාඨමාලා ගාස්තු අය කර ගැනීමට හෝ නිසි ක්‍රියාමාර්ග ගැනීමට හෝ මෙම වාර්තාවේ දිනය දක්වා කටයුතු කර නොතිබුණි.

(ඈ) 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව, සියළුම රජයේ ආයතනවල ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතා කිරීම මඟින් නිලධාරීන් කාර්යාලයට පැමිණීම හා පිටවීම සනාථ කිරීම සම්බන්ධයෙන් වාර්තා තබා ගැනීමට පියවර ගත යුතු අතර 2017 මැයි 12 දිනැති අංක DMS/0016 දරන භාණ්ඩාගාර ලේකම් විසින් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් වෙත නිකුත් කර තිබුණු ලිපිය ප්‍රකාරව, සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම සනාථ කළ හැකි පරිදි ඇඟිලි සලකුණු යන්ත්‍ර 2017 ජූලි 01 දින සිට ක්‍රියාත්මක නොකරන්නේ නම් වර්තමාන වැටුපට අනුව අතිකාල දීමනා නොගෙවීමට වග බලා ගත යුතු විය. එසේම 2023 නොවැම්බර් 09 දින පවත්වන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අනු කමිටු අංක 2 විසින් සෞඛ්‍ය සේවාව සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කළ යුතු බවට නිර්දේශ කර තිබුණි. නමුත් අමාත්‍යාංශය විසින් අමාත්‍යාංශයට, එයට අයත් රෝහල් හා ආයතන සඳහා රු.මිලියන 31.08 ක් වැය කර ස්ථාපිත කර තිබුණු ඇඟිලි සලකුණු යන්ත්‍ර 213 ක් භාවිතයට නොගෙන නිශ්ක්‍රීයව පැවති අතර වර්තමාන වැටුප පදනම් කර ගෙන සමාලෝචිත වර්ෂයේදීද වැටුප් සඳහා රු.මිලියන 58,980.31 ක් ද අතිකාල හා නිවාඩු දින වැටුප් සඳහා රු.මිලියන 50,938.54 ක්ද වශයෙන් මුළු මුදල රු.මිලියන 109,918.85 ක් ගෙවා තිබුණි. එසේම අතිකාල හා නිවාඩු දින වැටුප් වෙනුවෙන් වැය කර තිබුණු මුළු මුදල් වැටුප් පිරිවැයෙන් සියයට 86.36 ක් පමණ වී තිබුණි.

(ඉ) ලෝක සෞඛ්‍ය සංවිධානයේ ජාත්‍යන්තර සෞඛ්‍ය රෙගුලාසි 2005 අනුව කොළඹ, ගාල්ල, හම්බන්තොට හා ත්‍රිකුණාමලය වරායන් විසින් නැව් සනීපාරක්ෂක සහතිකය (Ship Sanitation Certificate) නිකුත් කරනු ලබයි. මෙම සහතිකය නිකුත් කිරීම වෙනුවෙන් නැවේ බර අනුව එ. ජ. ඩොලර් 200 සිට 300 දක්වා ගාස්තුවක් හා සහතිකයේ කාලය දිර්ඝ කිරීම සඳහා එ. ජ. ඩොලර් 100 ක් ලෙස ගාස්තු අයකිරීමක් සිදුකරනු ලැබේ. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) සහතිකය නිකුත් කිරීමේදී අයකරනු ලබන ගාස්තු 2018 ඔක්තෝබර් 23 දින සෞඛ්‍ය ලේකම් විසින් සංශෝධනය කර තිබුණු අතර පසුගිය අවුරුදු 07 ක් තුළ එම ගාස්තුව සංශෝධනය කර නොතිබුණි.

(ii) විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2025 වර්ෂයේදී මෙම සහනික 715 ක් නිකුත් කර තිබුණු අතර මෙමඟින් උපයන ලද අදායම රු. 63,558,185 ක හා එක්සත් ජනපද ඩොලර් 4,650 ක් විය. රටතුළ විදේශ විනිමය ගැටළු පැවතියේදී මෙම ගාස්තු එක්සත් ජනපද ඩොලර් මඟින් පමණක් අයකර ගැනීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

(ද) ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ වැය විෂයයන් 28 ක් මඟින් රු.මිලියන 9,710.00 ක් වූ ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද වර්ෂය අවසාන වනවිට කිසිදු මුදලක් වැයකර නොතිබුණි. එයට හේතු වශයෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදයන් බව සඳහන් කර තිබුණු බැවින් විධිමත් ප්‍රසම්පාන සැලැස්මක් අනුව කටයුතු නොකිරීම මත ව්‍යාපෘති සඳහා වෙන්කර තිබුණු මුදලින් අපේක්ෂිත ප්‍රතිලාභ ලභාකර ගැනමට නොහැකි වී තිබූ බව නිරීක්ෂණය විය.

(ධ) වෛද්‍ය සැපයීම් අංශය Emergency Assistance of USD 100 Million for the Procurement of Essential Pharmaceuticals and Medical Supplies ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රතිපාදන යොදාගෙන පිරිවැය රු.මිලියන 503.75 ක්වූ Human Immunoglobulin Iv 5-6g (SR 00603205) ඖෂධයේ ඒකක 15,000 ක් ඇණවුම් කර ඉන් ඒකක7,500 ක් 2024 වර්ෂයේදී මිලදී ගෙන තිබුණි. 2024 ඔක්තෝබර් 23 දිනැති අංක MSD/Q/P/2024/41 දරන වක්‍රලේඛය මඟින් මෙම ඖෂධය තත්ත්වයෙන් අසමත්ව භාවිතයෙන් ඉවත්කර තිබුණි. එසේ වුවද ජාතික ඖෂධ නියාමන අධිකාරියේ නිර්දේශ මත මෙම ඖෂධය නැවත භාවිතයට ගන්නා ලෙස ඊට මාස 07 ½ කට පමණ පසු 2025 ජුනි 09 දිනැති අංක MSD/Q/P/2025/31 දරන වක්‍රලේඛය මඟින් සියළුම රෝහල් දැනුවත් කර තිබුණි. මෙම ඖෂධය සෙල්සියස් අංශක 2 ත් 8 ත් අතර උෂ්ණත්වයක ගබඩා කළ යුතු වුවද භාවිතයෙන් ඉවත් කිරීමේ නිවේදනය පදනම් කරගෙන ඇතැම් රෝහල් එම ඖෂධය ශීතකරණවලින් ඉවත් කර කාමර උෂ්ණත්වයේ පවත්වා ගැනීම හේතුවෙන් රෝහල් 13 ක පැවති ඖෂධයේ ඒකක 651 ක් විනාශ වීමෙන් රජයට රු.මිලියන 21.86 ක පාඩුවක් සිදුව තිබුණි.

(න) Yellow soft paraffin (SR -01100102) හා Methyl salicylate spirit (SR -01400101) නමැති ඖෂධ මිශ්‍රකර වේදනා නාශක ආලේපනයක් නිෂ්පාදනය කිරීම සඳහා 2023 අගෝස්තු මාසයේදී පිරිවැය රු. මිලියන 280.27 ක්වූ Yellow soft paraffin කිලෝග්‍රෑම් 415,990 ක් මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ 2023 අප්‍රේල් 04 දිනැති 01-14/2023 සහ 2023 නොවැම්බර් 30 දිනැති 01-14/2023(i) වක්‍රලේඛ ප්‍රකාරව Methyl salicylate අයිතමය ඖෂධ ප්‍රමුඛතා ලැයිස්තුවෙන් ඉවත් කර ඊට අදාළ ඇණවුම් අවලංගු කිරීම හේතුවෙන් Yellow soft paraffin අයිතමයේ තොග නිකුත් කිරීමට නොහැකිව තොග අතිරික්තයක් ඇතිවීමත්, නිලධාරීන් විසින් එලෙස ප්‍රමුඛතා ලැයිස්තුවෙන් ඉවත් කළ අයිතමවල ඇණවුම්වල බලපෑම විශ්ලේෂණය කර නොමැති වීමත්, කළමනාකරණය විසින් අදාළ තොග විධිමත් පරිදි බෙදාහැරීමට කිසිදු සාධනීය මැදිහත්වීමක් සිදුකර නොමැති වීමත් හේතුවෙන් වෛද්‍ය සැපයීම් අංශයේත්, රෝහල්වලත් මාස 87 කට ප්‍රමාණවත් කිලෝග්‍රෑම් 223,965 ක තොග 2026 මැයි

31 දින කල් ඉකුත් වීමට නියමිත බව විගණනයේදී නිරීක්ෂණය විය. එය තොගයෙන් සියයට 54 ක් බවද එම තොගය කල් ඉකුත් වීමේ අවධානමක පවතින බවත්, එසේ වුවහොත් රජයට රු.මිලියන 150 ක පමණ පාඩුවක් සිදුවන බවද විගණනයේදී නිරීක්ෂණය විය. එසේම එකම සැපයුම්කරුවෙකුගෙන් ඇණවුම් 02 කට අදාළ තොග එකම කාලවකවානුවකදී ලැබීමෙදී නිලධාරීන් ඒ පිළිබඳව සැලකිලිමත් වී නොමැති බවත්, තොග ලබා ගැනීමේ කාලසටහන් සංශෝධනය කිරීමට කටයුතු කර නොමැති බවත් ඒ හේතුවෙන් එකවර විශාල තොග ප්‍රමාණයක් කල් ඉකුත් වීමේ අවධානමක් මතුව ඇති බවත් නිරීක්ෂණය විය.

(ii) මෙම තත්ත්වය white soft paraffin (01100103) අයිතමයටද මේ ආකාරයෙන්ම බලපා තිබුණු අතර ඒ හේතුවෙන් මෙම අයිතමයද 2026 මැයි 31 දින කල් ඉකුත් වන නමුත් මාස 35 ක ට අධික කාලයක් භාවිතා කළ හැකි තොග කිලෝග්‍රෑම් 33,379 ක් දිවයින පුරා පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය. ඉන් කිලෝග්‍රෑම් 22,395 ක්ම වෛද්‍ය සැපයීම් අංශයේ ගබඩා තුළ බෙදාහැරීමකින් තොරව පවතින බවත් මේ හේතුවෙන් මෙම තොගය කල් ඉකුත් වුවහොත් ආසන්න වශයෙන් රු.මිලියන 21 ක් පමණ රජයට පාඩුවන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ප) වෛද්‍ය සැපයීම් අංශය විසින් 2019 හා 2020 වර්ෂ වෙනුවෙන් පිරිවැය රු.මිලියන 15.12 ක්වූ Peritoneal Dialysis solution 1.5% in 1000ml ඖෂධ බෝතල් 78,000 ක් මිලදී ගෙන තිබුණු අතර වෛද්‍ය සැපයීම් අංශයේ කළමනාකාරිත්වය විසින් සාධනීය ක්‍රියාමාර්ග නොගැනීමේ පසුබිම තුළ වර්ෂ 05 ක ජීවකාලයක් පැවතියදීත් 2025 මාර්තු 31 දින සහ 2025 අගෝස්තු 31 දින බෝතල් 36,411 ක් කල් ඉකුත් වීමෙන් රු.මිලියන 7.39 ක මුදලක් රජයට පාඩු වී තිබුණි. ඖෂධයේ පිරිවිතර අනුව සහ සැපයුම්කරුට නිකුත් කරන ලද ඉන්ඩෙන්ටුවල සඳහන් පරිදි මෙම ඖෂධය භාවිතා කිරීම සඳහා ඒ සමඟ අවශ්‍ය වන අයිතම දෙකක් වන Peritoneal dialysis catheter set for Peritoneal dialysis and Peritoneal lavage සහ Administration set for Peritoneal dialysis solution with two leads යන අයිතම ඒකක 6,000 බැගින් සැපයිය යුතු බව දක්වා ඇතත් නිලධාරීන් විසින් ඒ පිළිබඳව පරීක්ෂාවකින් තොරව තොග භාරගැනීමේ ප්‍රතිඵලයක් ලෙස 2020 වර්ෂයට අදාළ ඇණවුම් වූ ඒකක 33,000 න් පිරිවැය රු. මිලියන 6.59 ක්වූ ඒකක 32,135 ක් හෙවත් සියයට 97 ක ප්‍රමාණයක් රෝහල්වලට බෙදාහැරීමකින් තොරව වෛද්‍ය සැපයීම් අංශ ගබඩා තුළම කල් ඉකුත් වී තිබුණි.

(එ) 2023 නොවැම්බර් හා දෙසැම්බර් මාසයේදී ඇමරිකා එක්සත් ජනපද ආයතනයක් වෙතින් පරිත්‍යාග ලෙස වෛද්‍ය සැපයීම් අංශයට ලද රු. මිලියන 1,672.73 ක් පමණ වටිනා Enoxaparin 0.6ml (SR- 00204702) (IU 6000) ඒකක 694,836 ක තොගයක් වෛද්‍ය සැපයීම් අංශයට ලැබී මාස 03 කට පසු රෝහල්වලට බෙදාහැරීමකින් තොරව කල් ඉකුත් වී 2026 ජනවාරි විගණන අවස්ථාව වන විට ඉරණවිල ගබඩාවේ ගබඩා කර තිබුණි. මෙම තොගය නිෂ්කාශනය කිරීම සඳහා වැයකළ රු. මිලියන 6.51 ක මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

(ඛ) 2021 වර්ෂයේ කොවිඩ් වසංගත සමයේදී හදිසි මිලදී ගැනීම් යටතේ සහ විදේශ ණය ආධාර යටතේ UNOPS ආයතනය හරහා මිලදී ගෙන 2025 දෙසැම්බර් 31 දින වන විට කල් ඉකුත් වූ Hood & Head cover 73,300 ක් Boot cover 26,555 ක් සහ PPE Set 21,350 ක් නැවත භාවිතයට ගැනීමට සුදුසු බවට දින දීර්ඝ කර තිබුණි. කල් ඉකුත් නොවූ Protective coverall 14,900 ක්, Safety Goggles 55,540 ක් හා PPE Set 13,761 ක් ඉරණවිල ගබඩාවේ අක්‍රමවත්ව ගොඩ ගසා පැවැති බව විගණනයේදී නිරීක්ෂණය විය. තවත් වසර 53 කින් කල් ඉකුත් වීමට නියමිත Goggles සමාලෝචිත වර්ෂය වන විටත් දූර්වර්ණ වී ඇති බවද නිරීක්ෂණය විය. හදිසි මිලදී ගැනීම් හා විදේශ ණය ආධාර යටතේ විශාල මුදලක් වැයකර මිලදී ගත් මෙම අයිතම කල් ඉකුත් වීම අවම කිරීමට හෝ නිසි පරිදි ගබඩා කර ආරක්ෂිත තොගයක් ලෙස පවත්වා ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඟ) ඉරණවිල ගබඩාව තුළ අන්තර්ජාල පහසුකම් සපයා නොමැති බැවින් ස්වස්ථා පද්ධතියට පිවිස තොග හුවමාරුපත්‍ර (STV) මුද්‍රණය කර ගැනීමට විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබීම හේතුවෙන් නිලධාරීන්ගේ පෞද්ගලික දුරකථන මඟින් අදාළ කාර්යයන් සිදු කරන බවත්, ගබඩාවේ සේවය කරන කාර්ය මණ්ඩලය සඳහා පානීය ජල පහසුකම් ලබා දීමට ස්ථිර ක්‍රමවේදයක් හෝ ස්ථිර වැසිකිලි පහසුකම් සඳහා අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණු බවත්, ගබඩාවේ දකුණු පස අංශය සඳහා විදුලිය ලබා දී නොමැති බැවින් එම අංශයේ පවතින තොග ගබඩා කිරීම, පරීක්ෂා කිරීම හා නිරීක්ෂණය කිරීම අපහසු වූ බවත්, ගබඩාවේ ඇතැම් ස්ථාන වර්ෂාවෙන් තෙමෙන බැවින් ශල්‍ය ද්‍රව්‍යවලට හානිවීමේ අවදානමක් පැවති බවත් නිරීක්ෂණය විය.

(ච) වෛද්‍ය සැපයීම් අංශය විසින් සියළුම රජයේ රෝහල් සඳහා සර්ජිකල් ස්පිරිතු නිෂ්පාදනය කිරීමට අවශ්‍ය වන පරිපාක ස්පිරිතු (ඇල්කොහොල් 95-99%) දේශීයව මිලදී ගැනීමත්, රසායනාගාර කටයුතු සඳහා අවශ්‍ය වන ඊතයිල් සහ එතනෝල් යන රසායන ද්‍රව්‍ය ආනයනය කිරීමත් සිදුකරන අතර 2025 නොවැම්බර් විගණිත දින වන විට මෙම අයිතම 03 ට අදාළව පිරිවැය රු. මිලියන 251.32 ක්වූ ලීටර් 68,634 ක් වෛද්‍ය සැපයීම් අංශයේ ගබඩා තුළ අනාරක්ෂිතව ගබඩා කර තිබුණි. ඒ අනුව ඖෂධීය හෝ කාර්මික අරමුණු සඳහා භාවිතා කිරීමට යොදා ගන්නා ඇල්කොහොල් හෝ ඊතයිල් මධ්‍යසාර වැනි වහා ගිනි ඇවිලෙන සුළු දෑ ගබඩා කිරීමේදී වෛද්‍ය සැපයීම් අංශය රජය විසින් පනවා ඇති නීති රෙගුලාසි හා සම්මත මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කර නොතිබුණි. 2000 අංක 53 දරන ජාතික පාරිසරික (සංශෝධන) පනතින් හා 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ 2022 ජනවාරි 27 දින නිකුත් කළ අංක 2264/18 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයට අනුකූලව රසායනික ද්‍රව්‍ය ගබඩා කිරීමට පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. තවද ගිනි නිවීමේ දෙපාර්තමේන්තුවේ සහතිකයද ලබා ගෙන නොතිබුණු අතර මෙම සහතික ලැබී නොතිබීම හේතුවෙන් සුරාබදු දෙපාර්තමේන්තුවේ බලපත්‍රයද ලැබී නොතිබුණි. 2022 වර්ෂයේ සිට ඇල්කොහොල් ගබඩාවක් ඇතුළුව අංගොඩ ගබඩා සංකීර්ණය නවීකරණය කිරීමට ලංසු කැඳවා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කළද 2026 මාර්තු 31 දින වන විටත් මෙම කටයුතු අවසන් කර නොතිබුණි. ඇල්කොහොල් හා රසායනික ද්‍රව්‍ය තවදුරටත් අනාරක්ෂිත තත්ත්වයේ ගබඩා කර ඇති බවත්, නිසි

අනුමැතීන් හා බලපත්‍ර රහිතව ගබඩා කිරීම හේතුවෙන් හදිසි තත්ත්වයකදී රක්ෂණ ආයතන මඟින් හානිපූරණය නොකිරීමේ අවධානමක් පිළිබඳවත් විගණනයේදී නිරීක්ෂණය විය.

(ය) තාවකාලිකව තොග ගබඩා කිරීමට දින 03 ක් එනම් පැය 72 ක කාලයක් සඳහා පමණක් අවසරය හිමිව පැවතියත් ඉන් බැහැරව ලිපි ලේඛන, තත්ත්ව පරීක්ෂණ වාර්තා හෝ ලේබලය සම්බන්ධ ගැටළුසහගත තත්ත්වයන් පැවතියදී ශල්‍ය අයිතම 08 කට අදාළ තොග භාරගෙන භාණ්ඩ ලැබීම්පත් නිකුත් කිරීමකින් තොරව අංගොඩ ගබඩා සංකීර්ණයේ අංක 25 සහ 27 ගබඩාවල තාවකාලිකව ගබඩාකර තිබුණු බවත්, ඉන් ශල්‍ය අයිතම 06 ක් සඳහා තොග ලැබීම්පත් නිකුත් කිරීමට දින 33 ත් 75 ත් අතර කාලයක් ගතකර තිබුණු බවත්, අනෙක් අයිතම 02 විගණන විමසුම නිකුත් කරන දින දක්වාම එනම් දින 53 ක කාලයක් ගතවී තිබියදීත් තොග ලැබීම්පත් නිකුත් කිරීමට අපොහොසත් වී තිබුණි.

(ර) 2021, 2024 හා 2025 වර්ෂ වෙනුවෙන් ඇණවුම් කළ Paraffin Wax (SR – 40300201) කිලෝග්‍රෑම් 53,500 ක තොගයක් 2024 අගෝස්තු 12 දින සිට මාස 09 ක කාලයක් තුළ වෛද්‍ය සැපයීම් අංශය වෙත ලැබී තිබුණු අතර ඉන් පිරිවැය රු.මිලියන 79.72 ක්වූ කිලෝග්‍රෑම් 38,218 ක තොග 2025 සැප්තැම්බර් 03 දින වන විට වෛද්‍ය සැපයීම් අංශයේ අංගොඩ ගබඩා සංකීර්ණයේ අංක 17 ගබඩාවේ පැවති බව නිරීක්ෂණය විය. එනම් ආසන්න වශයෙන් අවු.03 ක කාලයකට භාවිතා කළ හැකි තොග වෛද්‍ය සැපයීම් අංශයට ලැබී ඇති බවත් එම තොග අංගොඩ ගබඩාවේ අපිළිවෙලට ගබඩා කර ඇති බවත් විගණනයේදී නිරීක්ෂණය විය. ප්‍රශස්ත තොගයක් ගබඩාව තුළ පවත්වාගෙන යාම මඟින් තොග පවත්වාගෙන යාමේ පිරිවැය අවම මට්ටමක පවත්වාගත හැකි වුවත්, අවු.03 ක කාලයකට භාවිතා කළ හැකි තොගයක් ගබඩා තුළ ගබඩා කිරීම හේතුවෙන් එම අයිතමයට අදාළ තොග මෙන්ම අනෙකුත් අයිතමවලට අදාළ තොග කළමනාකරණය හා ගබඩා ඉඩ කළමනාකරණය කිරීම දුෂ්කර වී ඇති බවත්, මෙවැනි විශාල තොගයක් ඉතා කෙටි කාලසීමාවක් තුළ ගබඩා වෙත ලැබීම අවම කර ගත හැකි වන පරිදි තොග ලැබීමේ කාලසටහන් ඉදිරිපත් කිරීමට හා ව්‍යාපෘති මඟින් ලබා දෙන තොග පිළිබඳ තොරතුරු සම්බන්ධීකරණය කිරීමට නිලධාරීන් කටයුතු කර නොමැති බවත් නිරීක්ෂණය විය.

(ල) සමාලෝචිත වර්ෂයේදී විදේශීය ආයතනවලින් වෛද්‍ය සැපයීම් අංශයට ලද පරිත්‍යාග වරායෙන් සහ ගුවන්තොටුපොළින් නිෂ්කාශනය කිරීම සඳහා අවස්ථා 141 කදී කටයුතු කර ඇති අතර ඉන් අවස්ථා 120 කදී රු.මිලියන 84.45 කට අධික ප්‍රමාද ගාස්තු හා ගුදම් ගාස්තු ගෙවා තිබුණි. විදේශ ආයතනවලින් ශ්‍රී ලංකාවේ රෝහල් සහ සෞඛ්‍ය ආයතන වෙත ලැබෙන පරිත්‍යාග දිවයිනට ලැබෙන තෙක්ම නිසිලෙස සම්බන්ධීකරණය නොකිරීම හේතුවෙන් වෛද්‍ය සැපයීම් අංශයේ වාප්පු අංශයට නිෂ්කාශන ලිපිලේඛන ලැබීම ප්‍රමාද වීම සහ ආනයන බලපත්‍ර කටයුතු ප්‍රමාද වන බවත්, ඒ සඳහා දින 02 ත් 209 ත් අතර ප්‍රමාද කාලයක් ගතවී ඇති බවත් නිරීක්ෂණය විය. එසේම ඉන් අවස්ථා 22 කදී රු.මිලියනයකට වැඩි ප්‍රමාද සහ ගුදම් ගාස්තු ගෙවා ඇති බවත් නිරීක්ෂණය විය. ඇතැම් අවස්ථාවලදී නිෂ්කාශන ක්‍රියාවලිය ආරම්භ කිරීම ප්‍රමාදවීම මත වරාය විසින් තොග වෙන්දේසි කිරීම සඳහා කටයුතු කරන බවට දැනුවත් කිරීමේ ලිපි නිකුත් කර ඇති බවද විගණනයේදී නිරීක්ෂණය වූ අතර පරිගණක උපකරණ, ගොඩනැඟිලි ද්‍රව්‍ය සහ වෛද්‍ය උපකරණ

නිෂ්කාශනයේදී දරන ලද ප්‍රමාද ගාස්තු වෛද්‍ය සැපයීම් අංශයේ ඖෂධ මිලදී ගැනීම සඳහා වූ වැය විෂයෙන් වැයකර ඇති බවද නිරීක්ෂණය විය.

(ව) 2023 වර්ෂයේදී Prednisolone Acetate Eye Drop ඖෂධය භාවිතයෙන් අවදානමට ලක්වූ රෝගීන් 17 දෙනෙකුගෙන් රෝගීන් 12 දෙනෙකුගේ ස්ථිරවම එක් ඇසක පෙනීම අහිමි වීම හේතුවෙන් නීත්‍යානුකූලව අන්ධභාවයට පත්වී ඇති බවත්, තවත් රෝගීන් තිදෙනෙකුගේ සියයට 70කට වඩා පෙනීම අහිමි වී ඇති බවත් වාර්තා වී තිබුණි. මෙම සිදුවීමෙන් විත්දිතයන් බවට පත්වූවන්ට රු.මිලියන 14.70 ක කරුණා සහගත දීමනාවක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණද ප්‍රමිතියෙන් තොර ඖෂධ සපයන ලද සැපයුම්කරුවන්ට එරෙහිව ගිවිසුම්ගත ප්‍රතිකර්මයන්ට අමතරව පොදු නීතියේ ප්‍රතිපාදන අනුව හානිපූරණය සඳහා වන්දි ලබා ගැනීමට කටයුතු කිරීමට හෝ තත්ත්වයෙන් අසමත් ඖෂධ සපයන ලබන සමාගම්වලින් වන්දි ලබා ගැනීමට අදාළ ප්‍රතිපාදන ප්‍රසම්පාදන ලියවිලි තුළ ඇතුළත් කිරීමට මෙම වාර්තාවේ දිනය දක්වා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව කටයුතු කර නොමැති බවත්, මෙවැනි සැපයුම්කරුවන් අසාධු ලේඛනගත කිරීමට ක්‍රියාමාර්ගයන් ගෙන නොමැති බවත් නිරීක්ෂණය විය.

(ශ) වෛද්‍ය සැපයීම් අධ්‍යක්ෂ විසින් 2023 ඔක්තෝබර් 09 හා 18 දිනවල නිකුත් කරන ලද අංක MSD/Q/P/2023/56 හා MSD/Q/Special/2023/4 දරන වක්‍රලේඛ මඟින් Human Immunoglobulin හා Rituximab ඇතුළු ඖෂධ තත්ත්වයෙන් අසමත් වීම මත භාවිතයෙන් ඉවත් කර තිබුණි. සමාජය තුළ මහත් ආන්දෝලනයකට තුඩු දුන් මෙම ඖෂධ 02 තත්ත්වයෙන් අසමත්ව 2026 මාර්තු 30 විගණිත දින වන විට වර්ෂ 2 ½ කට ආසන්න කාලයක් ගතව ඇතත් 2023 ජනවාරි 13 සැපයුම්කරු වෙත නිකුත් කරන ලද අංක ICL/EOI/P1/174/2022 දරන ගැණුම් ඇණවුමේ 9 ඡේදය ප්‍රකාරව මේ වන තෙක් අදාළ සැපයුම්කාර සමාගමෙන් රු.මිලියන180.37 ක් වූ පිරිවැය හා සියයට 25 ක් වූ පරිපාලන වියදම් අයකර ගෙන නොතිබුණි.

(ෂ) පැවැති ඖෂධ නිෂ්පාදන, සැපයීම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය පවත්වාගෙන ගිය HQ Colombo ගොඩනැගිල්ලේ පළමු මහලෙහි Rare wing කොටස සහ පස්වන මහල බදු කුලී පදනම මත ලබාගැනීමේ දී ආරක්ෂිත තැන්පතු හා විදුලිය තැන්පතු ලෙස පුද්ගලික සමාගමක් වෙත ගෙවා තිබුණු රු.මිලියන 7.57 ක මුදල 2026 මාර්තු 30 දිනට ගිවිසුම්ගත කාලය අවසන් වී වර්ෂ 2.5 කට ආසන්න කාලයක් ගත වී ඇතත් අයකරගෙන නොතිබුණි.

(ස) වෛද්‍ය සැපයීම් අංශය විසින් නියමිත පරිදි රෝහල් වෙත වෛද්‍ය සැපයීම් නිකුත් කිරීම කළමනාකරණය නොකිරීම හේතුවෙන් රෝහල් විසින් සමාලෝචිත වර්ෂයේදී පිරිවැය රු.මිලියන 1,411.49 ක්වූ වෛද්‍ය සැපයීම් වර්ග 119 ක් දේශීයව මිලදිගැනීමට සිදුවී තිබුණු අතර 2024/2025 වර්ෂයන්හිදී රෝහල්වලට නිකුත් කිරීමකින් තොරව Blood Glucose Strips මිලියන 2.5 ක් වෛද්‍ය සැපයීම් අංශ ගබඩා තුළම කල් ඉකුත් වීම හේතුවෙන් රු.මිලියන 133.96 ක් වටිනා ඒකක 1,968,415 ක් රෝහල් විසින් දේශීය වෙළඳපලින් වැඩි මිලට මිලදිගැනීමට සිදුවී තිබුණි.

(ඟ) වෛද්‍ය සැපයීම් අංශය විසින් නිසි කලට ඖෂධ නොසැපයීම, අවශ්‍යතාවය නිසි පරිදි ඇස්තමේන්තු නොකර වරින් වර මිලදී ගැනීම හේතුවෙන් පොළොන්නරුව ශික්ෂණ රෝහල, පොළොන්නරුව වෘක්කවේද හා කැගල්ල රෝහල් මඟින් වෛද්‍ය සැපයීම් අයිතම 128 ක් ප්‍රාදේශීය මිල ගණන් කැඳවා මිලට ගැනීමේදී වෛද්‍ය සැපයීම් අංශය මඟින් අදාළ ඖෂධය සපයන මිල හා ප්‍රාදේශීය මිලදී ගැනීමේදී ගෙවූ මිල අතර සැලකිය යුතු මිල විචලනාවයක් පැවති අතර ප්‍රාදේශීය මිලදී ගැනීම් හේතුවෙන් රු. මිලියන 62.51 ක අමතර පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.

(ඉ) වෛද්‍ය සැපයීම් අංශය විසින් මිලදී ගන්නා ලද වෛද්‍ය සැපයීම්වලින් පිරිවැය රු.මිලියන 10,065.82 ක්වූ වෛද්‍ය සැපයීම් අයිතම 2,777 ක් 2025 වර්ෂය තුළදී කල් ඉකුත් වී තිබුණු අතර නිලධාරීන්ගේ නොසැලකිලිමත්කම, පිරිවිතරයන්ට අනුකූල නොවූ තොග භාර ගැනීම ආදී හේතු මත ඇතැම් අයිතම කල් ඉකුත් වී ඇති බව නිරීක්ෂණය විය. වෛද්‍ය සැපයීම් අංශය විසින් මහනුවර, පේරාදෙනිය, නාවලපිටිය, කුලියාපිටිය, කුරුණෑගල, මාතර, මඩකලපුව හා හම්බන්තොට රෝහල් වෙත ලබා දී තිබුණු පිරිවැය රු.මිලියන 108.22 ක්වූ වෛද්‍ය සැපයීම් වර්ග 118 කට වැඩි ප්‍රමාණයක් රෝහල් විසින් භාවිතයට නොගැනීම, විශේෂඥ වෛද්‍යවරුන් විසින් ඇස්තමේන්තු ගත කළද භාවිතය අවම වීම, වෛද්‍ය සැපයීම් අංශය විසින් භාවිතයට අවශ්‍ය උපාංග නොසැපයීම, කල් ඉකුත් වීමට ආසන්න දිනකදී රෝහල වෙත ලබා දීම, නව ප්‍රතිකාර ක්‍රමවේදය සඳහා භාවිතා නොකිරීම, විශේෂඥ වෛද්‍යවරුන්ගේ ස්ථාන මාරු වීම්, තත්ත්වයෙන් අසමත්ව භාවිතය අත්හිටවූ අයිතමවල තත්ත්ව වාර්තා නිකුත් නොකිරීම, කොවිඩ් වසංගතය හේතුවෙන් භාවිතය අඩුවීම මත කල් ඉකුත් වී තිබුණි.

(ඌ) 2025 දෙසැම්බර් 31 දින වන විට බදුල්ල, ගාල්ල, හලාවත, කුලියාපිටිය, කුරුණෑගල, ඇඹිලිපිටිය, ත්‍රිකුණාමලය, කන්තලේ හා පොළොන්නරුව යන රෝහල් සඳහා වෛද්‍ය සැපයීම් අංශයෙන් ලද පිරිවැය රු. මිලියන 134.14 ක් වූ වෛද්‍ය සැපයීම් අයිතම 402 කට වැඩි ප්‍රමාණයක් තත්ත්වයෙන් අසමත් වී හා කල් ඉකුත් වී තිබුණු අතර 2017 වර්ෂයේ සිට එම තොග අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(අඑ) ඖෂධ කළමනාකරණය පිළිබඳ අත්පොතට අනුව ඖෂධ ආරක්ෂිතව, පිරිසිදු, හොඳින් වාතාශ්‍රය ඇති සහ උෂ්ණත්වය පාලනය කරන ලද තත්වයන් යටතේ ගබඩා කළ යුතු වුවත්, කුරුණෑගල, පොළොන්නරුව, මඩකලපුව, ඇඹිලිපිටිය, හලාවත රෝහල්වල හා පොළොන්නරුව ජාතික වෘක්කවේද රෝහලේ ගබඩා පහසුකම් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් පිරිවැය රු. මිලියන 63.96 ක් වූ වෛද්‍ය සැපයීම් අනාරක්ෂිත ලෙස රෝහලේ ගබඩා කොරිඩෝ දෙපස හා ඖෂධ ගබඩාවෙන් පිටත රෝහල් භූමියේ ගබඩා කර තිබුණි.

(අඒ) සෙල්සියස් අංශක 25 ට වඩා අඩු උෂ්ණත්වයක ගබඩා කළ යුතු පිරිවැය රු.මිලියන 5.51 ක් වූ වෛද්‍ය සැපයීම් අයිතම 18 ක් පොළොන්නරුව හා පොළොන්නරුව වෘක්කවේද රෝහල්වල සෙල්සියස් අංශක 26 ත් 30 ත් අතර උෂ්ණත්වයක පැවතුණි. ඉරණවිල ගබඩා පරිශ්‍රයේ ගබඩා කර තිබුණු හලාවත රෝහලට අයත් ඖෂධ බොහෝමයක් සෙල්සියස්

අංශක 30ට අඩු උෂ්ණත්වයක ගබඩා කළ යුතු වුවද, විගණිත අවස්ථාවේදී එහි උෂ්ණත්වය සෙල්සියස් අංශක 37ක් විය.

(අෑ) මහරගම අපේක්ෂා රෝහලේ හිඟ ඖෂධ පිළිබඳ විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) රෝහල සඳහා අවශ්‍යවන වෛද්‍ය සැපයීම් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයීම් අංශය මඟින් සැපයුම් කරනු ලබන අතර විගණනයට ලද තොරතුරු අනුව වෛද්‍ය සැපයීම් අංශයෙන් අඛණ්ඩව ඖෂධ නොලැබීම මත සමාලෝචිත වර්ෂයට අදාළව රෝහලේ පිළිකා රෝගීන් සඳහා ලබාදෙන ඇතැම් පිළිකා නාශක ඖෂධ හා එන්නත්වල හිඟතාවයක් පැවති බව නිරීක්ෂණය විය. ඒ අනුව 2025 ඔක්තෝබර් 09 දිනැතිව අපේක්ෂා රෝහල විසින් විගණනයට ලබාදුන් තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය තුළ පිළිකා රෝගීන් සඳහා ලබාදෙන අත්‍යාවශ්‍ය ඖෂධ හා එන්නත් වර්ග 42 ක් දින 03 සිට 281 ක් දක්වා වූ කාල පරාසක හිඟව පැවතුණු බව නිරීක්ෂණය වූ අතර මෙම ඖෂධ හා එන්නත්වලින් 13ක් සමාලෝචිත වර්ෂය පුරාම හිඟ තත්ත්වයේ පැවති බවත් නිරීක්ෂණය විය. ඇතැම් පිළිකා රෝගීන් සඳහා ඔවුන් වෙනුවෙන්ම ගෙන්වා ලබාදෙන නාමික ඖෂධ වර්ග 07 ක්ද (Name patient drugs) දින 27 සිට දින 281 දක්වා වූ කාලපරාසයක් තුළ හිඟ තත්ත්වයේ පැවතුණු බවත් ඒ අනුව අඛණ්ඩව රෝගීන් වෙත ලබාදීමට ප්‍රමාණවත් ඖෂධ තොග රෝහලෙහි නොපැවතීම හේතුවෙන් රෝගීන් දැඩි අපහසුතාවයකට පත්වන බවත් විගණනයේදී නිරීක්ෂණය විය. අදාළ ඖෂධ වෙනුවට ආදේශක ඖෂධ භාවිතය, අතිරික්තතා ඇති වෙනත් රෝහල්වලින් ලබාගැනීමට කටයුතු කිරීම, පරිත්‍යාග මඟින් ලබාගැනීමට හෝ එසේ ලබාගැනීමට නොහැකිවන අවස්ථාවන්හිදී දේශීය වෙළඳපලෙන් මිලදීගැනීමට රෝහලට සිදුව තිබුණි. දේශීය වෙළඳපලෙන් මිලදීගැනීමේදී ඇතැම් ඖෂධ සඳහා සැපයුම්කරුවන් සොයාගැනීමට නොහැකිවීමත්, මිලදීගැනීමේ ක්‍රියාවලිය සඳහා දීර්ඝ කාලයක් ගතවීමත් හේතුවෙන් රෝගීන්ට අඛණ්ඩව ඖෂධ සැපයීමට නොහැකි වීමෙන් රෝගීන්ගේ රෝගී තත්ත්වයට බලපෑමක් සිදුවිය හැකි බව නිරීක්ෂණය විය.

(ii) ඖෂධ හා එන්නත් හිඟවීම හේතුවෙන් වර්ෂය තුළ දේශීයව මිලදීගැනීමට රෝහලට සිදුවී තිබුණු අතර සැපයුම්කරුවන් සංඛ්‍යාව සීමිත වීම, මිලදීගැනීමේ ප්‍රමාණය අවමවීම ආදී හේතූන් මත ඒවායේ මිළගණන් වෛද්‍ය සැපයීම් අංශයේ පැවති ඇස්තමේන්තුගත මිල හා ආසන්නතම ගැනුම් මිලගණන් (Latest price) සමඟ සැසඳීමේදී මිලෙහි වැඩිවීමක් නිරීක්ෂණය විය. ඒ අනුව වර්ෂය තුළ මිලදීගත් වෛද්‍ය සැපයුම් අයිතම 06කට අදාළව සියයට 14 සිට සියයට 1224 දක්වා වූ පරාසයක මිල වැඩිවීමක් පැවතුණු අතර අඛණ්ඩව වෛද්‍ය සැපයීම් ලබාගැනීමේ නිශ්චිත ක්‍රමවේදයක් සකස් කර නොතිබීම හේතුවෙන් රජයට අතිරේක වැය බරක් දැරීමට සිදුවී තිබුණු බව නිරීක්ෂණය විය.

(අෑ) ගාල්ල ජාතික රෝහලේ දේශීය වෙළඳපොළ හදිසි මිලදී ගැනීම් හා වෛද්‍ය සැපයීම් අංශයේ සැපයීම් භාවිතය පිළිබඳව සිදුකරන ලද විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2024 වර්ෂයේ අවස්ථා 57 කදී එකතුව රු.මිලියන 29.26 ක් වූ ඖෂධ වර්ග 27 කට අයත් ඖෂධ ඒකක 13,322 ක් මිලදී ගැනීම වෙනුවෙන් අනුමැතිය ලබා ගැනීම සඳහා රෝහල විසින් වෛද්‍ය සැපයුම් අංශයට යොමු කර තිබුණු අතර ඒ සඳහා ස්වස්ථා පරිගණක පද්ධතිය මගින් අනුමැතිය ලබා දීමට වෛද්‍ය සැපයුම් අංශය විසින් දින 02 සිට දින 123 දක්වා වූ ප්‍රමාද කාලයක් ගෙන තිබුණි.එසේම අවස්ථා 51 කදී රු. මිලියන 28.65 ක්වූ ඖෂධ ඒකක 16,851 ක් රෝහල වෙත මිලදී ගැනීම වෙනුවෙන් සැපයුම්කරුවන් වෙත ඇණවුම් ලබා දී තිබුණද අදාළ ඖෂධ රෝහලට සැපයීමට දින 02 සිට දින 69 දක්වා වූ ප්‍රමාද කාලයක් ගත වී තිබීම හේතුවෙන් සෞඛ්‍ය සේවා යථාවත් පරිදි පවත්වාගෙන යාමට බාධා සිදුවන බව නිරීක්ෂණය විය.

(ii) සමාලෝචිත වර්ෂයේ අවස්ථා 28 කදී එකතුව රු.මිලියන11.45 ක් වූ ඖෂධ වර්ග 15 කට අයත් ඖෂධ ඒකක 7,442 ක් මිලදී ගැනීම වෙනුවෙන් අනුමැතිය ලබා ගැනීම සඳහා රෝහල විසින් වෛද්‍ය සැපයුම් අංශයට යොමු කර තිබුණු අතර ඒ සඳහා ස්වස්ථා පරිගණක පද්ධතිය මගින් අනුමැතිය ලබා දීමට වෛද්‍ය සැපයුම් අංශය විසින් දින 06 සිට දින 38 දක්වා වූ ප්‍රමාද කාලයක් ගෙන තිබුණි.එසේම අවස්ථා 26 කදී ඖෂධ ඒකක 7,027 ක් රෝහල වෙත මිලදී ගැනීම වෙනුවෙන් රු.මිලියන 10.58 ක්වූ ඇණවුම් ඖෂධ සැපයුම්කරුවන් වෙත ලබා දී තිබුණද අදාළ ඖෂධ රෝහලට සැපයීමට සැපයුම්කරුවන් විසින් දින 02 සිට දින 38 දක්වා වූ ප්‍රමාද කාලයක් ගෙන තිබීම හේතුවෙන් සෞඛ්‍ය සේවා කාර්යක්ෂම පරිදි පවත්වාගෙන යාමට නොහැකි වී තිබුණි.

(iii) 2024 වර්ෂයේ අවස්ථා 10 කදී එකතුව රු. මිලියන 27.41 ක් වූ ශල්‍ය වෛද්‍ය උපකරණ වර්ග 17 කට අයත් ශල්‍ය වෛද්‍ය උපකරණ ඒකක 3,393 ක් මිලදී ගැනීම වෙනුවෙන් අනුමැතිය ලබා ගැනීම සඳහා රෝහල විසින් වෛද්‍ය සැපයුම් අංශයට යොමු කර තිබුණු අතර ඒ සඳහා ස්වස්ථා පරිගණක පද්ධතිය මගින් අනුමැතිය ලබා දීමට වෛද්‍ය සැපයුම් අංශය විසින් දින 02 සිට දින 62 දක්වා වූ ප්‍රමාද කාලයක් ද, ඇණවුම් සැපයුම්කරුවන් වෙත ලබා දී තිබුණද අදාළ ශල්‍ය වෛද්‍ය උපකරණ රෝහලට සැපයීමට දින 17 සිට දින 143 දක්වා වූ ප්‍රමාද කාලයක් සැපයුම්කරුවන් විසින් ගෙන තිබීම හේතුවෙන් රෝහලේ ශල්‍ය කටයුතු ප්‍රමාද වී තිබුණි.

(iv) වෛද්‍ය රසායනාගාරයේ 2024 වර්ෂයේ අවස්ථා 47 කදී එකතුව රු.මිලියන 4.91 ක් වූ ඖෂධ වර්ග 30 කට අයත් ඖෂධ ඒකක 473,745 ක් මිලදී ගැනීම් වෙනුවෙන් අනුමැතිය ලබා ගැනීම සඳහා රෝහල විසින් වෛද්‍ය සැපයුම් අංශයට යොමු කර තිබුණු අතර ඒ සඳහා ස්වස්ථා පරිගණක පද්ධතිය මගින් අනුමැතිය ලබා දීමට වෛද්‍ය සැපයුම් අංශය විසින් දින 03 සිට දින 43 දක්වා වූ ප්‍රමාද කාලයක් ගෙන

තිබුණි.එසේම අවස්ථා 47 කදී ඖෂධ ඒකක 473,745 රෝහල වෙත මිලදී ගැනීම වෙනුවෙන් රු. මිලියන 4.91 ක් වූ ඇණවුම් ඖෂධ සැපයුම්කරුවන් වෙත ලබා දී තිබුණද අදාළ ඖෂධ රෝහලට සැපයීමට දින 13 සිට දින 224 දක්වා වූ ප්‍රමාද කාලයක් සැපයුම්කරුවන් විසින් ගෙන තිබීම හේතුවෙන් වෛද්‍ය රසායනාගාර කටයුතු ප්‍රමාද වී තිබුණි.

(v) විගණනය විසින් සිදු කළ නියැදි පරීක්ෂාවට අනුව ඖෂධ, ශල්‍ය වෛද්‍ය උපකරණ හා රසායනාගාරයට අවශ්‍ය උපකරණ සඳහා මෙම රෝහල තුල ආරක්ෂිත ඖෂධ තොගයක් පවත්වා නොගැනීම සහ ඖෂධ පිළිබඳ නිසි කළමනාකරණයක් නොමැති වීම හේතුවෙන් වෛද්‍ය සැපයුම් අංශයෙන් ඇණවුම් කිරීම වෙනුවට හදිසි මිලදී ගැනීම් කිරීමට සිදු වීම මඟින් එකතුව රු. මිලියන 35.29 වියදම් වී තිබුණු අතර මෙය වෛද්‍ය සැපයුම් අංශය මඟින්ම සපයා ගැනීමට හැකි වූයේ නම් එකතුව රු.මිලියන14.11 ක් පමණක් වැය වන බවත් එම නිසා රු.මිලියන 21.18 ක ඉතිරියක් රජයට සිදුවී ඇති බවත් විගණනයේදී බැහැර කළ නොහැකි විය.

(අඉ) කුරුණෑගල ශික්ෂණ රෝහලට අදාළව සිදුකරන ලද විගණනයේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) රෝහලේ සමාලෝචිත වර්ෂය සඳහා ඖෂධ වර්ග 681 ක් ඇස්තමේන්තුගත කර තිබුණු අතර එයින් ඖෂධ වර්ග 92 ක් සඳහා වෛද්‍ය සැපයුම් අංශය මඟින් ඖෂධ ලබා දී නොතිබුණි. ඖෂධ වර්ග 139 ක් සඳහා ඖෂධ සැපයුම සියයට 50 කට වඩා අඩු බව නිරීක්ෂණය විය. තවද, ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දුර්වලතා හේතුවෙන් ඖෂධ වර්ග 56 ක් සඳහා අතුරු ඇස්තමේන්තු මඟින් ඖෂධ සපයා ගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

(ii) 2024 පෙර හා 2025 වර්ෂය තුළ තත්ත්වය අසමත් වීම මත මාස 03 සිට වර්ෂ 08 දක්වා කාලයක සිට නිකුත් කිරීම තාවකාලිකව නවතා ඇති කල් ඉකුත් වූ හා කල් ඉකුත් වීමට ආසන්නව ඇති ඖෂධ වර්ග 14 ක් සඳහා තත්ත්ව වාර්තාවක් නිකුත් කර නොතිබුණි.

(iii) ඖෂධ වර්ග කිහිපයක් සංයෝග කර නිෂ්පාදනය කරනු ලබන ඖෂධ 12 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී අවශ්‍ය අයිතම කොටසක් පමණක් ලැබීම හේතුවෙන්, එම ඖෂධවලින් නිමි නිෂ්පාදන සිදු කිරීමට නොහැකි වී තිබුණු අතර, ලැබී තිබුණු අයිතමයන්ද කල් ඉකුත්වීමට ආසන්න මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

(අඊ) පොලොන්නරුව ශික්ෂණ රෝහලට අදාළව සිදුකරන ලද විගණනයේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) මිල කැඳවුම් ලබා දුන් අවස්ථාවේදී නියමිත ප්‍රමාණය සැපයීමට එකඟ වෙමින් සැපයුම්කරුවන් මඟින් ලංසු ඉදිරිපත් කර තිබුණද,ඖෂධ වර්ග 2ක ඒකක 25500 ක් ඇනවුම් කර තිබුණද, නියමිත ඇණවුම් ප්‍රමාණයම සැපයුම්කරුවන් විසින් එකවර සැපයීමකින් තොරව විවිධ ප්‍රමාණයන්ගෙන් වාර 03කදී ඒකක 10500 ක්

පමණක් සපයා තිබුණු බැවින් ඖෂධ අවශ්‍යතාවය නිසි කලට හා නියමිත අවශ්‍යතාවයන්ට සරිලන ලෙස සැපයීමට අපොහොසත්වී ඇති බව නිරීක්ෂණය විය.

(ii) රෝහලේ ගබඩා 03 ක් තුල ගබඩා කර ඇති ඖෂධ අයිතම 19 ක රාජ්‍ය ලාංඡනය මුද්‍රණය කර නොතිබුණි.

(iii) ප්‍රාදේශීය ඖෂධ මිලට ගැනීම සඳහා වන ඉල්ලීම විශේෂඥ වෛද්‍යවරයකු විසින් සිදුකළ අවස්ථාවේ සිට ආයතන ප්‍රධානියා විසින් එම ඉල්ලීම අනුමත කර සැපයුම්කරුවන් මඟින් ලබා දෙන භාණ්ඩ, භාණ්ඩ භාර ගැනීමේ කමිටුව විසින් අනුමත කර ගබඩාව වෙත භාර දෙන අවස්ථාව දක්වා ප්‍රාදේශීය ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා දින 34 සිට දින 257 ක් දක්වා සැලකිය යුතු කාලයක් ඖෂධ අයිතම 21 ක් මිලට ගැනීමට ගත වී ඇති බැවින් රෝගීන් සඳහා ප්‍රතිකාර කිරීම ප්‍රමාද වීම සිදුවිය හැකි බව නිරීක්ෂණය විය.

(අඑ) පොළොන්නරුව ජාතික වෘක්කවේද විශේෂිත රෝහලට අදාළව සිදුකරන ලද විගණනයේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) හදිසි ඖෂධ සපයා ගැනීම සඳහා වන ඉල්ලීම විශේෂඥ වෛද්‍යවරයකු විසින් සිදු කළ අවස්ථාවේ සිට ආයතන ප්‍රධානියා විසින් එම ඉල්ලීම අනුමත කර සැපයුම්කරුවන් මඟින් ගබඩා වෙත භාර දෙන දින තෙක් සමස්ථ ක්‍රියාවලිය සඳහා දින 36 සිට දින 147 ක් දක්වා සැලකිය යුතු කාලයක් ගතව තිබුණු බව නිරීක්ෂණය විය.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2024 හි 9.1 (ඇ) ඡේදයේ උපදෙස්වලට පටහැනිව භාණ්ඩ භාර ගැනීමේ කමිටුව මඟින් වෛද්‍ය සැපයුම්වල ගුණාත්මකභාවය, ප්‍රමාණය හා අදාළත්වය සනාථ කර ගැනීමකින් තොරව පිරිවැය රු.මිලියන 30.55 ක්වූ වෛද්‍ය සැපයුම් වර්ග 17 කට අයත් ඒකක 42,926 ක් අදාළ රෝහල් අංශ වෙත යොමු කර තිබුණි.

(iii) හදිසි ඖෂධ සපයා ගැනීම සඳහා විශේෂඥ වෛද්‍යවරුන් මඟින් ඉල්ලීම් කර තිබුණු වෛද්‍ය සැපයුම් 03 ක් සපයා ගැනීම සඳහා සැපයුම්කරුවන් ඉදිරිපත් නොවීම හා එම ඖෂධ වෛද්‍ය සැපයීම් අංශය මඟින් සැපයීමට අපොහොසත් වී තිබීම හේතුවෙන් ඖෂධ වර්ග 03 ක සහ ශල්‍ය පාරිභෝජ්‍ය ද්‍රව්‍යයක සැපයුම් විගණිත දින වූ 2026 පෙබරවාරි 03 දින වන විටත් අදාළ රෝහල වෙත ලැබී නොතිබුණි.

(iv) හදිසි ඖෂධ සපයා ගැනීම සඳහා විශේෂඥ වෛද්‍යවරුන්ගේ ඉල්ලීම් ලද පසු ඇණවුම් කර තිබුණු වෛද්‍ය සැපයුම් 06 ක් ඇණවුම් කළ දින සිට විගණිත දිනයවූ 2026 පෙබරවාරි 03 දින දක්වා දින 38 සිට දින 130 ක් ගත වී තිබුණද, සැපයුම්කරුවන් මඟින් අදාළ ඇණවුම් රෝහල වෙත සපයා ගෙන නොතිබුණි.

(v) රෝහල සතුව පැවති වර්ග 05 කට අයත් ඖෂධ හා ශල්‍ය පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ඒකක 120,153 ක ශ්‍රී ලංකා රාජ්‍ය ලාංඡනය සඳහන් වී නොතිබුණි.

(අථ) බදුල්ල ප්‍රාදේශීය වෛද්‍ය සැපයුම් අංශය (RSMD) විසින් ඌව පළාත් රෝහල් සහ වෛද්‍ය මධ්‍යස්ථාන වෙත ස්වස්ථ පද්ධතිය හරහා ඖෂධ නිකුත් කර තිබුණද හල්දුම්මුල්ල හා මීගහකිවුල ප්‍රාදේශීය රෝහල් වෙත රු.3,844,276 ක් වටිනා ඖෂධ හෞතිකව ලැබී නොතිබුණි.

5 තිරසාර සංවර්ධනය

5.1 තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීමේ ප්‍රගතිය

සෞඛ්‍ය අමාත්‍යාංශයට අදාළව තිරසර සංවර්ධන දර්ශක 42 ක් හඳුනාගෙන තිබුණු අතර 2026 අප්‍රේල් 08 දිනැති අංක HP/SDG/01/2025-Vol 1 දරන අභ්‍යන්තර සටහන මගින් සංවර්ධන දර්ශක 3 කට අදාළ ප්‍රගතිය විගණනයට වාර්තා කර තිබුණි. ඉතිරි තිරසර සංවර්ධන ඉලක්ක සඳහා වන ප්‍රගතිය 2026 වර්ෂයේ පවැත්වීමට නියමිත කමිටු රැස්වීමෙන් පසුව ඉදිරිපත් කරන බව දන්වා තිබුණු අතර ප්‍රගතිය වාර්තා කරන ලද පහත සඳහන් දර්ශක අවශ්‍ය කාර්යසාධන මට්ටම කරා ළඟා වී නොතිබුණි.

(අ) දර්ශක අංක 3.3.5 (1) අනුව ජනගහනය 100,000 කට ඩෙංගු රෝගය වැළඳුණු නව රෝගීන් ගණන 2030 වන විට 21,000 ක අගයක් පවත්වා ගැනීමට ඉලක්ක කර තිබුණද 2025 වර්ෂය වන විට එම අගය 45,926 ක් වී තිබුණි.

(ආ) දර්ශක අංක 3.3.5 (1a) අනුව ඩෙංගු රෝගය වැළඳුණු රෝගීන්ගෙන් මිය ගිය අනුපාතය 2024 වර්ෂයේ 100,000කට 0.05 ක පැවති අතර සමාලෝචිත වර්ෂයේදී ප්‍රගතියක් අත්කර ගෙන නොතිබුණි.

(ඇ) දර්ශක අංක 2.2.2.b අනුව 2024 වර්ෂයේදී වයස අවුරුදු 5ට අඩු ළදරුවන් අතර අධිබර / ස්ථූල තත්ත්වයෙන් පෙළෙන ප්‍රතිශතය 0.49 ක් වුව ද එම අගය 2025 වර්ෂයේදී 0.57 ප්‍රතිශතයක් දක්වා අහිතකර ලෙස වර්ධනය වී තිබුණි.

6 යහපාලනය

6.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

(අ) වෛද්‍ය පරීක්ෂණ මණ්ඩල සඳහා අයදුම්කිරීම හා ඊට අදාළ වාර්තා නිකුත්කිරීම සම්බන්ධව අධ්‍යක්ෂ ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර සේවා අංශය විසින් 2025 නොවැම්බර් 10 දින රජයේ විගණන අංශයේ විද්‍යුත් තැපෑල වෙත යොමුකරන ලද තොරතුරු පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2018 වර්ෂයේ සිට වෛද්‍ය පරීක්ෂණ මණ්ඩල සඳහා අයදුම්කිරීම හා ඊට අදාළ වාර්තා නිකුත්කිරීම සම්බන්ධව තොරතුරු විගණනයට ඉදිරිපත් කරන ලෙස

ඉල්ලීම් කළද 2022 වර්ෂයේ සිට පමණක් අදාළ තොරතුරු ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව 2022 වර්ෂයට පෙර ඉල්ලුම් කරන ලද වෛද්‍ය පරීක්ෂණ මණ්ඩල වාර්තා නිකුත්කිරීම් අවසන් කර තිබෙද යන්න විගණනයේදී තහවුරු කරගැනීමට නොහැකි විය.

(ii) 2022 වර්ෂයේ සිට 2025 මැයි දක්වා හා 2025 ජුනි සිට වෙන් වෙන් වශයෙන් දත්ත පද්ධති දෙකක් මඟින් ඉහත තොරතුරු ඉදිරිපත් කර තිබුණද පද්ධති දෙකෙහිම තොරතුරු අසම්පූර්ණ වී තිබුණි.

(iii) 2022 සිට 2025 මැයි දක්වා කාලපරිච්ඡේදයට අදාළ දත්ත පද්ධතිය පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

- කාලපරිච්ඡේදය තුළදී ආයතන මඟින් ලැබී තිබුණු අයදුම්පත් 16438 කින් වෛද්‍ය මණ්ඩල පැවැත්වීම සඳහා රෝහල් නම් කිරීම 10958 ක් පමණක් වූ අතර අමාත්‍යාංශය විසින් රෝහල් වෙත යොමු කර තිබුණු අයදුම්පත් සංඛ්‍යාව 8116 ක් එනම් ඉදිරිපත් කරන ලද අයදුම් පත් සංඛ්‍යාවෙන් සියයට 49 ක් පමණක් විය.

- මෙම කාලපරිච්ඡේදය තුළ සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් නම්කරන ලද රෝහල් විසින් වෛද්‍ය පරීක්ෂණ වාර්තා 3440 ක් අමාත්‍යාංශය වෙත යොමුකර නොතිබුණි.

- දත්ත පද්ධතිය අනුව කාලපරිච්ඡේදය තුළ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් වෛද්‍ය පරීක්ෂණ මණ්ඩල වාර්තා ලබාගැනීම සඳහා රෝහලක් නම් නොකලද වෛද්‍ය පරීක්ෂණ මණ්ඩල වාර්තා අමාත්‍යාංශය වෙත ලැබී තිබුණු බව සඳහන් වූ අවස්ථා 938 ක් පැවතුණි.

- දත්ත පද්ධතිය අනුව කාලපරිච්ඡේදය තුළ සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත එක් එක් ආයතන මඟින් වෛද්‍ය පරීක්ෂණ මණ්ඩල වාර්තා ලබාගැනීම සඳහා යොමුකරන ලද අයදුම්පත් වෙනුවෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය එම ආයතන වෙත වාර්තා නිකුත් කිරීම සිදු නොකළ අවස්ථාවන් 7840 ක් පැවතුණි.

- සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත අයදුම්පත් ලද දිනයන්, රෝහල් වෙත අයදුම්පත් යොමු කළ දිනයන්, රෝහල වෙතින් වෛද්‍ය පරීක්ෂණ මණ්ඩල වාර්තා අමාත්‍යාංශය වෙත ලද දිනයන් සහ අමාත්‍යාංශය විසින් වෛද්‍ය පරීක්ෂණ මණ්ඩල වාර්තා අදාළ ආයතන වෙත යොමු කළ දිනයන් දත්ත පද්ධතියට ඒකාකාරී ක්‍රමයකට ඇතුළත් කර නොතිබුණි.

- වෛද්‍ය පරීක්ෂණ මණ්ඩල වාර්තා ලබාගැනීමට ආයතන විසින් 2022 වර්ෂයේදී ඉදිරිපත් කළ අයදුම්පත් සඳහා 2024 හා සමාලෝචිත වර්ෂයේදී

ද 2023 වර්ෂයේදී ඉදිරිපත් කළ අයදුම්පත් සඳහා 2025 වර්ෂයේදී ද වාර්තා නිකුත් කර තිබුණු බැවින් අයදුම්කරුවන්ගේ අවශ්‍යතා කාර්යක්ෂමව ඉටුකර නොමැති බව නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

- වෛද්‍ය පරීක්ෂණ මණ්ඩල පැවැත්වීම සඳහා අයදුම්පත රෝහල වෙත යොමුකළ දිනය හා රෝහල්වලින් වෛද්‍ය පරීක්ෂණ මණ්ඩල වාර්තාව ලද දිනය සටහන් නොකළ අවස්ථා පැවතුණි. එසේම සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය සහිත වෛද්‍ය වාර්තා අදාළ ආයතනය වෙත යොමුකරන ලද දිනයන් සටහන් කර නොමැති අවස්ථා පැවතුණි.

(iv) 2025 ජූනි මස සිට ප්‍රාථමික සත්කාර ඒකකය විසින් නව පද්ධතියක දත්ත සටහන් කිරීම සිදුකර තිබුණු අතර 2025 වර්ෂයේ ජූනි මස සිට අගෝස්තු මස දක්වා නිවැරදි ලෙස අයදුම්පත් ලද දිනය සටහන් කරන ලද අවස්ථා 862 ක් අතරින් අවස්ථා 304 ක් සඳහා අදාළ ආයතනය නිසිලෙස හඳුනාගත නොහැකි ලෙස දත්ත ඇතුළත් කර තිබුණි.

(v) රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් විසින් දේශීය වෛද්‍ය අංශයෙන් ප්‍රතිකාර ලබාගත් පසු හදිසි අනතුරු නිවාඩු සහ විශේෂ අසනීප නිවාඩු අනුමත කරගැනීමට හෝ තවදුරටත් සේවයේ යෙදීමේ යෝග්‍යතාවය පරීක්ෂා කිරීම පිණිස වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයක් වෙත යොමුකර සම්පූර්ණකරනු ලබන වෛද්‍ය පරීක්ෂණ මණ්ඩල පොදු (142)I ආකෘති පත්‍රයෙහි හා පොදු (142 අ)II ආකෘති පත්‍රයෙහි වෛද්‍ය මණ්ඩල නිර්දේශ අනුමත කිරීම සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදුකරනු ලබන අතර මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

- දේශීය වෛද්‍ය අංශයෙන් ප්‍රතිකාර ලද නිලධාරීන් සඳහා වෛද්‍ය පරීක්ෂණ මණ්ඩල පැවැත්වීම සම්බන්ධයෙන් 2022 ජූලි 29 දින සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලයේදී පවත්වන ලද සාකච්ඡාවට අනුව විශේෂයෙන් සකසන ලද ආකෘතියක ආයුර්වේද විශේෂඥ වෛද්‍ය මණ්ඩලයේ සහතික වෛද්‍ය මණ්ඩලයේ සභාපතිගේ හා ආයුර්වේද කොමසාරිස්ගේ අත්සන සහිතව හා අයදුම්කරුවන්ගේ සියලු ලිපි ලේඛන සහිතව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යොමු කර තිබුණි. එසේ වුවද ආයුර්වේද වෛද්‍ය මණ්ඩලයේ නිර්දේශ පිළිබඳව කිසිදු විමසීමක් නොමැතිව නැවතත් වෛද්‍ය සහතික පරීක්ෂා කිරීම සඳහා වෛද්‍ය මණ්ඩලයක් වෙත කැඳවීමට කටයුතු කරන බව ආයුර්වේද කොමසාරිස්ගේ අංක 6-3/3 වෛ.මණ්.පොදු හා 2023 මාර්තු 27 දිනැති ලිපිය මඟින් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා තිබුණි. පසුව ආයුර්වේද රෝහල මඟින් වෛද්‍ය මණ්ඩල පත්කොට ලබාදී තිබුණු වෛද්‍ය පරීක්ෂණ මණ්ඩල වාර්තා බටහිර විශේෂඥ වෛද්‍යවරුන් දෙදෙනෙකු හා එක් ආයුර්වේද විශේෂඥ වෛද්‍යවරයෙකු ඇතුළත් විශේෂ වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයක් වෙත ඉදිරිපත් කිරීමට තීරණය කර තිබුණි.

එසේවුවද වර්තමානය වනවිට විශේෂඥ වෛද්‍ය පරීක්ෂණ මණ්ඩල මඟින් වෛද්‍ය සහතික පරීක්ෂා කිරීම සිදු නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය.

- 2023 මාර්තු 27 දිනැති ආයුර්වේද කොමසාරිස්ගේ අංක 6-3/3 වෛ.මණ්.පොදු දරන ලිපිය මඟින් දේශීය වෛද්‍ය අංශයෙන් ප්‍රතිකාර ලබන නිලධාරීන්ගේ ආයුර්වේද වෛද්‍ය මණ්ඩලයේ නිර්දේශය අනුමත කර අත්සන යෙදීම සඳහා ආයුර්වේද කොමසාරිස් වෙත බලය පැවරීම සම්බන්ධයෙන් සුදුසු පියවර ගන්නා ලෙස ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ඉල්ලා තිබුණි. මෙම කරුණ සඳහා ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ 2023 අගෝස්තු 26 දිනැති අංක EST-6/03/LEA/3460(I) දරන ලිපිය මඟින් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ නිරීක්ෂණ හා නිර්දේශ ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි. මේ සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් 2023 ඔක්තෝබර් 26 දිනැති අභ්‍යන්තර සටහන මඟින් සිය එකඟතාව පලකර ඇති බැවින් ආයුර්වේද කොමසාරිස් අත්සන් කිරීම නිර්දේශ කරන බවත් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ 2023 නොවැම්බර් 16 දිනැති අංක MIM/AD/14/9/1 දරන ලිපිය මඟින් ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා තිබුණි . ඉන් අනතුරුව 2024 ජනවාරි 09 දින ආයතන අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලයේදී පැවති සාකච්ඡාවේදී එළඹී තීරණ අනුව කරුණු 04 ක් සම්බන්ධයෙන් ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත නිරීක්ෂණ හා නිර්දේශ යොමු කිරීම සිදු කළ යුතුව තිබුණි. ඉහත තීරණයන්ට එළඹ මාස 06 ක පමණ කාලයක් ගතවීමෙන් පසු ඒ සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් 2024 ජූලි 30 දින ආයුර්වේද කොමසාරිස් ද ඇතුළත්ව කමිටුවක් පත්කර තිබුණු අතර කමිටුව 2024 ඔක්තෝබර් 09 දින පවත්වා තිබුණද නිර්දේශ සහිත එම කමිටු වාර්තාව වසරකට ආසන්න කාලයක් ගතවීමෙන් පසු 2025 සැප්තැම්බර් 26 දින අධ්‍යක්ෂ (ප්‍රාථමික සත්කාර සේවා) විසින් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමුකර තිබුණි. මෙම තීරණයන්ට එළඹීම සම්බන්ධයෙන් ප්‍රධානතම පාර්ශවකරුවෙකු වන ආයුර්වේද කොමසාරිස් ඒ සඳහා සහභාගි වී නොමැති බව නිරීක්ෂණය විය.

- එසේ වුවද ඉහත කරුණු සම්බන්ධයෙන් ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත නිරීක්ෂණ හා නිර්දේශ යොමු කිරීම සිදුකර තිබේද යන්න විගණනයට ඉදිරිපත් කරන ලද ගොනුවෙහි ඇතුළත් කර නොතිබුණි.

- සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින දේශීය වෛද්‍ය අංශයෙන් ආයුර්වේද ප්‍රතිකාර ලද නිලධාරීන් වෙත ආයුර්වේද විශේෂඥ වෛද්‍ය මණ්ඩල විසින් ලබාදුන් නිර්දේශ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත නොකර නැවත ඒකාබද්ධ වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයකට යොමුකිරීම හේතුවෙන් දේශීය වෛද්‍ය අංශයෙන් ප්‍රතිකාර ලද

නිලධාරීන්ගේ වෛද්‍ය මණ්ඩල වාර්තා අනුමතකිරීම ප්‍රමාද වන බව විගණනයේදී නිරීක්ෂණය විය. එසේ වුවද මේ සම්බන්ධයෙන් විසඳුම් ක්‍රියාමාර්ගයක් ගැනීමට වගකිව යුතු නිලධාරීන් කාර්යක්ෂම කටයුතු කර නොතිබුණි.

(vi) වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයක් වෙත යොමුකර සම්පූර්ණ කරණු ලබන වෛද්‍ය පරීක්ෂණ මණ්ඩල පොදු (142)I ආකෘති පත්‍රයෙහි හා පොදු (142 අ)II ආකෘති පත්‍රයෙහි වෛද්‍ය මණ්ඩල නිර්දේශ අනුමත කිරීම සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ලෙස සඳහන් කර තිබුණද වර්තමානය වනවිට සෞඛ්‍ය අමාත්‍යාංශයේ එවැනි තනතුරක් නොපවතින අතර සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් ලෙස තනතුරු නාමය පැවතියද ඒ අනුව අවශ්‍ය සංශෝධන සිදුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ජාතික මානසික සෞඛ්‍ය විද්‍යායතනයේ නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගීන් මෙන්ම බාහිර රෝගීන් ද මනෝ විද්‍යා විශේෂඥ වෛද්‍යවරයාගේ තීරණය හා රෝහල් අධ්‍යක්ෂගේ අනුමැතිය මත රෝහලේ ගෙවන වාට්ටු සඳහා ඇතුළත් කරනු ලබයි. ගෙවන වාට්ටු ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති බැවින් 2025 අගෝස්තු 15 විගණිත දිනට ගෙවන වාට්ටු අපේක්ෂාවෙන් රෝගීන් 67 දෙනෙකු පොරොත්තු ලේඛනයේ සිටින බැව් නිරීක්ෂණය විය. මෙසේ දීර්ඝ කාලයක් ගෙවන වාට්ටුවලට ඇතුළත්වීමේ අපේක්ෂාවෙන් නේවාසිකව රැඳී සිටින රෝගීන් සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු විධිමත් ක්‍රියා පිළිවෙතක් රෝහල් කළමනාකාරිත්වය විසින් 2025 දෙසැම්බර් 31 දින වන තෙක් ස්ථාපිත කර තිබුණි.

(ඇ) නාවලපිටිය දිස්ත්‍රික් මහ රෝහලේ පල්දෝරු පද්ධතිය තුළ එකතුවන අපවිත්‍ර ජලය ක්ලෝරීන්කරණයට ලක්කර පාරිසරික හානිය අවම වන පරිදි මහවැලි ගංගාව වෙත මුදා හැරීම සඳහා සකස් කර තිබුණද 2012 වර්ෂයේ සිට එම ක්ලෝරීන්කරණ මෝටරය ක්‍රියාවිරහිත වීමත් සමඟ විගණිත දිනය වූ 2025 ජනවාරි 30 දක්වා කිසිදු පිරිසිදු කිරීමකින් තොරව මහවැලි ගංගාව වෙත අපද්‍රව්‍ය මිශ්‍රිත ජලය මුදා හැරීම හේතුවෙන් මහජනතාව අපහසුතාවයට පත්ව තිබුණි.

(ඈ) කළුතර ශික්ෂණ රෝහලේ මුළුතැන්ගෙට අවශ්‍ය අමු ආහාර සැපයීමේ කොන්ත්‍රාත්තුව 2025/2026 වර්ෂය වෙනුවෙන් රු. මිලියන 57.19 ක අගයකට ප්‍රදානය කර තිබුණද දිනකට ආහාර වේල් 03 බැගින් මාසය පුරා අබන්ඩව අනුමත ආහාර වට්ටෝරුව ප්‍රකාරව අමු ආහාර සැපයීමට සැපයුම්කරු අපොහොසත් වී තිබුණි. මෙහිදී බොහෝ මාසවල අවසන් දින කිහිපය වන විට එක් එක් ආහාර වර්ග ඇණවුම් කළ හැකි සීමාවන් ඉක්මවා යාම හේතුවෙන් අනුමත ආහාර වට්ටෝරුවෙන් බැහැරව එක් එක් ආහාර වර්ගයක් සඳහා පවතින ආදේශන අමු ආහාර වර්ග සපයා ගෙන ආහාර වේල් පිළියෙල කර තිබුණි. මේ හේතුවෙන් ආහාර වේලක තිබිය යුතු පෝෂණ මට්ටම හා සමතුලිතභාවය පිළිබඳ සැලකිලිමත් නොවීමත් පිළිකා රෝගීන්, දියවැඩියා රෝගීන් වැනි විශේෂිත රෝගී තත්ත්වයන් සඳහා ලබාදිය යුතු අධි ප්‍රෝටීන් සහිත ආහාර සහ විශේෂිත ආහාර වර්ගවල අවශ්‍යතාවයන් සැපයුම්කරුවන්ගෙන් සපයා ගත නොහැකි තත්ත්වයක් අති වී තිබුණි.

(ඉ) අලුත්ගම ප්‍රාදේශීය රෝහලේ සතියකට වරක් පැවැත්වෙන බෝ නොවන රෝග (NCD) සායනය සඳහා රෝගීන් 100 කට අධික පිරිසක් සහභාගී වුවද, එම රෝගීන්ගේ රුධිරයේ සීනි, කොලෙස්ට්‍රෝල් ආදී මූලික පරීක්ෂාවන් සිදුකර ගැනීමට ප්‍රමාණවත් රෝහල් පහසුකම් රෝහල් රසායනාගාරයේ නොමැති බැවින් රෝගීන්ට තම පෞද්ගලික වියදමින් බාහිරින් එම පරීක්ෂණ සිදුකරවා ගෙන සායනයට පැමිණිය යුතු තත්ත්වයක් උද්ගතවී තිබුණි. එසේම රුධිරගත සීනි, කොලෙස්ට්‍රෝල් වැනි පරීක්ෂණ සඳහා රෝහල් රසායනාගාරයේ පවතින Chemistry Specto meter උපකරණය සඳහා 2023 වර්ෂයේ සිට ප්‍රතික්‍රියක සපයා ගත නොහැකිවීම හේතුවෙන් එම උපකරණය භාවිතයට නොගෙන නිශ්ක්‍රීයව පැවතුණි. මෙම ප්‍රාදේශීය රෝහල වෙනුවෙන් විශාල මුදලක් වැය කර ගොඩනැගිලි ඉදිකර තිබුණද ඊට සාපේක්ෂව රසායනාගාර පහසුකම් හා අනෙකුත් වෛද්‍ය පහසුකම් වැඩිදියුණු කිරීමක් සිදුකර නොතිබුණු බැවින් මහජනයාට ලැබෙන ප්‍රතිලාභ නිසියාකාරව ලබාගත නොහැකි තත්ත්වයක් පැවතුණි.

(ඊ) 2025/2026 වර්ෂයට අදාළව ඇඹිලිපිටිය දිස්ත්‍රික් මහ රෝහල වෙත අමු ආහාර ද්‍රව්‍ය සැපයීමේදී විගණනය විසින් පරීක්ෂා කළ දින 21 කට අදාළව අමු ආහාර වර්ග 07 ක් නියමිත ප්‍රමාණයට සපයා නොතිබීම හේතුවෙන් රෝගීන්ගේ පෝෂණ අවශ්‍යතාවන්ට සරිලන ආහාර වේලක් ලබාදීමට නොහැකි වී තිබුණි.

7. මානව සම්පත් කළමනාකරණය

(අ) සැලසුම් අංශය විසින් විගණනය වෙත ඉදිරිපත් කරන ලද සෞඛ්‍ය අමාත්‍යාංශය, පළාත් සෞඛ්‍ය හා ඒ යටතේ පවතින ආයතනවලට අදාළ 2025 දෙසැම්බර් 31 දිනට කාර්යමණ්ඩලය පිළිබඳ තොරතුරු පරීක්ෂාවේදී 2025 දෙසැම්බර් 31 දිනට වැටුප්තල අනුව අනුමත සමස්ත කාර්යමණ්ඩලය 177,942 ක් හා තත්‍ය කාර්යමණ්ඩලය 147,850 ක් වූයෙන් සමස්ත කාර්යමණ්ඩල ඌනතාවය 30,092 ක් ලෙස සියයට 17 ක ඉහළ අගයකින් යුක්ත විය.

(ආ) විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව තනතුරු 351 කට අදාළව නිලධාරීන් 18,213 ක ඌනතාවයක්ද තනතුරු 28 කට අදාළව නිලධාරීන් 559 ක් අතිරික්තව ද සේවයේ යොදවා තිබුණි. මේ තුළ පැවති තනතුරු 48 කට අදාළව නිලධාරීන් 14,430 ප්‍රමාණයක් ආයතන තුළ ඌනව පැවතීම මෙන්ම ඇතැම් ආයතනවල නිලධාරීන් 1,982 අතිරික්තව පැවතීමත් නිරීක්ෂණය වූ අතර මෙලෙස අතිරික්තය හා ඌනතා තුළනය නොකර සේවයේ යෙදවීම කළමනාකරණයේ දුර්වලතාවයක් බව නිරීක්ෂණය විය.

(ඇ) ඉහත අතිරික්ත හා ඌනතාවයන් පැවති තනතුරුවලට අමතරව ඌනතාවයන් පමණක් පැවති තවත් තනතුරු 305 කට අදාළව නිලධාරීන් 5,644 ක කාර්යමණ්ඩල ඌනතාවයක් පැවතුණි. මේ සම්බන්ධයෙන් අවධානය යොමුකර අදාළ තනතුරු තවදුරටත් පවත්වාගෙන යාම අත්‍යාවශ්‍ය නම් එම තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීමට හෝ අත්‍යාවශ්‍ය නොවන තනතුරු යටපත් කිරීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය නිරීක්ෂණය විය.

(ඇ) ඉහත අතිරික්ත හා ඌනතාවයන් පැවති තනතුරුවලට අමතරව තවත් තනතුරු 25 කට අදාළව නිලධාරීන් 440 ක කාර්යමණ්ඩල අතිරික්තයක් පැවතුණි. මෙසේ අනුමැතියක් රහිත තනතුරුවලට නිලධාරීන් බඳවාගැනීමට හා වැටුප් හා දීමනා ගෙවීමට ලැබී ඇති අධිකාරි බලය විගණනයේදී මතභේදයට තුඩුදෙන කරුණක් විය.

(ඉ) 2025 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්යමණ්ඩලය තුළ නොපවතින තනතුරු නාම 15 කට අදාළව නිලධාරීන් 157 ක් අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින ආයතන තුළ සේවය කරමින් පවතින බව නිරීක්ෂණය වූ අතර මෙසේ අනුමත නොවූ සේවාවන් තුළ නිලධාරීන් රඳවාගැනීම හා අවශ්‍යතාවය අනුව සේවාවන් අනුමත කිරීමට කටයුතු නොකිරීමත්, මෙසේ අනුමැතියක් රහිත තනතුරුවලට නිලධාරීන් බඳවාගැනීමට හා වැටුප් හා දීමනා ගෙවීමට ලැබී ඇති අධිකාරි බලය විගණනයේදී මතභේදයට තුඩුදෙන කරුණක් විය.

(ඊ) අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින ආයතන වශයෙන් ගත් විට අදාළ ආයතනයෙහි අනුමත කාර්යමණ්ඩලය තුළ නොපවතින තනතුරුවලට අදාළව නිලධාරීන් 282 ක් 2025 දෙසැම්බර් 31 දිනට ආයතන තුළ සේවය කරමින් පවතින බව නිරීක්ෂණය වූ අතර මෙසේ අනුමත නොවූ සේවාවන් තුළ නිලධාරීන් රඳවාගැනීම හා අවශ්‍යතාවය විගණනයේදී මතභේදයට තුඩුදෙන කරුණක් විය.

(උ) විගණනය වෙත ඉදිරිපත් කර තිබුණු තොරතුරු අනුව ආයතන තුනක් සඳහා 2025 දෙසැම්බර් 31 දිනට නිලධාරීන් 16 ක කාර්යමණ්ඩලයක් අනුමතව පැවතියද කිසිදු නිලධාරියකු එම ආයතන තුනට අනුයුක්ත කර නොතිබුණි.

(ඌ) අමාත්‍යාංශයේ ප්‍රධාන නීති නිලධාරී තනතුර හෙබවූ නිලධාරියා, ඇය භාරයේ පැවති නීති කටයුතු සඳහා හා පරිපාලන කටයුතු සඳහා අදාළ වූ ලේඛන නිසි පරිදි භාර නොදී 2025 දෙසැම්බර් 10 දින විශ්‍රාම ගොස් තිබුණි. ඇය විසින්ම බාර දිය යුතු නීති අංශයේ ලිපි ලේඛන කිසිවක් විගණිත දිනය වූ 2026 මාර්තු 11 දිනවන විටත් විධිමත් පරිදි භාරදීමට කටයුතු කර නොතිබුණු බවත් මෙලෙස විශ්‍රාම යන නිලධාරිණිය විසින් විධිමත් පරිදි ඇය භාරයේ පැවති නීති කටයුතු සඳහා හා පරිපාලන කටයුතු සඳහා අදාළ වූ ලේඛන නිසි පරිදි භාර නොදීම තුළ අමාත්‍යාංශයේ ඉදිරි නීතිමය කටයුතුවලදී හා නීති අංශයේ පරිපාලන කටයුතු වලදී ගැටලුකාරී තත්වයන් පැන නැඟිය හැකි බවත් නව ප්‍රධාන නීති නිලධාරී තනතුරෙහි රාජකාරී කටයුතු සිදුකිරීමේ දී ගැටලු සහගත තත්වයන් ඇති විය හැකි බවත් නිරීක්ෂණය විය.

(එ) සෞඛ්‍ය අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින රෝහල්, ආයතන හා අංශයන්හි කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) කොළඹ ජාතික රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුර සහ ද සොයිසා කාන්තා රෝහල, වෘක්කවේද කාන්දු පෙරීම හා වකුගඩු බද්ධ කිරීමේ ජාතික මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා ජාතික අක්ෂි රෝහල, යන රෝහල් 03 හි අධ්‍යක්ෂ තනතුර වසරකට අධික කාලයක් තිස්සේ පුරප්පාඩු වී පවතින අතර නිත්‍ය පත් කිරීමක් සිදු

නොකර රාජකාරි අවරණය කිරීමේ පදනමින් එම තනතුරු පැවතීම මත රෝහල් පරිපාලනය නිසි පරිදි පවත්වාගෙන යාම කෙරෙහි අහිතකර බලපෑමක් වී පවතින බව නිරීක්ෂණය විය.

(ii) ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශයේ කාර්ය මණ්ඩල කළමනාකරණය සම්බන්ධයෙන් සිදුකළ විගණන පරීක්ෂාවේදී, ඉහල මට්ටමේ කළමනාකරණ හා තාක්ෂණික තනතුරු ගණනාවක් දිගුකාලීනව පුරප්පාඩුව පවතින අතර, ඒවා සඳහා නිත්‍ය පත්වීම් සිදු කිරීමට කළමනාකරණය විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොමැති බව නිරීක්ෂණය විය. විශේෂයෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සහ අධ්‍යක්ෂ තනතුරු පිළිවෙලින් 2016 හා 2024 සිට වැඩබැලීමේ පදනම මත පවත්වාගෙන යාම, 2014 වර්ෂයේ අනුමත දින සිට ජ්‍යෙෂ්ඨ ජීව වෛද්‍ය ඉංජිනේරු තනතුරු සඳහා කිසිදු බඳවා ගැනීමක් නොකිරීම, සහ ජීව වෛද්‍ය ඉංජිනේරුවන්ගේ සැලකිය යුතු පුරප්පාඩු පැවතීම හේතුවෙන් අංශයේ ප්‍රධාන කාර්යයන් වන වෛද්‍ය උපකරණ මිලදී ගැනීම, නඩත්තු කිරීම, තාක්ෂණික පිරිවිතර සැකසීම හා ආයතනික සහ පළාත් මට්ටමේ අධීක්ෂණ කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීමට නොහැකිවී තිබුණි. එමෙන්ම, අනුමත කාර්ය මණ්ඩලයට සරිලන පරිදි බඳවා ගැනීම් සිදු නොවීම, උසස් කිරීමේ පරිපාටි අනුමත නොවීම, සහ බඳවා ගැනීමේ සංශෝධන සඳහා අවශ්‍ය අනුමැති ලබාගැනීමේ කටයුතු ප්‍රමාදවීම මගින් මානව සම්පත් සැලසුම්කරණයේ දුර්වලතා නිරීක්ෂණය විය. තවද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබීම සම්බන්ධ ලේඛන නිසි පරිදි පුද්ගලික ලිපිගොනුවල ඇතුළත් නොකිරීම වැනි පරිපාලන අඩුපාඩුද නිරීක්ෂණය විය. ගබඩාහාර නිලධාරීන්ගේ දැඩි නිහය හේතුවෙන් වටිනා වෛද්‍ය උපකරණ භාරගැනීම හා නිකුත් කිරීම වැනි මූලික පාලන කාර්යයන් තනි පුද්ගලයෙකු මත රඳා පවතින බවත්, මෙවැනි තත්ත්වයන් අංශයේ ක්‍රියාකාරිත්වය, සේවා ගුණාත්මකභාවය හා සම්පත් භාවිතයේ කාර්යක්ෂමතාවයට අහිතකර ලෙස බලපාන බවත් නිරීක්ෂණය විය.

(iii) 2001 සැප්තැම්බර් 30 දිනැති අංක 01-22/2001 දරන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ වක්‍රලේඛයේ 2:1:1 ඡේදය ප්‍රකාර සියළුම ශ්‍රේණිවල වෛද්‍ය නිලධාරීන් වසර 04 ක් සම්පූර්ණ වූ විට ස්ථාන මාරුවීම් වලට යටත් විය යුතු බව දක්වා තිබුණද 2025 නොවැම්බර් 03 දිනට වෛද්‍ය පර්යේෂණ ආයතනයේ සේවයේ නියුක්ත වෛද්‍ය නිලධාරීන් 20 ක් ස්ථානමාරුවීම් වලට යටත් නොවී අවුරුදු 5 - 14 දක්වා කාලපරිච්ඡේදයක් සේවයේ යොදවා තිබුණි.

(iv) 2001 අගෝස්තු 22 දිනැති රාජ්‍ය පරිපාලන වක්‍රලේඛ අංක 18/2001 අනුව තනතුරක උපරිම කාල සීමාව වන අවුරුදු 05ක් එකම තනතුරේ/ සේවා ස්ථානයේ සේවය කර ඇති සෑම නිලධාරියෙකුටම වෙනත් තනතුරුවල/ සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩ දීම සඳහා වහාම ස්ථාන මාරු ලබා දිය යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. අවස්ථා කිහිපයක් පහත පරිදි විය.

- 2025 මැයි 31 දිනට පවුල් සෞඛ්‍ය කාර්යාංශයට අදාළව සේවා කාළය අවුරුදු 05ත් 10ත් අතර නිලධාරීන් 20 දෙනෙකුද, අවුරුදු 10ත් 20ත් අතර

නිලධාරීන් 27 දෙනෙකුද, අවුරුදු 20ත් 30ත් අතර නිලධාරීන් 3 දෙනෙකු සේවයේ යොදවා තිබුණි.

- 2024 සැප්තැම්බර් 30 දිනට ළමා රෝහලේ කාර්ය මණ්ඩලයට අදාළව සේවා කාලය අවුරුදු 05ත් 10ත් අතර නිලධාරීන් 520 දෙනෙකුද, අවුරුදු 10ත් 20ත් අතර නිලධාරීන් 389 දෙනෙකුද, අවුරුදු 20ත් 30ත් අතර නිලධාරීන් 219 දෙනෙකුද අවුරුදු 30ට වැඩි නිලධාරීන් 33 දෙනෙකුද සේවයේ යොදවා තිබුණි.

කේ.කේ.ඩ්‍රස්.ජයකොඩි
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

4 පරිච්ඡේදය

කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක

සෞඛ්‍ය සේවා සැපයීමේ කාර්ය සාධනය විශ්ලේෂණය කිරීම සෞඛ්‍ය සේවාවන් සැපයීමේ ඉහළ කාර්යක්ෂමතාවය හා සඵලතාවය ළඟාකරගැනීමට හේතු වේ. සෞඛ්‍ය ආයතනික අරමුණු හා අභිප්‍රායයන් කාලයත් සමඟ ඇගයීම තුළින් සෞඛ්‍ය සේවාවේ කාර්ය සාධනය තෝරාගත් දර්ශක භාවිතා කරමින් නිර්ණය කල හැක. මෙම අවශ්‍යතාවය සපුරාගැනීමට ජාතික සෞඛ්‍ය කාර්ය සාධන රාමුව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් හඳුනාගෙන ඇත. මෙම දර්ශක භාවිතා කරමින් සෞඛ්‍ය කාර්ය සාධනය විශ්ලේෂණයට හා නිවැරදි මඟට ගැනීම සඳහා මෙන්ම කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් හා සම්පත් වෙන්කරදීමේ දී තීරණ ගැනීමේ පදනම වශයෙන් මෙම දර්ශක භාවිතා කළ හැක. තෝරාගත් ප්‍රයෝජනවත් දර්ශක කිහිපයක් පහත සඳහන් කෙරේ.

දර්ශකය	2022	2023	2024	2025
සජීවී උපත් 100,000 කට මාතෘ මරණ අනුපාතිකය (පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ දත්ත)	33	25		දත්ත නොමැත
සජීවී උපත් 1,000 කට ළදරු මරණ අනුපාතිකය (පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ දත්ත)	10.1	10.4		දත්ත නොමැත
සජීවී උපත් 1,000 කට අවුරුදු පහට අඩු ළමා මරණ අනුපාතිකය (පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ දත්ත)	12.0	12.5	12.1	දත්ත නොමැත
ක්ෂය රෝග ප්‍රතිකාර සාර්ථකත්ව අනුපාතය (ක්ෂය රෝග මර්දන හා ළය රෝග පිලිබඳ ජාතික වැඩසටහනේ දත්ත)	78.1	79	දත්ත නොමැත	දත්ත නොමැත
ඩෙංගු රෝගීන්ගේ මරණ අනුපාතය (ජාතික ඩෙංගු මර්දන ඒකකය)	0.09	0.07	0.05	දත්ත නොමැත
ඩෙංගු ආශ්‍රිත මරණ සංඛ්‍යාව	72	62	24	දත්ත නොමැත
ළමා (අවුරුදු 15ට අඩු) ලාදුරු රෝගීන් ගණන (ලාදුරු මර්ධන වැඩසටහනේ දත්ත)	දත්ත නොමැත	11.8%	7.1%	9.6%
දැනට antiretroviral චිකිත්සා ප්‍රතිකාර ලබන HIV ආසාධිතව ජීවත්වන ජනතාවගේ ප්‍රතිශතය (ජාතික ලිංගාශ්‍රිත රෝග / ඒඩ්ස් මර්දන වැඩසටහනේ දත්ත)	68.00	71.00	දත්ත නොමැත	
ආසාදනය නොවූ ජනගහනය 1,000 කට නව HIV ආසාදිත සංඛ්‍යාව (ජාතික ලිංගාශ්‍රිත රෝග / ඒඩ්ස් මර්දන වැඩසටහනේ දත්ත)	0.01	0.01	0.01	
ජනගහනය 10,000කට සෞඛ්‍ය සේවක ඝනත්ව (වාර්ෂික සෞඛ්‍ය වාර්තා දත්ත)	ජනගහනය 22,181,000	ජනගහනය 22,037,000	ජනගහනය 21,781,000	දත්ත නොමැත
විශේෂඥ වෛද්‍යවරුන්	1.28 (2,839)	1.25 (2,756)	1.36 (2,957)	දත්ත නොමැත

දර්ශකය	2022	2023	2024	2025
වෛද්‍ය නිළධාරීන් (පරිපාලකයින් හා විශේෂඥ වෛද්‍යවරුන් හැර)	9.21 (20,426)	9.58 (21,119)	9.62 (20,960)	දත්ත නොමැත
දන්ත ශල්‍ය වෛද්‍යවරුන්	0.76 (1,689)	0.73 (1,604)	0.69 (1,494)	දත්ත නොමැත
හෙද නිළධාරීන්	22.77 (50,516)	24.18 (53,283)	22.80 (49,665)	දත්ත නොමැත
ඖෂධවේදීන් සහ ඖෂධ සංයෝජකයින්	1.66 (3,676)	1.64 (3,625)	1.67 (3,635)	දත්ත නොමැත
පරිපාලන සහ රෝහල්වල සේවය කරන පවුල් සෞඛ්‍ය සේවා නිළධාරීන් ඇතුළු පවුල් සෞඛ්‍ය සේවා නිළධාරීන්	4.18 (9,100)	4.16 (9,059)	3.92 (8,528)	දත්ත නොමැත
මූලික රෝහල් සහ ඊට ඉහළ රෝහල්වල අත්‍යවශ්‍ය ඖෂධ පැවතීම (සාරා සමීක්ෂණ දත්ත)				දත්ත නොමැත
අවුරුදු 5 ට අඩු දරුවන් අතර මිටි බව (පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ දත්ත)	9.2	10.3	10.5	10.1*
අවුරුදු 5 ට අඩු දරුවන් අතර කෘෂ බව (පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ දත්ත)	10.1	10.0	9.2	8.6*
අඩු බර සහිත අවුරුදු 5 ට අඩු දරුවන් (පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ දත්ත)	15.3	17.1	17.0	16.1*
අධි බර සහිත අවුරුදු 5 ට අඩු දරුවන් (පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ දත්ත)	0.59	0.43	0.49	0.57*
ළමා ප්‍රතිශක්තිකරණය: ගලපටලය - පිටගැස්ම - කක්කල්කැස්ස යන මාත්‍රා තුනම ලබාගත් ළදරුවන්ගේ ප්‍රතිශතය (වසංගත රෝග විද්‍යා ඒකකයේ දත්ත)	<95	<95	<95	
හෘදඝමනි රෝග, පිළිකා, දියවැඩියාව හෝ කල්ගතවූ ශ්වසන රෝග නිසා ඇතිවන මරණ අනුපාතය (ගෝලීය සෞඛ්‍ය නිරීක්ෂණ දත්ත)				
රෝහල්ගත රෝගීන් දින 10,000 කට MRSA bacteremia අනුපාතය				
සිසේරියන් සැත්කමින් පසු සැත්කම් ප්‍රදේශයේ ආසාදන ඇතිවීමේ අනුපාතය		රෝහල් කාර්ය සාධන වගුවල රෝහල් අනුව දත්ත සඳහන් කර ඇත.		
ශල්‍යාගාර ලැයිස්තුවට අනුව, මාසයක් තුළ කල් දැමූ කලින් දින තීරණය කළ සැත්කම්වල (elective surgeries) අනුපාතය හෝ සුවිගත කරන ලද ශල්‍යකර්මවල (indexed operations) පොරොත්තු (waiting) කාල සීමාව				
ශල්‍ය ආරක්ෂණ පිරික්සුම් ලැයිස්තුවට අනුගතවීමේ අනුපාතය				

දර්ශකය	2022	2023	2024	2025
විද්‍යාගාර පරීක්ෂණ නොමැතිව බාහිර රෝගී අංශයේ රැඳී සිටීමේ කාලය (මිනිත්තු)				

දේශීය වෛද්‍ය අංශයේ කාර්ය සාධන නිර්ණායක

- දේශීය වෛද්‍ය සේවයේ ගුණාත්මක හා ප්‍රමාණවත් වර්ධනය
- ගුණාත්මක ඔසු , අමුද්‍රව්‍ය හා ගුණාත්මක ප්‍රමිතිගත ඖෂධ නිෂ්පාදනය
- පාරම්පරික වෛද්‍ය ක්‍රම හා වෛද්‍ය දැනුම සංරක්ෂණය වීම
- දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පවතින පර්යේෂණ අවස්ථා පුළුල් වීම
- ප්‍රාථමික සෞඛ්‍ය සංරක්ෂණයට හා බෝ නොවන රෝග පාලනය සඳහා දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයෙන් ලබාදෙන දායකත්වය
- දේශීය වෛද්‍ය ක්‍රම හා බැඳි ශික්ෂණ පද්ධතිය පුළුල් වීම

රේඛීය අමාත්‍යාංශයේ රෝහල්වල (මූලික රෝහල් සහ ඊට ඉහල) කාර්යසාධන දර්ශක

➢ ජාතික රෝහල්

අංකය	දර්ශකය	රෝහලේ නම		
		ශ්‍රී ලංකා ජාතික රෝහල, කොළඹ	ජාතික රෝහල, මහනුවර	ජාතික රෝහල, ගාල්ල
01	2025 වසර සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රය (EPL) සහ උපලේඛනගත අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍රය (SWML) ලබා ගෙන / අලුත් කර තිබේද යන්න	නැත	ඇත	නැත
02	මුළු ඇඳන් සංඛ්‍යාව	3413	2808	2107
03	නේවාසික (ඇතුළත) ඇඳන් සංඛ්‍යාව	3374	2167	2084
04	ඇඳන් භාවිත කිරීමේ අනුපාතය (BOR)	81.6	63	77.97%
05	**දැඩි සත්කාර ඒකක (ICU) ඇඳන් ධාරිතාව, ICU වර්ග අනුව**	**131**	**85**	**56**
	SICU		08	0
	MICU		09	07
	NICU /NSICU		07/22	05
	ETC-ICU		00	12
	OITU / PICU / CTU-ICU / CCU-ICU		0/12//16/08/08/	05 / 12 /07 / 08
06	අධි සත්කාර ඒකක (HDU) මුළු ඇඳන් සංඛ්‍යාව	186	136	54
07	වාර්ෂික ඩෙංගු රෝගීන්ගේ මරණ අනුපාතය	0.046	0.4	0.24
08	වාර්ෂික රෝහල්ගත හෘද අකරනිය සහිත රෝගීන්ගේ මරණ අනුපාතය	9.0		15.60

අංකය	දර්ශකය	රෝහලේ නම		
		ශ්‍රී ලංකා ජාතික රෝහල, කොළඹ	ජාතික රෝහල, මහනුවර	ජාතික රෝහල, ගාල්ල
09	වර්ෂය තුළ සිදු කරන ලද ප්‍රධාන සැත්කම් ගණන	22942	22362	12813
10	බෝ නොවන රෝග කළමනාකරණය සඳහා අත්‍යවශ්‍ය ඖෂධ වසර පුරා පැවති ප්‍රතිශතය	90.87	57.8	96.29
11	වෛද්‍ය රසායනාගාර කාර්මිකයකු විසින් වර්ෂය තුළ කරන ලද පරීක්ෂණ ගණන	62954	38898	37,299
12	ඖෂධ සඳහා වන මුළු ප්‍රතිපාදනයේ දේශීය මිලදී ගැනීම් සඳහා වූ වියදමේ ප්‍රතිශතය	13.07	56.50	10.78
13	වාර්ෂික සිසේරියන් සැත්කම් අනුපාතය - (සජීවී දරු උපත් 100කට සිසේරියන් සැත්කම් ගණන)	NA	43	N/A
14	වර්ෂය සඳහා පශ්චාත් සිසේරියන් සැත්කම් ආසාදන අනුපාතය	NA	0.1	NA
15	**සේවක කාණ්ඩ අනුව වර්ෂය තුල අවම වශයෙන් එක් ධාරිතා වර්ධන වැඩසටහනකට සහභාගී වූ කාර්ය මණ්ඩලයේ ප්‍රතිශතය**			
	1. වෛද්‍ය නිලධාරී	15.13	16.37	64
	2. හෙද නිලධාරී	37.43	17.61	91
	3. වෙනත් තාක්ෂණික නිලධාරීන්	22.30	24.13	58
	4. කණිෂ්ඨ කාර්ය මණ්ඩලය	25.37	5.78	61
